## 2018/07/10 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

2018.07.10 වන දින පෙ.ව. 09.00 ට නාගොඩ ප්‍රාදේශිය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.

**සහභාගීත්වය -**

| | |
|---|---|
| 1. නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. එම් කේ ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. ඒ එච් වී අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. ඩබ් ජී නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. සී වි සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. බන්දුල සමන්ත හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 7. එච් ජී තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. එච් කේ ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. එන් ජී ගයාන් මදුසංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රී |
| 14. එඩ්රි ආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. නාපේ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. සී වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 18. ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රී |
| 19. එම්. එම්. දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 21. කේ. කේ. අයි. නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 22. කේ ඒ සී දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රී |
| 23. එච් එච් ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රී |
| 24. වී ජී අරුණ ශාන්ති මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. පී ජී රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

**01. ආගම සිහි කිරීම**

සුභ උදෑසනක් වේවා සියළුම දෙනාට, අද නාගොඩ ප්‍රාදේශීය සභාවේ හතරවන සභාවාරය පැවැත්වීමට කටයුතු සැලසිලා තියෙන මේ අවස්ථාවේ ප්‍රථමයෙන්ම තියෙන්නේ ආගම සිහි කිරීමයි. මම ඉතාම ගෞරවයෙන් ආරාධනා කරනවා තම තමන්ගේ ආගම සිහි කර , රට දැය වෙනුවෙන් රටේ ඒකීය භාවය ආරක්ෂා කරන්න දිවි පිදූ රණවිරුවන්, සහ තමන්ගේ මිය ගිය ආදරණීය ඥාතීන් සිහි කර විනාඩි 02 ක නිශ්ශබ්දතාවයක් ආරක්ෂා කරන ලෙස

**02. ගරු සභාපතිතුමාගේ පිළිගැනීමේ කතාව**

නාගොඩ ප්‍රාදේශීය සභාවේ මාසික සභා රැස්වීම පවත්වන්නට අවශ්‍ය ගනපූර්ණය තිබෙන බැවින් පැමිණ සිටින නියෝජ්‍ය සභාපති ගාමිණී සුසන්ත මැතිතුමා ප්‍රමුඛ සියළුම මන්ත්‍රීතුමන්ලා/ මන්ත්‍රීතුමියන්ලා මම ඉතා ගෞරවාධරයෙන් පිළිගනිමි. විශේෂයෙන්ම අද දින අපේ සභාවේ වැඩ කටයුතු කරගෙන යාමට , පෙර සභාවලදී මෙන්ම ඔබතුමන්ලාගේ සහයෝගය බලාපොරොත්තු වන අතර ඔබතුමන්ලාගේ අදහස් උදහස් ප්‍රකාශ කරමින් කටයුතු කරයි කියලා මම බලාපොරොත්තු වෙමින් ලේකම්තුමියත් මේ අවස්ථාවේ පිළිගනිමින් මගේ පිළිගැනීමේ කතාව අවසන් කරනවා.

**03. 2018.06.12 දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇතිනම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම,**

ඒ අනුව 2018-06-12 දින පැවති මාසික සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් ලෙස පිළිගත හැකි බවට ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා විසින් යෝජනා කල අතර ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය විසින් එම යෝජනාව ස්ථිර කරන ලදී. ඉන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**04. පසුගිය වාර්තාවේ යෝජනා සඳහා ඉදිරිපත් කර ඇති සංශෝධන ඉදිරිපත් කිරීම.**

නැත

**05. විශේෂ නිවේදන**

01. ගරු මන්ත්‍රිනී නෙලී වක්වැල්ල මහත්මිය පෞද්ගලික හේතුවක් මත අද දින සභාවට පැමිණීමට නොහැකි බව දන්වා එවන ලද ලිපිය සභා ගත කරන ලදී. ගරු පතිනායක මන්ත්‍රීතුමා අසනීප තත්වය මත රෝහල් ගත වී ඇති බැවින් අද දින සභාවට සහභාගී වීමට නොහැකි බව දන්වා ඇත.

ගරු සභාපතිතුමා විසින් මෙම නිවාඩු අනුමත කර දෙන ලෙස සභාවට යෝජනා කරන ලදී. එහිදී ලක්රුවන් ගරු මන්ත්‍රීතුමා සභාපතිතුමාගේ යෝජනාව ස්ථිර කරමින් ඉහත නිවාඩු දෙක අනුමත කරන ලදී.

02. 2018 ඔක්තෝම්බර් මාසය තුළදී ලෝක ළමා දින උත්සවය සංවිධානය කල යුතු අතර ළමුන් වෙනුවෙන් පැවැත්විය හැකි වැඩසටහන් හෝ ළමා දින උත්සවය සම්බන්ධව යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස දන්වා සිටිමි.

03. ප්‍රාදේශීය සභාව මගින් පාලනය වන සමිතියක් සෑම කොට්ඨාශයකටම එක බැගින් ආරම්භ කරන ලෙස දන්වා සිටිමි. එම සමිති ප්‍රජා මූල සංවිධාන සමිති නමින් හදුන්වන අතර කොට්ඨාස මට්ටමින් ආරම්භ කල යුතු අතර එම සමිති හරහා ඉදිරියේදී සංවර්ධන යෝජනා හා අයවැය යෝජනා ලබා ගැනීමට නියමිත වේ. එබැවින් කොට්ඨාස මන්ත්‍රීවරුන් මූලික වී එම සමිති පිහිටුවන ලෙස පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය මගින් දැනුම් දී ඇත.

04. ගිය සභා වාරයේදී ඉල්ලන ලද අප ප්‍රාදේශීය සභාව සතු වාහන සම්බන්ධ තොරතුරු ඉදිරිපත් කරමි.

2018.06.12 සභා වාරයේදී ඉල්ලුම් කරන ලද සභාව සතු වාහනවල තොරතුරු

| | |
|---|---|
| **වාහනය** | **දැනට භාවිතය** |

01. 252-6478 කැබ් රථය කාර්යාලීය කටයුතු සඳහා
02. PF 7360 කැබ් රථය සභාපතිතුමාගේ නිල රථය වශයෙන්
03. LL 7650 කෲ කැබ් රථය කාර්යාලීය කටයුතු සඳහා
04. RA 8569 ට්‍රැක්ටරය කසල කළමනාකරණය
05. RA 8570 ට්‍රැක්ටරය කසල කළමනාකරණය
06. RD 1637 ට්‍රැක්ටරය කසල කළමනාකරණය
07. RD 9457 ට්‍රැක්ටරය කසල කළමනාකරණය
08. LL 7103 ටිපර් රථය කසල කළමනාකරණය
09. RV 5013 ට්‍රේලරය කසල කළමනාකරණය
10. RW 8886 ගාබේජ් ට්‍රේලරය යාන්ත්‍රික ඉංජිනේරු මහතාගේ උපදෙස් පරිදි අළුත්වැඩියා කිරීමට නියමිතව ඇත.
11. RX 2239 සුදු යකඩ බවුසරය ජල අවශ්‍යතාවය සඳහා
12. RW 9116 බවුසරය ජල අවශ්‍යතාවය සඳහා
13. RW 9115 බවුසරය ජල අවශ්‍යතාවය සඳහා
14. LL 7366 ට්‍රක් බවුසරය ජල අවශ්‍යතාවය සඳහා
15. SC 3570 හාඩ්මෙක් දොඹකරය විදුලි පහන් නඩත්තු කටයුතු සඳහා
16. 340- 4321 අත් ට්‍රැක්ටරය නිශ්චිත කාර්යයක් සඳහා වෙන් කර නැත. අවශ්‍යතාවය අනුව යොදා ගැනේ.

දැනට ගාල්කර ඇති වාහන පිළිබඳව, එම වාහන ගාල් කරන අවස්ථාවේ තිබූ තත්වය පිළිබඳව සවිස්තර වාර්තාවක් ඉදිරිපත් කිරීම සුදුසු බව සී. වී. සහබන්දු මහතා විසින් ප්‍රකාශ කරන ලදුව ඉදිරියේදී ලිපිගොනුවල පවතින තත්වය පරීක්ෂා කර බලා එම තොරතුරු ලබා දීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

**06. සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම.**

**01. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. එම්. දිසානායක මන්ත්‍රීතුමා මගින් ආරියදාස රුවන් පතිරණ මහතා විසින් එවන ලද නාගොඩ බද්දේගම මහා මාර්ගය කාපට් අතුරා පිළිසකර කිරීමේ ව්‍යාපෘතිය නිසි ලෙස හා විධිමත්ව නිම නොකිරීම නිසා මහජනතාවට අත්විඳීමට සිදු වී ඇති දුෂ්කරතා හා එල විපාක පිළිබඳ පැමිණිල්ල 2018.06.02 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

ගරු මන්ත්‍රී එම්. එම්. දිසානායක මන්ත්‍රීතුමා හරහා ආරියදාස රුවන් පතිරණ මහතා ඉදිරිපත් කරන ලද පැමිණිල්ලට අනුව ඉදිරියේදී අදාළ ආයතන දැනුවත් කිරීමට කටයුතු කරන බව සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

02. **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී චන්දිමා දිල්රුක්ෂි මහත්මිය මාර්ගයේ බර වාහන ප්‍රවාහනය සම්බන්ධයෙන් එවන ලද 2018.07.05 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

එම ලිපිය සම්බන්ධයෙන් ගරු සභාපතිතුමන් අදහස් දක්වමින් කියා සිටියේ තමන් ගරු මන්ත්‍රී ගයාන් මහතාත් සමග මෙම ස්ථානයේ ස්ථානීය පරීක්ෂාවක් සිදු කල අතර පාරට හා බෝක්කුවලට දැඩි හානි සිදු වී තිබුණු බැවින් අපට පාර ආරක්ෂා කර ගැනීමට අවශ්‍ය නිසා ගෙන යා හැකි බරට පමණක් දර ප්‍රවාහනය කරන ලෙස කොන්ත්‍රාත්කරුට අවවාද කල නමුත් ඔහු දිගින් දිගටම එම කටයුත්ත සිදු කරන බව පැහැදිලි වන බවයි. එබැවින් මෙම මාර්ගවල "බර වාහන ධාවනය තහනම්" යන පුවරු සවි කල යුතු බවත් එතුමා

වැඩි දුරටත් ප්‍රකාශ කරන ලදී. මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී චන්දිමා දිල්රුක්ෂි මහත්මියද එයට එකගත්වය පළ කරමින් තම අදහස් ප්‍රකාශ කරන ලදී.

මෙහිදී ගරු මන්ත්‍රි ගයාන් මහතා කියා සිටියේ සභාපතිතුමා සමග එක්ව මෙම මාර්ග ආරක්ෂා කර ගැනීමට ගොස් මෙතෙක් කාලයක් නොකල වැරදි වෙනුවෙන් අපහස විදීමට සිදු වූ බවයි.

මෙහිදී, ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා හා ගරු මන්ත්‍රී සී. වී. සහබන්දු මහතා තම අදහස් ප්‍රකාශ කරමින් කියා සිටියේ බර වාහන ධාවනය නතර කිරීම සදහා නීතියේ ප්‍රතිපාදන නොමැති බැවින් හදිසි අවශ්‍යතාවයක් වශයෙන් සළකා සභාපතිවරයාගේ බලතල පාවිච්චි කර තීන්දු තීරණ ගන්නා ලෙස අවධාරනය කරන ලදී.

ගරු සභාපතිතුමා මේ සම්බන්ධයෙන් තව දුරටත් අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ මෙසේ බෝඩ් සවි කලත්, ඇතැම් අය විසින් එය කඩා ඉවත් කර වාහන ධාවනයේ යෙදෙන බව වාර්තා වී ඇති බවයි. උදාහරණයක් ලෙස ඌරල පාර පෙන්වා දිය හැකිය. කෙසේ වෙතත් මදුරුදූව මාර්ගය හා කුඩමලාන මාර්ගයේ අදාළ දැන්වීම් පුවරු සවි කිරීමට තීරණය කල අතර, පාර ආරක්ෂා කර ගැනීම ප්‍රදේශවාසීන්ගේ යුතුකමක් හා වගකීමක් වන බවද වැඩිදුරටත් සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේය.

03. **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා මගින් හේමචන්ද්‍ර වීරසිංහ මහතා විසින් කොන්ක්‍රීට් අතුරා පාර සකස් කර දෙන මෙන් ඉල්ලා එවා ඇති 2018.06.07 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

ධර්මසිරි ගනේවත්ත මන්ත්‍රීතුමා අදහස් ප්‍රකාශ කරමින් කියා සිටියේ මෙම මාර්ගය ඉතා අත්‍යාවශ්‍ය බවත්, එහි පළමු 100 m කොන්ක්‍රීට් කරන ලෙසත්, අවසානයේ ඇති විවෘත නොවුනු කොටස, සෞඛ්‍ය මධ්‍යස්ථානය දක්වා J.C.B. යන්ත්‍රයක් යොදා සකස් කර ලෙසත්ය. මෙම කොටස ඉඩම් අයිතිකරුවන් වගා කිරීමට යොදා ගත හැකි බැවින් මෙය ඉක්මණින් සංවර්ධනය කිරීම අවශ්‍ය බවත්ය.

**04. කේ. කේ. කේ. චන්දිම ඇතුළු ප්‍රදේශවාසීන් විසින් පාසල් කන්ද මාවත පිළිසකර කර ගැනීම සම්බන්ධයෙන් එවන ලද 2018.06.25 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

**05. පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය විසින් එවන අංක පපාසකො/ගා/ආ06 හා 2018.06.19 දිනැති වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් කිරීම ලිපිය සභාගත කරන ලදී.**

ඒ අනුව මෙතෙක් වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකරන ලද ගරු මන්ත්‍රීවරුන් හා ගරු මන්ත්‍රීවරියන් ඉතා ඉක්මණින් තමන්ගේ වත්කම් හා බැරකම් ප්‍රකාශ ලේකම්තුමිය වෙත ලබා දෙන මෙන් දන්වා සිටිමි.

**06. ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය, නාගොඩ විසින් එවන ලද අංක NAG/SDB/15/2/1 හා 2018.06.13 දිනැති දහම් පාසල් ගුරු පුහුණු වැඩසටහනක් සඳහා අනුග්‍රහය ලබා ගැනීම යන ලිපිය සභාගත කරන ලදී.**

මේ සම්බන්ධයෙන් ගරු උප සභාපතිතුමා සහ ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා තම අදහස් ප්‍රකාශ කරමින් කියා සිටියේ නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් නොව අප සභාව මගින් මෙම කටයුත්ත සිදු කිරීම සුදුසු බවයි. ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා අදහස් දක්වමින් ප්‍රකාශ කරන ලද්දේ දේශකයකුට මුදල් ගෙවීම අනවශ්‍ය බවත්, අපිට නොමිලේම දේශකයකු සපයා දිය හැකි බවත්, එබැවින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා සම්බන්ධ නොවී අපම මේ වැඩසටහන සිදු කරමු යන්නයි.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්, එහෙනම් ඉදිරි කටයුතුවලට අපි සාකච්ඡා කරලා කටයුතු කරමු යන්න ප්‍රකාශ කරන ලදී.

**07. කේ.පී. ජයනි මිය , ප්‍රජා සංවර්ධන නිලධාරී, නාගොඩ ප්‍රාදේශීය සභාව විසින් යොමු කරන ලද නාගොඩ, මාපලගම, උඩුගම මහජන පුස්තකාල තුනෙහි අඩුපාඩු සම්පූර්ණ කර ගැනීම සම්බන්ධව එවන ලද 2018.06.22 දිනැති ලිපිය සභාගත කරන ලදී.**

මේ දෙකටම මුදල් වෙන් වෙලා තියෙනවා. මාපලගම මහජන පුස්තකාලයට නල ජලය ලබා ගන්න එතැන ඉඩ ප්‍රමාණය මදි. නැත්නම් අපිට නොමිලෙම ළිදක් ගහල දෙන්න හැදුවා. නමුත් ඒක කරන්න බැහැ. දැනට මාපලගමට වතුර ගන්නෙ එතන තියෙන කඩෙන්.

ජයවීර මන්ත්‍රීතුමා , ගරු සභාපතිතුමා ඒ මෝටරය ගිනිහින් සවි කලාද යන්න විමසූ අතර එයට පිළිතුරු වශයෙන් එය සවි නොකල බව ප්‍රකාශ කරන ලදී.

**08. විගණකාධිපති දෙපාර්තමේන්තුව මගින් එවා ඇති අංක SNP/GL/F/NAGPS/5/17/06 හා 2018.06.13 දිනැති නාගොඩ ප්‍රදේශීය සභාවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව සභාගත කරන ලදී.**

**07 යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ**

නැත.

**08. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**01. උඩුගම ප්‍රාදේශීය සභා උප කාර්යාලය මාර්ග සංවර්ධන අධිකාරියට බදු දීම**

නාගොඩ ප්‍රාදේශීය සභා උඩුගම උප කාර්යාලය මාර්ග සංවර්ධන අධිකාරිය මගින් ඔවුන්ගේ කාර්යාලය පවත්වා ගෙන යාම සඳහා බදු පදනම මත ඉල්ලා තිබූ අතර ගිය සභා වාරයේදී ඒ සම්බන්ධව කටයුතු කිරීමට ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතාගේ නායකත්වයෙන් යුතු කමිටුවක් පත් කරන ලදී. ඒ අනුව මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මෙම ස්ථානය පරික්ෂා කර බලා ඔවුන්ගේ කාර්යාලය පවත්වා ගෙන යාමට සුදුසු පරිදි අළුත්වැඩියා කටයුතු කිරීමට ඇස්තමේන්තුවක් සකස් කර අප වෙත ලබා දී ඇත. එහෙත් මේ සම්බන්ධව සභාව සතු දේපල මෙසේ බදු දීම කල හැකිද යන්න පිළිබඳ ගැටළු සහගත

තත්වයක් පැන නැගී ඇත. නමුත් මුලටියන ප්‍රාදේශීය සභාවේ ගොඩනැගිල්ලක් දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට බදුදී ලා තියෙනවා. ඒකට අදාළ ගිවිසුම් ඉංජිනේරු මහත්තයා අප වෙත ලබා දීලත් තියෙනවා. ඒ නිසා මේ ගැන ඔබතුමන්ලගේ අදහස් ප්‍රකාශ කරන ලෙස ගරු සභාපතිතුමා විසින් සභාව වෙත දන්වා සිටින ලදී.

ගරු උප සභාපතිතුමා මෙහිදී අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ ගරු සභාපතිතුමා, ගරු මන්ත්‍රී එඩේරආරච්චි මහතා හා ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා සමග මම ත් එම ස්ථානයට ගොස් ඒ සම්බන්ධව අධීක්ෂණයක යෙදුනු අතර මාර්ග සංවර්ධන අධිකාරියෙන් පැමිණ සිටි නිලධාරීන් සමග සාකච්ඡා කරන ලදී. මෙහිදී ඔවුන් එම ශාලාව ලබා ගැනීමට ඉතා කැමැත්තක් දැක්වූ අතර ගරාජය හා පැරණි ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමට ඔවුන් එකග වූ අතර විදුලි බිල ගෙවීමට හෝ ප්‍රතිපූර්ණය කිරීමටද ඔවුන් එකග විය. නමුත් මෙහිදී රංගන ශාලාවට හා පැරණි ගොඩනැගිල්ලට එකම ජල මීටරයක් ඇති බැවින් ජල මාර්ගයක් ස්ථාපිත කර වෙන වෙනම මීටර් යෙදිය යුතුය. වසර 10 ක කාලයකට ලබා දෙන ලෙස ඉල්ලූ නමුත් අපේ නිල කාලය වසර 4 කට සීමාවන බැවින් එම වසර 4 ට පමණක් බදු දීමට එකග වුණි. මුලටියන ප්‍රාදේශීය සභාව මෙන් අපටද ගිවිසුම් ගත වී මෙම ගොඩනැගිල්ල බදු දීම තුල ගැටළුවකින් තොරව මාසික ආදායමක් ලබා ගත හැකිය. ඒ වගේම අපේ රංගන ශාලාවේ ලොකු උත්සවයක් පවත්වන අවස්ථාවක රථ වාහන නැවැත්වීමේ පොඩි ගැටළුවක් පැන නගිනවා. රථවාහන නවත්වන්න ඉඩ තිබුනෙ ඔය පැරනි ගොඩනැගිල්ල අසළ, ඒ සම්බන්ධවත් එකගතාවයට ඇවිල්ලා තමයි තීරණයකට ආවේ. මේ සම්බන්ධව තවත් අදහස් දැක්වීම් ඇති නම් වෙනත් කරුණු යටතේ කතා කරන්න.

මේ සම්බන්ධව ගරු මන්ත්‍රී සී. වී. සහබන්දු මහතා තම අදහස් ප්‍රකාශ කරමින් කියා සිටියේ මම හිතනවා සභාපතිතුමා උප සභාපතිතුමා කියන ලද කරුණු අනුව රු. 10000.00 කට හෝ නැතිනම් රු. 25000.00 කට ලබා දුන්නත් මෙහි අහිතකර ප්‍රතිඵල ඒවි. උදාහරණ දක්වමින් මේ සම්බන්ධව දීර්ඝ ලෙස කරුණු දක්වන ලදී.

ගරු මන්ත්‍රී ධනංජය විලේගේ මහතා ඒ සම්බන්ධව අදහස් දක්වමින්, ගරු සභාපතිතුමා මටත් පොඩි ගැටළුවක් තියෙනවා. අපි එතන හදුන්වන්නෙ උප කාර්යාලය කියලා. ප්‍රාදේශීය සභාව විදියට එතැන සිදුවන්නෙ මොනවද, මම දන්න තරමින් පෙර පාසල විතරයි තියෙන්නෙ. අපට අවශ්‍ය දේවල් කරගන්න උප කාර්යාලය විදියට එතැන පහසුකම් තියෙනවද එතැන මම හිතන්නෙ කලින් මුදල් එකතු කිරීම් සිදු වුනා ඒ දේවල් දැනුත් සිදු වෙනවද උඩුගම නාගොඩ කියන්නෙ ටිකක් දුරයි. අපට තියෙනවද අපේ පහසුකම් සපයගන්න තියෙන තැනක්. මෙම සමාජය සංකීර්ණ වීමත් සමග එවැනි අවශ්‍යතාවයක් පැන නැගුනහොත් එවැනි තැනක් තියෙනවද? වෙනත් ආයතනයක් සම්බන්ධ කර නොගෙන අපේම දෙයක් කරනවනම් වඩා හොදයි. ඔතන ඉඩම් අත්පත් කර ගැනීමේදී විශාල ගැටළුවලට මුහුණ දුන්නා. අපේ දේවල් සභාව හරහා යම් දෙයකට යොදවනවනම් හොදයි කියන තැන මම ඉන්නවා.

මේ සම්බන්ධව ගරු සභාපතිතුමා අදහස් දක්වමින්, දැනට උප කාර්යාලය කියලා තියෙන්නෙ පුසතකාලයයි, පෙර පාසලයි. මෙතුවක් කල් පුස්තකාලය කාර්යාලය හැටියට යොදා ගෙන තියෙනවා. ඒ හැර වෙන කර්තව්‍යයක් එතැන සිදු වෙලා නැහැ. එහෙම මුදල් එකතු කරන්න සිදු වුනොත් අපට ඒ ස්ථානයේදී වෙනම කරගන්න පුළුවන්.

මේ සම්බන්ධව ගරු උපසභාපතිතුමා අදහස් දක්වමින්, මෙතුවක් කාලයකට ධනංජය මන්ත්‍රීතුමා ඔය කියන අවශ්‍යතාවයක් සිදු වුනේ නැහැ. මාසෙකට දවසක් මුදල් එකතු කරන මහත්මිය තාක්ෂණ නිලධාරී මහතා ගිහින් ඉන්න පොඩි කාමරයක් තිබුණා. නමුත් ඒක ලොකුවට ප්‍රායෝගිකව අවශ්‍ය වුනේ නැහැ. මෙතන තියෙන්න ඕන පුස්තකාලයට අවශ්‍ය පරිසරයයි. ඇතැම් විට එහෙම ලොකු අවශ්‍යතාවයක් ඇති වුනොත් රංගන ශාලාව ප්‍රයෝජනයට ගන්න පුළුවන්. එතැන කාර්යාලයක ස්වරූපය නැතත්, අවශ්‍යතාවය සපුරා ගන්න පුළුවන්.

මෙම ඉඩමේ අයිතිය පිළිබද කරුණු දක්වමින් ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ ඔය ඉඩම තවම සභාව සතු නැති බවත්, ප්‍රාදේශීය ලේකම් හා කොමසාරිස්තුමා මගින් ඉඩම පවරගන්න අවශ්‍ය කටයුතු

කරන්න කියලා දන්වලා තියෙනවා. අපේ භූමි ප්‍රමාණය, අප භුක්ති විදින ප්‍රමාණය පවරදෙන්න කියලා අපිට ඉල්ලීම් කරන ලෙස දන්වලා තියෙනවා. සතියක් ඇතුලත පැවරීමේ කටයුතු සිදු කරන බව අපට දන්වලා තියෙනවා. මම මෑත කාලයේ දැනුවත් වීම තුළ නීත්‍යානුකූල අයිතිය අපිට ලැබිලා නැහැ. අපි පාවිච්චි කරාට, උදාහරණයක් ලෙස පාර්ලිමේන්තුව ඊයෙ, පෙරේදා තමයි ඔප්පුවකින් පවරලා තිබුනෙ. ඒක නිසා අපේ මේ පොඩි ආයතන මොනවද දැනට ලියුම් ගණුදෙනු වුන ආකාරයට කොමසාරිස්තුමා හරහා එවලා තියෙනවා, අපි දැනට භුක්ති විදින ප්‍රමාණය මැනලා තියෙනවා. තාමත් මේක තියෙන්න ප්‍රාදේශීය ලේකම් යටතේ. හැබැයි ප්ලෑන් එක අපි ලග තියෙනවා. , සත්‍ය කතාව නම් අපි භුක්ති විදින ඒවා පවර ගන්න යන්නෙ. ඇප්තොප්වත්තටත් අක්කර 34 යි පර්චස් 39 යි. එදා හිටපු ප්‍රාදේශීය ලේකම් පවරලා දෙන්න ප්‍රකාශ කරලා තියෙනවා. ඒතුල තමයි අපි වැඩ කරලා තියෙන්නෙ. ඒ නිසා අපට අක්කර 5 ක් පිළිසරු එකට ලබා දුන්නා. නමුත් අපට නීත්‍යානුකූල අයිතියක් නැහැ. කට වචනෙට තමයි වැඩ කරලා තියෙන්නෙ. දැන් නීත්‍යානුකූල අයිතිය ලබා ගන්න යන්නෙ. අජිත් මන්ත්‍රීතුමා, දැන් ධනංජය මන්ත්‍රීතුමත් කියනවා මේක සභාවෙ කටයුතුවලට තියා ගත්තොත් හොදයි කියලා. සහබන්දු මන්ත්‍රීතුමත් මේකට විරෝධතාවයක් දැක්වුවෙ නැහැ.

එහිදී ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්, පුදුම කතාවක් මේ විදියට බලනකොට මේ ගොඩනැගිලිවලත් අයිතිවාසිකම් නැතිවෙන විදියක් තියෙන්නෙ. පසුගිය දවස්වල ඕක නිරවුල් කළා. අර මන්ත්‍රීතුමා කියූ විදියට මිනිස්සු ගෙවල් හදා ගෙන භුක්ති වින්දා. ඒත් ප්ලෑන් එක ගෙන්නගෙන මිනින්දොරුවෙක් ලවා හේමචන්ද්‍ර විලේගේ මැතිතුමා ඕක නිරවුල් කර ගත්ත. ඒ නිසා ප්‍රාදේශීය ලේකම් අනිත් නිලධාරීන් කියන විදියට වැඩ කරන්න එපා. ඕක අපිට නැතිවෙන්න හේතුවක් නැහැ. උප කාර්යාලයක් විදියට 1960 ගණන් වල ඉදලා ගම් සභාවක් ලෙස ගරු මන්ත්‍රීතුමන්ලා ඉදපු ඉඩමක් හා ගොඩනැගිල්ලක්. මෙහෙමයි ඕක විසදන්න ගියොත් ප්‍රශ්නයක් වෙනවා. ඔබතුමාල දන්නවා. ඇප්තොප්වත්තේ අක්කර 25 ක් සදර්න් ලංකා කියලා උපාධිධාරී සංගමයකට ගිවිසුම්ගත වෙලා දීලා පොදු අරමුදලට සල්ලිත් ආවා කාලයක්. ඒක නිසා අපිට අයිතිවාසිකම් තියෙනවා.

ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා තම අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ ගරු සභාපතිතුමනි, මීට පෙර අවස්ථාවන්වල මම මෙතන කතා කළා. නිරන්තරයෙන්ම ප්‍රාදේශීය ලේකම්තුමිය උත්සාහයක යෙදෙනවා, අපේ ඉඩම් අත්පත් කර ගැනීමේ මහා මෙහෙයුමක් දියත් කරනවා. අර පොල් ඉඩම සම්බන්ධයෙන් පසුගිය දවස්වල ඇති වුනු ප්‍රශ්ණයත්, ඒකමයි හේතුව වුනෙ.

ගරු මන්ත්‍රී සී. වී. සහබන්දු මහතා තම අදහස් ප්‍රකාශ කරමින්, ඔය ඉඩමේ වට මැන්නා. මායිමක් එවකට තිබුණා. ප්ලෑන් එකක් තිබුණා. මම දන්නෑ දැන් තියෙනවද කියලා. ප්ලෑන් එකයි ඔප්පුවයි දෙකම ඇතිනෙ ඔප්පුව නැත්නම් අපි භුක්ති විදපු අවුරුදු ගණන කීයද නාගොඩ ගම් සභාවක් ලෙස පැවති අවුරුදු 100 ක පමණ කාලයක සිට උප කාර්යාලයත් ලෙස තියෙන්න ඇතිනෙ, ඒකනෙ අපට ප්ලෑන් එකක් තියෙන්නෙ. මම දන්න විදියට සෙනවිරත්න මහත්තයා මේ සභාවේ ඉඩම නීත්‍යානුකූල ඔප්පුවකින් පරිත්‍යාග කරලා තියෙන්නෙ. ඒ වගේ උඩුගම ඉඩමටත් ප්ලෑන් එකක් ඇති. පසුගිය වකවානුව තුල ප්ලෑන් එකක් ඇදලා මන්නවලා භුක්ති වින්දා. ඔප්පුවක් නැත්නම් ඒක ප්‍රසිද්ධියේ කියන්නත් එපා.

ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා හා ගරු මන්ත්‍රී සී. වී. සහබන්දු මහතා උනන්විටිය පොළ සම්බන්ධ නඩුව උදාහරන ලෙස දක්වමින් කරුණු දක්වන ලදී. ඒ සම්බන්ධව වැඩි දුරටත් ගරු මන්ත්‍රී සී. වී. සහබන්දු මහතා අදහස් ප්‍රකාශ කර සිටියේ අපි මුල ඉදලම වරද්දාගෙන ඇති බවත් අපට අයිති දේවල් අපි භුක්ති නොවිදින නිසා වෙන උදව්ය තමයි පාලනය කරන්නේ, සමස්ථයක් ලෙස මෙය නාගොඩ ප්‍රාදේශීය සභාවට විතරක් පැන නැගුනු ගැටලුවක් නොවෙයි.

ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා කරුණු දක්වමින්, මේ ඉඩම මහ ප්ලෑන් එකේ තියෙනවා. ඔප්පුවක් නැහැ. 1976 තමයි නීල්ද අල්විස් මහත්තයා ගොඩනැගිල්ලට මුල්ගල තිබ්බෙ. 1977 විවෘත කළා. අදට අවුරුදු කීයක්ද උප කාර්යාලය හැටියට පාවිච්චි කලා, ගම් සභාව හැටියට තිබුණා. 1991 ප්‍රාදේශීය සභාවට පාවිච්චි වුණා. මේවා කළේ කොහොමද අයිතිය නැත්නම්. අයිතිය ඉල්ලන ප්‍රශ්නෙ තමයි මම ඊයෙ සම්බන්ධීකරණ කමිටුවෙ දිගින් දිගටම කතා කළේ. මේවා සුළු පටු කාරණා නෙවෙයි. අපිට මේ අය කියන

කියන විදියට වැඩ කරන්න බැහැ. සභාව මුලුමණින්ම නිලධාරීන් විසින් යටකරගන්න හදන්නෙ. ඒ අයගෙ නියෝජිතයො විදියට මහජනතාවගෙන් පත් වෙච්ච මහජන නියෝජිතයො හැටියට අපිට කටයුතු කරන්න බැහැ. මන්ත්‍රීවරුන්ගෙ අදහස් විමසලා ගන්න තීරනය වෙනම කාරනයක්. එතනදී අපට පොදු තීන්දුවකට යන්න වෙනවා. මහජන නියෝජිතයො ටික කියනවනම් දෙන්න එපා කියලා ඒක වෙනම කතාවක්. මම කියන්නේ ඊට පරිභාහිර කණ්ඩායමක් කියන කතාවකට මේක යට කරන්න එපා කියන එක. කමිටුවක් දැම්මා ඒක බැලුවා. දීම හා නොදීම සභාවෙ තීරණයක්. ඒ වගේ ආයතනයක් අපේ අයිතිය තියෙන තැනකට ගෙනැල්ලා අපිට ඕන වෙලාවට යවා ගන්න පුළුවන් විදියට ගිවිසුම් හදලා දුන්නනම් හරි. ඒ අය ඒක අලුත්වැඩියා කරන්නත් අපිට උදව් කරන්නත් එකග වුණා. ලිත් මාසයක් කෙසේ වෙතත් ලිත් මාස 3 කටවත් කලින් කියලා ගිවිසුම සංශෝධනය කරලා දෙනවනම් හොදයි. රජයෙ ආයතනයකට එහෙම කියන කොටම යන්න බැහැ. ඒ ගොල්ලා කැමතිනම් මාසයකට හරි කමක් නැහැ. ගිවිසුම සකස් කරන්න.

ඒ සම්බන්ධව ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා තම අදහස් ප්‍රකාශ කරමින්, ගරු සභාපතිතුමනි, ගිය සභාවෙත් මේක කතා කරලා කමිටුවකුත් පත් කරලා ඒ අයත් ගෙන්නලා මේකට කාලයකුත් වෙන් කරලා තීරණයක් ගත්තා. අපේ ධනංජය මන්ත්‍රීතුමා එදා නොහිටපු නිසා අවබෝධයකින් තොරව කතා කළත් විරුද්ධ වුනේ නැහැ. එතුම කියන කතාවේ ඇත්තක් තියෙනවා. මොනවහරි අවශ්‍යතාවයක් වුනොත් අපිට ලොකු සම්පතක් තියෙනවා අපේ රංගන ශාලාව. එතන එහෙම වුනොත් ඒකෙ පොඩි වෙන්කිරීමක් කර ගෙන ප්‍රයෝජනයට ගන්න පුළුවන් සභාවෙ ආදායම නැති වුන වෙලාවෙ මේක නිකම්ම තියෙන එක් තේරුමක් නැහැ. ප්‍රයෝජනයක් නැතුව තමයි මේ ඉදිකිරීම තියෙන්නෙ. උඩුගම ප්‍රදේශයේ අපි හිතනවා සියළු දෙනාගෙ එකගතාවය මත කමිටුවෙත් තීරණය අනුව ඒක ඒ කාරණයට යොමු කිරීම සුදුසුයි කියලා.

ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා තම අදහස් දක්වමින් , ගරු සභාපතිතුමනි, මගේ කොට්ඨාසයට තමයි අයිතිව තියෙන්නෙ උඩුගම උප කාර්යාලයකොට්ඨාසය නියෝජනය කරන මන්ත්‍රීවරයා වශයෙන් මම මගේ කැමැත්ත මේ සභාවේදී ප්‍රකාශ කරනවා. සභාවට සම්පතක් වගේම අපට ආදායමකුත එන නිසා වනිගරත්න මන්ත්‍රීතුමා කරපු යෝජනාව මම ස්ථිර කරනවා.

**02. උඩුගම ඇප්තොප්වත්ත පොල් ඉඩම වෙන්දේසියෙන් ලබා ගැනීම**

ගරු සභාපතිතුමා ඒ සම්බන්ධව පැහැදිලි කරමින්, ඇප්තොප්වත්තෙ පොල් ඉඩම වෙන්දේසියේ ලබා ගත්තා. මන්ත්‍රීවරු පෞද්ගලිකව දැනුවත් කරලා. අපි ලියුමකිනුත් ප්‍රාදේශීය ලේකම් දැනුවත් කලා. මේකෙ අක්කර 35 ම අයිතිය අපට දෙන්න ඉන් අක්කර 05 අයිතිය ඉක්මණින්ම ලබා දෙන්න කියලා. ඒ ගැන ප්‍රාදේශීය ලේකම් තුමිය කිව්වා අපිට එහෙමනම් මේ ගැන කොමසාරිස්තුමාගෙන් අහන්න කියලා. හිටපු කොමසාරිස්තුමා වන චන්ද්‍රලාල් මහත්තයගෙන් මේ ගැන විමසූ විට එතුමා උපදෙස් දුන්නෙ ඔයාලා බද්දට ගෙන අයිතිය තහවුරු කර ගන්නා ලෙසයි. ඒ අනුව තමයි අපි වෙන්දේසියට ඉදිරිපත් වුනේ. දැන්වීම ඉදිරිපත් කරලා තිබුනෙ ජුනි මාසෙ 19 වෙනිදා. පසුගිය මහ සභා රැස්වීමෙන් පසුවයි. පසුගිය සභා වාරවල් වලදී මෙම ඉඩම සම්බන්ධව නිරන්තර සාකච්ඡාවවට භාජනය වුණා. මෙය අප විසින් ලබා ගත යුතු බවත්, නිරන්තරයෙන් කියවුණා. අපි පෞද්ගලිකව මන්ත්‍රීවරුන්ට කතා කරලා කිව්වා. මෙහෙම වෙන්දේසියක් තියෙනවා මොකද කරන්නේ කියලා. එතුමාලත් කැමැත්ත ප්‍රකාශ කරපු නිසා වෙන්දේසියට ඉදිරිපත් වුණා. අවම ලංසුව රු. 48000.00 ක් ලෙස සදහන් වූ අතර වෙන්දේසිය සදහා තිදෙනෙක් ඉදිරිපත් විය. සභාවේ සභාපති හැටියට මම ඉදිරිපත් වුණා. කලින් වෙන්දේසිය ගත් සමිතියයි, පෞද්ගලික අයෙකුයි ඉදිරිපත් වෙලා වෙන්දේසිය ඉල්ලුවා. ඒ අය සභාවෙ අපි ගන්න නිසා ඉල්ලන එක නතර කළා. අපි රු. 60600.00 කට පොල් ඉඩම වෙන්ද්සියෙන් ලබා ගත්තා. අපිට මේකෙන් ලාභයක් ලැබෙනවා වගේම කොම්පෝස්ට් ව්‍යාපෘතියට ආරක්ෂාවක් ලැබෙනවා. පෞද්ගලික කෙනෙක් ගත්තනම් අපට අතුරු ආබාධ ඇති වෙන්න පුළුවන්. ඒ ගැන හිතලා තමයි වෙන්දේසියට ඉදිරිපත් වුනේ. ඒ අවස්ථාවේදි සභාවෙ සල්ලි නොතිබුණ නිසාත්, එවෙලෙම මුදල් ගෙවිය යුතු නිසාත්, මගේ පෞද්ගලික මුදල් වලින් තමයි එම ගෙවීම සිදු කළේ.

ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා අදහස් දක්වමින් විමසා සිටියේ අපිට වෙන්දේසි ඉඩමකට වෙන්දේසියෙ ගිහිල්ලා සභාව සතු කර ගැනීමේ හැකියාව තිබේද මීට පෙර ඒ කාරණයට ගිහිල්ලා නැහැ. මේ කාරනයට අදාලව පනතේ ප්‍රතිපාදන තියෙනවද

ගරු මන්ත්‍රී අජිත් එඩ්රිආරච්චි මහතා කරුණු දක්වමින්, පනතේ එහෙම නැහැ. අපි වෙන්දේසියේ අවම ලංසුව 48 කට තිබ්බා. ඒ තියන වෙලාවෙ එවෙලෙ ලංසු කිය කියනෙ වැඩි කරන්නෙ. එතකොට අපිත් රාජ්‍ය ආයතනයක්, අපිට තිබුණා පැහැදිලිවම අවම ලංසුවට මේක දෙන්න කියලා ප්‍රාදේශිය ලේකම්ට කියන්න. හැබැයි ඒ අයටත් ඒ යුතුකම ඉටු කරන්න ඕන තරම් ඉඩ තිබුණා. එතකොට විගණන පරීක්ෂණවත්, වෙන ප්‍රශ්නයක්වත් ඇති වෙන්නෙ නැහැ. අපිටත් සාමාන්‍ය අය වගේ තරගයක් දීලා 60600.00 ට ගන්න සිදු වුණා. දැන් ඉතින් කමක් නැහැ. අපිට මේ ගැන අවබෝයක් තිබුනෙත් නෑනේ. ඊළග අවස්ථාවකදී අපි ඒ ගනුදෙනුව කරන්න ඕන රාජ්‍ය ආයතනයක් විදියට. දැන් මෙහෙම වෙච්ච එකත් හොදයි. ඉස්සර පොල් කඩන්න ආපු අය අපේ දේවල් අතපත ගාගෙන ගියා. ඒක හරි නතර වේච්චිනෙ සභාව ගත්තහම.

ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්, රාජ්‍ය ආයතනයක් වුනාට එහෙම කරන්න බැරි බව දැන්වුවා. මේක ගන්න ඕන වෙන්දේසියට ගිහිල්ලම බව ඔවුන් ප්‍රකාශ කළා. පිට කෙනෙක් අරගෙන අපේ පරිශ්‍රයට ඇතුල්වීම ප්‍රශ්නයක්. හේතුව කලින් වෙන්දේසියෙ ගත්තු කෙනා අපේ කොම්පෝස්ට් එකේ තියෙන පොල් ගස් දෙකේත් පොල් කඩන් යනවලු. ඒකෙ තියෙන කෙසෙල් කැනුත් කපනවලු.

ගරු මන්ත්‍රී අජිත් එඩ්රිආරච්චි මහතා කරුණු දක්වමින්, එයා ඒක කියනවා. අපිට අයිතියක් තියෙනවා. දිස්ත්‍රික් ලේකම් හමුවෙලා සම්බන්ධීකරණ කමිටුවට දාලා තීරණයක් ගන්න පුළුවන්. ප්‍රාදේශීය ලේකම් කියන්නේ වෙන්දේසියෙන් ගන්න ඕන බව තමයි. එයා මේ සම්බන්ධව දන්නෙ නැහැ. ඒ නිසා ඒ අය කියන කිසි දේකට හා කියන්න නරකයි. ප්‍රශ්නයක් නෑ කොහොම හරි ගත්තනෙ.

ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා තම අදහස් ප්‍රකාශ කරමින්, ගරු සභාපතිතුමා කලින් ගනිපු කෙනා කියන විදියට කොම්පෝස්ට් එකත් එයාට අයිතියිලු. එයා කියන්නෙ කොම්පෝස්ට් පොහොර ටිකත් හරි විදියට නම් එයාට අයිති කියලයි. එහෙම තියෙන වකවානුවක ඕක ලබා ගැනීම ඉතාම හොද දෙයක්.

ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය අදහස් ප්‍රකාශ කරමින්, ගරු සභාපතිතුමා මම දන්න නිසා කතා කරන්නෙ. ප්‍රාදේශීය ලේකම් පෙන්නපු පොල් ගස්වල විතරයි පොල් කඩන් ගිහින් තියෙන්නෙ. අක්කර පහ එකට තියෙන නිසා පොල් ගස් ටික එතනට තියෙනවයි කියලා තමයි කියන්නෙ.

ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා තම අදහස් ප්‍රකාශ කරමින්, සභාපතිතුමා ඕකෙ පොල් ගස ගාණක් වෙන්දේසි කලේ මං හිතන්නෙ 96 ක්. ඒ පොල් ගස් 96 ට තමයි 48000 ක් තක්සේරු කරලා තිබ්බෙ. ඒකට රු. 100.00 ක් වැඩියෙන් තමයි. ඔය ග්‍රාම සංවර්ධන සමිතිය ගත්තෙ. ඔක්කොම ගස් 96 ට තමයි ලංසුව හැදුවෙ ගහකට රු. 500.00 ගානෙ. බදුකරුට ඕන විදියට නෙමෙයි ග්‍රාම සංවර්ධන සමිතිය තමයි පාලනය කළේ. ඒකත් ප්‍රාදේශීය සභාව වගේම සමිතියක්. කවුරුවත් පුද්ගලිකව කරපු වැඩක් නෙවෙයි.

ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා තම අදහස් ප්‍රකාශ කරමින්, හරි ඕක 66000 ට හෝ 50000 ට ගත්තයි කියමු. පාඩුවුනයි කියමු. ඊට කලින් අපි මේක පාලණය කළා. කවුරුත් දන්නවනෙ. ඒ අවුරුදුවල ආදායම තිබුනද, සභාවට ආදායම දාලා තියෙනවද එයට පිළිතුරු වශයෙන් ගරු සභාපතිතුමා හා ගරු උප සභාපතිතුමා දෙතුන් වතාවක් ආදායම ලැබුන බව දැන්වීය. නිශාන්ත මන්ත්‍රීතුමා වැඩිදුරටත් විමසා සිටියේ දෙතුන් වතාවි වෙන්න බෑ. දිගටම තියෙන්න ඕන. ඒක මාර කතාවක්. මේක දිගටම සභාවෙ තිබුණා. එතකොට මේ 60600.00 ට ගත්තෙ ලාභ උපයන්න නම් ඔය 60600.00 හැම අවුරුද්දකම තියෙන්න ඕන. එහෙම දාලා තියෙනවද එහෙම නැත්නම් මේ සභාවෙ කට්ටිය මේක හොරකම් කරලා. නැවතත් ඒ සභාවටමනේ මේක ගත්තෙ

ගරු උපසභාපතිතුමා තම අදහස් දක්වමින්, ගරු සභාපතිතුමනි ඕක ඔය තරම් ගැටලුවක් කරගන්න එපා. ඔබතුමා ඕක ගත්තට ඔබතුමා නෙමෙයිනෙ පොල් කඩන්න යන්නෙ. මේ නිලධාරියෙකුට ඕක භාර දෙන්න වෙනවා. අධීක්ෂණය කරන්න වෙනවා. ආරක්ෂා කරගන්න වෙනවා. 60600.00 ට ගත්ත නම් ඒ මුදල වාර්ෂිකව ලැබෙනවද කියලා බලන්න මොකක්හරි වැඩපිළිවෙලක් යොදන්න. ඔබතුමා ඒ ක්‍රියාදාමය කර ගෙන යන්න. පරන ගැටලු ගැන සාකච්ඡා කර කර ඉන්න එපා.

ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා නැවතත් කතා කරමින්, ගරු උප සභාපතිතුමා ඔයාට  කියන එක තේරුම් ගන්නෙ නැහැ. මම අහනන්නෙ ඔය වත්කම මේ සභාවෙ මීට කලින් තිබුණා එතකොට ඒ සභාවෙ ආදායම කොහේද ගියේ කියන එකයි. වත්කමට මොකද වෙලා තිබුනෙ පහුගිය කාලෙ මම අහන්නෙ ප්‍රශ්නයක්. මේ සම්බන්ධව ගරු මන්ත්‍රී සී. වී. සහබන්දු මහතා අදහස් දක්වමින් දැනට තියෙන්නෙ සභාපතිතුමා මෙතුම අහන ප්‍රශ්නයට, මේකෙ ආදායම් භාරදීපුවා පොත්පත්වල ඇතිනෙ. ලේකම්තුමියගෙන් තොරතුරු අරගෙන පිළිතුරක් දෙන්න.

ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්, ඔය පිළිබදව කතා කරනවනම් මේ අවස්ථාවේදී අවශ්‍යතාවයක් නෑ.  ගරු සභාපතිතුමා සත්භාවයෙන් උපක්‍රමශීලීව සභාවෙ ආදායම පවත්වා ගෙන යන ක්‍රමවේදයකට ඇවිල්ල තියෙන්නෙ. ඉදිරියට ක්‍රමවේදයක් හදා ගමු. සිදුවුන අඩුපාඩු  නිවැරදි කර ගමු.

නැවතත් ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා විමසා සිටියේ අපිට මේ සභාවෙ ප්‍රශ්න අහන්නත් අයිතියක් නැද්ද යනුවෙනි. එයට පිළිතුරු ලෙස ගරු උප සභාපතිතුමා ප්‍රශ්න අහන්නකෝ ඔබතුමා වෙනත් කරුණු යටතේ. දන් මේ මාතෘකාවේ කතා කරලා සභාව දැනුවත් කරලා සභාව කර ගෙන යන්න ඉඩ දෙන්න. ප්‍රශ්න අහන්න වෙනත් කරුණු යටතේ.

ගරු මන්ත්‍රී සමන් මහතාද අදහස් දක්වමින් කියා සිටියේ ගරු සභාපතිතුමනි, අපි දැන් කරන්න ඕන හරි දේ. වැරදි හොය හොය ඉන්න එක නෙවෙයි. නිශාන්ත මන්ත්‍රීතුමා පිළිතුරු දෙමින් ගරු මන්ත්‍රීතුමා වැරදි හොයන එකක් නෙමෙයි. තේරුම් ගන්න කලින් තිබිලා ආදායමක් නැතුව නැවත අරන් ආදායම ගන්නෙ කොහොමද කියලා ප්‍රශ්නයක් ඇහුවෙ.

ගරු සභාපතිතුමා කරුණු දක්වමින්, හරි මන්ත්‍රීතුමාලා නිශ්ශබ්ද වෙන්න. මට තේරුණා. ඕක අතීතයේ ඉදලා කතා කරන්න ගියොත් හිටපු සභාපතිවරු දෙපලක්ම මේ සභාවෙ ඉන්නවා. එතුමන්ලත් දන්නවා අභ්‍යන්තරයේ සිදු වුනේ මොකද්ද කියලා. අලුත් මන්ත්‍රීවරු නම් මේවා නොදන්නවා ඇති.  නමුත් දැන් මේ අවස්ථාවෙ අපි සත්භාවයෙන් යුතුව පොල් ඉඩම අරගත්තෙ අපේ වත්කමක් හැටියට සභාවට කීයක් හරි ආදායමක් ගන්න. මොකද නැත්නම් ඒක මට සභාපති වෙලා හිටියට හිතට මදිකමක් කියලා හිතෙන හින්දා. හරි ඒ පිළිබදව පසුව කතා කරමු.

ගරු මන්ත්‍රී සී. වී. සහබන්දු මහතා අදහස් ප්‍රකාශ කරමින් , හරි ඔබතුමා ගත්තයි කියමු. දැන් පැහැදිලිව පේනවා ඉතිහාසය ගද ගහන ඉතිහාසයක් බව. එහෙමනම් අද ඉදලා පොල් ඉඩම පිළිබදව වෙනම වාර්තාවක් මාස තුනකට වරක්වත් මේ සභාවට ඉදිරිපත් කරන්න.  මුරකරුගෙ පඩිය, කම්කරුවන්ගේ පඩි, ඉතිරිය, ලාභය හෝ පාඩුව  කොපමනද කියලා මේ සභාවට ඉදිරිපත් කල යුතුයි. ළගට මම යෝජනා කරනවා. තමුන්නාන්සේලා ඒ ගමන යන ගමන් පහුගිය වකවානුව තුල මේ ඉඩම සභාව සතුව තියෙද්දි රු. 5.00 ක් හරි පොල්ගෙඩියකින් සභාවට ආදායමක් ලැබිලා තියෙනවනම් ලබන සභා වාරයේදී ඉදිරිපත් කරන එක ලේකම්තුමියගෙ වගකීමක්. තමුන්නාන්සෙට ඒකෙන් ලකුණු දාගන්න පුළුවන්.

ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්, ඔබතුමත් සභාපති වෙලා හිටිය අවුරුදු 04 ත් ආදායම පෙන්නන්න වෙලාව ගරු මන්ත්‍රී සී. වී. සහබන්දු මහතා කියා සිටියේ ඔව් පැහැදිලිවම මං බදු දීලා තිබුනෙ දෙලක්ෂ, තුන්ලක්ෂ ගානක් මෙතෙන්ට ගෙන්නගෙන ඇති. අපි ඒවා ගෙදර ගෙනිච්චෙ නැහැ. ලෙජර් බලන්න.

### 8.1 ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩ විතාන මහතා ඉදිරිපත් කරන පරිපාලන යෝජනා

I. මාපලගම මහජන පුස්තකාල පරිශ්‍රය තුල පාර්ටිෂන් යොදා අංශ වෙන් කර දීමට යෝජනා කරමි.
II. මාපලගම නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලා පරිශ්‍රය පාර්ටිෂන් යොදා අංශ වෙන් කර තිර රෙදි දැමීමට යෝජනා කරමි.
III. 2018 වර්ෂය වෙනුවෙන් නාගොඩ ප්‍රාදේශීය සභාවට අයත් නාගොඩ, මාපලගම හා උඩුගම මහජන පුස්තකාල තුන සදහා එක් පුස්තකාලයකට රු. 100000.00 බැගින් ලක්ෂ 3 ක මුදලක් අයවැයෙන්

වෙන් කර ඇති අතර ඉදිරියේදී සාහිත්‍ය මාසය වෙනුවෙන් සැප්තැම්බර් මස බණ්ඩාරනායක පොත් ප්‍රදර්ශනය මගින් එම ලක්ෂ 3 ක පොත් සහා අරමුදලින් මිළදී ගැනීමට යෝජනා කරමි.

IV. කාර්යසාධන තරගාවලිය සඳහා ලකුණු ලබා ගැනීමේ නිර්නායකයක් ලෙස දක්වා ඇති පුස්තකාල පොත් පහසුවෙන් හදුනාගැනීමට අවශ්‍ය සුචි කබඩ් 03 ක් පුස්තකාල 3 සඳහා ලබා ගැනීමට යෝජනා කරමි.

V. මාපලගම මහජන පුස්තකාලය සඳහා අවශ්‍ය බිත්ති පුවත්පතක් ලබා ගැනීමට යෝජනා කරමි.

VI. මාපලගම හා උඩුගම මහජන පුස්තකාල සඳහා අවශ්‍ය ජල පහසුකම් ලබා දීමට යෝජනා කරමි.

VII. සභාවෙහි පවතින පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමට යෝජනා කිරීම

- ❖ රියදුරු 03
- ❖ විදුලි කාර්මික 01
- ❖ මුරකරු 02
- ❖ පුස්තකාල සහායක 01
- ❖ සෞඛ්‍ය කම්කරු 02
- ❖ වැඩ/ක්ෂේත්‍ර කම්කරු 03
- ❖ ඖෂධ සංයෝජක 01

සභාවෙ පවතින පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට අනුමැතිය ඉල්ලලා තියෙනවා. මෙම තනතුරු ගැසට් කර බඳවා ගැනීම සඳහා ඒකමතිකව සභා සම්මත විය.

ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා අදහස් දක්වමින්, ගරු සභාපතිතුමා සභාවට අවශ්‍ය දේවල් ඉක්මණට ගන්න. ලෙවල් මැෂින් එකට හා ඩුප්ලෝ මැෂින් එකට මිළ ගණන් කැඳවන්න. කරන්න ඕන වැඩ ටික පහුනොකර කරන්න.

VIII. නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ මුද්‍රණ කටයුතු සඳහා ඩුප්ලෝ යන්ත්‍රයක් මිළදී ගැනීමට යෝජනා කරමි

ඩුප්ලෝ යන්ත්‍රයක් මිළදී ගැනීම සඳහා සභාවේ එකගත්වය පළවිය. සභාපතිතුමාගේ මෙම යෝජනාව ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා විසින් ස්ථිර කරන ලදී

IX. නාගොඩ ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ හදිසි ගිනි ගැනීමක් ඇති වුව හොත් එය මැඩපැවැත්වීම සඳහා කාබන්ඩයොක්සයිඩ් පෙණ ගිනි නිවීමේ උපකරණයක් හා කාබන්ඩයොක්සයිඩ් ඩ්‍රයි පවුඩර් ගිනි නිවීමේ උපකරණයක් ලබා ගැනීමට යෝජනා කරමි.

X. විශේෂ යෝජනාවක් තියෙනවා. අපේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ නිවාස ඉදිකිරීම සඳහා අනුමත වෙලා තියෙන්නෙ පර්චස් 10 ක ප්‍රමානය තමයි. අපේ 10 යි නියාගම 6 යි ඒ නිසා නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේත් පර්චස් 6 ක් කරන්න තමයි යෝජනා කරන්නෙ ඒකට අපි ව්‍යවස්ථාවක් හදන්න වෙනවා. හදලා ඉදිරිපත් කරනවා. අද මේ සභාවෙ අනුමැතිය දෙන්න.

ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා මේ සම්බන්ධව අදහස් දක්වමින්, අජිත් කලබලයට අනුමත කලාට විවිධ ගැටලු එනවා. ඕවයින් තමයි ජලය බහින්නෙ නැති ප්‍රශ්න, මළපහ ප්‍රශ්න, කෙල ගහන ප්‍රශ්න අරවා මේවා එනවා. නමුත් මේ වෙලාවත් එක්ක දැන් මිනිස්සුන්ට නගරවල, මේ නාගොඩ වුනත් ගන්න මිනිස්සුන්ට සල්ලි නැහැ. අනුමත නැති ගානක් අරගත්තම ණයක් ගන්නවත් බැහැ. අපි ඒ ගැනත් සැළකිල්ලට ගන්න ඕන.

XI. ඒ වගේම දැන් සභාවෙ ආදායම් තත්වය දුර්වල මට්ටමක පවතින නිසා වරිපනම් ගාස්තු අය කිරීමට නගරයක් යෝජනා වෙලා තියෙනවා. උඩුගම බල ප්‍රදේශය ආදර්ශයක් හැටියට උඩුගම මේක ක්‍රියාත්මක කරනවා. නාගොඩත් ක්‍රියාත්මක කරන්න ඕන. උඩුගමට හැම පහසුකමක්ම තියෙන නිසා දැනට අපි උඩුගම ක්‍රියාත්මක කරනවා. ඒ කටයුත්තෙදි සියළු දෙනා එක්කම සාකච්ඡා කරලා ඒ ප්‍රදේශයේ මන්ත්‍රීතුමන්ලා ,

වෙළඳ ප්‍රජාව,ල සමග සාකච්ඡා කරලා ඉදිරියෙදි කරන්න කටයුතු යොදනවා. මේකෙ එයාලට තියෙන ප්‍රතිලාභ හා අනිත් පැත්ත යන දෙකම පෙන්නලා දෙන්න ඕන. ඒක 90% ක් හොඳ වෙන කොට 10% ක් නරකයි. අපි සාකච්ඡා කරලා කරමු. ඒකයි දැන් මම යෝජනා කලේ. ඊට කලින් වෙනම ප්‍රදේශයක් නම් කර ගන්න ඕන. වරිපනම් කිව්වම මිනිස්සු අකමැති වේවි. බදු බදු කියලා කියාවි. නමුත් ඒකෙ වටිනාකම වැඩියි. පැහැදිලි කරලා දෙන්න ඕන.

**එම යෝජනාව සම්බන්ධව අදහස් දැක්වීම,**

ගරු මන්ත්‍රී අජිත් මහතා කතා කරමින්, ඇයි දෙයියනෙ නාගොඩ, යටලමත්ත නැද්ද. පුරනැගුම උඩුගමට. වරිපනම් නගරෙත් උඩුගම අපි තමයි ඔක්කොම කරන්නෙ. ගරු සභාපතිතුමනි කලින් ඉදලම මේ යෝජනාව තිබුණා. දැන් හරි කමක් නැහැ කරනවනම්. ඉස්සෙල්ලම උඩුගම වරිපනම් අය කරන කොටම වහාම පොදු වැසිකිලියක් හදන්න ඕන. ඒක මේකට අදාළ නැහැ. නමුත් වරිපනම් අය කරනවනම් වැසිකිලියක් නැත්නම් කැසිකිලියක්වත් අඩුගානේ සකස් කරන්න ඉක්මනටම. මේකෙ හොඳ වගේම නරකකුත් තියෙනවා. මොකද අපි අලුත් දෙයක් දෙන්නේ. අලුත් දෙයක් දෙනවා නෙමෙයි අපි අලුතෙන් දෙයක් ගන්නවා. මේ හැම පවුලකින්ම අපිට ගෙවන්න ඕන. එතකොට ඉතින් හොඳ ප්‍රතිචාරයක් නෙමෙයි ලැබෙන්නෙ. ගාලු නගර සභාවේ දැන් ඒක අවුරුදු ගානක් තිස්සෙ ඇවිල්ලා ඇවිල්ලා ඒක හුරුයි. ගැටලුවක් නැහැ. කවුරුත් දන්නවා අනිවාර්යයෙන් ගෙවන්න ඕන කියලා. මේ ක අලුත් පළවෙනි අවුරුදුවලදී දැඩි පීඩනයකට ලක් වෙන්න වෙනවා. නමුත් අපි ඒක සභාවෙ කතා කරලා අඩු ප්‍රතිශතයකින් පටන් අරගෙන පස්සෙ පුළුවන් ක්‍රමානුකූලව ඉදිරියට මොනවහරි කරන්න. වරිපනම් ගෙවන පුද්ගලයන් බවට අපි නම් කරන ප්‍රදේශයේ සියළුම ගෙවල් මොනතරම් දුප්පත් වුනත් මොනතරම් පොහොසත් වුනත් වරිපනම් ගෙවන මිනිස්සු බවට පත්වෙනවා. ඒක පැහැර හරින්න ඒ අයට බැහැ. එහෙම එකක් තියෙනවා. හැබැයි අපි දියුණු කරන්නත් ඕන. ඒ අය අහයිනේ ඉස්සර වෙලා අපි දෙන්න උඹලා අපිට දෙන්නේ මොනවද කියලා. වරිපනම් ගෙවන එක සමහරු බලෙන් ගෙවන්නත් කැමතියි. ඒකට ඒ අය  කැමතියි. වාසියක් තියෙනවා. නගර ඉදිකෙරුනාම දුප්පත් ගෙවල් ටිකනේ අපිට තියෙන්නෙ. ඒ අයටනේ මේ ප්‍රශ්නෙ තියෙන්නෙ.  ඒත් අපි ටිකක් ඉස්සරහට යන්න එපැයි. ඒකට යන්න කලින් අපි ලැයිස්තුවක් හදලා මෙහේ සාකච්ඡා කරන්න ඕන. මොකද ඒ අය අහන ප්‍රශ්නවලට හරියට උත්තර දෙන්න ඕන. වරිපනම් හිමිවුනහම ඒ අයට තියෙන වාසිය ඇයි අපි මේ වරිපනම්වලට යන්නෙ කියන එක අපි පැහැදිළි කරන්න ඕන.

ගරු මන්ත්‍රී වනිගරත්න මහතා කියා සිටියේ අපි ප්‍රජාවත් සමග සාකච්ඡා කළා. ඒ සම්බන්ධව ගරු මන්ත්‍රී සමන් මහතා ගරු සභාපතිතුමනි, මම හිතන්නෙ වෙළද ප්‍රජාවත් එක්ක සාකච්ඡා කරලා ඉදිරියේදී ඒක තීරණය කලොත් හොඳයි කියන එක තමා මගේ අදහස යනුවෙනි.

ගරු මන්ත්‍රී වෙරංග මහතා කරුණු දක්වමින්, මෙහෙමයි ගරු සභාපතිතුමනි. ඉදිරියෙදි යම් කිසි රාමුවක් තුල ඉදගෙන අපිට වැඩ කරන්න වෙන්නෙ. එතනදි අපි අවශ්‍ය කරන පහසුකම් පිළිබඳ ජනතාවට අවබෝධයක් දෙන්න ඕන. අන්න ඒ පැහැදිලි කිරීම අපි ඉස්සෙල්ලා කරමු. මම සාකච්ඡා කරපු ගොඩක් අය වරිපනම් ගෙවන්න කැමැත්තෙන් ඉන්නවා.

- **ඉහත යෝජනා සියල්ල සදහා  සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා ඒකමතිකව සභා සම්මත විය.**

- ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා තම අදහස් ප්‍රකාශ කරමින්, සභාපතිතුමනි, මම අහන්නෙ මේ යෝජනා එකින් එකම ස්ථිර වෙන්න ඕනදමෙතන යෝජනා 50 ක් තියෙනවනම් මන්ත්‍රීවරු කී දෙනෙක් නම් ඔය 50 ස්ථිර කරන්න නැගිටින්න ඕනද, මේ යෝජණාව යෝජනා කරමි. ස්ථිර කරමි. එතකොට මේ සියළුම මන්ත්‍රීවරු මේ යෝජනා අහල තියෙන්නෙ. මේ 50 ටම කැමති නම් සියළුම දෙනා ඒ 50 ම සම්මතයි කියලා කිව්වහම ඒකෙ ඇති වැරැද්ද මොකද්ද ඉස්සරත් මෙහෙම වුණා. මොන හේතුවකට කරනවද කියලා මම දන්නෙ නැහැ. තෝරා බේරා ගෙන 50 ටම කැමතිනම් ඒ 50 ම ඒකමතිකව සම්මත වුනයි කිව්වහම ඉවරයි.

### 8.2 කර්මාන්ත යෝජනා

I. පළාත් නිශ්චිත ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහනේ කොම්පෝස්ට් අංගනය අළුත්වැඩියා කිරීමේ කර්මාන්තය උඩුගම බටහිර ග්‍රාම සංවර්ධන සමිතිය වෙත ලබා දීමට යෝජනා කරමි.

II. සංවර්ධන සැලැස්ම - 2018 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - ග්‍රාමීය හා වතු මාර්ග සංවර්ධනය යටතේ දකුණු පළාත් සභා නියෝජ්‍ය සභාපති සම්පත් අතුකොරල මැතිතුමාගේ යෝජනාවක් අනුව නාගොඩ යටලමත්ත මාමණදොළ වතු මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වෙන් කල මුදල රු. 1,000,000.00

III. දකුණු පළාත් සභා සංවර්ධන සැලැස්ම - 2018 (මන්ත්‍රී ප්‍රතිපාදන), දකුණු පළාත් සභා මන්ත්‍රී කේ. පී. ජී. සිසිර කුමාරරත්න මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ නාගොඩ ප්‍රාදේශීය සභාවේ පුස්තකාලයට අවශ්‍ය පොත් ලබා ගැනීම සඳහා රු. 25000.00 ක් අනුමත කර ඇත.

IV. දකුණු පළාත් සභා සංවර්ධන සැලැස්ම - 2018 (මන්ත්‍රී ප්‍රතිපාදන),දකුණු පළාත් සභා මන්ත්‍රී සුමනසිරි ලියනගේ මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ වීථි පහන් නඩත්තු කිරීම සඳහා රු. 50,000.00 ක් අනුමත කර ඇත.

V. දකුණු පළාත් සභා සංවර්ධන සැලැස්ම - 2018 (මන්ත්‍රී ප්‍රතිපාදන),දකුණු පළාත් සභා මන්ත්‍රී ඉසුරු දොඩංගොඩ මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පුස්තකාලවලට අවශ්‍ය පොත් ලබා දීම සඳහා රු. 10,000.00 ක් අනුමත කර ඇත.

VI. දකුණු පළාත් සභා සංවර්ධන සැලැස්ම - 2018 (මන්ත්‍රී ප්‍රතිපාදන),දකුණු පළාත් සභා මන්ත්‍රී සුමනසිරි ලියනගේ මැතිතුමාගේ ප්‍රතිපාදන යටතේ නාගොඩ ප්‍රාදේශීය සභාවේ හගරන්වල අතුරු මාර්ග J.C.B. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම සඳහා රු. 100,000.00 ක් අනුමත කර ඇත.

**කර්මාන්ත යෝජනා සම්බන්ධව අදහස් දක්වමින්,**

ගරු සභාපතිතුමා කරුණු දක්වමින් දකුණු පළාත් සංවර්ධන සැලැස්ම පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන ග්‍රාමීය හා වතු මාර්ග සංවර්ධනය සඳහා , දකුණු පළාත් සංවර්ධන සැලැස්ම මන්ත්‍රී ප්‍රතිපාදන කේ.ජී. සිසිර කුමාර මහතා විසින් ලබා දී ඇති ප්‍රතිපාදන , ප්‍රාදේශීය සභා පොදු අරමුදලින් සිදු කල යුතු ප්‍රතිසංස්කරණ සඳහා ගරු මන්ත්‍රී ගයාන් මහතාගේ ඉල්ලීම රංගන ශාලාව අමරසිරි දොඩංගොඩ රංගන ශාලාව නමින් නම් කිරීම සම්බන්ධ උප සභාපතිතුමාගේ යෝජනාව හා ජන උදාන ගම්මානය මැද පාර මැණික් කඩේ අසළ සිට මාර්ගය සංවර්ධනය කිරීමට අදාළ ඇස්තමේන්තුව පිළිබඳ සභාවට දැනුම් දීම

ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා තම අදහස් දක්වමින්, ගරු සභාපතිතුමා පොඩ්ඩක් සමාවෙන්න ඕන ඔය කියවුන ඒවා පොදු අරමුදලින් කරන්න වුන යෝජනා නේද. ඔය යෝජනා ගත්තෙ කොහොමද මොන පදනමින්ද අපේ යෝජනා ඕකට දෙන්න පුලුවන් කම තියෙනවද අපිත් යෝජනා ගෙනැල්ල තියෙන්නෙ. ඒ පදනම පොඩ්ඩක් දැනගන්න ඕන. ඒවටත් ඒ විදියට කරනවද නැත්නම් අපි අහන් ඉන්නවත් කැමති නැහැ.

ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්, මේවා කාගෙනුත් ඉල්ලුවා යෝජනා දෙන්න කියලා. අනිවාර්යයෙන්ම කෙරෙනවා. කොට්ඨාශය තුල

ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා තම අදහස් විමසමින් නෑ කොට්ඨාශයට කොරෙන එක නෙමෙයි මම අහන්නෙ. යෝජනා එක එක මන්ත්‍රීවරුන්ගෙ නමින් ගන්නවනම් ඒ වරප්‍රසාදය මේ සියළුම මන්ත්‍රීවරුන්ට තියෙන්න ඕන. එහෙම නැත්නම් මේ අවස්ථාවෙ ඉදලම විරුද්ධයි ඕකට. හොදටම පැහැදිලියි කොට්ඨාශ කතාවක් නෙවෙයි ඔය කියන්නෙ. ඔබතුමාලා පැහැදිලි කරලා දෙන්න යන්න එපා ඔය වරප්‍රසාදය හැමෝටම හිමිවෙන්න ඕන. නැත්නම් ඕකට අපි විරුද්ධයි. අපි අදත් යෝජනා ගෙනත් තියෙන්නෙ.

ගරු මන්ත්‍රී සී. වී. සහබන්දු මහතා අදහස් දක්වමින්, ගරු සභාපතිතුමා අපි තමුන්නාන්සෙත් එක්ක මාස තුනක් වැඩ කළා. නමුත් මේ මොහොත වන විට වීථි ලාම්පුවක් අපිට සවි කර ගන්න බැරි වෙලා තියෙනවා. ඒකයි තත්වය. මගේ ගෙදරට හැරෙන තැන වීථි ලාම්පුවවත් දාලා නැහැ. ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයෙක් දයාවංශ මහත්තයා, එතුමාගේ පුතා හිටපු මන්ත්‍රීවරයෙක්. එවැනි පුද්ගලයකුගේ නිවස ඉදිරිපිට වීථි ලාම්පුව දාලා නැහැ. මම ගැන හිතන්න ඕන නැහැ. මැරිච්ච මනුසස්යා ගැන හිතලා හරි මේක කරන්න තිබුණා. කණගාටුයි මේ ගැන. අන්තවාදීව යන්න එපා.

ගරු සභාපතිතුමා අදහස් ප්‍රකාශ කරමින්, ඔය කරුණු ගැන වෙනත් කරුණු යටතේ කතා කරන්න.

ගරු මන්ත්‍රී සී. වී. සහබන්දු මහතා ප්‍රකාශ කලේ මම තමයි පළවෙනි යෝජනාව දීලා තියෙන්නෙ. එයට පිළිතුරු වශයෙන් ගරු සභාපතිතුමා, ඒකෙන් රු. 25000.00 ක ඇස්තමේන්තුවක් හදලා තියෙන්නෙ. පසුගිය දවස්වල කරගන්න බැරිවුනා. යථාකාලෙදි කරනවා. තාක්ෂණ නිලධාරීන්ට ඉඩ තිබුනෙ නැහැ. එතනට යන්න. මොකද මන්ත්‍රීවරුන්ගේ පාරවල් මනින්න යන නිසා. ඊටත් මේ කාලගුනෙත් ඒකට හුගක් බලපෑවා. ඒ නිසා ඕන කෙනෙකුට මේකට යෝජනා යවන්න පුළුවන්.

ගරු මන්ත්‍රී තරංග මහතා, සභාපතිතුමා එක්කෙනෙකුට දෙන්න පුළුවන් ප්‍රමාණය කුමක්ද, යෝජනා ගණනක්ද, මුදලින් ප්‍රමාණයක්ද මොකද්ද කියලා අපි දැනුවත් කරානම් අපිට යෝජනා කරන්න පුළුවන්.

ගරු මන්ත්‍රී සී. වී. සහබන්දු මහතා, සභාපතිතුමනි, ඔබතුමා පොදු ප්‍රකාශයක් කරන්න. එක්කෙනෙකුට දෙන්නෙ ලක්ෂෙද, කියලා තමුන්නාන්සේගේ කණ්ඩායමට ලක්ෂ 03 ක් 04 ක් වැඩියෙන් දුන්නත් ඒකට විරුද්ධ නැහැ. ප්‍රතිපක්ෂය හැටියට අපිට ලක්ෂයක් හරි දෙනවනම් අපි යෝජනා එවන්නම්.

ගරු සභාපතිතුමා ප්‍රකාශ කරමින්, ගිය සැරෙත් ඔබතුමාලා පොඩි විරෝධතාවයක් දැක්වුවා. හදවතට එකගව කවුරුත් කතා කලොත් මේක කොට්ඨාස 15 ට වෙන්වෙලානෙ තියෙන්නෙ. එක කොට්ඨාසයක ඉන්න ආණ්ඩු පක්ෂය හා විපක්ෂය මන්ත්‍රීවරු එකතුවෙලා කතා බහ කරගෙන යෝජනා දෙන්න. අපි කාගෙත් සල්ලි ඒ නිසා මගේ එහෙම බෙදීමක් නැහැ. නමුත් මූලිකත්වය දෙන්න වෙන්නෙ අපේ නියෝජිතයින්ට. මම නිතරම ඉල්ලන්නෙ සභාවෙ මුදල් නැතිකම නිසා ඔබතුමන්ලා පුළුවන් තරම් තම තමන් දන්න මන්ත්‍රීවරුන්ගෙන් ප්‍රතිපාදන ඉල්ල ගන්න.

ගරු මන්ත්‍රී තරංග මහතා අදහස් දක්වමින්, සභාපතිතුමා අපි ඒ වැඩේ කළා. රු. 250000.00 ක් මම පුද්ගලිකවම ඉල්ලලා මේ වන විට අපේ සභාවට දීලා තියෙනවා. ඒකට ඇස්තමේන්තු කොච්චර කතා කලාද මේ මාසයක් තිස්සෙ.

ගරු මන්ත්‍රී අජිත් මහතා තම අදහස් දක්වමින් වෙනම කතා කරන්න ඕන කාරණයක් එතුමා කියනවා ලක්ෂ දෙකහමාරක් සභාවට ගෙනැල්ලත් මාසයක් ගිහිල්ලත්ඒක ඇස්තමේන්තු කරලා දෙන්නෙ නැතිලු. මම ලක්ෂ 7 ක් ගෙනැල්ල තියෙනවා. මට ඇස්තමේන්තු කරලා දෙන්නෙ නැහැ. සභාවෙ අනුමැතියත් අරගෙන සභා තීරණයක් හැටියටවත් ගරු මන්ත්‍රීතුමන්ලා මට සහයෝගය දෙන්න. මේවා පිටින් ගෙනාපු සල්ලි. තමුන්නාන්සේලට වියදම් කරන්න තියෙන පොදු අරමුදලේ සල්ලි නෙවෙයි. මගේ ඇස්තමේන්තු හදලා දෙන්න. ඒකට මට දිනයක් කියන්න.

ගරු සභාපතිතුමා, ඒක ප්‍රශ්නයක් වෙලා තිබ්බෙ ඒ ලියුමෙ තියෙනවා සභාවෙ අයිතිය තහවුරු කරන්න කියලා. ඒකෙදි උපදෙස් අරගෙන ඇස්තමේන්තු හදල දෙන්න කියලා මම කියලා තියෙන්නෙ.

ගරු මන්ත්‍රී අජිත් මහතා තම අදහස් දක්වමින් මගේ ෆයිල් එක ලේකම්තුමිය භාර ගත්තා. ඒත් මම පස්සෙ හොයන කොට ෆයිල් එක කොහේද කියලා විෂය දන්නෙත් නැහැ. ඇත්තටම මේ ගැන කතා නොකර ඉන්න බැහැ. මේ වෙනුවෙන් උවමනාවක්, උනන්දුවක් දක්වන්නෙ නෑ කියලා තමයි මට හිතෙන්නෙ. කරුණාකරලා මට දිනයක් කියන්න. මටත් වැඩ තියෙනවා. ඔයගොල්ලන්ටත් වැඩ තියෙනවා. දෙගොල්ලන්ටම මේක කරන්න පුළුවන් දිනයක් කතා කර ගන්න පුළුවන්. මොකද මේක අපේ සභාව හින්දා. මේකෙ ඉදගෙන මේකෙන් ඇස්තමේන්තුවක් හදාගන්න බැරිනම් මේ විදියට අපි වෙනත් ආයතනයකින් ඇස්තමේන්තුවක්

හදවගන්නෙ කොහොමද? තරංග මන්ත්‍රීතුමා  කියන කතාවත් ඇත්තනෙ. මේ මන්ත්‍රීවරුන්ගෙ වැඩත් කරන්න ඕන.  ඒ අයත් මහජන නියෝජිතයො හින්දා. ඒවත් ඉක්මනටම කෙරෙන්න ඕන. දින නැත්නම් අපිට කතා කරලා ඕන දෙයක් කර ගන්න පුළුවන්. අපි මේ අමනාපෙකට කියනවා නෙමෙයි. වැඩ පහුවුනාම සල්ලි ආපසු යනවා. පොදු අරමුදලෙ සල්ලි ටික යන්න තැනක් නැහැ. අපේ මේ සල්ලි ටික ගියහම ප්‍රශ්නයක්. නිලධාරීන් නම් කියයි යන්නෙ නැහැ. අවිච්ඡේද වෙයි කියලා. එහෙම වුනාම මේ අවුරුද්දෙ සල්ලි ඊළඟ අවුරුද්දෙ අනන්තිම වෙයි හම්බවෙනකොට. උඩුගම නැගෙනහිර ගොවි සංවිධානය ගිය අවුරුද්දෙ අත්සන් කරපු ගිවිසුමක් අද සභාවෙ තමයි සම්මත වෙන්නෙ. මේ ජූලි මාසෙ. මේකටනෙ මේ අඳින්නෙ. ඉක්මනට කරලා දෙන්න. මේ ඇස්තමේන්තු දෙක අද තාක්ෂණ නිලධාරීත් එක්ක කතා කරලා මට දිනයක් කියන්න. මම ඊයෙත් සම්බන්ධීකරන කමිටුවේ මේ ප්‍රශ්නය පොදු ප්‍රශ්නයක් හැටියට අරගෙන කතා කළා. අනික් කාරනය මේ යෝජනා සම්බන්ධයෙන් කියන එකට මම මේ කියන්නෙ. ලේකම්තුමියනෙ වාර්තාවෙ කටයුතු කරන්නෙ. එතුමියට තියෙනවා ප්‍රශ්නයක්. අපි දෙපැත්තම බලන්න ඕන. මේක මුද්‍රණයට යන්න කලින් යෝජනා දෙන්න ඕන. නැත්නම් ඇතුලත් කරන්න බැහැ. අපි කෑ ගැහුවට වැඩක් නැහැ. ඒ නිසා ලේකම්තුමිය කියන්න කවදට කලින්ද යෝජනා ටික ලැබෙන්න ඕන කියලා. අද මේ මන්ත්‍රීවරුන්ට දැනුම් දීම කලාම ආයි කියන්න බැ අපි දන්නෑ. කිව්වෙ නැහැ. කියලා කියන්න එපා.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්, කොළඹ කඩේ හංදියේ සිට කුඹුරුහේන මාර්ගයේ කැඩී ගිය බෝක්කුව සකස් කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කරලා තියෙනවා. මෙකෙ මුදල රු. 260000.00යි.

ගරු මන්ත්‍රී නිශාන්ත මහතා අදහස් දක්වමින්, හොඳම දේ තමයි සල්ලි හොයා ගෙන යෝජනා ඉදිරිපත් කරලා ඇස්තමේන්තු සකස් කර ගන්නවනම්, එතකොට මේ ප්‍රශ්න එන්නෙත් නැහැ. පාරවල් 10 ක් යෝජනා කරලා ඒ 10 ටම ඇස්තමේන්තු හදනවා. අන්තිමට එහෙකටවත් සල්ලි නැහැ.  අර ගියපු රජයේ නිලධාරියාගේ කාලයත් අපරාදේ එම අදහස අනුමත කරමින් ගරු මන්ත්‍රී අජිත් මහතා කියා සිටියේ ඒක තමයි අපිට මේ රන්ඩු වෙන්න වෙලා තියෙන්නෙ නැතුව තාක්ෂණ නිලධාරි එක්කවත් ලේකම්තුමිය එක්කවත් අපේ තරහක් නැහැ. ඒ අයට විශාල වැඩ කොටසක් වැඩි වෙලා තියෙනවා. මෙතන තියෙන යෝජනාවලිය බලන්න. මේවා ඇස්තමේනතු කරන්න ගියහම කොහොමද අපි ඒ අයගෙන් දිනයක් ගන්නේ ඇත්තටම ගන්න බැහැ. ගරු සභාපතිතුමනි, අපි 91 ඉඳල ඉන්නවා. අපේ අයටත් ගොඩාක් අත්දැකීම් තියෙනවා. දැන් මම එක යෝජනාවක්වත් දාලා නැහැ. හැබැයි දාන්නැතුව ඉන්නත් බැහැ. සභාපතිතුමා කොයි වෙලාක හරි ඇහුවොත් කො කරලා දෙන්න යෝජනා ඉදිරිපත් කරලා තියෙනවද කියලා. අපි යෝජනා ඉදිරිපත් කරලා නැත්තේ ඇත්තටම සල්ලි ප්‍රශ්නයක් තියෙන නිසා.  මේ ඉදිරිපත් කරලා තියෙන යෝජනා ටික කරන්නත් කෝටි කීයක් ඕනද? අපිත් යෝජනා එකක දෙකක් ඉදිරිපත් කරලා ඒක කරවගන්න බලමු. නැත්නම් පිටින් සල්ලි හොයන් ඇවිත් අන්න ඒක කරන්න කියමු. යෝජනා ගොඩගැහුවට තේරුමක් නැහැ.

ගරු සභාපතිතුමා , මම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් ඉල්ලන්නේ මන්ත්‍රීවරුන්ගෙන් ප්‍රතිපාදන අරගෙන ඇවිල්ල තමන්ට ඕන එකක් කරගන්න පුළුවන්. කිසි ප්‍රශ්නයක් නැහැ. සභාවේ ඉදිරි කටයුතුවලටත් සල්ලි තියෙන්න ඕන.

ගරු මන්ත්‍රී රංජත් ජයවීර මහතා කියා සිටියේ, සභාපතිතුමා කොළඹ කඩේ ලග බෝක්කුවේ පැත්තක්ම ගැලවිලා ඒක අනිවාර්යයෙන්ම දාන්න ඕන. ඒක සභාවට අයිති එකක්.

ගරු මන්ත්‍රී නිශාන්ත මහතා අදහස් දක්වමින්, මේ සභාවෙ ඉන්න හැම මන්ත්‍රීවරයෙක්ම යෝජනා 10 බැගින් දැම්මොත් 270 ක් මේ ටික දවස් කීයක් බලන්නද. අපි සල්ලි නැතුව මේ යෝජනා 270 ම කරන්නේ කොහොමද ? සභාවට දාන්න, ඇස්තමේන්තු හදන්න, ඕන නැහැ. හරියට කරන්න ඕන දෙයක් නම් සභාවෙන් කරන්න ඕන.

ගරු සභාපතිතුමා කරුණු දක්වමින්, දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියෙන් මාපලගම පොදු වැසිකිළිය ඉදි කිරීම සඳහා ලක්ෂ 30 ක ඇස්තමේනතු සකස් කරලා තියෙනවා. මාපලගම බස් නැවතුම්පොලේ පොදු වැසිකිලිය මෙතන දැනට ඉන්න කෙනාගෙන් හරියට පිරිසිදු කිරීමේ කටයුතු සිදු

වෙන්නෙ නැහැ. ඒ නිසා අලුතින් ඉදිකරන වැසිකිලිය හදලා ඉවර වුනාම පරණ වැසිකිලිය ඉවත් කරනවා. නැත්නම් එතන කඩ කාමරයක් දාන්න කටයුතු කරන්න තමයි වෙන්නෙ.

ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා අදහස් දක්වමින්, ගරු සභාපතිතුමනි, මම එතන පිරිසිදු කිරීම් කරන අරුනෝලිස් මහත්තයත් එක්ක කතා කළා. එතුමා කියනවා සියළුම පිරිසිදු කිරීම් කරලා උදේ 10 වෙනකොට යන්න ඕනලු. ඕන නම් වෙන කාටහරි මේක භාරදෙන්නලු. එයාගේ කිසිම අකමැත්තක් නැතෙයි කියලා කියනවා. ඒත් ඒ මනුස්සයා මේ වැඩේ හරියට කරනවා. අරුනෝලිසි මහතා හැර වෙනත් කෙනෙකුට භාරදුන්නොත් එයාගෙ අතින් ඒ කටයුත්ත හරියට සිදු නොවුනොත් මට තමයි අන්තිමට දෝෂාරෝපණයට ලක්වෙන්න වෙන්නෙ.

- **ඉහත යෝජනා සියල්ලම ඉටුකිරීම සම්බන්ධව සභාවේ ඒකමාතික එකගතාවය පළ කල අතර ඉහත යෝජනා සියල්ල සභා සම්මත විය.**

**8.3. ගරු සභාපතිතුමන් හා මන්ත්‍රීවරුන් විසින් ඉදිරිපත් කරන යෝජනා**

**ගරු උප සභාපති ගාමිණී සුසන්ත මහතා විසින් ඉදිරිපත් කරන යෝජනා**

I. උඩුගම උප කාර්යාල භූමියේ ඉදි කර ඇති රංගන ශාලාව අමරසිරි දොඩංගොඩ රංගන ශාලාව නමින් නම් කරන ලෙස ඉල්ලා සිටිමි.

ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා රංගන ශාලාව පිළිබඳව අදහස් ප්‍රකාශ කරමින්, ගරු සභාපතිතුමනි, අපේ උප සභාපතිතුමා යෝජනාවක් කරලා තිබුණා. උඩුගම ශ්‍රවනාගාරය අමරසිරි දොඩංගොඩ මැතිතුමාගේ නමින් නම් කරන්න කියලා. එතුමා මොන පක්ෂෙ වුනත් අපි ගොඩක් ගරු කරන දේශපාලන නායකයෙක්. නමුත් ඒක එහෙම කරන්න තියෙන හැකියාව සහ අවශ්‍යතාවය මොකද්ද? එහෙම යෝජනා කරන්න හේතුව දැනගන්න ඕන. අපේ දිවංගත හේමචන්ද්‍ර විලේගේ හිටපු සභාපතිතුමා ඕකට ගොඩක් මහන්සි වුන කෙනෙක්. අපේ සභාවේ දේවල් කිසිම දේශපාලන නායකයකුගේ නමින් නම් කරන්න ඕන නැහැ. ඔය ශ්‍රවනාගාරයට කවුරුවත් භූමි පරිත්‍යාගයක්වත්, මුදල් පරිත්‍යාගයක්වත් කරලා තියෙනවද කියලා අපි නම් දන්නෙ නැහැ. ඕක පුරනැගුමෙන් ලැබුණු ශාලාව. එහෙම දේශපාලන නායකයකුගෙ නමින් නම් කරන්න ඕන නම් නම් කරන්න ඕන හිටපු සභාපතිතුමාගෙ නමින්.

ඒ සම්බන්ධව ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්, තරංග මන්ත්‍රීතුමා මම ඒකට පිළිතුරක් දෙන්නම්. හේමචන්ද්‍ර විලේගේ මැතිතුමත් මේ ප්‍රාදේශීය සභාවේදි කිව්වෙ ඕක දොඩංගොඩ මැතිතුමා නමින් නම් කරන්න කතියලා. ඒ වාර්තාවන් තියෙනවා. වෙනත් කරුණු යටතේ පැහැදිලි කිරීමක් කරන්නම්.

ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා වැඩි දුරටත් අදහස් ප්‍රකාශ කරමින්, ඔබතුමා පළවෙනි ලියුම විදියට ඒක කියෙව්වා. ඒක නිසා අපි මේක පිළිබද දැනුවත් වෙන්න ඕන. මොකද මේක ස්ථිර කිරීමට පෙර අපි දැනුවත් වෙන්න ඕන හින්දා අහන්නෙ. අපි දොඩංගොඩ මැතිතුමාට ගරු කරනවා. ඒ ගෞරවය එහෙමම තියෙනවා. ඇයි එහෙම එකක් මේකට පටලවාගන්න හේතුව

ගරු උපසභාපතිතුමා පැහැදිලි කරමින්, ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, මේක පටලවා ගැනීමක් නෙමෙයි. හේමචන්ද්‍ර මැතිතුමා මේ සභාවෙ ඉන්න කාලෙ පුරනැගුම යෝජනාව අනුව ඒ ගොඩනැගිල්ල ඉදි කළා. අපි සභා මන්ත්‍රීවරු වශයෙන් මේකට සම්බන්ධ වුණා. විලේගේ මැතිතුමාගේත් මේ අදහස තිබිලා මේ ගොඩනැගිල්ල දිවංගත අමරසිරි දොඩංගොඩ මැතිතුමාට උපහාරයක් ලෙස එතුමගේ නමින් නම් කරන්න කියලා එතුමගෙ කාලයේදීම යම් සභාවක මේ යෝජනාව ගෙන ආවා. ඔබතුමත් මේ සභාවෙ ඉන්දැද්දි තමයි ඔය යෝජනාව ගෙනාවෙ. ආසනයට විතරක් නොවී සමස්ත රටටම විශාල සේවයක් කරපු අමරසිරි දොඩංගොඩ මැතිතුමා පිළිබදව හැදින්වීමක් කරන්න අවශ්‍ය නැහැ. සියළු දෙනාම දන්නවා එතුමා

ගැන. එතුමා විශාල වැඩකොටසක් උඩුගම ප්‍රදේශය වෙනුවෙන් කරපු පුද්ගලයෙක්. ඒ නිසා මේ ගරු සභාවෙ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා සියළු දෙනාම අනුමැතිය ලබා දෙන්න කියලා. ඒ රංගන ශාලාව බෝඩ් එකක් ගහලා නම් කරලා නැහැ. ඒ නිසා අමරසිරි දොඩංගොඩ මැතිතුමාට උපහාරයක් වශයෙන් අමරසිරි දොඩංගොඩ රංගන ශාලාව නමින් නම් කරන ලෙස මම මේ ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

ඒ සම්බන්ධව ගරු මන්ත්‍රී සී. වී. සහබන්දු මැතිතුමා ගරු උප සභාපතිතුමා ගෙන ආ යෝජනාව ස්ථිර කරන බව ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා වැඩි දුරටත් අදහස් ප්‍රකාශ කරමින්, ගරු සභාපතිතුමා මම මේක අහන්න ගියේ මෙහෙමයි. ඒ භූමි පරිත්‍යාගය හරි ඒ උපකාර්යාලයේ කටයුත්තට මුල් වෙලා කටයුතු කරලා තිබුනේ මම දන්න තරමින් හෙන්රි දිසානායක මහත්තයා. අපි එදා ගිය වෙලාවෙත් බෝඩ් එක කියෙව්වා. අමරසිරි දොඩංගොඩ මහතාගේ නමින් එතුමා කරපු ගොඩක් වැඩ උඩුගම ප්‍රදේශයේ තියෙනවා. උඩුගම දකුණෙ අමරසිරි දොඩංගොඩ මාවත කියලා පාරක් තියෙනවා. එතුමා කරපු දේවලට එතුමට ගෞරවය යන්න ඕන. ඒ රංගන ශාලාවෙ විශාල අඩුපාඩුකම් තියෙනවා. ගරු සභාපතිතුමා ඔබතුමත් ගිය සතියෙ ඒක දැක්කා. ඒ වගේ එකකට මෙහෙම නමක් දාලා ජීවතුන් අතර නැති අමරසිරි දොඩංගොඩ මැතිතුමාට අගෞරව කරන්නත් බැහැ. ඒ නිසා මම නම් කියන්නෙ මේක නම් කරනවනම් හිටපු සභාපතිතුමාගෙ ණාමින් නම් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

නැවතත් ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින්, ගරු මන්ත්‍රීතුමා දැන් මෙතන ඝට්ටනයක් ඇති කරන්න එපා. වෙනත් යෝජනා තියෙනවනම් ගරු සභාවෙ ගරු මන්ත්‍රීතුමන්ලා යෝජනා කරන්නකො. එතකොට යෝජනා දෙපාර්ශවය අතරෙ මොකද්ද කියලා විසඳගන්න පුළුවන්. මම කියන්නෙ අමරසිරි දොඩංගොඩ මැතිතුමා කරපු සේවය පිළිබඳ, උඩුගම පාරවල් නම් කරපු එක පිළිබඳ ගැටලුවක් තියාගන්න එපා. වෙනත් යෝජනාවක් තියෙනවනම් ඉදිරිපත් කරන්න. එතකොට ගරු මන්ත්‍රීතුමන්ලගේ අදහස් විමසන්නම්.

ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා නැවතත් අදහස් ප්‍රකාශ කරමින් , ගරු උප සභාපතිතුමනි මම එතන කලේ වෙනත් යෝජනාවක් තමයි, ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා එම යෝජනාව ස්ථිර කරන බව ප්‍රකාශ කරන ලදී.

ගරු උප සභාපතිතුමා :- එහෙම යෝජනා දාන්න බැහැ. ඔබතුමාලා ඊළග සභාවට දාන්න ඕන. එහෙනම් මේ සභාවෙත් ඡන්ද විමසීමක් කරන්න. දිවංගත පුද්ගලයෙක් පිළිබඳ ගැටලු ඇති කර ගන්න එපා. මෙතන ඉන්න අපේ ගරු මන්ත්‍රීතුමන්ලා ඒකට වෙනත් යෝජනාවක් තියෙනවනම් න්‍යාය පත්‍රයට අරගෙන නීත්‍යානුකූලව කටයුතු කරන්න.

ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා :- ගරු උප සභාපතිතුමා ඔබතුමාමනෙ කිව්වෙ වෙනත් යෝජනා තියෙනවනම් ඉදිරිපත් කරන්න කියලා. ඒක යෝජනා ස්ථිර වුනහම ඔබතුමා තව කතාවක් කියනවා.

ගරු උප සභාපතිතුමා :- මම එහෙම කිව්වෙ නැත්නම් ඔබතුමා නිශ්ශබ්ද වෙනවා. ඔබතුමාගෙ බලාපොරොත්තුව මොකද්ද කියලා මම දැනගන්න කැමතියි.

ගරු මන්ත්‍රී ධනංජය විලේගේ මහතා ඒ පිළිබද තම අදහස් ප්‍රකාශ කරමින්, ඔය ගොඩනැගිල්ලෙ ඉඩම අත්පත් කර ගැනීමේදි මට හොඳට මතකයි. මගේ පියාට මරණ තර්ජන පවා එල්ල වුණා. ඒකත් මම මේ අවස්ථාවේදි මතක් කරන්න ඕන. යුධ හමුදාවෙ දකුණු පළාත් ආඥාපති අපේ ගෙදරට ඇවිත් මගේ ඉදිරිපිටදිම මරණ තර්ජන එල්ල කළා.

ගරු උප සභාපතිතුමා :- අපි එදා මන්ත්‍රී මණ්ඩලයක් හැටියට හිටපු සියළු දෙනාම අපහසුතාවයට පත් වුණා. ඔබතුමාගෙ පියාට අපි ගෞරව කරනවා. ඔබතුමාගෙ පියා නෙමෙයි. ඒ අවස්ථාවෙ හිටපු මන්ත්‍රීවරු සියළු දෙනා කරුණු කාරනා දැන ගෙන කතා බහ කරලා තමයි සියළු දේ කළේ.

**ගරු මන්ත්‍රිනී සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය ඉදිරිපත් කරන යෝජනා**

**උඩවැලිවිටිය කොට්ඨාශය**

I. තලාව හොරන්ගල්ල මාර්ගය
II. ගල්ලෙන්මුල්ල මාර්ගය
III. කොස්ඇට හේන සිට කුරුදු ජනපදය දක්වා
IV. ගල්ලෙනමුල්ල මුත්තවිල මාර්ගය

**ගම්මැද්දේගොඩ කොට්ඨාශය**

V. කවඩැල්දූව බතලවත්තේගොඩ මාර්ගය (ඉතිරි කොටස)
VI. ගම්මැද්දේගොඩ මිරිස්වැල හේන්දෙණිය මාර්ගය
VII. ගම්මැද්දේගොඩ රණවිරු බන්දුල විජේසේකර මාවත
VIII. ගෝණලගොඩ මොරෙන්කන්ද මාර්ගය
IX. ගෝණලගොඩ දවුගහහේන මාර්ගය

**ගම්මැද්දේගොඩ කොට්ඨාශය**

I. බතලවත්තේගොඩ කවඩැල්දූව මාර්ගය කොරිපස් හා J.C.B. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම
II. ගම්මැද්දේගොඩ මිරිස්වැල හේන්දෙනිය මාර්ගය J.C.B. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම
III. ගෝණලගොඩ හොරංගල්ල මාර්ගය කොරි පස් දමා සංවර්ධනය කිරීම

- **ඉහත යෝජනා සියල්ල සදහා සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී එච්. කේ. ලක්රුවන් සම්පත් මහතා ඉදිරිපත් කරන යෝජනා**

I. තලාව හොරංගල්ල මාර්ගය කොරි පස් දමා සංවර්ධනය කිරීම
II. උඩවැලිවිටිය ගම්මැද්දේගොඩ මාර්ගය මඩ ඇති ස්ථාන කොරි පස් දමා සංවර්ධනය කිරීම
III. කොස් ඇට හේන කුරුදුකන්ද දක්වා මාර්ගය J.C.B. යන්ත්‍රයක් දමා කැපීම
IV. උඩවැලිවිටිතලාව ශ්‍රමදාන මාවත කොරිපස් දමා සංවර්ධනය කිරීම

- **ඉහත යෝජනා සියල්ල සදහා සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී පියල් ජේ. හිරිමුතුගොඩ මහතා ඉදිරිපත් කරන යෝජනා**

**I.** තල්ගස්වල දියවර ගම්මානය අතුරු මාර්ග බැකෝ යන්ත්‍රයක් යොදා ප්‍රතිසංස්කරණය කිරීම
**II.** කුඹුරුහේන අතුරු මාර්ග බැකෝ යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම
**III.** 215 අලුත් පහල නාරංගොඩ මාර්ගය (100 m) පස් දමා පිරවීම

- **ඉහත යෝජනා සියල්ල සඳහා සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා ඉදිරිපත් කරන යෝජනා**

**I.** උඩුගම නැගෙනහිර ඇටකෙහෙල්කන්ද මාර්ගය
**II.** උඩුගම අලුත්වත්ත කැකිරිහේන්දොළ මාර්ගය
**III.** උඩුගම අලුත්වත්ත උඩුගම කැල්ල මාර්ගය
**IV.** උඩුගම අලුත්වත්ත ප්‍රොජෙක්ට් එක මාර්ගය
**V.** උඩුගම මධ්‍යම ක්‍රීඩා පිටිය අසලින් සමගිගම යා කරන මාර්ගය
**VI.** උඩුගම මධ්‍යම 28 මාර්ගය

- **ඉහත යෝජනා සියල්ල සඳහා සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා ඉදිරිපත් කරන යෝජනා**

I. උඩුගම 218 සී මොරගල්මුල්ල කාබිල්වත්ත පාර J.C.B. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම
II. 218 බටහිර කාබිල්වත්තේ පිහිටි ප්‍රජා ශාලාවක් ඉදි කිරීම සඳහා J.C.B. යන්ත්‍රයක් යොදා ඉඩම සංවර්ධනය කිරීම
III. මොරගල්මුල්ල පාර සඳහා කොරි පස් ලබා ගැනීම
IV. මොරගල්මුල්ල කොස්ගහහේන පාර අඩි 100 කොටසක් ගමේ සහයෝගය 70% ක් ඇතුව කොන්ක්‍රීට් දැමීම සඳහා සිමෙන්ති කොට්ට 25 ක් ලබා ගැනීම

- **ඉහත යෝජනා සියල්ල සඳහා සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රිනී ප්‍රියන්තා ගුණසේකර මහත්මිය ඉදිරිපත් කරන යෝජනා**

**I.** ආරියතිලක මාර්ගය දක්වා මාර්ගය අලුත්වැඩියා කිරීමට රු. 50000.00
**II.** සංවර්ධන ගම්මානයට ප්‍රවිශ්ඨ වන ස්ථානය සඳහා රු. 50000.00 ක් ලබා දීමට කටයුතු සලස්වා දීම

**ඉහත යෝජනා සියල්ල සඳහා සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී එම්. එම්. දිසානායක මහතා ඉදිරිපත් කරන යෝජනා**

**I.** ඌරල පහළ අක්කර 25 බෝක්කුව සෑදීමට සිලින්ඩර් දමා පස් දැමීම
**II.** ඔන්ද උඩවත්ත මාර්ගයේ කාණු සැකසීම
**III.** තලහුවල බෝගහ අසලින් මාර්ගයේ සිලින්ඩර් 2 ක් දමා පස් දැමීම
**IV.** තලහුවල කන්ද බින්ටර්වත්ත මාර්ගයේ සිලින්ඩර් දමා පස් දැමීම
**V.** නීල්ද අල්විස් මාවතේ දෙපස ශුද්ධ කිරීම
**VI.** සමනළ පෙර පාසලේ දැල් ප්‍රතිසංස්කරණය කිරීම

- **ඉහත යෝජනා සියල්ල සදහා  සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී පී. පී. රංජිත් ජයවීර මහතා ඉදිරිපත් කරන යෝජනා**

- **I.** බල ප්‍රදේශයට අයත් සෝභිත මාවතේ ඇති පාලම අබලන් තත්වයේ පවතින බැවින් එම පාලමේ පැතිබැම්ම ඉතා ඉක්මණින් ස්ථාපිත කිරීම
- **II.** බල ප්‍රදේශයේ නිදැල්ලේ හැසිරෙන ගවයින් නිසා ගොවියන්ගේ භෝග විනාශ වන බැවින් එම නිදැල්ලේ හැසිරෙන ගවයින් සදහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම
- **III.** අප බල ප්‍රදේශයේ ඇති චූන් පාන් වැනි වාහන මගින් පිටි බහුල ආහාර පිළිසකර කිරීමේදී, ප්‍රවාහනයේදී ඇතිවන අහිතකර තත්වයන් මග හරවා ගැනීමට සෞඛ්‍ය ආයතන හා මහජන සෞඛ්‍ය පරීක්‍ෂක නිලධාරීන් ඒ සදහා යොමු කිරීම
- **IV.** කුඹුරුහේන කණිෂ්ඨ විද්‍යාල වැසී යාමට පවතින බැවින් ඒ සදහා අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙස යෝජනා කරමි.
- **V.** අප බල ප්‍රදේශයට පොදු නාන ළිදක් සකස් කර දීම
- **VI.** අප බල ප්‍රදේශයට අයත් ධීවර ගම්මානයේ නිවාස 6 ට යන මාර්ගය දිය කඩිත්තක් ඇත. එම මාර්ගයට අඩි 6 බෝක්කු 2 ක් ලබා දෙන මෙන් ඉල්ලා සිටිමි.

- **ඉහත යෝජනා සියල්ල සදහා  සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී එන්. ඩබ්. පතිනායක මහතා ඉදිරිපත් කරන යෝජනා**

- I. 222 D ඌරල නැගෙනහිර ග්‍රා.නි.ව. මිදැල්ල මිනුවන්විල මාර්ගයේ වයලට් ජාගොඩ මහත්මියගේ සහ බන්දුල ජාගොඩ මහතාගේ නිවෙස් දෙක අතර මාර්ගය හරහා සිලින්ඩර් යොදා බෝක්කුවක් ඉදි කර දීම
- II. 222 ඌරල මධ්‍යම කොතේගොඩකන්ද මාර්ගය ගාමිණී මහතාගේ නිවස දක්වා දිවෙන ප්‍රධාන මාර්ගය J.C.B. යන්ත්‍රයක් යොදා පිළිසකර කිරීම
- III. කොතේගොඩකන්ද ප්‍රධාන මාර්ගයේ සිට සිරිමාන්න මහතාගේ නිවස දක්වා දිවෙන අතුරු මාර්ගය J.C.B. යන්ත්‍රයක් යොදා පිළිසකර කිරීම
- IV. ඌරල දකුණ 222 A ග්‍රාම නලධාරී වසමේ ගල්කැටියාගොඩ කන්ද මුදුනේ සිට මල්වත්තහේන මාර්ගය දක්වා ඇති උතුරු මාර්ගය J.C.B. යන්ත්‍රයක් යොදා පිළිසකර කිරීම
- V. නෑහිණිගල ලියංදොළ සිට අමරජීව වෙළදසැල දක්වා ඇති මාර්ගය J.C.B. යන්ත්‍රයක් යොදා පිළිසකර කිරීම
- VI. ඌරල උතුර ග්‍රාම නිලධාරී වසමේ ඉහල කටඹුරාව ගැමිදිරිය ශාලාව අසල ඇති දොළෙ මාර්ගය බෝක්කු සිලින්ඩර් යොදා සකස් කර දීම

- **ඉහත යෝජනා සියල්ල සදහා  සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී එන්. වී. සමන්  මහතා ඉදිරිපත් කරන යෝජනා**

I. හෝමදොළ 50 මාර්ගය J.C.B. යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම
II. නො. 04 දෙණිය ගෙදර ඉදිරිපස මාර්ගය J.C.B. යන්ත්‍රයක් යොදා පිළිසකර කිරීම
III. ගල්ලන්දල ඇළ ඉහළ මාර්ගය සිලින්ඩර් දමා සැකසීම

- **ඉහත යෝජනා සියල්ල සඳහා සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**ගරු මන්ත්‍රී එන්. පී. ගයාන් මධුෂංක මහතා ඉදිරිපත් කරන යෝජනා**

I. සමෘද්ධි මාවත, කැටගොඩ 300 m ක් ප්‍රතිසංස්කරණය කිරීම
II. මලාමුර 37 කන්ද 300 m ක් ප්‍රතිසංස්කරණය කිරීම
III. ගොරකගස්තුඩුව මාර්ගය 100 m ක් ප්‍රතිසංස්කරණය කිරීම
IV. මිනුවන්ගොඩ කන්ද සර්වෝදය මාවත සංවර්ධනය කිරීම

- **ඉහත යෝජනා සියල්ල සඳහා සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

ඉහත මාර්ග සියල්ල J.C.B. යන්ත්‍රයක් යොදා ගනිමින් දෙපස ශුද්ධ කර කාණු සකසා කොරි පස් යෙදිය යුතුය.

- ගරු මන්ත්‍රී ලක්රුවන් මහතා විසින් සභාපතිතුමනි, ඕකෙ මගෙ යෝජනාවක් සුභාෂි මන්ත්‍රීතුමිය යෝජනා කරපු හැටියට තියෙන්නෙ. ඒකත් පොඩ්ඩක් සංශෝධනය වෙන්න ඕන. යනුවෙන් දැනුම් දුන් අතර ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා ප්‍රකාශ කරන ලද්දේ රංගන ශාලාව සම්බන්ධව වෙනත් යෝජනාවක් එතුමන් කරන ලද බැවින් ඒකත් සටහන් කර ගන්නා ලෙසයි.

ගරු උපසභාපතිතුමා මේ සම්බන්ධව කතා කරමින්, එහෙම ක්‍රමවේදයක් මෙතන නැහැ. ඔබතුමා න්‍යාය පත්‍රානුකූලව ඇවිල්ලා විරෝධය ප්‍රකාශ කරන්න. මේක සභාවෙ සම්මත කරලා තියෙන්නෙ.

ගරු මන්ත්‍රී තරංග මහතා මේ සම්බන්ධයෙන් විරෝධය පළ කරමින් කියා සිටියේ ඔබතුමා කියන එක විතරයිද කරන්න ඕන. අපි ඒකට විරුද්ධයි. ඒ කියපු ටික එහෙමමයි. යෝජනාව සභා සම්මත වුනයි කීවට අපි දන්නෙ නැහැ. අපිට අදාල නැහැ. සභාවෙ සම්මත කරන්නෙ කොහොමද? වෙනත් යෝජනාවක් තියෙද්දි. ධනංජය ගරු මන්ත්‍රීතුමා කියා සිටියේ ගරු සභාවෙ ඡන්දයක් හරි තියන්න යනුවෙනි.

ගරු උප සභාපතිතුමා තවදුරටත් මේ සම්බන්ධව කරුණු දක්වමින්, මම කියන්නෙ අපේ මේ ධනංජය මන්ත්‍රීතුමහා මට ඔබතුමත් එක්ක පුද්ගලික කතාවක් තියෙනවා. ඔය අතින් බලන කොට ඔබතුමා විරුද්ධද අමරසිරි දොඩංගොඩ මැතිතුමාගෙ නම දාලා රංගන ශාලාව හදනකොට ඔබතුමාගෙ පියාගේ නමින් නම් කරන්න වෙනත් දෙයක් යොදා ගන්න ඔබතුමාගේ පිය තාමත් බේරගන්නෙ අපි. දැනගන්න මේ ප්‍රශ්න ඔක්කොම ආවෙ ඔබතුමාගෙ පියාගෙ කාලෙ. දූෂණ චෝදනා, මගෙන් අහගන්න එපා චන්ද විමසීමක් කරන්නකො. එතකොට පරාද වුනත් කමක් නැහැ.

ගරු මන්ත්‍රී ධනංජය මහතා කියා සිටියේ මම කැමතියි මග් පියාගේ නමන් නම් කරනවට. අමරසිරි දොඩංගොඩ මැතිතුමාගේ නමින් නම් කරනවට මම විරුද්ධ නැහැ. ඒත් මගේ පියාගේ නමින් නම් කරනවනම් මම කැමතියි. මගේ පියාගේ කාලෙ ඒවට මං අල්ලගෙන හරියන්නෙ නැහැ. මම මෙතන ඉන්නෙ ජනතා නියෝජිතයෙක් හැටියට තාත්තගේ ප්‍රශ්නවලට මේකෙ සම්බන්ධතාවයක් නැහැ.

ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා අදහස් දක්වමින් , ගරු සභාපතිතුමනි අපේ ගරු උප සභාපතිතුමා ගෙනා යෝජනාව, පැහැදිලිවම අපි සියළු දෙනාම දන්නවා අමරසිරි දොඩංගොඩ මැතිතුමා මේ පළාතට විතරක් නොවෙයි රටටම සේවයක් කරපු දිවංගත නායකයෙක්. ඒ නිසා අපි සියළු දෙනාම කැමතියි අමරසිරි දොඩංගොඩ නමින් ඒ ශාලාව නම් කරනවට. මොකද මූලිකව මේ සියළු කටයුතුවලට මුල පිරුවෙ එතුමා නිසා. ඒ නිසා අමරසිරි දොඩංගොඩ මැතිතුමාගෙ නමින් ඒක නම් කරන එකට ඡන්දයක් විමසුවත් අපි කැමතියි.

ගරු මන්ත්‍රී අජිත් මහතා අදහස් දක්වමින්, ගරු සභාපතිතුමනි, මම විශේෂ ඉල්ලීමක් කරනවා. ඔබතුමා ඇතුළු ගරු සභාවෙන් අමරසිරි දොඩංගොඩ මැතිතුමා කියන්නෙ අපි අලුතින් හඳුන්වා දිය යුතු නැති මේ රටේ හිටපු ජ්‍යේෂ්ඨම දේශපාලන චරිතවලින් එකක්. එතුමා ජීවතුන් අතර ඉන්න කාලෙත් කිසිම ගොඩනැගිල්ලක නම දානවද කියලා හොයලා බලන නායකයෙක් නෙමෙයි. අද දොඩංගාඩ ඇමතිතුමා ජීවතුන් අතර සිටියනම් කොහොමත් මේක කරන්න දෙන්නෙ නැහැ. මම ඉතාම ගෞරවයෙන් මේ ගරු සභාවට යෝජනා කරනවා එතුමගේ ගරුත්වයට ශ්‍රේෂ්ඨත්වයට හානි නොවෙන්න එතුමගේ නම ඕනවට වැඩිය විවේචනය නොකර කරන දෙයක් කරන්න කියලා. අමරසිරි දොඩංගොඩ මැතිතුමා හරි නිහතමානි කෙනෙක්. ඒ නිසා තමුන්නාන්සේලා කැමති නමක් යෝජනා කරලා ඒකෙ තියන්න. අමරසිරි දොඩංගොඩ මැතිතුමාට හානි කරන්න එපා.

ගරු මන්ත්‍රී සී. වී. සහබන්දු මහතා අදහස් දක්වමින්, මේකෙ අයිතිවාසිකමක් තමයි. මන්ත්‍රීවරුන්ට සභාවට යෝජනා ඉදිරිපත් කිරීම. උපසභාපතිතුමා කිව්වා එහෙම යෝජනා ගේන්න බැහැ කියලා. මම ඒකට විරුද්ධයි. ඕනම දෙයකට යෝජනාවක් අවොත් ඒ යෝජනාව නෙමෙයි තව ටිකකින් තව යෝජනාවක් එන්න පුළුවන්. ඒක අයිතිවාසිකමක්. අපි කියන්නෙ නැහැ මේක දොඩංගොඩ මහත්තයටද, කියන කතාවක්. එහෙම කරුනු දක්වනවා නෙමෙයි එතුමා ගරු කල යුතු පුද්ගලයෙක්. නමුත් මෙතෙනදි අද ජීවතුන් අතර නැති විලේගේ සභාපතිතුමාගෙ අඩුපාඩුකම් තියෙන්න ඇති. නමුත් සබාව වෙනුවෙන් යමක් කලයි කියන එක අපි සියළු දෙනාටම පිළිගන්න වෙනවා. අඩුපාඩු නැතෙයි කියන්නෙ නැහැ. අපි ඒවත් කතා කරනවා. ඒ නිසා යම් වෙනත් යෝජනාවක් ඇවිල්ල නම් අපි බහුතර කැමැත්ත බලලා බොහොම නිහතමානීව බහුතර කැමැත්තට ඉඩ දෙනවා. ඒක තමයි සභාවෙ ගරුත්වය. සභාපති හැටියට හෙට ඔබතුමා නැතිවුනොත් අපි ගරු කරන්න ඕන. ඔබතුමාගෙත් අඩුපාඩු තියෙන්න පුළුවන්. අපටත් නොයෙක් දේශපාලන මතවාද තියෙනවා. එහෙම නම් අපිටත් තිබුණා විලේගේ මන්ත්‍රීතුමා ඕන නැහැ කියලා කියන්න. ඒ නිසා මෙතන යෝජනා දෙකක් ඇවිත් තියෙනවා. ඉතින් බහුතර කැමැත්තට ඉඩ දෙමු.

ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා අදහස් දක්වමින් , ගරු සභාපතිතුමනි, මෙතනදි දැන් ඇත්තටම යෝජනා දෙකක් ඇවිල්ලා තියෙනවා. මේ යෝජනා දෙකම අපේ පාක්ෂිකයො දෙන්නෙක් සම්බන්ධව. මෙතනදි ඡන්දයකට යන්න නම් ලෑස්ති වෙන්න එපා. මොකද ඔබතුමාගේ නිල කාලෙදි පළමු ඡන්දයකට යන්න ලෑස්තා වෙන්නෙ. ඒ නිසා මෙතන අර්බුධයක් ඇති වෙනවා. මෙතනදි අමරසිරි දොඩංගොඩ මැතිතුමාගේ නම යෝජනා කරන්නෙ අපේ උප සභාපතිතුමා, හේමචන්ද්‍ර විලේගේ හිටපු සභාපතිතුමා ගැන යෝජනා කරන්නෙ තරංග මන්ත්‍රීතුමා විලේගේ මැතිතුමාගේ පුතනුවනුත් මේ සභාවෙ ඉන්න නිසා අපි අතරමැදියො වශයෙන් ගැටලුවකට මුහුණ දෙන්න සිදු වෙනවා. අපට මේ දෙන්නවම ඕන. එහෙමනම් ඔය ගොඩනැගිල්ලට මගේ හරි අපේ තාත්තගේ හරි නම දාලා මේක බේරගන්න. ඡන්දයකට නම් යන්න ලෑස්ති වෙන්න එපා.

ගරු මන්ත්‍රී නිශාන්ත මහතා අදහස් දක්වමින්, ගරු සභාපතිතුමනි, මේ නායකයන්ට අපහස කරගන්න එපා. තම තමන්ගේ තාත්තලගේ අම්මලගේ නම් දාලා රටේ හිටපු දේශපාලන නායකයන්ට අපහාස කරන තත්වෙට පත්වෙන්න එපා. අමරසිරි දොඩංගොඩ මැතිතුමා, එම්. එස්. අමරසිරි මැතිතුමා හෝ වෙනත් නායකයකුට, මේ සභාවෙ මීට අවුරුදු 05 කට කලින් මටත් මතක නෑ හරියටම වර්ෂය කිසිම පෞද්ගලික චරිතයක් නමින් කිසිම දෙයක් නම් කරන්න එපා කියලා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලියුමක් එවලා තිබුණා. මොකද රණවිරු මාවතක් හැටියට කෙනෙක්ගෙ නමින් නම් කරන්න ඉල්ලුවම එහෙම නමක් දාන්න එපා. රණවිරු මාවත කියලා විතරක් දාන්න කියලා තිබුණා. ඒ නිසා කරුණු විමසා දේශපාලන නායකයන්ට හා තම තමන්ගේ පෞද්ගලික න්‍යාය පත්‍රවලට ගිහිල්ලා යම් යම් අය අපහසුතාවයට පත් නොවන විදියට

වැඩ කරන්න කියන එක තමයි මම නම් ඉල්ලන්නෙ. ඒ නිසා මම නම් විශ්වාස කරන්නෙ නැහැ. කෙනෙක්ගෙ නමින් නම් කරන්න පුළුවන් වේය කියලා. තවදුරටත් සොයා බලන්න. එහෙම ප්‍රශ්නයක් තියෙනවා. උපදෙස් අරගෙන මොකද්ද කරන්නෙ කියලා ප්‍රශ්නෙ ඉවර කර ගන්න කෙනෙකුට අපහාස වෙන විදියට වැඩ කරන්න එපා.

ගරු උප සභාපතිතුමා කරුණු දක්වමින්, ගරු සභාපතිතුමනි, ඔය කියන කාරණය වැදගත්කමක් නැහැ. වැදගත් විදියට න්‍යාය පත්‍රයට යෝජනාවක් දාලා තියෙනවා. ඒ යෝජනාව පිළිබඳ යෝජනාව දාපු පුද්ගලයා අදහස් දක්වලා තියෙනවා. තව මන්ත්‍රීවරු අදහස් දක්වලා තියෙනවා. ඔය කියන කාරණය අදාල වෙන්නෙ පාරවල් සම්බන්ධයෙන් විතරයි. රණවිරුවන්ගෙ නම් දාන්න එපයි කිව්වෙ ඒකට හේතුව විශාල රණවිරුවන් සංඛ්‍යාවක් ජීවිත පුජා කරපු නිසා. ඒ නම් දාන්න රටේ පාරවල් මදිවෙනවා. ඒකට විතරයි ඒ ප්‍රශ්නෙ ස්ථානයක්, ගොඩනැගිල්ලක් නම් කරන්න එහෙම ගැටලුවක් ඇති වෙලා නැහැ. මමත් කණගාටුවෙනවා මේ තරම් උගත් මේ ගරු මන්ත්‍රීතුමන්ලා විශේෂයෙන්ම ධනංජය මන්ත්‍රීතුමා මම නම් කරලම කියනවා බලන්නකෝ මේ ගරු සභාවෙ අමරසිරි දොඩංගොඩ මැතිතුමාට කරන අපහාසය.

ගරු මන්ත්‍රී ධනංජය විලේගේ මහතා කරුණු දක්වමින්, ගරු සභාපතිතුමනි, මම කිසිම චරිතයකට අපහාසයක් කළේ නැහැ. සභාවත් සාක්ෂි දරාවි. කිසි කෙනෙකුට අපහසයක් කලේ නැහැ කියන එක. ඒ නිසා මගේ දැඩි විරෝධය ප්‍රකාශ කරනවා. මම කිසිම චරිතයකට දේශපාලන චරිතයකට කිසිම හානියක් කලේ නැහැ. මම කිව්වෙ පියාගේ නමින් නම් කරනවනම් ඒ යෝජනාවට මම කැමතියි කියන එක පමණයි. කරුණාකර ඒ පිළිබඳ අවධානය යොමු කරන්න.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්, ගරු මන්ත්‍රීවරුනි, ඇත්තටම මේ ප්‍රශ්නෙදි අපි හරි ව්‍යාකූලයි. මේ සභාවෙදි ඔහොම කතා කරගන්න එපා. දිවංගත නායකයන්ගේ නම්වලටත් එතුමන්ලටත් අපි කවුරුත් ගරු කරන්න ඕන. සියළු දෙනාම ආවේගශීලි නොවී කතා කරනවනම් හොදයි. මොකද දේශපාලනයෙන් තොරව අපි කතා කරනවනම් අමරසිරි දොඩංගොඩ මැතිතුමා කියන්නෙත් නිහතමානී දක්ෂ ගෞරවණීය නායකයෙක්. ඒ වගේම දිවංගත අපේ හේමචන්ද්‍ර විලේගේ සභාපතිතුමා මේ සභා බල ප්‍රදේශය යම් වැඩ කොටසක් කරලා තියෙනවා. ඉතින් මේ නම් කිරීම අපේ උප සභාපතිතුමා සත්භාවයෙන් කරලා තියෙන්නේ. බද්දේගම ආසනෙත් සම්බන්ධ නිසා. මගේ හිතෙත් යම් කාරණයක් තිබුණා. විලේගේ සභාපතිතුමාගේ නමින් මොනවහරි දෙයක් යෝජනා කරලා නම් කරන්න ඕන කියලා. පස්සෙ මම හිතුවා ගෝණදෙනියෙ පිට්ටනිය හරි එතුමා නමින් නම් කිරීමට. උප සභාපතිතුමා කිව්ව වගේ නම් කිරීමට අපහසු පාරවල් විතරයි. මොකද රණවිරුවන් දහස් ගණනක් ජීවිත පූජා කරලා තියෙනවා. ඒ අනුව පාරවල් නම් කරන්න ගියාම අපහසුතාවයට පත් වන නිසා. නමුත් වර්තමානයෙත් පිට්ටනිය ආදිය නම් කරනවා. පසුගිය දවසකත් මම දැක්කා දේශපාලන නායකයකුගේ නමින් නම් කරලා තියෙනවා. ඒ නිසා ගැටලුවක් වෙනකක් නැහැ. නමුත් මේ පිලිබදව ඔබතුමාලගෙන් මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා අපහසුතාවයට පත් වෙන විදියට කටයුතු කරන්න එපා කියලා.

ගරු මන්ත්‍රී අජිත් මහතා :- ගරු සභාපතිතුමනි, අපි දැන් චරිතයකට ගරුත්වයක් ආරෝපනය කරන්න ගිහිල්ලා ඒ චරිතයට සම්පූර්ණ අගෞරවයක් කරනවා නම් ඒක අමරසිරි දොඩංගොඩ මැතිතුමාට වේවා හේමචන්ද්‍ර විලේගේ මැතිතුමාට හො වෙනත් කෙනෙකු වේවා මොකද්ද අපි මේ කරන්න හදන වැඩේ තේරුම. මෙතන විතරක් නෙමෙයි කොතනක වුනත් සිද්ධ වෙන ඕන දෙයක් නෙවෙයි මේක. ගරුත්වයක් නොවෙයි දෙන්නෙ අන්තිමට විවාදයට භාජනය කර ගෙන පුදුම අගෞරවයක්නෙ ඒ මිනිස්සුන්ගෙ චරිතවලට කරන්නෙ. ඒ නිසා ඒ චරිත දිහාත් බලන්න. ඒ මිනිස්සු මේවා බලාපොරොත්තු නොවුන දේවල් . ඇත්තටම මෙහෙම කරන්න එපා.

- **ඉහත යෝජනා සියල්ල සදහා සභාවේ එකගතාවය පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

**9. කාරක සභා වාර්තා**

**9.1. මුදල් ගෙවීම් වාර්තාව සම්මත කිරීම**

**සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත් ඉදිරි ගෙවීම්**

01. ලේකම්, නාගොඩ ප්‍රාදේශීය සභාව

උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී කණ්ඩායමට 2018 ජුනි මස සඳහා
ඉන්ධන වෙනුවෙන් දීමනා ගෙවීම - රු. 81000.00

02. සභාපතිතුමා, උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී කණ්ඩායමට 2018 ජුනි මස සඳහා
පෙර ගෙවුම් කාඩ්පත් ලබා දීමේ බිල්පත - රු. 28500.00

03. එම්. ඒ. ආරියවංශ මෝටර්ස්, නාගොඩ
හෑඩ්මෙක් ට්‍රැක්ටරයේ අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් ගෙවීම් බිල්පත - රු. 8290.00

04. ලියනගේ ට්‍රේඩ් සෙන්ටර්, නාගොඩ
මහ සභා රැස්වීම සඳහා සංග්‍රහ වියදම් බිල්පත - රු. 2435.00

05. හොටෙල් සීගිරි, නාගොඩ
මහ සභා රැස්වීම සඳහා සංග්‍රහ වියදම් බිල්පත - රු. 2815.00

**මෙම ගෙවීම් සඳහා ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.**

**9.2. මුදල් කමිටු වාර්තාව සම්මත කිරීම**

**ඉදිරි ගෙවීම්**

**01. මහජන බැංකුවේ ලංකා විදුලි බල මණ්ඩල ගිණුම**

**2018 ජුනි මස විදුලි බිල්පත්**

| | | | |
|---|---|---|---|
| I. | 2813038709 | - කැකුලු පෙර පාසල | - රු 240.00 |
| II. | 4507357802 | - සමනල පෙර පාසල | - රු. 276.60 |
| III. | 4509082800 | - උදාර පෙර පාසල | - රු. 404.70 |
| IV. | 2810125104 | - දීප්ති පෙර පාසල | - රු 258.30 |
| V. | 4591713210 | - ප්‍රධාන කාර්යාලය | - රු 4430.70 |
| VI. | 4509082908 | - උක්ඹිවිට පෙර පාසල | - රු. 276.60 |
| VII. | 2809093105 | - කොමපෝස්ට් ව්‍යාපෘතිය | - රු 1246.50 |
| VIII. | 8617046104 | - බහුකාර්ය මධ්‍යස්ථානය | - රු 734.10 |
| IX. | 4594192319 | - උඩුගම උප කාර්යාලය | - රු. 843.90 |
| X. | 8616374000 | - ටොයිලට් කම්ප්ලෙක්ස් | - රු 240.00 |
| XI. | 8616373802 | - උඩුගම පොළ | - රු. 240.00 |
| XII. | 2810236100 | - මා.ක. ක්‍රීඩාංගනය | - රු. 258.30 |
| XIII. | 8616374000 | - ටොයිලට් කම්ප්ලෙක්ස් | - රු 240.00 |
| XIV. | 8616373802 | - උඩුගම පොල | - රු. 240.00 |

**2018 මැයි  මස විදුලි බිල්පත්**

I. 2813189405 - තල්ගස්වල පෙර පාසල - රු 258.30
II. 8616374000 - ටොයිලට් කම්ප්ලෙක්ස් - රු 240.00
III. 8616373802 - උඩුගම පොළ - රු. 240.00
IV. 2810125104 - දීප්ති පෙර පාසල - රු 368.10

**02. ශ්‍රී ලංකා ටෙලිකොම් පී එල් සී**
**මැයි මස දුරකතන බිල්පත් ගෙවීම්**

I. 0912296433- ප්‍රධාන කාර්යාලය - රු 8361.85
II. 0912296537- ප්‍රධාන කාර්යාලය - රු 4668.31
III. 0912296577- මාපලගම උප කාර්යාලය - රු 516.38

**03. මොබිටෙල් පුද්ගලික සමාගම**

පුරනැගුම ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කෙටි පණිවුඩ සේවා ගාස්තු ගෙවීම - රු. 74.84

**04. සී/ස යක්කලමුල්ල විවිධ සේවා සමුපකාර සමිතිය**

**2018 මැයි මස ඉන්ධන ලබා ගැනීමේ බිල්පත්**

| | | |
|---|---|---|
| PF 7360 කැබ් රථය | ඩීසල් ලීටර් 600 ක | - රු.62320.00 |
| LL 7103 ටිපර් රථය | ඩීසල් ලීටර් 300 ක | - රු. 31020.00 |
| LL 7650 කෘෂ කැබ් | ඩීසල් ලීටර් 48 ක | - රු. 5232.00 |
| RD 1637 ට්‍රැක්ටරය | ඩීසල් ලීටර් 40 ක | - රු. 4360.00 |
| 252-6478 කැබ් රථය | ඩීසල් ලීටර් 230 ක | - රු 23250.00 |
| RD 9457 ට්‍රැක්ටරය | ඩීසල් ලීටර් 73 ක | - රු. 7677.00 |
| ඩෙංගු වැඩසටහන සඳහා පෙට්‍රල් ලීටර් 10 ක | | - රු. 1370.00 |
| ගබඩාවට | ඩීසල් ලීටර් 02 | - රු. 274.00 |

**05. ලේකම් , නාගොඩ ප්‍රාදේශීය සභාව**

I. මුදල් ප්‍රතිපූර්ණය කිරීම
- LL 7650 කෘෂ කැබ් රථයේ ආදායම් බලපත්‍රය ලබා ගැනීම - රු. 6600.00
- LL 7366 බවුසරයේ ආදායම් බලපත්‍රය ලබා ගැනීම - රු. 7700.00
- තාක්ෂණ ඇගයීම් කමිටුව සඳහා සහභාගී වු නිලධාරීන් සඳහා ගෙවීම - රු. 3000.00

**06. ගමන් වියදම් ගෙවීම්**

**2018 මැයි**

I. ඩී. එන්. ඩී. පලිහවඩන මිය - රු. 512.00
II. දිලිනි දිසානායක මිය - රු. 570.00
III. එච්. පී. මල්කාන්ති මිය - රු. 940.00
IV. යූ. පී. උපනාම මයා - රු.2024.00

**2018 ජුනි**

I. ඩී. එන්. ඩී. පලිහවඩන මිය - රු. 267.00
II. දිලිනි දිසානායක මිය - රු. 952.00
III. එස්. කේ. මල්ලවආරච්චි මයා - රු.2229.00
IV. එන්. පී. ගීතා රංජනී මිය - රු. 1572.00
V. එම්. ඒ. ඩිලානි චන්ද්‍රප්‍රභා මෙය - රු. 874.00
VI. බී. ඩී. රුවිනි චතුරිකා මෙය - රු. 1048.00
VII. ටෙක්ලා මනෝජනි මිය - රු. 524.00
VIII. ඒ. එච්. පී. සංජීව මයා - රු. 524.00
IX. කේ. පී. ජයනි මිය - රු. 1048.00
X. අවන්ත පද්ම මයා - රු. 1044.00
XI. ඩබ්. ජේ. ඒ. ශානක මයා - රු. 275.00
XII. පී. පී. පී. ශ්‍රීණිකා මෙය - රු. 524.00
XIII. එම්. කේ. ශීලා රංජනී මිය - රු. 524.00
XIV. එච්. පී. මල්කාන්ති මිය - රු. 1952.00
XV. යූ. පී. උපනාම මයා - රු. 1572.00
XVI. එම්. ඒ. වසන්ත මයා - රු. 525.00
XVII. පී.එල්.උපුල් ධර්මසිරි මයා - රු. 524.00
XVIII. ඩබ්.පී.දයානන්ද මයා - රු. 524.00

**2018 ජූලි**

I. එස්. කේ. මල්ලවආරච්චි මයා - රු. 301.00

**07. පරිවර්ථිත ගමන් වියදම් 2018 ජුනි**

I. දිලිනි දිසානායක මිය - රු. 4000.00
II. කේ. පී. ජයනි මිය - රු. 2920.00

III. කුසල් අසංක එදිරසිංහ මයා - රු. 4000.00
IV. එස්. එම්. වැලිවිටිගොඩ මයා - රු. 4000.00
V. අයි.චතුරි චින්තිකා මිය - රු. 2995.00

**පරිවර්ථිත ගමන් වියදම් 2018 මැයි**

I. ඩී. එන්. ඩී. පලිහවඩන මිය - රු. 3000.00
II. දිලිනි දිසානායක මිය - රු. 4000.00
III. අයි. චතුරි චින්තිකා මිය - රු. 2928.00

**08. අතිකාල දීමනා ගෙවීම්**

**2018 මාර්තු**

I. සම්පත් සංජීව මයා - රු. 8250.00

II. එන්. එම්. රජිත මයා - රු. 4343.75

**2018 මැයි**

I. ඩබ්. කේ. සම්පත් සංජීව මයා - රු. 7500.00

**2018 ජුනි**

I. ඒ. එච්. පී. සංජීව මයා - රු. 4800.00

II. එම්. ඒ. වසන්ත මයා - රු. 7034.00

III. බී. පී. පියතිලක මයා - රු. 7034.00

**09. එච්. ඩබ්.පී. අමරනාත් මයා , ම.සෞ.ප.**

ආහාර පනතේ නඩු සඳහා බද්දේගම මහේස්ත්‍රාත් අධිකරණයට යාම හා ඒම වෙනුවෙන් ගෙවීම් (2018.06.08) - රු. 354.00

**10. ගෙස්ටෙට්නර් ඔෆ් සිලෝන් පී එල් සී**

MP 2001 L ඡායා පිටපත් යන්ත්‍රයේ ටෝනර් කාට්ලේජ් 2 ක් මිළදී ගැනීමේ බිල්පත පියවීම (2018.06.14) - රු.14790.00

**11. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව**

විගණකාධිපති දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු හිග විගණන ගාස්තු මුදලින් කොටසක් ගෙවීම - රු.10000.00

**12. මාපලගම පැරණි කඩ කාමර 1 වෙනුවෙන් කල ටෙන්ඩර් තැන්පතු මුදල් ආපසු ගෙවීම**

I. පී. කේ. වීරසිංහ මයා - රු. 5000.00

**13. දයානි පුද් සමාගම, මාපලගම**

උක්ඕවිට පෙර පාසලේ වැසිකිලියහ ා එහි වල සෑදීම සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීමේ බිල්පත පියවීම (2018.06.20) - රු. 5100.00

**14. අතුකෝරල ඉලෙක්ට්‍රිකල්ස්, පිටිගල**

වීථි පහන් සඳහා CFL බල්බ් මිළදී ගැනීමේ බිල්පත පියවීම. (2018.06.07) - රු.132000.00

**15. කෙත්සිරි කමියුනිකේශන්, තල්ගස්වල**

පුස්තකාල දඩ මුදල් බිල් පොත් සහ වාර්ෂික බදු අය කිරීම් සඳහා යවන සිහි කැඳවීම් ලිපි මුද්‍රණය සඳහා බිල්පත පියවීම (2018.06.24) - රු. 7050.00

**16. එච්. එල් කේ ශ්‍රීනිත් රුක්ෂාන් උඩුගම**

උඩුගම මහජන පුස්තකාලයට පුවත් පත් සැපයීම වෙනුවෙන් ගෙවීම
2018 ජුනි - රු 4280.00

**17. බී. ජේ. කරුණාරත්න, මාපලගම**

මාපලගම මහජන පුස්තකාලයට පුවත් පත් සැපයීම වෙනුවෙන් ගෙවීම

2018 අප්‍රේල් - රු.3810.00

2018 මැයි - රු 3860.00

**18. එම්. ඒ. සිරිපාල මාපලගම**

මාපලගම මහජන පුස්තකාලයට පුවත් පත් සැපයීම වෙනුවෙන් ගෙවීම

| | |
|---|---|
| 2018 අප්‍රේල් | - රු.2695.00 |
| 2018 මැයි | - රු 2025.00 |

**19. නීතිඥ හේමන්ත පී. ඩබ්. විතාරණ මයා, කොටුව, ගාල්ල**

I. නඩු අංක P 14658 දරණ නඩුව වෙනුවෙන් 2018.06.26 දින පෙනී සිටීමේ හා සටහන් ගාස්තු ගෙවීම - රු. 5500.00

**20. මුතුහෙට්ටිගම ටයර් සර්විස් ඇන්ඩ් මෝටර් ස්ටෝර්ස්**

I. LL 7103 ටිපර් රථයේ DS 40 ඔයිල් ලීටර් 5 ක් ලබා ගැනීමේ බිල්පත (2018.04.02) - රු. 3190.00

II. 252-6478 රථයට බ්‍රේක් ඔයිල් දැමීමේ හා වාහන සේදීමේ බිල්පත (2018.06.08) - රු. 750.00

**21. මුතුහෙට්ටිගම සේවා ස්ථානය, උඩුගම**

- LL 7103 ටිපර් රථයේ සෝදා තෙල් ඇල්ලීමේ බිල්පත පියවීම (2018.04.12) - රු. 4360.00
- 252-6478 කැබ් රථය සේවා කිරීමේ බිල්පත පියවීම (2018.06.30) - රු.13640.00

**22. නිව් විජය මෝටර්ස්, ගාල්ල**

PF 7360 කැබ් රථයේ ටයර් රෙපෙයාර් කිරීමේ බිල්පත (2018.05.09) - රු. 1500.00

**23. යුනයිටඩ් මෝටර්ස් ලංකා පී එල් සී, මාතර**

PF 7360 කැබ් රථයේ කැබින් ලොකරයේ ලොක් එක සවි කිරීමේ බිල්පත - රු. 10698.29

**24. එදිරිසිංහ මෝටර්ස්, උඩුගම**

252- 6478 කැබ් රථයේ අළුත්වැඩියා කිරීමේ බිල්පත (2018.06.07) - රු. 3350.00

**25. එම්. ඒ. ආරියවංශ මෝටර්ස්, නාගොඩ**

252-6478 කැබ් රථය අළුත්වැඩියා කිරීමේ බිල්පත (මෝටරය, ටර්මිනර් එක හා පිටුපස ටෙන්ට් එක සෑදීම) (2018.05.11) - රු. 850.00

**26. පී. පී. සදුන් චතුරංග, මාපලගම**

- HP 78 A වර්ගයේ ටෝනර් කාට්‍රිජ්ජයක් මිළදී ගැනීමේ බිල්පත - රු. 10250.00
- ප්‍රධාන කාර්යාලයේ පරිගණක සඳහා වෛරස් ගාඩ් මෘදුකාංගය ඇතුළු කිරීමේ බිල්පත - රු. 6800.00
- පරිගණක සඳහා Windows 7 OS එක හා අනිකුත් මෘදුකාංග ඇතුලත් කිරීමේ බිල්පත - රු. 2000.00

**27. ලක්දිව් එන්ටර්ප්‍රයිසස්, කොට්ටවගම**

වීථි පහන් අළුත්වැඩියා කටයුතු සඳහා විදුලි උපකරණ ලබා ගැනීමේ බිල්පත පියවීම (2018.06.25) - රු. 21900.00

**28. එස්. බී. ප්‍රින්ටර්ස් පුද්. සමාගම, මිගමුව**

ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය මුද්‍රිත ලේඛන ලබා ගැනීමේ බිල්පත පියවීම (2018.05.18) - රු. 17970.00

**29. සී/ස බද්දේගම බ. ප්‍රාදේශීය සංවර්ධන සමූපකාර සමිතිය, පුහුල්දූව**

උක්ඕිට පෙර පාසලේ වැසිකිළිට අවශ්‍ය අගල් 40 X 18 දැල් රහිත කොලර් හා කොලර් පියන් ලබා ගැනීමේ බිල්පත (2018.06.20) - රු. 10670.00

**30. සදර්න් ඩිජිටල් ප්‍රින්ටන් ඇන්ඩ් ඇඩ්වර්ටයිසින්, ගාල්ල**

නාගොඩ මාපලගම හා උඩුගම මහජන පුස්තකාල සඳහා සාහිත්‍ය නිර්මාණ තරගාවලිය පිළිබද ප්‍රජාව දැනුවත් කිරීමේ බැනර් 03 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් මුදල් ගෙවීම - රු, 3375.00

**31. ජනිත් ලී මෝල,උඩුගම**

LL 7103 ටිපර් රථය කසල ගෙන යාමේදී එරීම හේතුවෙන් එය ගොඩගැනීම සඳහා බූම් රථය යොදා ගැනීමේ බිල්පත (2018.04.30) - රු. 6000.00

**32. කග්ගොඩආරච්චි මෝටර්ස්, බටපොළ**
LL 7103 දරණ ටිපර් රථය අළුත්වැඩියා කිරීමේ බිල්පත පියවීම (2018.06.20) - රු. 30770.00

<u>රජයේ ආධාර</u>

**33. උඩුගම නැගෙනහිර ගොවි සංවිධානයේ ගිණුම් අංක 131200110019620 ට බැර**

අලුත්වත්ත ග්‍රාම නිලධාරී වසමේ මිරිස්කන්ද මාර්ගය හියුම් පයිප්ප යොදා සංවර්ධනය කිරීම කර්මාන්තයේ පළමු හා අවසාන ගෙවීම - රු.435457.11

- **නාගොඩ ප්‍රාදේශීය සභාවේ අපදා කළමනාකරණ සැලැස්ම මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට ඉදිරිපත් කල අතර එය කමිටුව මගින් නිර්දේශ කරන ලදී.**

- **මුදල් හා ප්‍රතිපත්ති කමිටුවට ඉදිරිපත් කල ඉහත අංක 1 සිට 33 දක්වා වූ ගෙවීම් වවුචර් අතරින් අංක 31 වවුචර්ය වන ජනිත් ලී මෝල ,උඩුගම යන ගෙවීම කමිටුව මගින් අනුමත නොකල අතර අනෙකුත් ගෙවීම් සඳහා මුදල් හා ප්‍රතිපත්ති කමිටු නිර්දේශය ලබා දුනි.**

**මුදල් කමිටු වාර්තා සම්බන්ධව පළ වූ අදහස්,**

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්, මුදල් ගෙවීම් මුදල් කමිටු වාර්තා, ඇස්තමේන්තු , මිළ ගණන් මන්ත්‍රීවරුන් සියළු දෙනාට ඉදිරිපත් කරලා තියෙන්නේ. මේවා යෝජනා ස්ථිර කර ගන්න. මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාව සම්මත කර ගන්න. මේකෙ 31 වන බිල්පත මුදල් කමිටුවේ අනුමත වුනේ නැහැ. ඒකෙ කාරණය වුනේ අපේ කුණු ගෙනිහිපු වාහනේ කුණු වල ගාව ඉරිලා. ට්‍රැක්ටරයෙන් අදින්න හදලා බැරුව ලේකම්තුමියට දැනුම් දීලා තියෙනවා. ලේකම්තුමිය උපදෙස් දීලා තියෙනවා මේ සම්බන්ධව තාක්ෂණ නිලධාරී දැනුවත් කරන ලෙස. මේ වාහනයේ රියදුරු ඉදලා තියෙන්නේ දිසානායක. ඔහු ලේකම්තුමියට කියලා තියෙන්නේ බූම් එක ගේන්න ඕන කියලා. මේ කාරණය සම්බන්ධව තාක්ෂණ නිලධාරී දැනුවත් වෙලා නැහැ. නමුත් බූම් එක ගෙනැල්ලා ඇදලා අරගෙන තියෙනවා. මේකට අදාල ෆොටෝ එහෙමත් ගෙනැල්ලා පෙන්නුවා.

ඒ සම්බන්ධව ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා අදහස් දක්වමින්, ගරු සභාපතිතුමනි, මුදල් කමිටුවෙදි අනුමැතිය දෙන්න අකැමැති වෙන්න හේතුව අය කරපු ගණන වැඩි නිසා. ඔය කියන ආයතනය තියෙන්නේ ජැක් 4 බූම් එකක්. ඒක ගනිපු අපේ සේවක මහත්තයා අපි දීපු උපදෙස් පිලිපදින්නැතුව කමයි

කටයුතු කරලා තියෙන්නෙ. මෙය සිදුවෙලා තියෙන්නේ ඉරිදා දවසක මේක අනුමත නොකරන්න හේතුව තමයි. ලේකම්තුමියගේ උපදෙස් මත තාක්ෂණ නිලධාරීතුමිය දැනුවත් නොකර කටයුතු කිරීම. අපි මේ සිදුවීමේදී දකින්නේ ආයතනයේ නිලධාරීන් ගනන් ගන්නෙ නැහැ වගේ කියන මතය. කොහොම වුනත් ඒ කටයුත්තෙදි තාක්ෂණ නිලධාරීතුමියගේ සහය ලබාගෙනත් නැහැ. දැනුවත් වීම් සිදුවෙලත් නැහැ. ඒ නිසා තාක්ෂණ නිලධාරීතුමිය මේක ගෙවන්න කැමැත්ත පළ කලේ නැහැ. එබැවින් අපි මුදල් කමිටුව හැටියට සභාපතිතුමත් ඇතුළුව එක තීරණයක හිටියා. මොකද එම මුදල ලබා දෙන්න අපහසුයි.

මේ සම්බන්ධව ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා , ඉරිදත් පිරිසිදු කිරීම් කටයුතු කරනවද මෙය සිදු වෙලා තියෙන්නේ නිවාඩු දවසක නේද ? නිවාඩු දවසක කොහොමද සභාවෙ වාහනේ වැඩ කළේ. යනුවෙන් විමසීමේදී ගරු සභාපතිතුමා විසින් පිළිතුරු ලබා දෙනුයේ නෑ මේ සඳුදා දවසක්. 30 වෙනිදා සඳුදා නිවාඩු දිනයක්. සාමාන්‍යයෙන් සතියේ නිවාඩු දිනවල පිරිසිදු කිරීම් කටයුතු සිදුකරනවා. වසන්ත මහතා විමසූ පරිදි මුදල් කමිටු වාර්තාවේ අංක 32 යටතේ අළුත්වැඩියා කල වාහනය සභාවෙ ලොකු ට්‍රක් රථය බව ගරු සභාපතිතුමා විසින් දන්වන ලදී.

ඒ සම්බන්ධව ගරු මන්ත්‍රී අජිත් මහතා අදහස් දක්වමින්, රියදුරුත් අමාරුවෙ නොදා ඒ ගොල්ලන්නෙ දන්නෙ මේක වුනාද නැද්ද කියන එක. සමහර විට නිවාඩු දවසක් නම්, ලේකම්තුමියත් දැනුවත් කරා නම්, තාක්ෂණ නිලධාරී දැනුවත් කරන්න ගියාට ඒකක රගන්න බැරිවෙන්නැති. එහෙමයි කියලා එතන වාහනේ දාලා එන්නත් බැහැ. සමහර විට දුරකතන වැඩකරන්නෙත් නැහැ. අනිත් එක පාරේ මේක දාලා එන්නත් බැහැ. තාක්ෂණ නිලධාරී සම්බන්ධ කරගන්න බැරිවුනයි කියලා ඔවුන්ට දොස් කියන්නත් බැහැ. ඇත්තටම සත්භාවයෙන් කරලා තියෙනවනම්, එහෙම ඒවා වෙනවා ඕන තරම්.

නැවත ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා විමසූ පරිදී, අපි අහන්නෙ කුණු ඇද්දා නම් ඒ කොහේද, මාපලගමද, තල්ගස්වලද, උඩුගමද කියලා. කොහේහරි වාහනය අදාල රාජකාරිය කරන්න ඇතිනෙ. ඒක නිවාඩු දවසෙ කලේ අත්‍යවශ්‍ය කාරණයක් නිසා වෙන්න ඇති. නිවාඩු දවසෙත් වැඩ කලාද කියලයි දැනගන්න ඕන. ගරු සභාපතිතුමා එයට පිළිතුරු දෙමින්, ඔව් ඔව් ඒක කුණු අරගෙන ගිහිල්ලා වලට දානකොට ඒ වල ළග තමයි එරිලා තියෙන්නේ. මේකෙ ප්‍රශ්නෙ තියෙන්නෙ. මේකෙ ප්‍රශ්නෙ වුනේ ලේකම්තුමියට දැනුම් දුන්නම කියලා තියෙනවා. තාක්ෂණ නිලධාරී වාර්තාව අර ගෙන කරන්න කියලා. මේක සත්භාවයෙන් කලාට තාක්ෂණ නිලධාරී වාර්තාව නැති එක තමයි ප්‍රශ්නෙ වුනෙ.

ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා නැවතත් කතා කරමින්, ගරු සභාපතිතුමනි, ඇත්තටම අපිට පැහැදිලි වුනේ නැහැ. අපේ අජිත් මන්ත්‍රීතුමා කිව්වෙ මොකද්ද කියන එක. අපි අකමැති වුනේ වෙන හේතුවක් නිසා. අපේ නිලධාරී මහත්වරු සේවය කරන කොට ඒ සේවය යම් කෙනෙකුට භාර දීලා තමයි යවන්නෙ. එයා රියදුරෙක් වශයෙන් යන කොට ගෝලයා වාහනේ අරන් ගිහින් හැප්පුවත් ගෙවන්න වෙනවා. මෙතන අපි කාර්මික නිලධාරියෙක් යොදවල තියෙන්නෙ එතන කටයුතු සොයා බලන්න. එතනදි අපි කලේ වැරැද්දක්ද දන්නෙ නැහැ. පළමුවෙන්ම මම කිව්වෙ අනේ මේ මනුස්සයගේ පඩිය කීයද දන්නෙ නැහැ කියලා. මොකද රු. 6000.00 ක් 8000.00 ක් ගෙවන්න වුනොත් එහෙම පස්සෙ හොයල බලනකොට තාක්ෂණ නිලධාරීගේ සහය පතන්නෙ නැතුව මේ කටයුතු සිදු කල නිසා තමයි අකමැති වුනේ. මේ රියදුරු කවුද කියලවත් මම දන්නෙ නැහැ.

මේ සම්බන්ධව ගරු මන්ත්‍රී අජිත් මහතා, සියල්ල හොයාගන්න එක සියළු දෙනාගෙ සෞඛ්‍යයට හොදයි. හැබැයි ඕක ඔය විදියටම කරන්න යන එක සමහර වෙලාවට ප්‍රායෝගික නැහැ.

ගරු මන්ත්‍රී තරංග මහතා අදහස් දක්වමින් ගරු සභාපතිතුමනි, මේ මුදල් කමිටුවට මමත් ඉන්නවා. කමිටුවට ලියුම හම්බවුනේ කමිටුව තියෙන දවසෙ උදේ. ඉතින් කොහොමද මේකට සහභාගි වෙන්නෙ. නමුත් ඔබතුමා ලියුම අත්සන් කරලා තියෙන්නෙ ඊට දවස් 5,6 කට කලින්. මේ නිලධාරීන් ඒ දක්වා මොකද්ද කරන්නේ. අපිට අඩුම ගානෙ, ඔබතුමාම කිව්වා මොකක්හර් වෙබ් සයිට් එකක් තියෙනවයි අපිට ඒ හරහා ආරධනා කරන බවයි. නමුත් අඩුම ගානේ දුරකථන ඇමතුමක් හරි දීලා කියන්න පුලුවන්නේ මේ දිනයට මුදල් කමිටුව තියන්න තීන්දු කළා කියලා.

ගරු සභාපතිතුමා :- මම ඔබතුමාට කතා කලානේ.

ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා වැඩි දුරටත් අදහස් ප්‍රකාශ කරමින් ඔබතුමා මට කතාකලේ සභාවට ඇවිල්ලනේ. මුදල් කමිටුවට වාඩිවෙලා මම පරක්කුවට හොයනවා. එදා තමයි මට ලියුම හම්බවුනේ. එතකොට මේකෙ නිලධාරී මොකද්ද කරන්නේ.

ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා අදහස් ප්‍රකාශ කරමින්, ගරු සභාපතිතුමනි, මුදල් හා ප්‍රතිපත්ති එකේ අතිකාල ගෙවීම් සම්බන්ධයෙන් 2018 මාර්තු සංජීව සම්පත් කියලා රු. 8250.00 ක් තියෙනවා. ඒක අනුමත පැය 80 ක්ද, එතැන පොඩි ගැටලුවක් තියෙනවා. වැටුපෙ හැටියට මෙච්චර වෙන්න විදියක් නැහැ. මොකක්හරි වැරදීමක්ද. දෛනික වැටුප වුනත් හරි 8250.00 හදල බලන්න. අනිත් එක මේ නම් සඳහන් කරද්දි තනතුර සඳහන් කරන්න මේකෙ නම තියෙන්නෙ සංජීව සම්පත් කියලා. මම කියන්නෙ පුද්ගලයා සම්බන්ධව නෙමෙයි. මුදල් වාර්තා ඉදිරිපත් කරනකොට නමයි, තනතුරයි දාන්න ඕන. මේවා වෙනම කාලයකදී ඉතාම වැදගත් අත්‍යවශ්‍ය දේවල්.

ගරු මන්ත්‍රී සී. වී. සහබන්දු මහතා මොහුගේ තනතුර කුමක්ද කියා ඇසූ ප්‍රශ්නයට ගරු සභාපතිතුමා පිළිතුරු දෙමින්, සම්පත් සංජීව කියන්නේ රියදුරු

ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා :- මේකෙ ගැටලුව තියෙන්නෙ, ගෙවන පැය ගණන තියෙනවනම් ගැටලුවක් නැහැ. මෙන්න මෙපමණ ගානක් ගෙවලා තියෙනවයි කියන එක. මෙතන මේක හරි ඇති. මේ වාර්තාව පැහැදිලි නැති හින්දා, නමයි, තනතුරයි ඒ ටික පැහැදිලිව ඉදිරිපත් කරන්න. එතකොට ගැටලුවක් නැහැ. නැතිව ඒක අනුමත කරන්න එපයි කියන එක නෙමේ. ඕක ගෙවීම සම්බන්ධව කිසිම ගැටලුවක් නැහැ. ගණනය කිරීමේ ගැටලුවක් තියෙන බව පේනවා. මගේ දැනීමේ හැටියට මම හිතනවා එහෙම. මේ 8250.00 දෛනික වැටුපද. එයාගෙ වැටුප කීයද. දෛනිකව කීයක් ගෙවනවද.

ගරු සභාපතිතුමා :- ඉදිරියෙදි ඒ ගැටලුව නිරාකරනය කරලා දෙන්නම්. මෙයාගෙ දෛනික වැටුප රු. 750.00යි.

ගරු මන්ත්‍රී සී. වී. සහබන්දු මහතා :- ගරු සභාපතිතුමා එයා ස්ථිර රියදුරුද, මුරකරුද මෙයා ස්ථිර අයෙක්ද, ආදේශකද ඔබතුමාගෙ රියදුරුද, ඔබතුමාගෙ රියදුරු නම් සාමාන්‍යයෙන් පැය ගණන වැඩිවෙනවා . ඒකයි ඇහුවෙ. එතකොටෙ මෙයා මොකකද වැඩ කරන්නෙ.

ගරු සභාපතිතුමා :- මෙයා ආදේශක රියදුරු මගේ රියදුරු නොවෙයි. මගේ රියදුරු වසන්ත සංජීව කුණු ට්‍රැක්ටරයේ යනවා,කෘෘ කැබ් එකේ යනවා. ආදේශක වුණාම හැම වාහනයේම යනවා.

ගරු මන්ත්‍රී වසන්ත මහතා :- ගරු සභාපතිතුමා මට පොඩි ප්‍රශ්නයක් අහන්න තියෙනවා. මේකෙ නම් 3 ක් තියෙනවා. සම්පත් සංජීව, ඩබ්. කේ. සම්පත් සංජීව, ඒ. එච්. පී. සංජීව කියලා. මේ තුන්දෙනෙක්ද, එක්කෙනෙක්ද?

එයට පිළිතුරු දුන් ගරු සභාපතිතුමා, දෙදෙනෙක්, එතකොට ඔය 8250.00 වැරදිද කියා විමසූ විට ගරු මන්ත්‍රී ලක්රුවන් මහතා කියා සිටියේ නෑ ඒක අනුමත කරමු. සංශෝධන වලට යටත්ව මුදල් හා ගෙවීමේ සියළු යෝජනා අනුමත කිරීමට යෝජනා කරමි. ගරු මන්ත්‍රී වී. වී. සහබන්දු මහතා ඒ සියළුම යෝජනා ස්ථිර කරන ලදී.

**9.3 ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම**

| ඇස්තමේන්තුව | මුදල රු. |
|---|---|
| 01. ජනඋද්‍යානගම මැදපාර මැණික්කඩේ අසළ සිට මාර්ගය සංවර්ධනය කිරීම | 25000.00 |

02. කොළඹ කඩේ හංදියේ සිට කුඹුරුහේන මාර්ගයේ බෝක්කුවෙහි කැඩී ගිය
පැති බැම්ම සකස් කිරීම 260,000.00

03. දකුණු පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය මගින් මාපලගම
පොදු වැසිකිළිය ඉදි කිරීම 3,000,000.00

**ඉහත ඇස්තමේන්තු සඳහා සභාවේ එකගතාව පළ වූ අතර එම යෝජනා සභා සම්මත විය.**

## 9.4 මිළ ගණන් ඉදිරිපත් කිරීම

**01. වායු සමන යන්ත්‍ර සවි කිරීම සඳහා ලැබී ඇති මිළ ගණන්**

| **විස්තරය** | **කූල් ටෙක් ඉන්ජිනියරින්, ගාල්ල** |
|---|---|
| වායු සමන යන්ත්‍ර සවි කිරීම | රු. 294,000.00 |

මේ අනුව මිලගනන් ලැබී ඇත්තේ **කූල් ටෙක් ඉන්ජිනියරින්, ගාල්ල** ආයතනයෙනි. එම අයගෙන් සේවාව ලබා ගැනීම සඳහා ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා විසින් යෝජනා කළ අතර ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා හා ගරු මන්ත්‍රිනි ප්‍රියන්තා ගුණසේකර විසින් ස්ථිර කරන ලදි. ඉන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය

**02. නාගොඩ ප්‍රාදේශීය සභාවට අවශ්‍ය උපකරණ මිළගණන්**

| | **සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ( විවිධ) නීතිගත සංස්ථාව,** |
|---|---|
| DB 328 Brush Cutter | රු. 16,300.00 |
| BG 305 HUNTER BUSH CUTTER | රු. 14711.71 |

මේ අනුව මිලගනන් ලැබී ඇත්තේ **සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ( විවිධ) නීතිගත සංස්ථාව** ආයතනයෙනි. එම අයගෙන් සේවාව ලබා ගැනීම සඳහා යෝජනා කරමින් ඒකමතිකව සභා සම්මත විය

**2018/07/06 දින මුදල් කමිටුවට ඉදිරිපත් කරන ලද මිළ ගණන්වල සාරාංශය හා ඒ පිළිබඳ කමිටු තීරණ ඇතුලත් වාර්තාව**

01. ප්‍රධාන කාර්යාලයේ සවි කර ඇති ඇඟිලි සලකුණු යන්ත්‍රය ක්‍රියා විරහිත වීම නිසා එය නැවත අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත නොහැකි තත්වයේ පවතින බැවින් ඒ වෙනුවට, අලුතින් ඇඟිලි සලකුණු යන්ත්‍රයක් ගෙන්වීමට අනුමැතිය ලැබුනි. ඒ සඳහා ලැබී ඇති මිළ ගණන් මෙසේය.

| **ආයතනය** | **මිළ රු.** |
|---|---|
| ගෝල් අයි. ටී. සොලියුෂන්, ගාල්ල | 24900.00 |
| කම්පියුටර් සිටි, වක්වැල්ල | 32500.00 |
| ඊ ඩේටා සොලියුෂන්, ගාල්ල | 35000.00 |

මෙහිදී අඩුම හා හොඳම මිළ ගණන් ඉදිරිපත් කල ගාල්ල, ගෝල් අයි. ටී. සොලියුෂන් වෙතින් එම යන්ත්‍රය මිළදී ගැනීමට තීරණය කරන ලදී.

02. පරිගණක ප්‍රින්ටරයක් මිළදී ගැනීම වෙනුවෙන් ලැබී තිබූ මිළ ගණන් මෙසේය.

| **ආයතනය** | **මිළ රු.** |
|---|---|
| ශ්‍රී වීවී කම්පියුටර්, වදුරඹ | 16900.00 |
| රුචිර කම්පියුටර්, නාගොඩ | 15100.00 |
| ඊ බේස් කම්පියුටර්, මාපලගම | 14500.00 |

මෙහිදී අඩුම හා හොඳම මිළ ගණන් ඉදිරිපත් කල මාපලගම, ඊ බේස් කම්පියුටර් වෙතින් එම උපකරණය මිළදී ගැනීමට තීරණය කරන ලදී.

03. PF 7360 දරණ කැබ් රථයේ අළුත්වැඩියා කටයුතු සිදු කිරීම වෙනුවෙන් කර තිබූ ඉල්ලීමට අනුව ඒ සඳහා සේවා නියෝජිත ආයතනය වන මාතර යුනයිටඩ් මෝටර්ස් වෙතින් එම කාර්යය සිදු කිරීමට තීරණය විය.

04. කාර්යාලයීය අවශ්‍යතාවය මත ගෘහභාණ්ඩ ගෙන්වීම සඳහා මිළ ගණන් ඉදිරිපත් වී තිබුණි.

| **ආයතනය** | **ලිපිකරු ලියන මේසය මිළ රු.** | **ලිපිකරු පුටුව මිළ රු.** | **පරිගණක මේසය මිළ රු.** |
|---|---|---|---|
| දම්රෝ ප්‍රදර්ශනාගාරය, උඩුගම | 12757.50 | 8977.50 | 5197.50 |
| සහන් ට්‍රේඩර්ස්, යක්කලමුල්ල | 10950.00 | 8150.00 | 5900.00 |
| සිංහගිරි ෆර්නිචර්, උඩුගම | 9900.00 | 7600.00 | 4850.00 |

මෙහිදී අඩුම හා හොඳම මිළ ගණන් ඉදිරිපත් කල සිංහගිරි ෆර්නිචර්, උඩුගම වෙතින් එම උපකරණ මිළදී ගැනීමට තීරණය කරන ලදී.

05. 2018 වර්ෂයට අවශ්‍ය ලිපිද්‍රව්‍ය මිළදී ගැනීමේදී අඩුම මිළ ගණන් ඉදිරිපත් කල ගාල්ල, පැරගන් ස්ටේෂනර්ස් වෙතින් මිළදී ගැනීමට තීරණය කරන ලදී.

06. සභාපති නිල කාමරයේ තැබීමට අවශ්‍ය කාර්යාලයීය අල්මාරිය සඳහා මිළ ගණන් 03 ක් ලැබී තිබුණි.

| **ආයතනය** | **කාර්යාලීය අල්මාරිය (වීදුර රහිත)** මිළ රු. | **කාර්යාලීය අල්මාරිය (වීදුර සහිත)** මිළ රු. |
|---|---|---|
| දම්රෝ ප්‍රදර්ශනාගාරය, උඩුගම | 19057.50 | 29677.50 |
| හසාරා එන්ටර්ප්‍රයිසස්, ගාල්ල | 18500.00 | 25500.00 |
| සිංහගිරි ෆර්නිචර්, උඩුගම | 15750.00 | 20900.00 |

මෙහිදී අඩුම හා හොඳම මිළ ගණන් ඉදිරිපත් කල සිංහගිරි ෆර්නිචර්, උඩුගම වෙතින් එම උපකරණය මිළදී ගැනීමට තීරණය කරන ලදී.

07. 252-6478 කැබ් රථයේ මඩ කවර හා කාපට් සඳහා මිළ ගණන් කැඳවා තිබුණි.

| **ආයතනය** | **මඩ කවර සෙට්** | **කාපට් සෙට්** |
|---|---|---|

| | මිළ රු. | මිළ රු. |
|---|---|---|
| ග්‍රීන් සිටි, කරාපිටිය | 2200.00 | 3600.00 |
| ෆෝඩ් මෝටර්ස්, ගාල්ල | 2000.00 | 3650.00 |
| ෆෝඩ් ඩ්‍රයිව්, ගාල්ල | 1900.00 | 3500.00 |

මෙහිදී අඩුම හා හොදම මිළ ගණන් ඉදිරිපත් කල ෆෝඩ් ඩ්‍රයිව්, ගාල්ල වෙතින් එම උපකරණය මිළදී ගැනීමට තීරණය කරන ලදී.

08. PF 7360 කැබ් රථයේ අළුත්වැඩියා කටයුතු සදහා ලැබී ඇති මිළ ගණන් මෙසේය.

| ආයතනය | ස්ටීරියන් කවර් මිළ රු. | එයාර් ෆ්‍රෙෂ්නර් මිළ රු. | වොෂින් ක්ලෝත් මිළ රු. | රබර් ලේන්සුව මිළ රු. |
|---|---|---|---|---|
| යුමා මෝටර්ස්, යටවත්ත | 1100.00 | 1250.00 | 600.00 | 800.00 |
| ෆෝඩ් මෝටර්ස්, ගාල්ල | 1200.00 | 1250.00 | 500.00 | 750.00 |
| ෆෝඩ් ඩ්‍රයිව්, ගාල්ල | 1000.00 | 1100.00 | 500.00 | 750.00 |

මෙහිදී අඩුම හා හොදම මිළ ගණන් ඉදිරිපත් කල ෆෝඩ් ඩ්‍රයිව්, ගාල්ල වෙතින් එම උපකරණය මිළදී ගැනීමට තීරණය කරන ලදී.

09. මාපලගම නිදහස් ආයුර්වේදයේ අත්‍යවශ්‍ය ඖෂධ ලබා ගැනීමට කර තිබූ ඉල්ලීමට අනුව එම ද්‍රව්‍ය ආයුර්වේද ඖෂධ සංස්ථාව, ගාල්ල ශාඛාවෙන් ගෙන්වීමට තීරණය කරන ලදී.

10. සභාව සතු වාහන සේදීමට High Pressure pump QL 280-1 සදහා ලැබී තිබූ ඉල්ලීමට අනුව රජයේ ආයතනයක් වන සී/ස ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව මගින් එම උපකරණ මිළදී ගැනීමට තීරණය කරන ලදී.

**මිළ ගණන් පිලිබද අදහස් දක්වමින්,**

ගරු සභාපතිතුමා ඒ පිළිබදව අදහස් දක්වමින් ප්‍රකාශ කර සිටියේ, පසුගිය සභාවෙන් යෝජනා වුණා. සභා රැස්වීම් ශාලාව වායු සමනය කිරීම පිළිබදව ඒකට අදාළව කූල් ටෙක් ඉංජිනියරින් වෙතින් මිළ ගනන් එවලා තයෙනවා. රු. 294000.00 ක් එක මිළ ගනනයි ඇවිත් තියෙන්නෙ. ඒ වගේම ශ්‍රී ලංකා රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාවෙන් බ්‍රෂ් කටර් අයිතමයන් සම්බන්ධව මිළ ගනන් එවලා තියෙනවා. අපේ සම්පත් අතුකෝරල ගරු මන්ත්‍රීතුමා එවපු රු. 50000.00 ට තණකොල කපන යන්ත්‍ර ගන්න කියලා කිව්වා. අපේ සේවකයො ලවා පාරවල් ශුද්ධ කරන්න තණකොල කපන මැෂින්වල අවශ්‍යතාවයක් තියෙනවා. ඒකට තමයි මේ රජයේ වාණිජ විවිධ නීතිගත සංස්ථාවෙන් වර්ග දෙකක මිළ ගණන් එවලා තියෙන්නෙ. එකක මිළ රු. 16000.00 අනිත් එක රු. 14711.00 යි.

ඒ සම්බන්ධව රංජිත් ජයවීර ගරු මන්ත්‍රීතුමා , ගරු සභාපතිතුමනි, වායු සමනය කරන්න දෙලක්ෂ ගානක් යනවනෙ. අපි මාසකට සැරයක් මෙතැනට සහභාගි වෙන්නෙ විදුලි පංකා හයි කරා නම් ඔයිට වැඩිය හොද නැද්ද. අපි කිව්වෙ අපේ මතය විදුලි පංකා 4, 5 ක් හයි කරා නම් ඇති. එයට එකගත්වය පළ කරමින් ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා කියා සිටියේ ගරු සභාපතිතුමනි, මන් හිතන්නෙ ඒ යෝජනා වුනාට කමක් නැහැ. ඊට කලින් යෝජනා වුනා මේක කඩලා පිටිපස්සට දාන්න. මම හිතන්නෙ මේකෙ යෝජනා වෙච්ච එකක්වත් සිදු නොවුනු නිසා ඒකත් වුනාට කමක් නැහැ. විදුලි පංකාවක මිළ රු. 2500.00 ක් වගේ තමයි වෙන්නෙ. රු. 50000.00 ක් වගේ මුදලක් දෙන කොට කර ගන්න පුළුවන් යටත් කූල් වෙන්න ඕන නම් යටටත් විදුලි පංකා ටිකක් තියන්න පුළුවන්. ඇත්තටම මම කියන්නෙ මේ ගොඩනැගිල්ල කැඩෙනවනම් ලක්ෂ 03 කට ආසන්න ගාණක් අපතේ යනවා. මීට පෙර අපට අවශය වීථි පහන් ටික හදන්න ෆයිබර්

ඉඟිමග ගේන්න කිව්වා ඒකත් නැහැ. ඒ වගේ දේවල් වෙනවනම් හොදයි. මුදල් තියෙනවනම් අවශයතාවය අනුව වායුසමනය කලත් කමක් නැහැ. අපි විරුද්ධ නැහැ. මොනවහරි කරනවනම් අපිත් සතුටුයි.

ගරු මන්ත්‍රී ලක්රුවන් මහතා අදහස් දක්වමින්, විදුලි පංකාවලින් හුලං වදින්නෙ උඩට විතරයි. යට රත්වෙනවා. මම මේ කියන්නෙ සත්‍ය කතාව. සුබෝපභෝගීව ඉන්න කියනවා නෙමේ. තව ටිකක් වෙලා යන විට මේකෙ ඉන්න බැහැ.

ගරු මන්ත්‍රී අජිත් මහතා අදහස් දක්වමින්, රංජිත් ජයවීර ගරු මන්ත්‍රීතුමා කියන එක ඇත්ත ඒකට අපි ගරු කරනවා. අපට කරන්න ඊට වැඩිය වැඩ තියෙනවා. නමුත් ප්‍රශ්නෙ තියෙන්න මෙතනත් ඉන්න අමාරුයි. ඒ නිසා රැස්වීම් ශාලාව වායු සමනය කල යුතුයයි කියලා මම යෝජනා කරනවා. එයට එකග වෙමින් ගරු මන්ත්‍රී තරංග මහතා ප්‍රකාශ කර සිටියේ විදුලි පංකා වලට යන වියදමයි, වායු සමනය යන්ත්‍රයට යන වියදමයි බැලුවම ලොකු වෙනසක් නැති බවයි.

ගරු මන්ත්‍රීනී අරුණා ශාන්ති මහත්මිය , වායු සමනය කිරීම පිළිබදව අදහස් දක්වමින් සිටියදී ප්‍රියන්තා ගුණසේකර ගරු මන්ත්‍රීතුමිය අජිත් මන්ත්‍රීතුමාගේ ඒ යෝජනාව අපි ස්ථිර කරනවා. යනුවෙන් ප්‍රකාශ කල අතර ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතාද එම යෝජනාව ස්ථිර කරනවා යනුවෙන් පිළිතුරු දුනි.

ගරු උප සභාපතිතුමා අදහස් දක්වමින් ගිය වතාවෙ ඔබතුමා කිව්වා මේ බිත්තිය කඩලා පස්සට අරගෙන මේක හදනවා කියලා බොහොම අමාරුවෙන් තමයි අද මෙතනට ආවෙ. එයට පිළිතුරු දෙමින් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලද්දේ මෙතන යට ගලක් නිසා ඒ කටයුත්ත කරන්න බැහැයි කියලා දන්වලා තියෙනවා. මේ සම්බන්ධව ගරු මන්ත්‍රී අජිත් එඩේරආරච්චි මහතා අදහස් දක්වමින් ප්‍රකාශ කලේ හාරන්න බැහැ කියන කතාව බොරු මොන හේතුවක් නිසාවත් මම ඒක පිළිගන්නෙ නැහැ. ගලක් හාරලා වරායක් හැදුවනම් මේ බැරි මොකද. එයට පිළිතුරු දෙමින්, හාරන්න බැරුව නෙමෙයි තියෙන මුදල් හාරන්නම වියදම් වේවි යනුවෙන් ගරු සභාපතිතුමා අදහස් දක්වන ලදී. ගරු මන්ත්‍රී වසන්ත මහතා ප්‍රකාශ කලේ මුදල් හොයාගන්න එක ගැටළුවක් නොවන බවත්, දීර්ඝ කාලීනව අතීතයටත් බලපාන පරිදි ගොඩනැගිල්ල හදන්න ඕන.ඒකේ යට කොටස සභාවේ වාහන දාන්න අපේ බයිසිකලයක් නවත්තන්න පුලුවන් විදියට හදන්න ඕන.

ගරු සභාපතිතුමා විසින් නැවත වතාවක් හාඩිමෙක් ට්‍රැක්ටරය හයිඩ්‍රොලික් පොම්පය ගලවා සෑදීම ඔයිල් සීල් ගැසීමට අදාල බිල්පත සභාවට ඉදිරිපත් කරන ලදී. දැන් දවස් 04ක 05 ක ඉදල ලයිට් හදන ට්‍රැක්ටරය කැඩිලා.ඒක හදන්න රු. 8290.00ක මුදලක් වැයවෙලා තියෙනවා.

**එම මුදල ගෙවීමට ඒකමතිකව සභා සම්මත විය**

ගරු සභාපතිතුමා :- උප සභාපතිතුමා පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න. ලැබීම් හා ගෙවීම් වාර්තා ලිපි ගොනුව සම්මත කරලා ඉන්න. නැත්නම් මේක ඇදි ඇදි යනවා. සමාවෙන්න ලැබීම් ගෙවීම් වාර්තාව නෙමෙයි. කාරක සභා වාර්තා , මුදල් ගෙවීම්, මුදල් කමිටු , ඇස්තමේන්තු, මිළ ගණන් ඇතුලත් වාර්තා සභා සම්මත කරගන්න.

## 10. ලැබීම් හා ගෙවීම් වාර්තා

ගරු සභාපතිතුමා:- ලැබීම් හා ගෙවීම් වාර්තාව සම්බන්ධ ලිපිගොනුව මාසික ආදායම් හා වියදම් වාර්තා සියළු දෙනාට ලැබිලා ඇති. 06 වන මාසෙ 30 වෙනිදට පොදු අරමුදල් ගිණුමෙ රු. 7426594.00 ක් තියෙනවා. සේවක ණය ගිණුමෙ රු. 404220.00 ක් තියෙනවා. කර්මාන්ත ගිණුමෙ රු. 1655649.00 ක් තියෙනවා. නාගොඩ ප්‍රාදේශීය සභාවෙ ජුනි මස මාසික ඒකාබද්ධ ආදායම් සාරාංශ වාර්තාවත් අනුමත කරන්න.

ගරු මන්ත්‍රී සී. වී. සහබන්දු මහතා :- මේ සභා වාරෙ විතරක් අනුමත කරන්නම්. නැත්නම් යෝජනාව ඔයාලා ක්‍රියාත්මක කලාට කමක් නැහැ. අපි ඒකට විරුද්ධ වෙනවා. එතකොට හිතේ සතුටින් ගෙදර යන්න පුළුවන්. අපට බල්බ් නොදැම්මත්, අපේ පාරවල් නොහැදුවත් කමක් නැහැ. අද පත්තරයක් අරන් බැලුවම වෙන ප්‍රාදේශීය සභාවල්වල වෙන දේවල්, ඒ අතින් නාගොඩ ප්‍රාදේශීය සභාව ගැන සතුටුවෙන්න ඕන. ඒ සතුට බෙදා ගන්න නම් අපිවත් සතුටු කරන්න වෙයි. නැත්නම් ඔයි සතුට තියන එකක් නැහැ.

## 11. වෙනත් කරුණු :-

### ගරු මන්ත්‍රී ධනංජය විලේගේ මහතා :-

ගරු සභාපතිතුමනි ඔබතුමාගෙන් මම විශේෂ අවසරයක් ඉල්ලනවා. මේ අවස්ථාවේදි මට නික්ම යාමට අවශ්‍ය වෙනවා. මට මේ විශේෂ අවසරය ලබා දීම ගැන පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. හරි එහෙනම් මම කියන්නම්, දැන් ඔබතුමාලා අතට ලැබෙන්න ඇති යම් කිසි වාර්තාවක් මධ්‍යම පරිසර අධිකාරියෙ වාර්තාවක්. තවත් වාර්තාවක් සැකසෙමින් පවතිනවා. ඒක ඔබතුමන්ලා අතට පත්වෙනවා ඇති. මේ වන කොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව හරහා ඔබතුමන්ලා දන්නවා ඇති කටුපොල් නැවත වගාව හා රබර් ගලවා කටුපොල් වගා කිරීමේ වැඩසටහන් දැනට තාවකාලිකව නවත්වන්න කියලා. තීරණයක් අරන් තියෙනවා. නමුත් මේ වන විට වටවල වතු සමාගමේ ඉතාම සීඝයෙන් කටුපොල් වගාව නැවත සිදු කරමින් යනවා. මම ඒ අවස්ථාවකට ඊයෙ සම්බන්ධ වුණා. ජ.වි.පෙ. මන්ත්‍රීතුමා ඒ අවස්ථාවලට අහම්බෙන් මමත් එක්ක සම්බන්ධ වුණා. මේ වෙනකොට වතු අධිකාරීන් සතුව තියෙනවා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයෙන් ලැබුනු ලියුමක්. ඒක වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම් හෝ වෙන කවුරුවත් දීපු එකක් නෙවෙයි. අංශ ප්‍රධානියෙක් දීපු ලියුමක්. ඒ හරහා මේ වැවිල්ල කර ගෙන යනවා. අපි ජනමාධ්‍යටත් ඊයෙ ඉදිරිපත් කළා. ජනමාධ්‍ය හරහාත් ප්‍රචාරය වුණා. මම විශේෂයෙන්ම පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ඉල්ලා සිටින්නේ, පරිසර වාර්තා අනුව දිනකට ජලය ලීටර් 400ක් 600 ක් අතර ප්‍රමාණයක් කටුපොල් එක ගසකට වැය වෙනවා. රබර් ගහකට යන්නෙ බොහොම සීමිත ප්‍රමාණයක්. ඒ ලීටර් 40 ත් 60 අතර ප්‍රමාණයක්. මේ විදියට කටුපොල් වගා කලොත් නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ, විශේෂයෙන්ම තියෙන ප්‍රශ්නයක් කටුපොල් කර්මාන්ත ශාලාව හා කටුපොල් වගාව මේ ආකාරයෙන් රබර් ගලව ගලවා මේ වැඩේ කලොත් තව අවුරුදු 10 ක් ඇතුලත මේ ප්‍රදේශ කාන්තාර බවට පත්වීම නැතිනම් පැහැදිලි දිය උල්පත් සිඳී යාමේ දැඩි තර්ජනයකට ලක්වෙලා තියෙනවා. නමුත් විශේෂයෙන්ම සභාවෙ විශේෂ අවධානය යොමු කරන්න කියලා පක්ෂ විපක්ෂ සියළු දෙනාගෙන් ඉල්ලා සිටිනවා. මොකද අපිට මේ ආකාරයෙන් රජය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවෙන් එක තීරණයක් ගනිද්දි වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය තව තීරණයක් ගනිද්දි අපිට සිද්ධ වෙනවා මේ රජයේ රාජ්‍ය නිලධාරීන් හා සම්බන්ධ වෙලා කටයුතු කරද්දි අපි කොතනද ඉන්නෙ කියලා ඉතින් මම විශේෂයෙන්ම විපක්ෂයේ අපේ මන්ත්‍රීවරුන්නෙුත් ඉල්ලා සිටින්නේ මේ සඳහා අපි සියළු දෙනා එකතුවෙලා ජනතා පෙල ගැස්මක් සෑදිය යුතුයි. ජනතාවත් එක්ක මේ දේ ඉල්ලන්න අවධානය යොමු කරන්න සිද්ධ වෙනවා. ඒ සඳහා කටයුතු කරන්න ඒ සඳහා අවශ්‍ය සහයෝගය ලබාදෙන්න කියලා මම විපක්ෂයේ සියළු පක්ෂවලින් ඉල්ලා සිටිනවා. ඒ වගේම ආණ්ඩු පක්ෂයේ සියළුම සාමාජික මහත්ම මහත්මීන්ගෙන් ඉල්ලා සිටිනවා. මේ සඳහා අවධානය යොමු කරන්න ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා වැඩිදුරටත් ඒ පිළිබඳව කතා කරාවි. මට තව බොහෝ වෙලාවක් රැඳී සිටින්න හැකියාවක් නැහැ. ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමයේ ඛණිජ තෙල් සංස්ථාවේ විශේෂ රැස්වීමක් තියෙනවා. ඒ සඳහා සවස 3.00 ට මම එතනට සහභාගි වෙන්න ඕන. නැතිනම් මම අනිවාර්යයෙන් මේක අවසන් කරලා යන්නෙ. මම ජ.වි.පෙ. මන්ත්‍රීතතුමාගෙන් ඒ පිළිබඳ වැඩිදුරටත් පැහැදිලි කරන ලෙස ඉල්ලා සිටිනවා. මධ්‍යම පරිසර අධිකාරියෙන් පැහැදිලිවම දීපු වාර්තාවක් අප සතුව තියෙනවා. ඒකත් එක්ක සභාවෙ තීන්දුවක් ගන්න සභා තීරණයක් ගන්න මේ සම්බන්ධව කරන්නෙ මොකද්ද කියලා. මම සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. තීරණයක් ගන්න කියලා. ඒ වගේම මම නැවත මතක් කරනවා. අපි අතර ගැටුම ඇතිවුන ප්‍රශ්නය පිළබදව සභාපතිතුමාට මම ඒ ප්‍රශ්නය කතා කරන්නෙ නැහැ. ඒ පිළිබදව අපි කණ්ඩායම් රැස්වීමකදි කතා කරලා එතනදි තීරණයක් අරගන්න මමත් එතකොට අපේ කණ්ඩායමේ සියළු දෙනත් එක්ක එකතුවෙලා පොදු එකගතාවයකට එන්න පූදානම්. එහෙම තීරණයකට යමු කියන එකත් මම ඉල්ලා සිටිමින් ගැටුම් ඇති

නොකරගෙන යමු. මගේ යෝජනාව හරහා යම් කිසි බාධාවක් සභාවට වුනා නම් ඒ පිළිබඳ සමාව ඉල්ලමින් මම නිහඬ වෙනවා. ස්තූතියි.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා කතා කරමින් :-**

ගරු සභාපතිතුමනි, මම නැගී සිටියේ මාපලගම කොට්ඨාශයේ ප්‍රගතිය ගැන කතා කරන්න. මම යෝජනාවක් වශයෙන් කීප වතවක්ම මාපලගම හා තල්ගස්වල බස් නැවතුම අසළ තිබෙන විදුළි ලාම්පු වලට සෝඩියම් බල්බ් ඉල්ලලා තියෙනවා. නමුත් මේ එකක්වත් ක්‍රියාත්මක වුනේ නම් නැහැ. ඒ වගේම මාපලගම උප කාර්යාලය තුළ වෛද්‍යවරියට අවශ්‍ය උපකරණ, මම හිතන්නෙ ඔබතුමාට මතක ඇති එතකොට තිර රෙදි, වැසිකිලිය, වතුර ඒ කිසිම දෙයක් ඉටු වුනේ නැහැ. විදුළි කාර්මිකයෙක් ලබා ගන්න සභාවෙ අපි යෝජනාවක් ගෙනාවා. ඒ වගේම ෆයිබර් ඉණිමගක් වතුර මෝටරයට අවශ්‍ය මීටර් 100 ක් වත් දිග වයරයක්, මොකද හැම ගෙදරක් ළගම විදුළි බලයත්, ළිදකුත් නැහැ. මම හිතන්නෙ ඒ කරුණු කිසිවක් මේ වන තෙක් ඉටු වෙලා නැහැ. අර සෝඩියම් ලාම්පු කොහොමද දන්නෙ නැහැ. අපේ ජනතාවගෙන් බේරෙන්න තියෙන්නෙ උපක්‍රමශීලීව දෙකයි. එක්කෝ වීථි ලාම්පු ටික දෙන්න ඕන. නැත්නම් ස්කේටරයක් යොදවලාවත් මාර්ග ටිකක් හදලා දෙන්න ඕන. දැන් විදුළි ලාම්පුවත් තාම නැහැ. අඩුම ගානේ සෝඩියම් බල්බ් ටික මාපලගම නගරයට හා තල්ගස්වල නගරයට ඕන වෙන්නෙ 6 ක් හෝ 7 ක්. කිහිප වතාවක්ම යෝජනා කලත්, මාපලගම උප කාර්යාලය ඇතුලට කිසිම දෙයක් සිදු වෙලා නැහැ. ඒ ගැනත් අවධානය යොමු කරන්න.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රීනී කේ. කේ. අයි. නෙරංජලී මහත්මිය කතා කරමින් :-**

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. මම මේ අවස්ථාවේ නැගී සිටියේ මම ගියවරත් යෝජනා කළා, දැනුම් දුන්නා. මගේ නිවස ඉදිරිපිට මහා බෝතල් ගොඩක් තියෙන බව කියලා. ඒවා තාමත් එහෙමමයි. ඒ වගේම තමයි පසුගිය දිනෙක අපට නායකත්ව කුසලතා සංවර්ධනය සඳහා වූ දිස්ත්‍රික් කණ්ඩායම් සාකච්ඡාවක් මාතර හෝටලයක තිබුණා. ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්ක තුනේම කාන්තා මන්ත්‍රීවරියන් සියළු දෙනාම, එම අවස්ථාවට අපි යොමු කල ලේකම්තුමියටත්, සභාපතිතුමාටත්, ප්‍රථමයෙන්ම ස්තූතිවන්ත වෙනවා. ඒකෙදි නායකත්වය යනු කුමක්ද, නායකත්වයේ ඉතිහාසය, කාන්තාව හා දේශපාලනය, කාන්තා සහභාගීත්වය ඇති අඩුකම වැනි දේවල් සාකච්ඡා කරලා අපට හොද දේශනයක් පැවැත්වුවා. ඒ ගැන සියළු මන්ත්‍රීවරුන්ට අපි මේ අවස්ථාවේ මතක් කර සිටිනවා. ඒ වගේම අපිට හොද බෑග් එකක් ඒ අවස්ථාවේදි ලැබුණා. අද අපි සියළු දෙනාම ඒ බෑග් එකත් අරගෙන තමයි මේ ස්ථානයට ආවේ. ඉතින් ඒ සඳහා ගිහින් එන්න අපට වාහන පහසුකම් සළසලා දුන්න. ඒ ගැන සභාපතිතුමා නිතර සොයා බැලුවා. ඒ ගැනත් ස්තූතිවන්ත වන ගමන් මගේ වචන කිහිපය අවසන් කරනවා. අපේ ප්‍රදේශයටත් වීථි ලාම්පු ටිකවත් දාලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රී පී. පී. රංජිත් ජයවීර මහතා කතා කරමින් :-**

ගරු සභාපතිතුමා ඇතළු සමස්ත සභාවෙන් අවසරයි. මා ප්‍රථමයෙන්ම මේ අවස්ථාවේ ස්තූතිය පුද කරන්න ඕන අපේ ගරු සභාපතිතුමන්ට. ඒ මොකද කියලා කියනවනම්, අපි 26 වෙනිදා ශ්‍රමදානයක් දියත් කර තිබුණා. ඒ ශ්‍රමදානයට ට්‍රැක්ටරයක්, රියදුරු මහතෙක්, කම්කරුවන් දෙපලක් ලබා දෙමින් ලේකම්තුමියත්, සභාපතිතුමත් අපට ලොකු සහයෝගයක් ලබා දුන්නා. ඒ වගේම තණකොල කපන යන්ත්‍ර 2 ක් ඉල්ලුවම 1 ක් දුන්නා. ඒකත් ලොකු දෙයක්. ගයාන් මන්ත්‍රීතුමත්, එදා උදේ පාන්දරම පැමිණියා. එතුමටත්, අපේ පියල් හිරිමුතුගොඩ මන්ත්‍රීතුමත් මේ අවස්ථාවට සම්බන්ධ වෙලා වරුවක් විතර අපිත් සමග සිටියා. මම ඒ සම්බන්ධව ඒ දෙපලට ගෞරවය පුද කරනවා. අපි සාමූහිකව සමාජයක් හැටියට වැඩ කිරීමේදී එකමුතුකම තමයි බලාපොරොත්තු වෙන්නේ. එය ඉතා අගය කරන අතර අපි ඊයෙ අපේ සහෝදර විලේගේ මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට අලුත්වත්ත සුදුවැලිපොත රබර් කොටසේ කටුපොල් සම්බන්ධව පැමිණිල්ලක් ආපු වෙලාවෙ එතනට ගියා. ඒ අවස්ථාවේ අජිත් එඩේරආරච්චි මන්ත්‍රීතුමත් පැමිණ සිටියා. මේ ස්ථානයට ට්‍රැක්ටරයකින් කටුපොල් පැල 50 ක් වගේ ප්‍රමාණයක් අරගෙන ආවා. ඒකට අපි අපේ දැඩි විරෝධයක්

පල කළා. ඒ මොහොතෙම අපි මාධ්‍යටත් කතා කලා. සිරස ආයතනයෙනුත් එම ස්ථානයට පැමිණියා. වත්තෙ කොන්දොස්තර මහත්තයට පැහැදිලි කරලා දුන්නා මේ කෙන් වෙන විනාශය ගැන. එදාම සිරස ආයතනයේ පහයි පහ වැඩසටහනෙන් මේ පිළිබද ප්‍රචාරය කළා. අපේ සභාව වෙනුවෙන් ඒක ඉතාමත් අගය කරනවා. මේ විනාශය ගැන මම පමණක් නොමෙයි සමස්ථ සභාවම ඉදිරියට කටයුතු කරන බ වමට හැගෙනවා. අපි නෙවෙයි පරිසරවේදීන් කියන්නෙ දිනකට කටුපොල් ගසකට වතුර ලීටර් 400 - 600 ක් අතර ප්‍රමානයක ඇද ගැනීමක් තියෙනවා. නමුත් අපි පාවිච්චි කරන අපට ආහාර ලබා දෙන පොල්ගසකට හා රබර් ගසකට දිනකට යන්නෙ ලීටර් 60 - 80 ක් අතර ප්‍රමාණයක්. අපේ පරම යුතුකම වෙන්නෙ. මේ කුමන්ත්‍රනකාරීව මහා පරිමාන වගාවක් ලෙස සිදු කරන කටුපොල් වගාව විනාශ කිරීමයි. ඒ වගේම මම සියළු දෙනාගෙන්ම ඉල්ලා සිටින්නේ මෙය නැවැත්වීමට කටයුතු කරන ලෙසයි. ඒ සම්බන්ධව විලේගේ මන්ත්‍රීතුමා එම ස්ථානයට ගොස් එම කටයුත්ත නතර කිරීමට දැඩි උත්සාහයක් ගත්තා ඒ සම්බන්ධව මම එතුමට ස්තූතිය පුද කරනවා.

ගරු සභාපතිතුමනි, අප බල ප්‍රදේශයේ මාපලගම සිරිසුනන්ද මහා විද්‍යාලයේ මේ වර්ෂයේ උසස් පෙළ හදාරන සිසුන්ට කෘෂි විද්‍යාව පිළිබද ගුරුවරයෙක් නැහැ. ඒක විශාල ප්‍රශ්නයක්. ඔබතුමා ඒ ගැන අදාළ නිලධාරීන්ට යොමු කරන ලෙස මා ඉතා ගෞරවයෙන් මේ සභාවෙන් ඉල්ලා සිටිනවා. සිරිසුනන්ද මහා විද්‍යාලය තුළ නිත්‍ය සේවයේ යෙදෙන ගුරුවරු 50 ක් හා අනුයුක්ත ගුරුවරු 09 ක් සිටියත් අත්‍යවශ්‍ය ගුරුවරයෙක් වන කෘෂි විද්‍යා විෂයට ගුරුවරයෙක් මේ පාසලේ නැහැ. එය විශාල අඩුවක්. මේ ගැන කලාප කාර්යාලයට දැනුවත් කරන ලෙස මම ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒවගේම ගරු සභාපතිතුමනි, දැන් මහා පරිමානයේ ව්‍යාප්තව යනවා, කෘෂිකර්ම නිලධාරීනුත් දැනුවත් ඇති මේ සම්බන්ධව. තල්ගස්වල සිට දියවර ගම්මානය දක්වා කුඹුරු ගොඩ කරමින් පවතිනවා. ඒක අපිට වගේම ඉදිරියේදී අපේ දරුවන්ටත් හානියක් වෙනවා. අපි කොච්චර ඇළ කාණු හෑරුවත් ඒවා ගොඩවීම නිසා එම මාර්ගය නැවතත් ජලය පිරී ඉතිරී යනවා. ඒ සම්බන්ධව මම ඊයෙත් සම්බන්ධීකරණ කමිටුවෙදි කතා කළා. ඔබතුමාගෙත් අවධානය ඒ සඳහා යොමු කරන්න. ගරු සභාපතිතුමනි, වැසි ජලය පවා පාරට ගලා බැස්සවීමට ඇතැම් ගෙවල්වලින් කටයුතු කර තියෙනවා. රාජ්‍ය නිලධාරීන් ඉන්න ගෙවල් පවා මේකට සම්බන්ධයි. ඒ සදහා ඔබතුමිය මැදිහත් වෙලා පළමුව දැනුවත් කිරීමේ වැඩක් කරන්න. ලේකම්තුමියනි, ඊට පස්සෙ අපිට පුළුවන් වෙනත් ක්‍රියාමාර්ගයකට යන්න. මම ඉල්ලා සිටිනවා. ඒ සම්බන්ධවත් මේ ගරු සභාවේ අවධානය යොමු කරන්න කියලා. මේ සියළු දේවල් මේ සභාවෙන් ඉටු කර දෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

ගරු සභාපතිතුමනි, අපට රජයෙන් කියන්නේ වස විස නැති බව භෝග වගා කරගන්න. නමුත් අපට ආහාර සදහා බවභෝග වගා කරන්න හැකියාවක් නැහැ. නිදැල්ලෙ යන ගවයන් නිසා. ඒක මහා ව්‍යසනයක් බවට පත්වෙලා තියෙනවා. අපේ ව්‍යවස්ථාවේ ඒකට ගන්න පුළුවන් ක්‍රියාමාර්ග තමාකද්ද කියලා පැහැදිලි කරලා තියෙනවා. ඔබතුමාට අයිතියක් තියෙනවා. ඒ සදහා ක්‍රියා මාර්ගයක් ගන්න. ඒ වගේම මම ඉල්ලා සිටිනවා මේ සදහා කුමක් හෝ පිළියමක් යොදන්න කියලා.

එමෙන්ම අප සියළු දෙනාගෙ සියළුම යෝජනා මෙතනදි සම්මත වුණා. අර වගේ අපහසුතාවයකට පත් වෙන්න එපයි කියලා මම නැවතත් ඉල්ලා සිටිනවා. මේ ගරු සභාවෙදි කතා කරන කොට, ඔය නාමපුවරු වගේ සකස් කිරීමේදී අපේ උප සභාපතිතුමා, ධනංජය මන්ත්‍රීතුමා, තරංග සුදර්ශන මන්ත්‍රීතුමා කිව්වා වගේ අපට මෙතන භේදයක් අවශ්‍ය නැහැ. අපි මෙතෙන්ට ආවෙ කොට්ඨාසෙන් නායකයෙක් වලා. සියළුම දෙනා කොට්ඨාසෙන් නායකයෙක් ලෙස පත් කර ගත්තෙ හොදම නායකයෙක් හැටියට. ඒ නිසා භේද භින්න නොවී දීර්ඝ කාලයක් නැත්නම් අපට මේ අවුරුදු 04 වත් එකට සාමූහික සමාජයක් ගොඩනගන්න සාධාරණයක් ඉටු කරන්න ශක්තිය ධෛර්‍ය්‍ය ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මා නිහඩ වෙනවා. ස්තූතියි.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රී වෙරංග ලක්මාල් මහතා කතා කරමින් :-**

මූලාසනාරූඪ ගරු සභාපතිතුමාගෙන් හා සියළුම මන්ත්‍රීතුමන්ලගෙන් හා මන්ත්‍රීතුමියන්ලගෙන් අවසරයි. මා මුල් අවස්ථාවෙදි යෝජනා කල පොල් ඉඩම සම්බන්ධව ප්‍රාදේශීය සභාවේ අවධානය යොමු වීම ගැන ස්තූතිවන්ත වෙනවා. මොකද පොල් ඉඩමේ ගොඩාක් ප්‍රශ්න ඇති වුන නිසා. ලේකම්තුමියත් එක්ක උඩුගම පොළට කණු වගයක් කපන්න ගිහිල්ලා මා දැනුවත්ව අපේ පස් දෙනෙක් විතර කුඩු කරන්නත් හිටියා. ඉතින්

එහෙම තත්වයක් තිබුනෙ. ඒ නිසා පොල් ඉඩම ගැනීම පිළිබඳව මා සභාපතිතුමාට මේ අවස්ථාවේ විශේෂ ස්තූතිය ප්‍රකාශ කර සිටිනවා. මොකද ඒ ආදායම අපට කෙසේ හෝ ලබාගන්න පුළුවන් පරිසරයක් නිර්මාණය කිරීම ඔබතුමාගෙ වගකීමක් කොට මම සලකනවා. ඒකෙදි ආරක්ෂක තත්වය පිළිබඳ ඉතාම සැළකිල්ලට භාජනය කරන්න ඕන. ආරක්ෂාව කියන්නේ, තනි පුද්ගලයෙක් ඉන්නේ. මම බැලුවා එයාට අඩුම ගනනේ ටෝච් එකක්වත් නැහැ. ඉතින් එතනදි අවශ්‍ය කරන පහසුකම් එතන ඉන්න ආරක්ෂක නිලධාරීතුමාට ලබාදෙන්න කියලා මම යෝජනා කරනවා. ඒවගේම තමයි පොල් ඉඩමට යන පාර, මන් දැක්කා අද ශුද්ධ කරන්න යනවා. එතන පල්ලෙහාට යනකම්ම ලයිට් කණු පෙළක් තියෙනවා. ලයිට් කණු පෙළට පල්ලෙහාට යන කම් අඩුම ගානෙ ලයිට් ටිකක්වත් දාලා හදන්න ඕන. නැත්නම් හොරු ඇවිල්ලා පොල් ටික කඩන් ගියාට පස්සෙ අඩුම ගානෙ අපට මේ රු. 60600 වත් ලබා ගැනීමට හැකි වේද කියන එක ප්‍රශ්නයක් වෙනවා. මේ පොල් ඉඩම වෙනුවෙන් වියදම් කලා වගේම ක්‍රමවත් වැඩපිළිවෙලක් හදන්න කියලා මම කියනවා. ඒ වගේම එතන ආරක්ෂක නිලධාරියෙක් ඉන්නවා. එයාට අයි. ඩී. එකක් නැහැ, තොරතුරු සටහන් පොතක් නැහැ. ඉතින් අපි ගියාට පස්සෙ පරික්ෂ කළා කියලා ලොග් ඇන්ට්‍රියක් දාගන්න විදියක් නැහැ. අපි ඇවිල්ලා හොයලා බලලා යනවා විතරයි. ඒ නිසා පොල් ඉඩම හා සමගාමිව තියෙන කසල කළමනාකරණ මධ්‍යස්ථානය පිළිබඳව වඩාත් පුළුල් ලෙස අවධානය යොමු කර නිශ්චිත වැඩපිළිවෙලක් ක්‍රියාවට නංවන ලෙස ඔබතුමාගෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටිනවා. මේ පොල් ඉඩම ලබා දීලා තියෙන්නෙ එක් අවුරුද්දකට බැවින් අදාළ වැඩකටයුතු ඉටු කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

හැමදාමත් කතා කල උඩුගම පොළ ගැන කතා කරන්න මම අදත් අවසර ඉල්ලනවා. මොකද හේතුව මම ගිය සතියෙ සඳුදා පොළට ගියෙත් නැහැ. හේතුවක් තියෙනවා. ඔබතුමාත් අපේ චන්ද්‍රසිරි වනිගරත්න මන්ත්‍රීතුමත්, සමන් මන්ත්‍රීතුමත් , මමත්, අපේ තාක්ෂණ නිලධාරීතුමියත් උඩුගම පොළේ වෙලෙන්දොත් එක්ක අපි පැය 02 ක විතර කාලයක් සාකච්ඡා කළා. ඉතින් එතනදි වෙලෙන්දො කිව්වෙ අපට මේ බිල්ඩින් එක අපි කියන විදියට හදල දෙනවනම් සියළු දෙනාම එන්න ලෑස්තියි කියලා. නමුත් කණගාටුවට කරුණක් අද වන තුරුත් අපට ඒක ඉටු කරන්න බැරි වෙලා තියෙනවා. ගරු සභාපතිතුමා, මන් මගේ පඩිය කවදාවත් ගන්න කෙනෙක් නෙවෙයි. මේ සභාවෙ අද මට හම්බවෙන වැටුපෙන්වත් මට මේක ශුද්ධ කරලා පොළ යථා තත්වයට අරන් එන්න අවසර ඉල්ලනවා. අපි බැදී සිටිනවා මේ කටයුත්ත කරන්න, එහෙම කරන්න බැරි නම්, අපිට පොළට යන්න විදියක් නැහැ. දැන් මේ සමන් මන්ත්‍රීතුමා ගිහින් ඇවිත් තිබුණා. ගිය සතියෙ පොළේ. කෝ මන්ත්‍රීතුමා කෝ මොකුත් නෑනේ. බඩුම තමයි කිව්වලු. ඒක නිසා මන් හිතනවා ලබන සතියෙවත් ඒ අවශ්‍ය කරන පියවර ඔබතුමාගෙන් ලැබෙයි කියලා. ශුද්ධ කරලා දෙපැත්තට කණු ගහලා දෙන්න කියලා තමයි ඒ අය ඉල්ලුවෙ. ඒක කරලා දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම මම අහන්න කැමතියි. මම ගිය වතාවෙ උඩුගම දවුල්හේන මාර්ගයෙ තියෙන ලයිට් කණුවක් සම්බන්ධව කතා කළා. ඒ සම්බන්ධව විදුලි අධිකාරි, වදුරඹට දැනුම් දුන්නද කියන එක. ගරු භාපතිතුමනි, ඒක අවධානම් සහගත ලයිට් කණුවක්. උඩුගම දාවුල්හේන මගේ නිවසට යන පාරෙමයි, පාරෙ මැද තියෙන්නෙ. බොහොම අවධානම් ගිය වරත් මම ඒ ගැන අවධානය යොමු කළා. මොකද ඒක හරිම භයානකයි. එබැවින් නැවතත් ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිනවා.

ඒ එක්කම තරංග සුදර්ශන මන්ත්‍රීතුමත්, අපිත් හැමදාමත් කතා කරන උඩුගම බස් නැවතුම් පොළ තාමත් අඳුරෙ තියෙන්නෙ. ඉතින් ඒකට අවශ්‍ය කරන විදුළි පහන් ටික ඉතාම ඉක්මණින් ගෙන්නවලා ඒ වැඩකටයුතු ටික කරන්න කියලත් ඉල්ලනවා. ඒ වගේම තමයි මම බොහොම සතුටු වෙනවා. අපි සභා වාර 4 ක් ඇවිල්ලා බොහොම සතුටින් වාඩිවෙලා සතුටින් විසිර ගිහිල්ලා තියෙනවා. මම පෞද්ගලිකව මන්ත්‍රීවරයෙක් විදියට ජ්‍යේෂ්ඨ මන්ත්‍රීවරුන් කතා කරන විලාසය, එතුමන්ලා හැසිරෙන ආකාරය ගොඩක් අධ්‍යනය කළා. ඔබ තුමාලගෙන් උකහා ගන්න ගොඩක් දේවල් තියෙනවා කියලා මම හිතනවා. ඒ උකහා ගැනීම එක්ක මම පසුගිය සභා වාරවල දැක්කා ජාතික දේශපාලනය අල්ලගෙන මේ සභාවෙ කතා කිරීම තුළ අපි තවත් කාලය ගතකරමින් සභාව අපහසුතාවයට පත්කරනවට වඩා, ජාතික දේශපාලනයත් එක්ක බද්ධ වෙන එක වෙනම කාරණයක්. නමුත් හැම ආණ්ඩුවකම බැලුවොත් හෙම කිල්ලෝටවලට අත දැම්මොත් හුනු ගෑවිලා තමයි අත එලියට එන්නෙ. ඒ නිසා මම හිතනවා ජාතික දේශපාලනය අල්ලගෙන මෙතන වාද විවාද කරලා අපහසුතාවයට පත් කරන්න එපා. මොකද එහෙම හිතන් ඉන්නවනම් අපිටත් නිවට නියාලු කට පියාගෙන ඉන්න පුළුවන්කමකුත් නැහැ ඉතින් ඒ නිසා එහෙම වෙන්න ඕන නැහැ. අපි සතුටින් එකතු වෙලා, සතුටින් විසිර යන්න පුළුවන් විදියට මෙපමන කාලයක් ඇවිල්ල තියෙනව. ඉතින් ඔබතුමාලගෙන් අවශ්‍ය කරන ඒ වෙනස ඇති වෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා. ඔබ සියළු දෙනාටම සුභ දවසක් ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා කතා කරමින් :-**

ගරු සභාපතිතුමනි, අවසරයි. අපේ වෙරංග මන්ත්‍රීතුමා කතා කරපු හින්දම මගේ කොට්ඨාසයට අදාළව මම කතා කරන කරුණුවලට වඩා උඩුගම පොළ පිළිබඳව සඳහන් කරපු කරුනෙදි ඇත්තටම අපි හිතනවා ඒ කාරණය විතරක් නෙමෙයි බොහෝ වෙලාවට අපට හැමදාම කතා කරන්න තියෙන්නෙ එකම කාරණයක්. ඔබතුමත් සමග අපි කිහිපදෙනාම ගිහිල්ලා බොහොම ලස්සනට අර වෙළෙන්දො ටික ඔක්කොම එකතු කර ගෙන ඒ මිනිස්සුන්ට ලොකු බලාපොරොත්තුවක් හදලා තියලා ආවා. අපි හිතුවා ඊළඟ පොළ දවස වන විට මේ සියල්ල ශුද්ධ පවිත්‍ර වෙලා අපිට නැවත පොළට යන්න පුළුවන් මට්ටමක් උදා වෙයි කියලා. නමුත් ඒකට අද වෙන තුරුත් අවධානයක් යොමු වෙලා නැහැ. අපි එතනදි යම් යම් තීන්දු තීරන ගත්තා. ගොඩනැගිල්ලට අපි මොකද කරන්නෙ, වාහන වලට මොනවද කරන්නෙ, කියලා. හැබැයි ඒවා පිළිබඳ දැනුවත් කිරීමක් හෝ නිලධාරී දැනුවත් කිරීමක් හෝ ඒ පිළිබඳ වැඩපිළිවෙලක් සකස්වෙලා නැහැ. ඒ නිසා ඔබතුමාගෙන් ඉතාම ගෞරවයෙන් මේ ගරු සභාව ඉදිරියෙ ඉල්ලා සිටිනවා. ලබන සඳුදා වෙන්න කලින්වත් නැවත අපිට දැනට කරන්න පුලුවන් මට්ටමින් යථා තත්වයට පත් කරලා දෙන්න. හේතුව මහ විශාල ජන සමූහයක් එකතු වන පොළක්. එතකොට විශාල ප්‍රදේශයකට පැතිරිලා තියෙනවා. අපේ මන්ත්‍රීවරු කිහිපදෙනෙක්ම ඉන්නවා. අපේ තරංග මන්ත්‍රීතුමා, අජිත් එඩේරආරච්චි මන්ත්‍රීතුමා, වගේ කිහිප දෙනෙක් ඉන්නවා. අජිත් ඔතනින් නිතර දෙවේලෙ යන එන අය. ඒ නිසා අපට මේක බරපතල ප්‍රශ්නයක්. ඒ නිසා අපි උඩුගම ප්‍රදේශය වෙනුවෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනව ඊළඟ පොළ දවස වෙන කොට මේකෙ වැඩ ආරම්භ කලයි කියන්න හරි පුලුවන් මට්ටමක කටයුතු කරන්නෙයි කියලා. ඒකෙදි හැබැයි බොහෝ වෙලාවට අපට දැනගන්න තියෙන දෙයක් තමයි. මොන වැඩේ කරන්න ගියත් සභාවෙ සල්ලි නැහැ කියන පදනමට අපි ඇවිල්ලා තියෙනවා. හැබැයි අපිට එහෙම කියන්න බැහැනේ. පොළ අපි යම් ආදායමක් ලබන තැනක්. ඒ නිසා අපේ වගකීමක් සහ යුතුකමක් තියෙනවා. එතන මිනිස්සුන්ට අවශ්‍ය පහසුකම් සළසා දීම. ඒ නිසා ඒ කාරණය පිළිබඳ විශේෂයෙන් සිහිපත් කරනවා. අනිත් කාරණාවලදි මම දැකපු දෙයක් තමයි බොහෝ වෙලාවට අපේ අජිත් එඩේරආරච්චි මන්ත්‍රීතුමා අනිත් මන්ත්‍රීවරු සඳහන් කල පරිදි මේ සභාවට මහ විශාල පරිමානයෙන් කටයුතු කරන්න බැරුවා වගේම මම හිතනවා අපට පුංචි දෙයක්වත් කරගන්න බැරි වෙලා තියෙනවා. මම ඒක ගිය සභා වාරෙත් සිහිපත් කළා.

ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා කතා කළා ප්‍රශ්නයක් ගැන. මේ හරක් ප්‍රශ්නයක්. ඒ නිසා මේ ප්‍රශ්නය එතුමන්ගේ ප්‍රදේශයට පමණක් නෙවෙයි අපේ ප්‍රදේශවලටත් තියෙනවා. හැමදාම අපිට මිනිස්සුන්ගෙනුත් බොහෝම කන්කෙදිරිගෑමක් තියෙනවා. මේ ප්‍රශ්නය විසඳන්න ක්‍රමයක් යොදන්න කියලා හැබැයි ඒකෙ වගකීම පැහැදිලිවම ප්‍රාදේශීය සභාවට තියෙනවා. නමුත් පියවරක් ගැනීමේදි බරපතල ප්‍රායෝගික ගැටලු තියෙනවා. කොහොමද මේවා කරන්නේ. ඒකෙදි එකම ප්‍රායෝගික ගැටලුවක් තමයි හරකෙක් අල්ලලා බැන්දාම අයිතිකාරයෝ එනවා. අල්ලලා බැදලා මිය ගියාම වලදාන්න අයිතිකාරයෝ කවුරුවත් නැහැ. ඉතින් එහෙම ගැටලුවක් අලුත්වත්ත ප්‍රදේශයේ සිදු වුණා. හරක් දෙන්නෙක් මැරිලා. එතනදි මම හිතනවා සාමාන්‍යයෙන් මිනිස්සුන්ට ඇදලා වල දාගන්නත් බැහැ. වලක් හාරලා. මේකෙදි මැෂින් එකක් දාලා වලක් හාරලා දාන්න වෙනවා. නමුත් ඒකට සභාවෙ මැදිහත්වීම අපට ගන්න ඕන වුනාම ප්‍රායෝගික ගැටලු ගොඩක් මතු වුණා. ඒ ප්‍රායෝගික ගැටලු තුල ඒ කරුණ ඉටු කර ගන්න බැරි වුණා. අපි එතනට ගියාම පොඩි අපහසුතාවයකට පත් වෙනවා. ඒ නිසා මගේ ඉල්ලීම ඒක අපේ ප්‍රදේශයට පමණක් නෙවෙයි. ඒ මන්ත්‍රීතුමා කිව්වා වගේ නාගොඩ ප්‍රදේශයේත් පොඩ්ඩක් රෑට ඇවිල්ල බලන්න ඕන තත්වය කොහොමද කියලා. නාගොඩ හංදියෙ යන්න බෑනේ. ඒ නිසා මේකට මොකක්හරි සුදුසු වැඩපිළිවෙලක් අදාළ පොලිස් ස්ථාන සහ කෘෂිකර්ම නිලධාරීන් සියලු දෙනා ඒකරාශී කර ගෙන, අලුත්වත්ත ප්‍රදේශයේ නම් ඉල්ලීමක් තියෙනවා මේවා පොලීසියට කරන්න බැරිනම්, අනිත් අයටත් කරන්න බැරි නම් අපිට ක්‍රමයක් හදල දෙන්න. අපි අල්ලලා බැදලා, ඒ සත්තු හදාගන්නම් කියලා. එහෙම හදන්න ගියත් නීතිමය ගැටලු තියෙනවා. ඒ නිසා මේකට මොකක්හරි ක්‍රමයක් සකස් කරන්න කියලා සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ඒ එක්කම මම සතුටු වෙනවා අපේ සහබන්දු මන්ත්‍රීතුමා කිව්වා එතුමගේ ප්‍රදේශයට දවස් 5 ක් විදුලි බල්බ් සවි කිරීම සඳහා ගියාය කියලා. එතනදි අපි කණගාටුවෙනවා පැහැදිලිවම අපිට එකම එක දවසයි ගියෙ. ඒ නිසා ඔබතුමන්ට විපක්ෂයේ වුනත් වැඩිපුර සළකලා තියෙනවා. ගෙදර ළග එක නැති වුනත් කමක් නැහැ. ප්‍රදේශයේ තමන්ගේ කොට්ඨාසයට පස් වතාවක් ගිහින් තියෙනවා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා ඒකෙදි මතක් කරන්න තියෙනවා අපේ පියල් මන්ත්‍රීතුමත් මතක් කළා දැන් සභා වාර 4 ක්. ඒ වැඩ කරන

අයට තියෙන ගැටලු ඉණිමගේ ගැටලුව වගේ ගැටලුවක් මගේ කොටසට ගියාම ආවා. දැන් අලුත් ක්‍රමයට, කේබල් ක්‍රමයට හැදුවම කරන්ට් එක ගන්න විදියක් නැහැ. ඒකට ක්ලිප් එකක් ඕනලු. වැඩ කරන අය එතනට ගිහිල්ලා කියනවා හදන්න විදියක් නැහැ. ක්ලිප් නැහැ කියලා. මම සභාපතිතුමාට කිව්වා ඔබතුමාට බලය තියෙනවා අපි සභාව එනකම් ඉන්න ඕන නැහැ. සභාවට ඔබතුමන්ට බලයක් තියෙනවා. එවැනි අවශ්‍යතාවයන් මේ සභාවෙ පොදු අරමුදලින් සම්පූර්ණ කරන්න. තීන්දුව ගන්න ඔබතුමාට හැකියාව තියෙනවා. ඒ නිසා නැවත ලබන සභා වාරයේ කතා කරන්න තියන්නෙ නැතුව ඒ අයගේ ඒ අඩුපාඩු ටික සකස් කරලා දෙන්න. ඒවගේම අපි යෝජනා කළා මේ දැන් තියෙන ක්‍රමයත් එක්ක කොට්ඨාස 15 ටම තියෙනවා. ඔබතුමා දන්නවද දන්නෙ නැහැ. කොට්ඨාස 15 අපි යන කොට මාසයකට දවසකට වැඩිය යැවෙන්නෙ නැහැ. එතකොට මේ මාසයකට දවසක් ගිහිල්ලා බල්බ් 10 ක් දාලා ඇවිල්ලා, බල්බ් 10 නේ දවසට හදන්න පුලුවන් කියන්නේ, එතකොට මේක දාලා එන්න ගියාම තවත් මහා ගැටලු ඒ නිසා මට මතකයි මේ සභාවෙ අදහසකුත් ගෙනාවා මේක කාර්යක්ෂම කරන්න තව කවුරුහරි බඳවගෙන හරි මේක කරන්න කියලා. ඒ නිසා මම ඉල්ලීමක් කරනවා. ඒ කියන කාරණා වලට අවධානය යොමු කරන්න කියලා.

ඒ එක්කම නැවතත් ඒ වගේම කාරණයක් තමයි සිහිපත් කරන්න තියෙන්නෙ. මම සභාපතිතුමාට කතා කරලා කිව්වෙ එතුමා නිල වශයෙන් දිව්රුම් දීපු දවසේ මේක මගේ කොට්ඨාසයේ තියෙන ගැටලුවක්. ඒ ප්‍රදේශයේ මීට පෙර කුණු එකතු කරන්න  වාහනේ ගියා. හැබැයි මොකක්හරි පුංචි ගැටලුවක් වෙලා වාහනේ යන්නෙ නැතුව වසර ගණනාවක් නතර වෙලා තිබුණා. ඊට පස්සෙ අපි සභාව නීත්‍යානුකූලව පිහිටුවීමෙන් පසු අපේ ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීමක් තියෙනවා. අඩුම ගානේ මේක හරි අපට කරලා දෙන්න කියලා. ඒ ඉල්ලීම මම සභාපතිතුමාටත්, කීප අවස්ථාවකදිම කළා. ල්කම්තුමියටත් මතක් කළා. හැබැයි මට ලැබුණු පිළිතුර තමයි වැඩපිළිවෙලක් හදනවයි කියලා. ඉතින් මම කණගාටුවෙනවා මේ සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට දැන් අපි සභා වාර 4 ක් ආවා. මේ සභා වාර 4 යනකනුත් මේ පිළිබඳව මොකුත්ම වැඩපිළිවෙලක් සකස් වෙලා නැහැ. ඒ නිසා මේ කාරනාවල කාර්යක්ෂමතාවයන් පිළිබඳ පැහැදිලිවම අපි නිවැරදි කර ගත යුතු ටිකක් තියෙනවා. මම ඉතාම ගෞරවයෙන් සභාවෙන් ඉල්ලා සිටිනවා සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. මේ කියන කරුණු නැවත එන සභාවාරවලදී පුන පුනා කියන එක අපිටම හොද නැහැ. ඒ නිසා පුන පුනා කියන තත්වය නැති කරගන්න

ඒ වගේම පුංචි මතක් කිරීමක් කරන්න ඕන. අපේ වෙරංග මන්ත්‍රීතුමා ප්‍රශ්න කළා මේ ලියුම අසවල් තැනට යොමු කළාද කියලා. දැන් මමත් එහෙම සභාවෙත් කතා කරලා තියෙනවා. ඒ ඒ කීප පලකටම අදාළ පරිදි ලිපි යොමු කරන්න කියලා. නමුත් අපි බැලුවහම අවශ්‍ය තැන්වලට ලිපි යොමු නොවීමේ ප්‍රවනතවයක් තියෙනවා. සභාවෙ කතා කරලත් අදාළ පරිදි ලිපියක් යොමු වෙන්නේ නැත්නම් ඒකත් බරපතල ගැටලුවක්. ඒ නිසා මට පේන විදියට අපි මේ සභාවෙ කතා කරනකොටත් කලින් මහ විශාල කාලයක් තේරුමක් නැති ප්‍රශ්නවලට නිකම් කතා කර කර හිටියා. මම හිතනවා ඒ අනවශ්‍ය දේවල් පිළිබඳ අපි හොද අවබෝධයෙන් කතා කරන්න ඕන. පැහැදිලිවම මේ පුංචි ගැටලුවක් අරගෙන මේ පුංචි උදාහරණයක්. ෆේස් බුක් ගැටලුවක් අරගෙන මහ වෙලාවක් ඒකට කාලය යොමු කළා. ඒ නිසා ඒවා කරන අය සහ කතා කරන අපි ආදර්ශමත් විදියට ඒ කරුණුවලදි පැහැදිලිවම අනවශ්‍ය තේරුමක් නැති කාරණාවලට වඩා ජනතාවට බලපාන ප්‍රශ්නවලට මූලිකත්වය දීලා අපි සියලු දෙනා එකාවන්ව කටයුතු කරමු කියන ඉල්ලීම කරනවා.

සභාපතිතුමා, පොඩි අපහසුතාවයකටත් පත් වුණා. කොට්ඨාස 15 අපි තේරුනු මන්ත්‍රීවරු 15 දෙනෙක් ඉන්න ගමන් ඒ හැම කොට්ඨාසයකටම තවත් මන්ත්‍රීවයෙකුත් ඉන්නවා. එතුමත් දැන් අර ඇස්තමේන්තු හා යෝජනා ගේන කොට ගැටලුවක් ආවා. අපිට විතරක් විශේෂ සැළකිල්ලක් කරනවයි කියන අපහසුතාවයට එතුමා පත් වුණා. ඒ නිසා අපි ඉල්ලා සිටිනවා එහෙම වෙන්න විදයක්  නැහැ. කොට්ඨාසෙ කිව්වම ඔබේ අයටත් අපි  පාරක් හදනකොට මේකෙ ඉන්නෙ යූ.ඇන්. පී. ගෙවල් මේකෙ ඉන්නෙ පෙරමුණේ ගෙවල්, මේකෙ ඉන්නේ ජේ.වී.පෙ ගෙවල්. එහෙම කිසිම වෙන්කිරීමක් නැහැ. ඒ ගේන යෝජනාවලට ඔබතුමන්ලාගේ සහයෝගය දෙන්න. මම හිතනවා කිසිම කෙනෙක් විරුද්ධ වෙනඑකක් නැහැ. අපේ තරංග සුදර්ශන මන්ත්‍රීතුමා විරුද්ධ වෙන එකක් නැහැ. වෙරංග මන්ත්‍රීතුමා ඒ කොට්ඨාසයේ ජනතාවට අදාළ පොදු ප්‍රශ්නයක් හැටියට පාරක් සකස් කරනවනම් ඒකට විරුද්ධ වෙන එකක් නැහැ. ඒ නිසා අපේ සහබන්දු මන්ත්‍රීතුමා සදහන් කල පරිදි අපේ සභාපතිතුමාට හා අපට දිගටම සහයෝගය දෙන්න. කොට්ඨාසයේ කටයුතුවලදී මම හිතනවා ඔබතුමන්ලාත් ඒ සහයෝගය දීලා අපි කවුරුත් එක්ක එකට ඉන්නනම් සහයෝගය දෙන්න. මගේ කොටසෙ ඉන්නෙ අජිත් එඩේරආරච්චි මන්ත්‍රීතුමා මම එතුමටත් ආරාධනය කරනවා අපේ කොට්ඨාසයේ කටයුතු කරන කොට එහෙම යම් මුදලක් වෙන් වෙනව නම් අපි දෙන්නටම පොදුවෙ ඒ මුදල වෙන් වෙන විදියට අපි කටයුතු කරමු. සහයෝගයෙන් කටයුතු කරමු කියන කාරුණික

ඉල්ලීමත් සියලු දෙනාගෙන් ඉල්ලමින් ඔබ සියලු දෙනාට සුභ දවසක් ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. ස්තූතියි.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය කතා කරමින් :-**

ගරු සභාපතිතුමාගෙන් ලේකම්තුමියගෙන් හා සමස්ථ සභාවෙන් අවසරයි. මමත් මේක අවස්ථාවක් කර ගන්නවා ගිය සිකුරාදා අපිට වැදගත් දේශනයක් පැවැත්වුණා. වනිතා කටයුතු අමාත්‍යාංශයත්, පාර්ලිමේන්තුවේ කාන්තා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයක් ඕවෙයිසෙයිට් කියන ආයතනයත් එකතු වෙලා කරපු දැනුවත් කිරීමක් තිබුණා. අපි හත් දෙනාම ඒකට යොමු කිරීම පිළිබඳව සභාපතිතුමාට මුළින්ම ස්තූතිවන්ත වෙනවා. මොකද සමහර සභාවල්වල අපි දැක්කා කවුරුවත් එවලා තිබුනේ නැහැ. ඒ ගැන නැවත ස්තූතිවන්ත වෙනවා. අපේ කාන්තාවන් සියලු දෙනාම ඒ සඳහා යොමු කිරීම සම්බන්ධව.
ඊළගට පොල් ඉඩම ගැන කතා කළා. මම නැවතත් කියන්නේ ඒක ගොඩක් දන්න කාරණයක් නිසා. 2015 වෙනකම් ඕකෙ තත්වය අපි දැනගෙන හිටියෙ නැහැ. මේක කොහේට තිබුන එකක්ද මොකද්ද කියන එක. පොල් හොරා කැඩීම සම්බන්ධයෙන් පොලීසිය දැනුවත් කරලා ඒ සම්බන්ධ සිදුවීමෙන් තමයි. මේකෙ අයිතිය තියෙන්නෙ කොහේටද කියලා දැනගත්තෙ. ඊට පස්සෙ ප්‍රාදේශීය ලේකම් භාරයට අරගෙන වෙන්දේසි කරන්න පටන් ගත්තා. අවුරුදු 2 යි මේක පිට භුක්ති වින්දෙ. ඒකත් ග්‍රාම සංවර්ධන සමිතිය එක අවුරුද්දකුත් මොරගල්මුල්ල ප්‍රදේශයේ ගම් වැසියෙක් එක අවුරුද්දකුත් තමයි භුක්ති වින්දෙ. නැවතත් සභාවට ඒක අරගත්ත එක ගැන සතුටු වෙනවා. දැන් කවුරුත් බලාගෙන ඉන්නෙ මේකෙ ආදායම කොහේට යයිද කියන එක ඒ නිසා ඔබතුමාට වගකීමක් තියෙනවා ඉදිරියට කොහොමද වෙන්නෙ කියන එක පිළිබඳ සභාවේ සියලු දෙනා දැනුවත් කරන එක. මන් හිතන්නෙ පොල් කැඩුවා කියන එක, ඒ අය දැනුවත් කරලා තිබුනෙ අක්කර පහේම පොල් එලදාව සහ වෙනත් එලදාවන් භුක්ති විඳීමේ අයිතිය තිබෙන බවයි. ඒ වුනාට ගස් කොලං කැපීමේ අවසරය තිබුනෙ නැහැ. ඒ නිසා තමයි ලක්මාල් මන්ත්‍රීතුමත් කතා කළේ, ලේකම්තුමියත් දන්නවා ගස් කැපුවොත් ඒකෙ වගකීම තිබුනෙ කොන්ත්‍රාත්කරුට. ඒ නිසා තමයි එයා පොලීසියෙ පැමිණිල්ලක් කරලා තිබුනෙ. 60600.00 කින් වගේ මුදලකින් වෙන්දේසිය ඉල්ලීම නතර කරලා තිබුනෙ ඔබතුමා ගැන විශ්වාස කරලා. නිසියාකාරව කරගෙන යයි කියන බලාපොරොත්තුවෙන්. ග්‍රාම සංවර්ධන සමිතියෙ මගේ මහත්තයා ඉන්න නිසා ඒ හරහා මගේ නිවසටත් පොල් ගෙනැල්ලා තියෙනවා. බොහොම පු පොල් ඒවා. 2015 2016 වර්ෂවලදී අනිවාර්යයෙන් ලාභ ලැබිලා තිබුණා. ග්‍රාම සංවර්ධන සමිතියට ආදායම ගිහින් තිබුණා. පෞද්ගලික කොන්ත්‍රාත්කරු සම්බන්ධව නම් මම දන්නෙ නැහැ. ග්‍රාම සංවර්ධන සමිතියේ අරමුදලට ලාභ ලැබිලා තියෙනවා. ඇප්තොප්වත්තෙ සෑහෙන ප්‍රමාණයක් අනවසරකරුවන් භුක්ති විඳිනවා. මේ සම්බන්ධව වෙනම පරීක්ෂණයක් කරන්න ඕන. කොම්පෝස්ට් මධ්‍යස්ථානයට යන පාර ඉක්මණින් කොන්ක්‍රීට් කරගන්න ඕන. ඒ පාර කැඩීගෙන යනවා. සභාවෙ වාහන තමයි ඕකෙ ගමන් කරන්නෙ කියන චෝදනාව තියෙන නිසා. ඒක ඉක්මණින් කරන්න ඕන. ඒ ගැන සළකා බලන ලෙස ඉල්ලා සිටිනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රි එන්. වී. සමන් මහතා කතා කරමින් :-**

ගරු සභාපතිතුමා ලේකම්තුමිය, ඒ වගේම සියලුම මන්ත්‍රීවරුන්ගෙන් හා මන්ත්‍රීවරියන්ගෙන් අවසරයි. ගරු සභාපතිතුමනි, කණගාටුවෙන් වුනත් කිව යුතු දෙයක් තියෙනවා. අපේ ගරු සහබන්දු මන්ත්‍රීතුමන් කිව්වා එතුමගේ කොට්ඨාසයට දින 5 ක් විදුලිය ලබාදෙන්න ගියාය කියලා. නමුත් අපේ කොට්ඨාසෙට ගිහින් තියෙන්නෙ දැනට එක දිනක් පමණයි. ගරු සභාපතිතුමනි, මම ගිය සභා වාරෙදිත් ඉල්ලීමක් කළා. ගම්මානයේ ඇතුල් පාරවල්වල වීථි ලාම්පු සකස් නොකලත් ප්‍රධාන පාරේ වීථි ලාම්පු ටික සකස් කරලා දෙන්න කියලා. වෙරංග මන්ත්‍රීතුමා කිව්වා වගේ කැටගොඩ බස් නැවතුම්පොළ දැනට තියෙන්නෙ කළුවරේ.

අපි මන්ත්‍රීවරුන් හැටියට සෑහෙන අපහසුතාවයට පත්වෙනවා. නෙලුව දෙල්ලව වැනි ප්‍රදේශවලින් පැමිණෙන විශාල පිරිසක් රෑට එම ස්ථානයේ ගැවසෙන නිසා වීථි ලාම්පු ටික සකස් කර දෙන ලෙස මම මේ අවස්ථාවේ ඉල්ලීමක් කරනවා. ඒ වගේම කැටගොඩ සිට බාර්හංදිය දක්වාවත් වීථි ලාම්පු ටික ඉතා ඉක්මණින් සකස් කර දෙන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම ඔබතුමාට මතක ඇති වෙරංග මන්ත්‍රීතුමත්, වනිගරත්න මන්ත්‍රීතුමත් අපි තුන් දෙනා එකතු වෙලා ඔබතුමාත් , තාක්ෂණ නිලධාරිතුමියත් උඩුගම පොළට ගෙන්නලා වෙළෙන්දන් එකතු කරලා අපි සාකච්ඡා කළා. පොළ සකස් කරන්න ඔබතුමාත් තාක්‍ෂණ නිලධාරීතුමියත් එවෙලේ පොරොන්දු වුණා. එහිදී ඔබතුමා ඊට පසු දිනම පොළ භූමිය ශුද්ධ කරන්න ඔවුන්ට වැඩ කටයුතු පවරා දුන්නා. නමුත් අද වන විටත් කිසිම සංවර්ධන කටයුත්තක් එතන සිදු වෙලා නැහැ. අපි ගිය සතියෙ පොළට ගිය වෙලාවෙ වෙළෙන්දො කතා කරලා අහන්නේ ගරු මන්ත්‍රීතුමා කෝ පොළ ශුද්ධ වෙනවද? සභාපතිතුමා පේන්නවත් නැහැ. ඔබතුමාලා පේන්නවත් නැහැ කියලා. මම ඔබතුමාගෙන් ගෞරවණීය ඉල්ලීමක් කරන්නෙ. අපි ආදායමක් ලබන තැනක් හැටියට ඔබතුමාගේ වගකීමක් තියෙනවා, අපේ සභාවේ වගකීමක් තියෙනවා, ඒක නිසා ඔබතුමා හෙට ඉදලම මේ ගැන අවධානය යොමු කරන්න. ඔවුන්ට දැනට තාවකාලිකව වෙලදාම් කරන්න පුලුවන් විදියට වත් සකස් කරලා දෙන්න. ඒ මඩවගුරෙන් මිදෙන්න ජනතාවට අවස්ථාව දෙන්න කියලා ඉල්ලීමක් කරනවා. අපිට සභාපතිතුමා කරන්න පුලුවන් උදව් උපකාර කරලා තියෙනවා. නමුත් අපට යම්කිසි අඩුපාඩුවක් වෙනවනම් මන්ත්‍රීවරු සියලු දෙනාට කටයුතු කරන්නත් වෙනවා. ඒ නිසා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරන්නෙ ප්‍රධාන පාරේ වීථි ලාම්පු ටික සකස් කරලා දෙන්න. ඒ වගේම පොළ ප්‍රදේශය ජනතාවට පහසුවෙන් බඩු ටික ලබා ගෙන යන්න පුලුවන් විදියට සකස් කරලා දෙන්න කියන ගෞරවණීය ඉල්ලීම මේ වෙලාවෙ සිහිපත් කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රි එම්. එම්. දිසානායක මහතා කතා කරමින් :-**

මම මේ අවස්ථාවේ නැගී සිටියේ කටු පොල් වගාව ගැන අපේ විලේගේ මන්ත්‍රීතුමාත්, ජයවීර මන්ත්‍රීතුමාත් කතා කරපු නිසා. මට මතකයට එනවා. ඒ දවස්වලත්, අවුරුදු විස්සකට උඩදිත් මේ සභාවෙ මේ ගැන කතා කළා. කටුපොල් වගාව ප්‍රචලිත වෙලා තියෙන්නෙ කටුපොල් ඇට ගගේ පාවෙලා ඇවිල්ලා ගග දෙපස ඉවුරුවල වැටිලා තියෙන නිසා. මේ පරිසර හානිය වෙලා ඉවරයි. එනිසා අපි දන්නවා අපගේ ජල උල්පත් සිදීයාම සිදුවෙනවා. එදත් අපි ඒ පිළිබද කරුණු දැක්වුවා. කටුපොල් ගසකට වතුර ගැලුන් 20,000 ක් විතර අවශ්‍ය වෙන නිසා එමගින් අපේ ජල උල්පත් සිදී යාමේ තර්ජන එල්ලවෙලා තියෙනවයි කියන එක එදත් කතා කළා. අද ලංකාවෙ බැලුවහම ප්‍රධානතම ආර්ථිකයක් බවට පත්වෙලා තියෙන්නෙ, පළවෙනි තැනට ඇවිල්ල තියෙන්නෙ කටුපොල් වගාව. අද හොරකම් කරන්න බැරි එකම වගාව බවට පත්වෙලා තියෙනවා. කම්කරු ප්‍රශ්නත් එක්ක බැලුවහම කම්කරුවො දෙන්නෙක් අක්කරයකට හොදටම ප්‍රමාණවත්. විශාල වශයෙන් ආදායමක් ලබන, මේ ආර්ථිකය දියුණු කරන, වගාවක් හැටියට තමයි කටුපොල් වගාව දැනුත් අපට දකින්නට ලැබෙන්නෙ. අපිට දැන් පේනවා මේ වගාව අපේ පරිසරයට ඉතාම හානිදායක බව. ඒ කර්මාන්ත ශාලාවෙන් පිට කරන අපද්‍රව්‍ය නිසා තමයි ගංවතුර ගලපු වෙලාවෙ අපේ තේ මැරෙන්න ප්‍රධාන සාධකය වුනේ. අපේ ගමේ ඔහොම කටුපොල් වගා කරන්න ඒ වතුයායෙන් පටන් ගත්තා. නමුත් අපි එකා වගේ කම්කරුවො, අපි ගමක් වගේ හිටිය හින්දා ඒක වළක්වලා අද කුරුදු වගාවක් බවට පත්වෙලා තියෙනවා. ඒ ගැන මම අද මේ සභාවෙ සතුට පළ කරන්න කැමතියි. බොහොම ස්තූතියි මම නවතිනවා.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රි ධර්මසිරි ගණේවත්ත මහතා කතා කරමින් :-**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. මම කතා කරන්න මාතෘකා කරන් හිටපු ගොඩක් කරුණු කාරනා මන්ත්‍රීවරුන්ගෙන් ප්‍රකාශ වුනු නිසා ඒ පිළිබදව කතා කරන්නෙ නැහැ. අපේ සභාපතිතුමා අපහසුතාවයට පත් කිරීමට අනිත් මන්ත්‍රීවරු ලයිට් ගණන්, දවස් ගණන්, කිව්වට, මටත් වීථි ලාම්පු සවි කරන්න ආවෙ නැති වුනාට මම ලෙස්ලි මහත්තයගෙ වීථි ලාම්පු සවිකරන ලේඛනය පරික්ෂා කරලා බැලුවා. ඔය කියපු එකක්වත් තිබුනෙ නැහැ. ඒ නිසා අපේ මන්ත්‍රීවරු අහුවෙන්න නම් එපා කියන එකත් සිහිපත් කරනවා.

පසුගිය දවස්වල සංවර්ධනගමට යන ප්‍රධාන මාර්ගය , කැටගොඩ කඩේ මාර්ගය අධික වර්ෂාව නිසා විනාශයට පත්වෙලා තිබුණා. සියලුම පළාත්වල මැටි පාරවල් විශාල වශයෙන් වර්ෂාව නිසා හානියට පත්වෙලා තිබුණා. සංවර්ධන ගම්මානයට යන පාර මිනිස්සුන්ට යන්න බැරි තත්වයකට පත්වෙලා තිබුනු මොහොතක වර්ෂාව නොතකා ශ්‍රමදානයක් මගින් ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරීමට කටයුතු යොදලා සභාපතිතුමා දැනුවත් කළා. එතුමගේ පූර්ණ අනුග්‍රහය ඒ සඳහා ලැබුණා. ඒ අවස්ථාවෙ හැටියට අපට උපකරණ , වාහන ගන්න බැරි වුණා. එතුමා මට ආශිර්වාද කළා මේක කරගෙන යන්න. ඒ ගැන මම මේ වෙලාවෙ සිහිපත් කරනවා. මගේ අතින් රු. 35000.00 ක මුදලක් මැෂින්වලට යොදවලා දින 03 ක ශ්‍රමදාන කටයුත්තක් සිදු කරලා ඒ ප්‍රදේශයට යන පාර සැකසුවත්, වර්ෂාව නතර නොවුන නිසා ගමනාගමන කටයුතුවලදී පෙරටත් වැඩිය පොඩි අපහසුතාවයකට පත් වුණා. මම ගිය මාසෙ සභාවේදිත් මේ සමබන්ධව කතා කළා. එවිට මෙය ඉක්මණින් කල යුතුයි කියලා සභාපතිතුමා කිව්වා. මොකද එතුමටත් ඒ පාරෙදි වාහනේ ගන්න බැරිව ගිය නිසා. මම මුදල් වියදම් කරලා හැදුවත් තාම මේකෙ යන්න පුලුවන් කමක් නැහැ. ගෙයක් කඩපු එකක් තියෙනවා ඒකෙ පස් දැම්මොතින් සිමෙන්ති මිශ්‍රණයයි, ගල්කුඩුයි තියෙන නිසා ABC , කොරි ගල් දාපු වගේ තත්වෙට ගන්න පුලුවන්. ඒකට අපිට තවත් මුදලක් වියදම් කරන්න වෙනවා. ඒ නිසා ඒ ගැන අවධානය යොමු කරලා පුලුවන් නම් මට ඉදිරියෙදි පාරෙ තියෙන විශාල වලවල් ටික ගොඩකර ගැනීමට ඔබතුමාගේ සහයෝගය ලබා දෙන්න කියලා සිහිපත් කරනවා.

ඒ වගේම පසුගිය මාස 2 ක් විතර කතා කළා මාපලගම උප කාර්යාලය සම්බන්ධව. සභාපතිතුමත්, ලේකම්තුමියත් කාර්ය මණ්ඩලයත් එතනට ගිහිල්ලා මටත් එන්න කියලා සාකච්ඡා කලා. පියල් මන්ත්‍රීතුමත් ඇවිල්ලා අපි මේක පරික්ෂා කරලා බැලුවා. පසුව ඔබතුමාගේ අධීක්ෂණය යටතේ ඒ අඹ ගසේ අතු ඉවත් කරන්න මට අවසරය ලබා දුන්නා. පියල් මන්ත්‍රීතුමාත්, ගයාන් මන්ත්‍රීතුමාත් අපි තුන්දෙනා එකතු වෙලා අපිත් මහන්සි වෙලා ඒ කටයුත්ත සිදු කළා. ඒ කාර්යාලයේ අයගෙනුත් අපට සහයෝගය ලැබුනා. උප කාර්යාලයේ හිටපු නිලධාරි මහත්ම මහත්මීන් අපට එදා දවසේ ඉතා හොදින් තේ සංග්‍රහයත් කළා. ඒ පිළිබඳවත් මම සිහිපත් කරනවා. ඉදිරියට උප කාර්යාලය තෙමෙන එකක් නැහැ. තවත් මන්ත්‍රීවරු ගිහිල්ලා ෆොටෝ ගහගෙන ඇවිත් තිබුණා. සිරස ආයතනයෙන් එතනට ගිහිල්ලා තිබුණා. වතුර වල වීඩියෝ කරන්න. ඇත්තටම අපි එකමුතුවෙලා අපේ සභාවේ දේවල්, මං කියන්නේ සභාව කිව්වම මේ ඉන්න 27 දෙනාගෙම සභාව ඉතින් එහෙම නම් අපි ඉස්සරවෙලා හැමදේම මෙතන කතා කරන්න ඕන. මෙතන කතාකරලා මෙතනන් විසඳුමක් නොලැබුනොත් අනිවාර්යයෙන්ම ඉස්සරහට අරන් යන්න ඕන. මම ඉල්ලා සිටිනවා මේ සභාව තුළ සභාවෙන් කල යුතු යම් දෙයක් තියෙනවද ඒ දේ සභාවෙ කතා කරලා මේ මහ සභාවෙන් විසදුමක් ගන්න බැරි වෙනවනම් විතරක් ඉදිරියට ගෙනියන්න නැත්නම් පළමුවෙන් මෙතන කතා කරලා ඒකට විසදුම වශයෙන් ඔබත් උදව් වෙලා වැඩ කරන්න කියන ගෞරවණීය ඉල්ලීම කරනවා.

ඒ වගේම කුඹුරු ගොඩ කිරීම පිළිබඳව අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමා ඊයෙ දවසේ සංවර්ධන කමිටුවේදීත්, අදත් අදහස් ප්‍රකාශ කළා. ඇත්තටම මම ගොවිජන සංවර්ධන කමිටුවෙ සභාපතිවරයා වශයෙන්, මට නිහඬව ඉන්න සිදුවීම ගැන කණගාටු වෙනවා. මගේ සහෝදර මන්ත්‍රීවරයෙක් එතනදි ඒ නිලධාරීතුමියට බනිද්දී ඇත්තටම මට නිහඬව ඉන්න සිදුවුණා. මේක දැනගැනීම පිනිස කියන්නෙ . ඒ නිලධාරීතුමිය එදා දවසෙ ගොවිජන සේවා මධ්‍යස්ථානයේ සිටිද්දී දුරකථන ඇමතුමක් ආවා. මමත් සුරවීර මහත්තයත් එතන හිටියා. ඒ දුරකථන ඇමතුමෙන් ඇහුවා මේකට නඩු පවරන්නේ කොහොමද කියලා. මොකක්ද කරන්නේ කියලා. එතනදි 32 වගන්තියෙන් නඩු පවරන්න කියලා එතුමිය උපදෙස් දීලා යන්න හදනකොටම තව දුරකථන ඇමතුමක් ආව. මම අයින් කරනවා මිස් ඒ නිසා නීතිමය කටයුතු කරන්න එපා කියලා. හැබැයි එතුමිය ඒ වෙලාව ක්‍රියාත්මක වුණා කියන එක මන්ත්‍රීතුමාගේ දැන ගැනීම පිනිස සිහිපත් කලේ. කුඹුරු ගොඩ කරන එකක් ගැන කිව්ව නිසා. හැබැයි ඔබතුමාට විරුද්ධව යම් ප්‍රකාශයක් නිකුත් කරානම් ඒකෙ වීඩියො එක තියෙනවා. මම ඒක හෙලා දකිනවා. අපි යම් ප්‍රකාශයක් කළායින් පස්සෙ තැනකට ගිහිල්ලා අපිට තොරතුරක් එනවා. අපිට තොරතුරු එන්නෙ ඒක නිවැරදි කර ගන්න. මම දැනුවත් කිරීමක් කරන්නම් මීට පස්සෙ කුඹුරු ගොඩ කරන තැනක් තියෙනවනම් ඇත්තටම අපට පුලුවන්කමක් තියෙනවා ඒ කටයුත්ත නවත්වන්න. මොකද මම ගොවිජන සංවර්ධන සභාවෙ සභාපති. ඒ පනත අනුව නඩු පැවරීමේ වගකීම තියෙන්නෙ ගොවිජන සංවර්ධන සභාවට ඒ නිසා අපි මින් ඉදිරියට නාගොඩ ගොවිජන සේවා බල ප්‍රදේශයේ කොහේහරි තැනක කුඹුරක් ගොඩ කරනවනම් මම දැනුවත් වුනෝතින් ඒ

පිළිබඳව කටයුතු කරන්න ඉඩ තියන්නෙ නැහැ. කුඹුරු ගොඩ කිරීම පිළිබඳව ඇත්තටම බැට කාලා දයානන්ද වීරසිංහ කියන මහත්තයා කුඹුරු ගොඩ කිරීමක් නිසා මගේම අක්කර 6 ක් විතර පුරං බවට පත්වෙලා තියෙන්නෙ. මේ ගැන මේ සභාවෙ කතා කරලා තියෙනවා, සංවර්ධන කමිටුවෙත් කතා කරලා තියෙනවා. එදා මම දැනුවත් වෙලා නොතිබුනාට ඒ පිළිබඳව හොඳ දැණීමක් මට අද තියෙනවා. මන්ත්‍රීතුමනි, ඇත්තටම හොඳයි ඔබතුමා ඒ පිළිබඳ අවධානය යොමු කිරීම මින් ඉදිරියට කුඹුරු ගොඩ කරනවනම් අපි දැනුවත් වෙනවනම්, ඒ කටයුතු නවත්තන්න අපට හැකියාව තියෙනවා.

ඒ වගේම මේ සභාවෙ කතා වුණා. ගවයන් පිළිබඳව, ඇත්තටම මට මේ පනත හම්බවුන ගමන් බැලුවෙ මේ සභාවට කල හැක්කේ මොකද්ද කියලා. මොකද අපි පිටින් ඉදගෙන සභාවට කොපමන ලිපි එවලා තියෙනවද කියලා දැනගන්න පුලුවන් සභාවෙ පරන ලේඛන තියෙනවනම්. මීට පෙර මන්ත්‍රීතුමාලා කතා කළා වගේ මම මේක අරගත්ත ගමන් බැලුවෙ මේකෙ තියෙනවද ගවයන් පිළිබඳව සභාවෙ සභාපති හා මන්ත්‍රීවරුන්ට මොකද්ද කල හැක්කේ කියලා. ඇත්තටම ගවයින් පිළිබඳව ගත හැකි තීරණයක් තියෙන්නෙ පාරේ ගමන් කරන ගවයින් ගැන විතරයි. මම සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා ගවයෙක් අලාභයට බැඳ ගත්තම අය කරන මුදල එදා චක්‍රලේඛ අනුව තමයි අය කරන්නෙ. තවමත් ඒවා සංශෝධනය වෙලා නැහැ. පුලුවන් නම් මේ සභාවල කතා වෙලා අපි උපරිම දඩයකට යන්න ඕන. එතකොට ගව හිමියා අනිවාර්යයෙන්ම ඒ තැනට යන්න බයයි. එහෙම නැත්නම් පවක් සිදු වුනත් ඒ ගවයා වෙන්දේසි කිරීමේ කටයුතු හරි සිදු කරන්න වෙනවා. මම මේ සභාවට එන්න ඉස්සරවෙලා ගොවිජන සංවර්ධන සමිතියේ ඉදගෙන, ගොවි සංවිධානවල ඉද ගෙන කතා කළා. අපිට තියෙන ලොකුම ගැටලුව තමයි මේ ගවයින්ගෙන් කුඹුරු බේරගන්න එක. මම කමිටුවටත් ආවා. කමිටුව පළමුවෙන්ම නියෝජනය කරලා තියෙන්නේ මේ ගවයන්ගේ ප්‍රශ්නෙට. ඇත්තටම අපේ මන්ත්‍රීවරු දෙපලක්ම කතා කල දෙයක් වුනත් මේකට මොකක්හරි විසඳුමක්,අපට ගන්න හැකි දෙයක් ගමු. මොකද නාගොඩ මාපලගම පාරේ ඉන්න ටික අල්ලන කොට අනිත් ටික බැඳගනීවි. අපට පුලුවන් පාරේ ඉන්න ගවයින් නිසි ක්‍රමවේදයක් අනුගමනය කරලා සභාපතිතුමාගේ බලතල අනුව අයාලේ යන ගවයින් පිළිබඳ පියවරක් ගන්න.

වීථි ලාම්පු ගැන සාකච්ඡා කල නිසා මමත් එතනදි සිහිපත් කරනවා ෆයිබර් ඉණිමග පුලුවන් තරම් ඉක්මනට අරන් දීලා අපට සේවය ලබා ගන්න කියලා. පස්සට දාන්න එපා. සභාවෙ යෝජනා වුනු දෙයක්. ඒක නිසා පුලුවන් තරම් ඉක්මනට ඒක කරමු. සභාපතිතුමා යම් නිලධාරියෙක් සහයට ලබා ගන්න ගිය සභාවේදි යෝජනා වුණා. ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න. මේ කටයුතු අතපසු වීම නිසා තමයි අපට දෝෂාරෝපන එන්නෙ. ඒ නිසා ඒ පිළිබඳ අවධානය යොමු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු සභාපතිතුමනි අපට මෙවැනි ප්‍රශ්න හා කරුණු තිබුනත් ඇත්තටම ඒ කතා කළ යුතු වෙලාවෙදි කතා කරමු. ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරලා මට බැහැරවීමට අවසර ලබා දෙන්න ඔබතුමා මට අවසර ලබා දේවි කියලා මම බලාපොරොත්තු වෙනා. ඔබ සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රි වසන්ත කුමාරගේ මහතා කතා කරමින් :-**

ගරු සභාපතිතුමනි, සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ලේකම්තුමිය ඇතුළු සියළුම දෙනාගෙන් අවසරයි. මම මුළින්ම සතුටුවෙනවා අද දවසෙ මාපලගම නගරය පිළිබඳ නිතර දෙවේලේ මමත්, බන්දුල මන්ත්‍රීතුමත් කතා කරනවා. අපි දීර්ඝ කාලයක් කතා කරපු සිද්ධියක් මල්ඵල ගැන්විලා තියෙනවා. ඒ තමයි මාපලගම බස් නැවතුම්පලේ වැසිකිලි, කැසිකිලි පද්ධතිය මං හිතනවා අපි කවුරුත් කතා කරපු එකේ ප්‍රතිඵලයකුත් මාර්ග සංවර්ධන අධිකාරියට රජයක් හැටියට අපේ සංවිධායක සුනිල් සේනානායක මැතිතුමත් නිතර දෙවේලේ මේ පිළිබඳව සිහිපත් කළා. ඒ වගේම අපේ දිස්ත්‍රික් නායක වජිර අබේවර්ධන මැතිතුමා හරහාත් අපි සිහිපත් කළා. අපේ සභාපතිතුමත් සභාව පැත්තෙන් මැදිහත් වුණා. ඒ සියල්ලෙ ප්‍රතිඵලයක් හැටියට ඉදිරියෙදි අපට ඒ කටයුත්ත කිරීමට හැකියාව ලැබෙයි. හැබැයි තව ගොඩක් අඩුපාඩු තියෙනවා. හැබැයි මේ එක්කම මම සභාපතිතුමාගෙන් මම අහන්න කැමතියි. මං ගිය සභා වාරේ සටහනක් කළා. මාපලගම වෙළඳ සංකීර්ණයේ උඩුමහලෙ කඩ කාමර වැසි දවසට තෙමෙනවයි කියලා. කඩ බදු ගනිපු අයට ඒවා නැවත් පාවිච්චියට ගැනීමට අපහසුතාවයක් තියෙනවා . මං හිතන්නෙ ඒකෙ ප්‍රතිඵලයක් හැටියට අද වන විට කඩ කාමරවල අයට එන්තරවාසි යවලා තියෙනවා. හිග මුදලක් තියෙනවා, මේ හිග මුදල නොගෙව්වොත් නඩුදානවයි කියලා. එහෙම දෙයක් සිදු වුණාද? සිදු වෙලා තියෙනවද? හැබැයි අපේ

යුතුකමක් තියෙනවා. ගරු සභාපතිතුමනි, අපි ඒ මිනිස්සුන්ට සභාව පැත්තෙන් අවශ්‍ය යුතුකම් ඉටු කරලා නැහැ. ඒ අයට ඒ ව්‍යාපාර පවත්වා ගෙන යන්න අවස්ථාව ලබා දීලා නැහැ. ඒ මිනිස්සු කඩ පාවිච්චි නොකර තමයි බදු ගෙවන්න වෙලා තියෙන්නෙ. සභාවෙ ලේකම්තුමියත්, සභාපතිතුමත් ගිහිල්ලා පොරොන්දු වෙලා තියෙනවා මේ කඩ කාමර භුක්ති විඳින අයට මේ වහල හදලා දෙනවා නැත්නම් ඒ දොර හදල දෙනවා නැත්නම් මේ සියල්ල හදල දෙනවා කියලා. නමුත් ඒක එහෙම නොවී ඒ අයට බදු ගෙවන්න කියලා සභාවෙන් ලියුම් යවලා තියෙනවා. ඒ වගේම ඒ අයට කියලා තියෙනවා නොගෙව්වොත් නඩු දානවා කියලා. සභාපතිතුමා තමන්ගේ යුතුකම ඉටු කලා නම් හොඳයි කියලා මම හිතනවා. මම ගිය සභාවෙත් ඒ ගැන කතා කළා. මෙහෙන් යවපු ලියුමක පිටපතක් තියෙනවා. කඩ කාමර කිහිපයක් උඩ තට්ටුවෙ තියෙනවා. විනෝදා පොත් හලේ කුරුවිට කංකානම්ගේ අමරදාස මහත්මය එතුමට තමයි මේ එන්තරවාසියක් යවලා තියෙන්නෙ. බදු මුදල් නොගෙවීම සම්බන්ධව. බදු මුදල් අනිවාර්යයෙන් ගෙවන්න ඕන. හැබැයි ඒ අය කඩ කාමරයෙන් යම් ප්‍රතිඵලයක් ගන්න ඕන බදු ගෙවන්න නම්. ගරු සභාපතිතුමනි, එහෙම තීන්දු තීරණ ගන්න එපා. මේ මිනිස්සු එදා ඉඳලම මාපලගම හංදියෙ හිටපු අය. කඩ කාමරය ආපහු භාරදෙන්න ඕන නැහැ. ටෙන්ඩරයකින් ඒක ගත්ත නම්, සභාවෙන් බදු අය කරනවනම්, යම් අඩුපාඩුවක් තියෙනවනම් අපි ඒක හදල දෙන්න ඕන. ඒකයි වෙන්න ඕන. මම හිතන්නෙ ඒ අයගෙ බදු ගෙවීම පහළ මට්ටමකට ඇවිල්ල තියෙන්නෙ මේ කාරණය නිසා. ඒ ගැන සභාවට දිගින් දිගටම ඉල්ලීම් ආවත් ඒවා ඉටු කරලා නැහැ. මම නැවත වාරයක් ඉල්ලීම් කරන්නෙ මේ ව්‍යාපාරිකයන්ගේ ඉල්ලීම් ගැන සානුකම්පිතව සොයා බලා මේ අයටත් සාධරණයක් කරන්න. එව්ට ඒ අයත් සභාවට සාධාරණයක් කරාවි. මොකද අද ඊයෙ නෙවෙයි මේක දිගුකාලීනව ව්‍යාපාරිකයින් කිහිප දෙනෙක් එක්ක මේ සභාවෙ ගැටලු තියෙනවා. දේශපාලනය මැදිහත් කර ගන්න එපා. කවුරුත් මොන දේශපාලනය කලත් කීයක් හරි හම්බ කර ගන්න හදන්නෙ. අපිත් ඔය කඩේට යන එන හින්දා මේක දේශපාලනය පිළිබඳ ප්‍රශ්නයක්ද කියලත් අපිට හිතෙනවා.

දෙවන කාරණය හැටියට මේ සභා වාර්තාවෙ යම් සටහනක් කලොත් ඒක තමන් කිව්වෙ නැහැ කියලා නැවත වරක් සංශෝධනය කරන්න පුළුවන්ද. මේ සභා වාර්තාවේ එහෙම නම් ඔයගොල්ලෝ බොරු ලියලා තියෙන්නෙ. මේ සභාවෙ ධර්මසිරි ගනේවත්ත ගරු මන්ත්‍රීතුමන් පසුගිය සභාවෙ යම් කාරණයක් ගැන කතා කළා. පරණතානායම්ගොඩ පඹගොඩවතුරාව වේල්ල සංවර්ධනය කිරීම හැබැයි මේ සභා වාර්තාවෙ ඒක තියෙනවා ඒක කිව්වෙ නැහැ කියලා. එතුමා විතරක් නෙමෙයි තවත් අපේ උඩුගම මන්ත්‍රීතුමත්, එතුමත් ඒ වගේ ප්‍රකාශයක් කළා. අපි අහගෙන හිටියා. සභාපතිතුමා මේක සමහරවිට ගමට ගිහිල්ලා මතයක් යවලා තියෙනවා මම ගිහිල්ලා සභාවෙ කතා කරපු දේවල් ගමේ කට්ටියට මෙහෙම ප්‍රකාශයක් කළේ නැහැ. මේ බොරු කතාවක් යවලා තියෙන්නෙ කියලා. ඉතින් ඒ නිසා අපි සභාවෙ යම් දෙයක් කතා කරනවනම් අපි ඒකෙ වගකීම භාර ගන්න ඕන. යම් දෙයක් අපි මේ සභාවෙ කිව්වනම් ඒක වගකීමෙන් කියන්නෙ. එහෙම කිව්වෙ නැහැයි කියලා කියන්න බැහැ. කියලු දේවල් ඇත්ත වෙන්න ඕන. සමහර විට අපි ප්‍රකාශ කරන දේවල් වල පොඩි පොඩි අඩුපාඩු අති එතුමා කියපු එක වැරදි විදියට අර්ථකතනය වෙලානම් ඒක සභාවෙ වැරැද්දක්. ඇයි වැරදි විදියට ලියන්නෙ. මෙහේ ඇතිනෙ ටේප් කරපුවා. අනිත් එක මේ සභා වාර්තාවෙ සමහරක් කරුණු කාරනා දිහා බලනකොට මේකෙ අපි කතා කරන ඒවයි, වචන හසුරුවන ආකාරය අපිට එච්චර පැහැදීමක් නැහැ. මේ මන්ත්‍රී මණ්ඩලයෙන් කියලා මේකෙ සඳහන් කරලා තියෙනවා. සභා වාර්තාව බලන කොට අපිට හිතෙන්නෙ අපි නිකන් හෑල්ලුවට ලක් කරලා වගේ මේ වාර්තාව වෙන කෙනෙක් බලනකොට මේ මිනිහා එතන ගිහින් කතා කරන භාෂාවද, මම දන්නෙ නැහැ අපි නම් එහෙම මන්ත්‍රී මණ්ඩලයෙන් අරහෙ මෙහෙ කියලා කතා කරලා නැහැ. සභා වාර්තාවෙ තියෙනවා මන්ත්‍රී මණ්ඩලයෙන් අවසරයි කියලා. එතකොට මේක බලන කෙනාට වැරදි හැඟීමක් ඇතිවෙනවා. ඒ නිා ඒ වගේ වචනවල නිවැරදි තාවයක් තියෙන්න ඕන. සභාපතිතුමනි, මොකද ඉස්කෝලෙ පහේ පන්තියට හරි අපි ගිහිල්ලා තියෙනව. ඒ ගියාම අපි මොනවහරි අර්ථවත් විදියට නේ කතා කරන්නෙ. එහෙම අවසර ගැනීම පිළිබඳව ඔබතුමාලට ගැටලුවක් නැති වුනාට අපිට ගැටලුවක් තියෙනවා.

ඊළගට මුලන ආනන්දාරාම විහාරස්ථානය අපේ ප්‍රදේශයේ තිබෙන ප්‍රධාන විහාරස්ථානයක්. දැන් මේ පාරවල් පිළිබඳව මේ වෙලාවෙ කතා වුණා. ආනන්දාරාමයට යන ප්‍රවේශ මාර්ගය සභාපතිතුමා නම් කරලා තියෙනවා. නාගොඩ පඤ්ඤානන්ද මාවත කියලා. මම හිතන්නෙ මේ සභාවේදි ඔබතුමාට යුතුකමක් තිබුණා සභාවට යොමු කරලා සභාවෙ අවසයක් ගන්න. මම දන්නෙ නැහැ ඒ හාමුදුරුවෝ ඔබතුමාලගේ පවුලේ ඥාති සාමාජික කෙනෙක් වෙන්න ඇති. ඉතින් ඒක ගැන ගැටලුවක් තියෙනවා. ගමේ අය අපෙන් අහනවා ඔබතුමාලත් සභාවෙ ඉන්නවා ඔබතුමාලා දැනුවත් වෙලාද මේ වගේ කටයුතු කරන්නෙ කියලා.

ඊලග කාරණය තමයි, මාපලගම බස් නැවතුම්පොලෙන් ශ්‍රී ලංගම බස් රථ සේවාව උදේ පාන්දර ඉදලා හැන්දෑවෙ 7 වෙනකම් ක්‍රියාත්මක වී අවසන් වෙනවා. දැන් තියෙන කාර්යබහුල ජීවිතයත් එක්ක රාජකාරි බහුල වකවානුවක රජයේ සේවකයන්ට හැන්දෑවෙ හතේ බස් එකට එන්න අමාරුයි. මේ වෙලාවෙ ගරු සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා ලංකා ගමනාගමන මණ්ඩලයේ ගාල්ල ඩිපෝවෙන් ඉල්ලීමක් කරන්න හැන්දෑවෙ 8 ටත් තව බස් රථයක් දාලා අවසාන ගමනාන්තය රාත්‍රි 8.00 වෙනකම්වත් මගී ජනතාවට අවස්ථාව ලබා දෙන්නෙයි කියලා. ඉතින් මේ කරුණු ටික පමණයි.මේ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරන්න.

අර පියල් මන්ත්‍රීතුමන් කිව්ව වගේ තව එක අඩු පාඩුවක් තියෙනවා. මාපලගම නගරෙ හැමදාම කතා කරන වීථි ලාම්පු ටික ඕක ඉතින් අපි හිතුවෙ මේ නාගොඩ කෙනෙක් සභාපති වුනාම ඉක්මනට කෙරෙයි කියලා. අර කවුරුත් කතා කළා වගේ ඒ වැඩේ නම් නොකෙරන පාටක් තියෙන්නෙ. ඔබතුමාගෙ විශේෂ අවධානය යොමු කර මාපලගම නගරය, දැන් තල්ගස්වල නගරෙ නම් යන්තම් තියෙනවා. සොඩියම් ලයිට් තියෙනවා. 1 යි තියන්නෙ. ඒක නිසා සෝඩියම් බල්බ් ටික හදන්න බැරි නම් කාර්මික නිලධාරී මහතා දන්නවා මේක මොකක් හරි මාර්ගයකින් CFL බල්බ් එකක් දාලා හරි මාපලගම ප්‍රධාන නගරයේ වීථි ලාම්පු ටික හදලා දෙන්න කියලා. මේ කරුණු කිහිපය කෙටියෙන් සඳහන් කරමින් ඔබතුමාට අපි හැමදාමත් සහයෝගය දෙනවා වගේ ඉදිරියටත් නොකැලැල්ව ලබා ගන්නට නම් අපේ අදහස් වලටත්, ඉල්ලීම් වලටත් පොඩ්ඩක් හරි සවන් යොමු කරන්නෙයි කියලා ඉල්ලා සිටින ගමන් මම නිහඬ වෙනවා. සියලු දෙනාට තෙරුවන් සරණයි.

**ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රි තරංග සුදර්ශන මහතා කතා කරමින් :-**

ගරු සභාපතිතුමා, උප සභාපතිතුමා, ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. ඇත්තටම මට තාරණා කිහිපයක් කතා කරන්න තිබුනත්, කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. විශේෂයෙනන්ම අද විශේෂ ස්තූතියක් කරන්න ඕන දකුණු පළාත් සභා ගරු මන්ත්‍රී සුමනසිරි ලියනගේ මැතිතුමා මගේ විශේෂ ඉල්ලීමක් මත ගෝණදෙනිය විද්‍යාලයට රුපියල් මිලියනයක මුදල් පරිත්‍යාගයක් සිදු කිරීම අද උදෑසන සිදු වුණා. ඒ උත්සවයට සහභාගි වුනු නිසා තමයි ප්‍රමාද වුනේ. මේ සභාවෙ අපේ බල ප්‍රදේශයට එතුමා පාසලක් වෙනුවෙන් කරපු මිලියනයක පමණ මුදල් ප්‍රතිපාදනය වෙනුවෙන් අපේ ප්‍රාදේශීය සභාවෙ ස්තූතිය මේ අවස්ථාවෙ පුද කරනවා. මේ අවස්ථාවට උඩුගම කොටසේ අපේ මන්ත්‍රීතුමියත්, මමත්, අපිත් අපේ හිටපු සභාපතිතුමත්, සහභාගි වුණා. එතුමා මේ ප්‍රාදේශීය සභාවට වවිශාල ලෙස සහයෝගය දක්වා කටයුතු කරන මන්ත්‍රීවරයෙක්. මුලින් කිව්වා වගේ අපි එතුමාගෙන් යම් ප්‍රතිපාදනයක් ඉල්ලා සිටියම රුපියල් ලක්ෂ 2.5 ක මුදලක් අපේ සභාවට එවලා තියෙනවා. සභාපතිතුමා මුලින්ම කිව්වෙ මේ මාස 4 ඇතුලත අපට පුලුවන් නම් ප්‍රතිපාදන හොයා ගෙන වැඩ කටයුතු කරන්න කියලා. ඔබතුමාටත් බරක් නොවී යම් ප්‍රතිපාදනයක් අපි ඉල්ලගෙන කටයුතු කරන්න හැදුවත් මේ සභාවෙ දෙන සහයෝගය නම් බොහොම මදි කියලා තමයි මේ අවස්ථාවෙ කියන්න හිතෙන්නෙ. ඔබතුමාට පුද්ගලිකව මේක කරන්න බැරිව ඇති. මොකද මේ මාස 4 තුල අපි ආපහු හැරිලා බැලුවම මේ සභාවෙ නවක සහ පැරණි මන්ත්‍රීවරු හිටපු සභාපතිතුමන්ලා විශාල ලෙස යෝජනා ගේනවා. වැඩිපුරම නවක මන්ත්‍රීවරු එක දවසට යෝජනා 10,15 ගේනවා. මාස 4 ට එක්කෙනෙක් යෝජනා 40, 50 ක් දීලා තියෙනවා. ඉතින් අපි මේවට අපේ තාක්ෂණ නිලධාරීන් ඇස්තමේන්තු කරන්න යවනවා. ඒ යැව්වට මම හිතන්නෙ නැහැ. ඒකෙන් 5 % ක් වත් එක මන්ත්‍රීකෙනෙක්ගෙ යෝජනා ක්‍රියාත්මක වුණා කියලා. මේ අවස්ථාවේ අහන්න සිද්ධ වෙනවා අප්‍රේල් මාසෙ ඉදලා සභා වාර 4 කට සහභාගි වුණා. මේ වාර 4 දිම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා එක් එක්කෙනාගේ හිත හොඳ කරන්න වෙන්න ඇති ගමේ

යෝජනා මෙතනට ගේනවා. ඒ යෝජනා එකක්වත් ක්‍රියාත්මක නොකර ඊළග යෝජනාවත් ගේනවා. ඊට පස්සෙ ඊළග මාසෙත් ආපහු යෝජනා ගේනවා. ඒ වගේ සමහර අයගේ මම ගනන් හදලා බැලුවා යේජනා 30, 40 ක් තියෙනවා. නමුත් මේ කිසිම යෝජනාවක් ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ වගේම තමයි අපි හදිස්සියට එවපු සල්ලිවලට තාක්ෂණ නිලධාරියෙක් මේ සභාවෙන් ඉල්ලුවම මෙන්න මේ වැඩේ කරගන්න දෙන්න, මේ වෙලාවෙ යන්නම බැරි පාරක් කරන්න, මේ මුදල් මේ සභා අරමුදලෙ සල්ලිත් නෙවෙයි. මේ ආණ්ඩුවෙන් එවපු මුදලුත් නෙවෙයි. මේ මුදල් අපි වෙනම ගෙන්න ගෙන ඒ මුදල්වලටවත් අපිට තාක්ෂණ නිලධාරියෙක් ගන්න වෙලාවක් නැහැ. එක්කො කියනවා. වාහන නැහැ, වෙන එකක් ඇස්තමේන්තු කරන්න ගිහිල්ලා කියලා කියනවා. සභාපතිතුමා කිව්වට කාලගුනය අයහපත් වීම නිසා මේවා පරක්කු වෙනවයි කියලා වැඩ

කරන්න කාලගුනය බාධාවක් වුනත්, එතනට ගිහිල්ලා බලලා ඇස්තමේන්තුවක් කරගන්න කාලගුනය බාධාවක් වෙන එකක් නැහැ. මේ සභාවෙ තාක්ෂණ නිලධාරී මහත්වරු දෙන්නෙකුත්, නිලධාරීතුමියකුත් ඉන්නවා. සමහර වෙලාවට ඒ දෙන්නා එකට එන්නෙ. සමහර වෙලාවට තුන්දෙනාම එකට යන වෙලාවල් තියෙනවා. එහෙම නැතුව ඒ අය එක එක කොටස්වලට වෙන් කරලා ඒ අදාළ ස්ථානවලට යවන්න කටයුතු කරන්න. මන් කියන්නෙ අනාගතයේදි කරන්න බලාපොරොත්තුවන හිතාගෙන ඉන්න සියල්ල නෙවෙයි. මේක සල්ලි ඇවිල්ලා කරන්න පුලුවන් අත්‍යවශ්‍ය වැඩේට හරි ප්‍රමුඛතාවය දෙන්න කියලා. මේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලා වෙනුවෙන් ඉල්ලා සිටිනවා.

ඒ වගේම පොල් ඉඩම ගැන කතා කළා. අපේ සභාපතිතුමා සද්භාවයෙන් කරන ඒ උත්සාහයට අපි ස්තුතිවන්ත වෙනවා. ඒකෙ අපේ දෙකක් නැහැ. මේ සභාවෙ හිටපු මන්ත්‍රීවරු හැටියට ගිය සභාවෙ අපි දැක්කා යම් යම් දූෂණ වංචා වුණා. මේ සභාවෙ නිලධාරීන් පවා පොල් ගෙනැල්ල විකුනුවා. පොල් බෙදාගත්තා, ගෙවල්වල ගෙනගියා, මම දන්නෙ නැහැ අරමුදලට සල්ලි දැම්මද නැද්ද කියලා. ඒ කොහොම වුනත් කමක් නැහැ. නමුත් සභාවෙ ආදායම සභාවට නම් කවදාවත් හරියට ආවද කියලා කියන්න අපි දන්නෙ නැහැ. නමුත් අවසානයේ මේ නාගොඩ ප්‍රාදේශීය සභාවෙ ප්‍රසිද්ධ වුණා යම් කාරනයකට. ඒ අර, සීනිගම ගිහිල්ලා පොල් ගහපු එකෙන් සභාව ප්‍රසිද්ධ වුන එක විතරයි වුනේ. ඒකෙන් සභාවට යහපතක් වුනේ නැහැ. මම මේ අවස්ථාවේ කියන්න කැමතියි. සභාපතිතුමා අපිට නොමිලේ හම්බවුනු පොල් ඉඩම කරගන්න බැරිව අක්කර 5 අපෙන් ගිලිහුනා. ඔබතුමත් මේ ගොඩක් මන්ත්‍රීවරුත් සභාපතිතුමන්ලා, උප සභාපතිතුමා අපි කිහිප දෙනෙක් මන්ත්‍රීවරු විදියට මෙතන හිටියා. අපි ඒක දැක්කා. ඒක නොමිලෙ හම්බ වුනු දේ. කරගන්න බැරිව දැන් රු. 60600.00 කට අරන් තියෙනවා. තව එකක් තමයි සභාවෙ අපි දැනුවත් වෙලා තිබුනෙ නැහැ. නමුත් ඔබතුමා ඔබතුමාගේ පුද්ගලික යුතුකමක් විදියට හැමෝටම කතා කරන්න උත්සාහ කළා. මම ඒකෙ වරදක් දකින්නෙ නැහැ. නමුත් නොමිලේ ලැබුන එක කරගන්න බැරිව, අපට තියෙන දේපල අපට පරිස්සම් කරගන්න බැරිව අපි බදු දෙනවා. අපි අන්තිමට පොලවල් තුනත් ටෙන්ඩර් කරනවා. ඒක අපේ ව්‍යාපාරයක් අපට ආදායමක් ගන්න කරනවනම්. අපේ දේ අපට කරන්න බැරිව ටෙන්ඩර් කරලා ඒක පිට කෙනෙකුට දීලා අපි යනවා වෙනතත් ව්‍යාපාරවල ආදායම මේකට ගන්න. නමුත් මම හිතන්නෙනෑ මෙතන ඒ නියම ආදායම, ඔය 60600.00 වත් ගන්න පුලුවන් වේද කියලා. අපේ වෙරංග මන්ත්‍රීතුමත් ඇහුවා. ඒ කියන්නෙ මොකක්හරි වැඩක් කරන්න කලින් පොඩ්ඩක් හොයලා බලන්න ඕන. මෙතනදි සංඛ්‍යාලේඛනවලින් ආදායම පෙන්නන්න පුලුවන් හේතුව අපේ සභාවෙ ඉන්න නිලධාරීන්, වාහන, කම්කරුවො, යොදවලා ඕක කලොත් ආදායම පෙන්නන්න පුලුවන්. පුද්ගලික කෙනෙක් කලේ තමන් අතින් වියදම් කරලා. එතකොට අපි බලන්න ඕන, මාසෙට මේ සදහා අත්තම් කීයක් යොමු කළාද අපේ වාහන ඒවා පටවන් එන්න ගියාද පොල් කඩන අයට කීයක් ගෙව්වද, අන්න ඒ විදියට ගණනය කරලා බලන්න ඕන. මේකෙ ලාභයක් පෙන්නන්න. නමුත් අවසානයේ මේ 60600.00 ට ලක්ෂයක් පෙන්නන්න පුලුවන් නමුත් ඒ ලක්ෂෙ පෙන්නුවට ලක්ෂය හොයාගන්න ලක්ෂ ගානක අපේ කම්කරුවන්ගේ වෙනත් දේකට යොදන්න තිබුනු සේවය නැතිකරලා තමයි ඒක ලබන්න වෙන්නෙ. සංඛ්‍යාත්මකව නෙමෙයි. හරි විදියට ප්‍රතිඵලය ලබන්න ඕන. අපේ කොට්ඨාශයේ මේක තියෙන්න ඕන කියලා කරන එක නෙවෙයි, අපිට කලින් නොතිබුනු දේකුත් නොවෙයි. ඒක නොමිලේ හම්බවුනු දෙයක් අපේ පාලනයක් නැති හින්දා තමයි එහෙම වුනේ. ඒ නිසා ඔබතුමාට වගකීමක් තියෙනවා, අපිටත් දෙන්න පුලුවන් සහයෝගයක් තියෙනවනම් දෙනවා. කොට්ඨාශයේ කොහේ වුනත්, කාගෙ වුනත්, නාගොඩද, උඩුගමද කියලා නෙවෙයි. ඒවා සභාව සතු දේපල. උප කාර්යාලය පොළවල් ඒ සියලුම දේට අපි කොට්ඨාසෙන් පිට වුනත් කරන්න ඕන තැනට ඕන වෙලාවක ඉදිරිපත් වෙනවා. ඕන සහයෝගයක් ලබා දෙනවා. ඒ නිසා ඔබතුමාගෙ වගකීමක් ඔබතුමා භාරගත්තෙ.

මට දැන් මේ සභාවෙ ආපු මාස 4 ඇතුලේ තේරෙනවා ඔබතුමාට මේ මන්ත්‍රීවරු 27 දෙනෙක් නොයෙකුත් යෝජනා ගේනවා. ඉතින් ඔබතුමා අර පොළට ගිහිල්ලා යම් පොරාන්දුවක් වුනාලු ලබන සදුදාට කලින් කරන්නම් කියලා. ඒක ඔබතුමාට කරගන්න බැරිවෙලා. දැන් වනිගරත්න මන්ත්‍රීතුමා සමන් මන්ත්‍රීතුමා, වෙරංග මන්ත්‍රීතුමා ඒ ගැන කිව්වා. මමත් සතිපතා උඩුගම පොළට යන කෙනෙක් ඉතින් ගියහම තේරෙනවා, ඔබතුමාට මන් හිතන් නෑ ඒ නිලධාරී මණ්ඩලෙන් හරි අනිත් මන්ත්‍රීවරුන්ගෙන් හරි නියම සහයෝගය ලැබෙනවා කියලා. එහෙම ලැබෙනවනම් ඔබතුමාට ඒක කරගන්න බැරිවෙන්නෙ නැහැ. මොකද ඔබතුමාටත් බැහැ මන්ත්‍රීවරු 27 දෙනේ කතා කරන ඒවා අහන් ඉදලා ඊළග සතිය වන විට කරන්න, පුලුවන් හැකියාවක් නැහැ. නමුත් ඒ සදහා හැමදාම මේ බොරු පොරෙන්දුවකට සීමා වෙන්නෙ නැතිව අපට කරන්න පුලුවන් සීමාවක් ඇතුලෙ අපි වැඩ කටයුතු භාර ගනිමු. අපේ ගරු මන්තමන්ලාගෙන් මම ගෞරවයෙන් ඉල්ලා සිටින්නෙ, අපි හැල්ලුවට ලක් නොවී කරන්න පුලුවන් යෝජනා ගේමු. ඒ කියන්නෙ වෙළඳ සංකීර්ණ ගහන්න

පුලුවන් නම් හොඳයි. වෙලද සංකීර්න ගහන්න නම් අපි ප්‍රතිපාදන හොයාගෙන ගේමු. අපට මේ ලයිට් එකක් හයි කරනවා, කුණු ටිකක් එකතු කරනවා, පාරක් JCB කරලා දෙනවා වගේ පොඩි දෙයක් කරනවා මිසක් සභාවෙ මොකද්ද කරන්න පුලුවන් හැකියාව ගැනත් අවබෝධයක් ඇතුව කටයුතු කරනවනම් හොඳයි. මොකද මම මේ කියන්නෙ මේ මාස 4 ඇතුලෙ තමන් කරපු යෝජනාවලින් මොකද්ද කෙරුනෙ කියලා ආපස්සට සොයා බලලා සභාපතිතුමාට කරන්න පුලුවන් දේවල් විතරක් සභාවට ගේන්න. යෝජනා සීමාවක් ඇතුව ගන්න. ගන්නන්වාලෙ, කියන්නන්වාලෙ යෝජනා ගන්න එපා. ඒක මම අදහසක් විදියට ගෙනාවෙ.

ඒ වගේම තමයි මම පසුගිය කාලෙ දිගින් දිගටම ඔයිල් ෆාම් කම්හලෙන් වෙන පරිසර හානිය ගැන කතා කළා. මාධ්‍යයත්, සභාවත් දැනුවත් කළා. නමුත් අපි ඒකෙ පරිසර හානිය වගේම අනාරක්ෂිත තෙල් වලවල් පිළිබඳව, ඒක කියලා සති 2 ක් යන්නත් කලින් ඔයිල් ෆාම් කර්මාන්තශාලාවේ අපි නොහිතපු විදියට ජීවිත හානියක් සිදු වුණා. අපේ සභාපතිතුමත් එවෙලෙම ඒ ස්ථනයට ගිහින් තිබුණා. මම එදා කතා කරන්න බලාපොරොත්තු වුනේ ඒ තෙල්වලවල් හින්දා ජීවිත හානි වගේම සතුන්ට හානි වෙන්න පුලුවන් කියලා. ඊටත් වඩා දැඩි ලෙස ආරක්ෂිත ස්ථානයක් වන කර්මාන්ත ශාලාව ඇතුලෙ ට්‍රැක්ටරයකට යට වෙලා කාන්තාවක් මිය ගියා. අපි සමහර දේවල් කතාබහ කරන කොට මේ ගැන සොයා නොබලන නිසා ඒ වතුවල නිලධාරීන් ඒ අයට ඕන ඕන විදියට කටයුතු කරනවා. ප්‍රාදේශීය සභාව කියන්නෙ මෙහෙම මරණෙ ගාවට යන එක නෙවෙයි වැඩේ. අපි කියන දේවල් ඇත්තද, මේකෙ ආරක්ෂාවක් තියෙනවද, හානියක් වෙන්න පුලුවන්ද කියලා අපි අවධානයෙන් ඉන්නවනම් වතු සමාගම් මීට වැඩිය සැලකිල්ලක් දක්වයි. නමුත් දැන් අපි බොරුවට ගිහින් ඇවිල්ලා, අපි මේ සභාව විදියට කිසිම ක්‍රියාමාර්ගයක් නොගත්තහම ඒ අයට ඕන ඕන විදියට කටයුතු කරනවා. අවසානෙ අපේ ප්‍රාදේශීය සභාවෙ මායිමේ කෙනෙකුට ජීවිතයෙන් වන්දි ගෙවන්න සිදු වුණා. නමුත් අපේ කෙනෙකුට හෝ වෙන කෙනෙකුට ඒක වුනත් එහෙම දෙයක් සිදුවෙන්න කලින් යම් සොයා බැලීමක් කරලා අපි ප්‍රාදේශීය සභාව විදියට අවදියෙන් ඉන්නවයි කියලා පෙනී හිටින්න කියලා මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. ඒක සභාපතිතුමාට පුලුවන් කාර්යයක්. එතකොට තමයි අනිත් මන්ත්‍රීතුමන්ලට වගකීමක් සහ නම්බුවක් තියෙන්නෙ. සභාවක් විදියට ඉන්නකොට අපි හරි දේ කලොත් අපිට ගෞරවයක් එනවා. ඒ ගැනත් නැවත සලකා බලන්න කියලා මම ඉල්ලා සිටිනවා. මොකද මේ දක්වා කතා කරපු කිසි දෙයක් සිදු නොවුන නිසා.

ඒ වගේම අපේ වනිගරත්න මන්ත්‍රීතුමා කතා කරන කොටත් කිව්වා කතා කරන දේවල්වලට අනුව යම් යම් ආයතනවලට ලිපි යොමු කරන්න කියලා. එහෙම නැත්නම් මේ සභාවෙ උදේ ඉඳලා කියවන ලිපිවලට පිළිතුරක් යවන්න කියලා. ඒවට පිළිතුරු නොයවන්නෙ, මම දන්නෙ නැහැ සභාපතිතුමාට මම කිව්ව වගේ තනියම කරන්න බැරිකමද, ලේකම්තුමිය හරි නිලධාරි මණ්ඩලය හරි ඒ සඳහා යොමු කරන්නෙ නැති කමද කියලා. මොකද අපි ලබන සභා වාරෙදි ඔය කතා කරපු කිසිම දෙයක් නැවත කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. එක්කො අපි කතා කරන අදහස් ඔබතුමාලට වැදගත් නැද්ද මම දන්නෙ නැහැ. එක පැත්තකින් අහලා අනිත් පැත්තෙන් පිට කරනවා වගේ අපට නම් තේරෙන්නෙ. මොකද ඒ වගේ වැදගත් යෝජනාවක අපිටත් ලිපියක් තියෙනවනම් ඔබතුමාලට හොයන්න බැරිනම් අපේ පිටපත අරන් ගිහින් හරි අපට අහන්න පුලුවන් අපි ප්‍රාදේශීය සභාවෙ කතා කළා ඔබතුමාලා මොකද්ද මේකට ගනිපු පියවර කියලා. මේ සභාවෙ අපි 27 දෙනෙක් ඇවිල් උදේ ඉඳලා කෑ ගහලා ගිහිල්ලා ලබන මාසේ ආපහු එනවා. නමුත් ඒ දක්වා අපි බලාපොරොත්තු වුනු දේට, අපි කතා කරපු දේට ඒ සේවය මේකෙ සිදුවෙන්නෙ නැහැ. ඒ නිසා නැවතත් මම ඒ කතාව කතා කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ. ලේකම්තුමිය සභාපතිතුමත් එක්ක කතා කරලා පුලුවන් නම් අපි මේ, මේවා නොකරපු දේවල් නෙවෙයි කරන්න පුලුවන් දේවල් කියන්නෙ. මේ සභාවෙ නිලධාරි මණ්ලය එක්ක කරන්න පුලුවන් ඒ ගැන නැවතත් සළකා බලන්න කියලා ඉල්ලා සිටිනවා.

අවසාන වශයෙන් කියන්නෙ අපි පෙරපාසල්වලට, හිටපු සභාපතිතුමා මෙතන ඉන්නවා. චන්ද්‍ර සහබන්දු මැතිතුමා ඇතුළු ඒ හිටපු සභාපතිතුමන්ලගේ කාලවල ප්‍රාදේශීය සභා දරුවන්ට නොමිල් නිල ඇඳුම දුන්නා. නමුත් අද වන විට අපෙන් රු. 1300.00 ක වගේ මුදලක් අය කරලා තමයි දරුවන්ට නිල ඇඳුම් දෙක දෙන්නෙ. මම හැමදාම කියනවා වගේ මගේ දරුවත් ප්‍රාදේශීය සභා පෙර පාසලට යන්නෙ . මම අඩුපාඩු දන්නවා. අනික ඒ දෙන නිල ඇඳුම කිසිම ප්‍රමිතියකින් තොරයි. අපේ දරුවා නොවැම්බර් මාසෙ, අවසාන මාසෙ තමයි පෙර පාසලට ඇතුල් වුනේ ජනවාරි වන විට පළමු ඇඳුම අඳින්න බැහැ. ටී ෂර්ට් එක හිල්වෙලා. ගිය අවුරුද්දෙ තිබුණු නිල් පාට එක. මේ සැරේ දම් පාට එකක් දීලා තියෙන්නෙ. දෙතුන් පාරක් අයන් කරනවිට ඒක ගන්න දෙයක් නැහැ. මොකද අපි දරුවො දෙන්නා තුන්දෙනෙක්ගෙම දන්නවා. ඒ නිසා අපි නොමිලෙ දීපු එක මේවගේ මුදලකට මේවා දෙනවනම් හරි දේ දෙන්න. මම ඉල්ලා සිටිනවා ලබන අවුරුද්දෙ 2019 වසරෙදි, මේ සභාවක් පත් කරලා තියෙන වෙලාවෙ නිල ඇඳුම ප්‍රාදේශීය සභා දරුවන් වෙනුවෙන්

නොමිලේ ලබා දෙන්න කල්තියාම වැඩපිළිවෙලක් හදන්න කියලා. වැඩිහරියක්ම ඉන්නෙ ගොඩක් අහිංසක දරුවො. ඒ දරුවන් වෙනුවෙන් නිල ඇඳුම නොමිලේ ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා. ඉතින් ඒ කරුනු ගැන ඔබතුමන්ලාගේ අවධානය යොමු කරයි කියලා බලාපොරොත්තු වෙනවා.

මම උඩුගම ප්‍රාදේශීය සභා පෙර පාසලේ අඩුපාඩුවක් ගැන සභාපතිතුමාට කියපු වෙලාවෙ ඉඳලා එතුමා ක්‍රියාත්මක වෙලා වැසිකිලි/කැසිකිලි පද්ධතියක් සකස් කළා. ඒ පෙර පාසල වෙනුවෙන් සභාපතිතුමාට, අදාළ නිලධාරීන්ට සහ මන්ත්‍රීතුමන්ලාට, මන්ත්‍රීතුමියන්ලට ඒ කරපු කාර්යය වෙනුවෙන් මගේ ස්තූතිය පුද කර සිටිනවා. අපි කියපු කාරනා ගැන හිතලා බලලා ලබන සභා වාරයේදී මේ කියපුවට පුලුවන් මට්ටමෙන් හරි, යම් පොඩි හරි පියවරක් ගන්න කියලා ඉල්ලා සිටිමින් නිහඩ වෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී චනද්‍ර සහබන්දු මහතා කතා කරමින්:-**

ගරු සභාපතිතුමනි ගරු මන්ත්‍රීවරුනි දීඝර් වශයෙන් තමුන්නාන්සේලා සවන් දුන්නා. මටත් කියන්න තියෙන්නේ අපි නොයෙකුත් අඩුපාඩු නොයෙකුත් යෝජනා ,මම දන්නෙ නැහැ . ඊළඟ සභාවාරයේදී වත් මේවට ගනිපු තීන්දු තීරණ අපිට දැනුම් දෙන්න. අර කොස් අත්තක් කඩාගෙන වැටිලා ව්‍යසනයක් වුනා. අපි වගකීම් පැහැර හැරලා. අද වෙනකොට සභා වාර දෙක තුනක අපි ඕක කතා කළා. මොකක්ද ඒ වෙනුවෙන් ගනිපු තීරණය කියලා අපිත් දැනගන්න ආසයි. එක්කෝ ඒක තමුන්නාන්සෙගෙ මට්ටමින් කරන්න බැරිනම් කොමසාරිස්තුමාට දැනුම් දීලා, නැත්නම් අපි කොමසාරිස්තුමාට දැනුම් දෙන්නම්. එහෙම දැනුම් දුන්නොත් ඔබතුමාට හොඳ නැහැ. මට පුලුවන් කොමසාරිස්තුමාට මේ ගැන පරීක්ෂණයක් කර වාතර්ාවක් දෙන්න කියලා කියන්න. මේ ගැන අපි මෙතැන යෝජනා කළත් පරීක්ෂණයක් වෙන්නෙ නැහැ. මම කොමසාරිස්තුමාට දැනුම් දුන්නොත්. ඔබතුමා මාත් එක්ක තියෙන මනාපය නැතිවේවි. ඒක නිසා මට්ටමින්ම මේ ප්‍රශ්නය විසඳ ගන්න බලමු ඊලගට මම යෝජනා කිහිපයක්ම ගෙනාවා .අර සංගීත භාණ්ඩ ඒවා විමධ්‍යගත මුදල් වලින් අපි ගෙනාපුවා. එක්කො ඒව තියෙන්න ඕන එක්කෝ ඒවා දිරලා යන්න ඕන. එක්කො ඒවා කවුරුහරි ගෙදර අරන් යන්න ඕන. ඒක නිසා කොමසාරිස්තුමාගෙන් මම එකක් ඇහුවා. අර සමහර්ට්, ඇත්තටම ඒවා බාර දීලා තියෙනවා. ඒ නිසා මේ පිළිබඳව ඊළඟ සභාවේ දී වත්, නැත්නම් මෙතුම කිව්ව වගේ පස් වෙනි මාසෙ, ඊළඟට අපි ඇවිල්ලා කතා කරලා යනවා තේරුමක් නැහැ. මේවට වෙච්ච දේවල් කියන්න. අපේ කිසි ප්‍රශ්නයක් නෑ. මම කතා කරපුවා වාතර්ාගත වෙලා ඇති. මම නැවතත් කොනක ඉඳන් කියන්න ගියොත් තමුන්නාන්සේ කිව්වා වගේ කාලය නිකන් ගන්න වෙනවා. ඒ නිසා අපි කාලය අඩු කරන්න සූදානම්. ආපු හැටියම ගිය සභාවාරෙ මන්ත්‍රීවරුන් විමසපු කරුණු කාරණා වලට ඉස්සෙල්ලම උත්තර බඳිනවා නම්, මෙන්න ගිය සභාවාරෙ මෙන්න මේ ප්‍රශ්න අහල තියෙනවා. මෙන්න පිළිතුර කියලා කියනවා නම් ඒක එතනින් ඉවරයි. දැන් අපි බලන්න හාරමාසයක් එකම දේ කතා කරනවා තමුන්නාන්සේලා අපි සියලු දෙනාම. ඒක නිසා මම නැවත සිහිගැන්වීම් කරන්නේ නෑ වාතර්ාව ගත්තහම මම සිහිගැන්වීම් කරපුවා ඇති. ඒ පිළිබඳව ඊළඟ සභාවෙදිවත් තමුන්නාන්සේ සම්පූණර් වාතර්ාවක් අපිට, සභාවට ඉදිරිපත් කරන්න. එතකොට අපට පුළුවන් මේකේ වතුර මෝටරයට මොකක්ද වුනේ අනිත් එකට මොකක්ද වුනේ කියන කතන්දරේ,

ඉතිං ඒ වගේම මෙතන කතාවුනා වීථි ලාම්පු පිළිබඳව පස් සැරයක් ගියා වඳුරඹට නමුත් පස් සැරයක් ගියාට, මම සතුටුවෙනවා කොහේ හරි දවස් පහක් යනකොට දවසට බල්බ් දහයක් දානකොට ඌරල කොහේ හරි බල්බ් 50ක් වැටිලා තියෙනවා. ඒ ගැන හඳවත ඇතුළින් පුංචි

සතුටක් තියෙනවා. නමුත් ඒ එක්කම මේක දානකොට කනු ඇරලා කණුවක් තෝරලා යූ.එන්.පී. කාරයෝ කොළ පාට නිල් පාට දානකොට පුංචි දුකකුත් ඇති වෙනවා. එහෙම දෙයක් තමයි මම කිව්වේ මගේ පක්‍ෂ දෙයක් නෙවෙයි. මේකෙ සභාපතිවරයෙක්, හිටපු මන්ත්‍රීවරයෙක් එතුමාගේ පුතා එම්.ඕ.දයාවංශ මහත්තයා. ඒ පුතා කතාකරල මට කිව්ව අයියෙ හරි වැඩේ මෙන්න බලන්න අපේ කණුව තෝරලා සේරම දාගෙන ගිහිල්ලා කියලා. දුකක් නැද්ද හිටපු සභාපතිවරයෙකුගේ පුතෙක් හිටපු මන්ත්‍රීවරයෙක් මේ කතා කරන්නේ. ඒක නිසා ඊළඟට තමුන්නාන්සේත් මමත් සහභාගි උනා ඌරල පල්ලෙහා වෛද්‍යවරයෙක් ඉන්න තැන බද්දේගම ප්‍රාදේශීය සභාවේ ලේකම්ගෙ ගෙදර එතැන ලයිට් දාගෙන ගියා ඊට සතියකට ඉස්සෙල්ලා නමුත් ඒ කනුව අතහැරලා ගියා අපට කණගාටුයි අපි දෙන්නම එතැන, දෙන්න නෙවෙයි සභාපතිවරු දෙන්නයි හිටපු කට්ටියයි ඔක්කොම එතන හිටියා. බද්දෙගම ප්‍රාදේශීය සභාවෙන් ඇවිල්ලා අදටත් ගැලෙවුවෙ නෑ කණුවලට ලයිට් දාගෙන ගියා. ලැජ්ජයි අපට ලැජ්ජ නැත්ද ඒක නිසා තමුන්නාන්සෙගෙ පෞෂර්ත්වය ගොඩනගන්න නම් අපි මොනව මෙතන කතා කරලා ගියත් වැඩක් නැහැ. පෞෂර්ත්වය ගොඩනැඟීමට ඇඟිල්ල දික් කරලා ඒ වැඩේ කරන්න හැකියාව තියෙන්න ඕන. ඒක තමයි මම කියන්නෙ එහෙම කියන්නේ ඒක වරදක් නෙමෙයි කණුවක ලයිට් එකක් දානවා කියන එක. එතන දේශපාලනයක්, එතැන ඡන්දයක් හැදෙන්නේ නැහැ. ඒක තමන්ට කතා කරන පුද්ගලයෝ කියන්නේ ඒ මනුස්සයාගේ දේශපාලනයක් නැහැ.හැමතැනම ලයිට් ටික දාලා තියෙනවා. මම නම් ඔය ලයිට් දාන්න ගියොත් ඒක පිටිපස්සෙ යන්නෙත් නැහැ. මෙන්න මේ ටික දාලා යන්න කණුවක් කණුවක් ගානේ ගිහිල්ලා ඒ දේශපාලනේ මම කරන්නෙත් නැහැ. ඒ පිළිබඳව මම මතක් කරනවා.

ඒ වගේම දැන් මෙතන කතා වුනා. පොල් පිළිබඳව ඒ පිළිබඳව මම වෙන්දේසිය ගැනීම ඒකත් නෙවෙයි, මෙතැන අඩුපාඩුවක් ව පවතිනවා පසුගිය ඉතිහාසය. අපි කපල එතැනින් ඉරක් ගහමු. නමුත් ඉතිහාසයට වෙච්ච දෙයක් තියෙන්න ඕන. රුපියල් හැටදාහක් වටින නිසා තමයි තමුන්නාන්සේ වෙන්දේසිය එදා ගත්තේ. එතැන එතකොට රුපියල් 60000 ආදායම මාසෙකට දෙන්න පුළුවන් නම් අවුරුදු දෙකකට ඉස්සෙල්ලා මේ රුපියල් 60000 ට නෙවෙයි 50000 ට හරි වෙච්ච දේ තමුන්නාන්සේටත්, අපටත් අයිතියක් තියෙනවා, මහජන නියෝජිතයෝ හැටියට අපි සියලු දෙනාටම අයිතියක් තියෙනවා, මේකට එක රුපියල් 5000ක් වත් ඇවිල්ලද කියල.

ඊළඟට මුරකාරයෝ තමුන්නාන්සේට මං කිව්වා. ගල් යට යතුරු කතන්දරයක් මං ආයෙම කියන්න යන්නේ නැහැ. මේකෙ මුරකාරයො හරියට සේවය කළා නම් හොරා පොල් කඩන්න බැහැ. එහෙනම් හොරා පොල් කැඩුවනම් ඒ මුරකාරයෝ වෙනුවෙන් තමුන්නාන්සේලා ගනිපු තීන්දුව කුමක්ද? ඊළඟට මම කිව්වා JCB යන්ත්‍රය බාරදීලා තියෙනවා. ඒ JCB ඔක්කොම යකඩ ගොඩවල්, ඔක්කොම එහේ තියෙන්නේ. මේ මුරකාරයන්ට අතිකාල ගෙවනවා. පෙන්නනවා අපි අනුමත කරනවා. නමුත් මේ මුර කාරයින්ගේ අතින් මොකක්ද සිද්ධ වෙන්නෙ කියන එක අපි හොයන්න ඕන. මම මෙහෙම කිව්වේ JCB එක නතර කරන කොට තිබුනා වගේ නෙමේ. ඒක අද කැලි ගොඩක් කැල්ලෙන් කැල්ල මස් කරල තියෙන්නෙ. අද මෝටරේ නැහැ, වයිපරේ නැහැ, බැටරිය නැහැ, ලයිට් දෙක නැහැ, මේ සියල්ලම නැහැ. හැබැයි පැය විසි හතරෙම මේ සභාවේ උප කායර්ාලයේ මුරකාරයා ඉන්නවා. අතිකාල දීලා තියෙනවා. මේව කොහොමද ගෙව්වෙ. පරිපාලනයක් තිබුන නම්, කළමනාකරණය තිබෙනවා නම්, මේ පිළිබඳ වගකිව යුතු

නිළධාරියෙක් පත් කරලා ඉන්නවා නම්, අහන්න පුළුවන් එතන මුර කාරයා උදේට ගිහිල්ලා පැමිණිලි කරන්න ඕන. කියන්න ඕන ඊයේ රාත්‍රී මෝටරය ගලවගෙන, වයිපරය ගලවගෙන කියලා. ඊට පස්සේ එයාගේ රාජකාරිය හරියට කෙරිලා ද කියලා අපි බලන්න ඕන. අද පොල් කැල්ලට මුරකාරයො දැම්මට තමුන්නාන්සේලා හිතනවද පොල් කැල්ල මුර කරයි කියලා. කොටහට තමයි එතකොට ඒ වැඩේ වෙන්නෙ. ඒක නිසා මේවා මේ කායර්භාරය ඉතිහාසෙ වුණෙත් නැහැ. දැනට වතර්මානෙ වුනෙත් නැහැ. තමුන්නාන්සේට හැඩ ගහන්න කාලය තියෙනවා. ඉතින් ඒ නිසා තමයි මේ සියල්ලක්ම තමුන්නාන්සේගේ අවධානයට යොමු කරන්නේ. තමුන්නාන්සේත් එක්ක අහිතකින් නෙවෙයි. අහිත හිතන්නේ තව ඉස්සරහට අපි දැන්ම අහිතක් නෑ. මෙහෙම ගියොත් අහිතක් හිතෙනවා තමුනාන්සේගේ වැඩපිළිවෙල කුමක්ද කියලා.

ඒ වගේම ඊලඟට කඩ කාමරේ කතා කළා. මෙතුමා දැන් මට පෙන්නුවා. අපි යමක් බදු දෙනකොට ඒකෙ අපේ වගකීමක් තියෙනවා.බද්දට දෙනකොට අපි අර උප කායර්ාලය ගැන කතා කළා. ඒක බදු දීම ගැන. කඩකාමර බදුදෙනකොට අපේ වගකීමක් තියෙනවා. ඒක දැන් කියනවා තෙමෙනවලු. අවුරුදු ගානක් තිස්සේ ඒ ඉල්ලීම කරලා තියෙනවා. ඔබතුමා හිටියෙත් නෑ, අපි කිසි කෙනෙක් හිටියෙ නෑ ලේකම්තුමිය ගිහිල්ලා ඒ පොරොන්දුව දීල ඇවිල්ල තියෙනවා. ව්‍යාපාරයක් කරන් නැතුව මම රුපියල් 25000 ක් ගෙවන වයි කියලා. මේ කඩ කාමරය බද්දට ගත්තයින් පස්සේ ඒක ව්‍යාපාරයක් කරන්න බැරි තත්වෙන් තමුන්නාන්සේලා වහලක් නැති ගොඩනැඟිල්ලක් අපට දුන්නොත් මට මාසිකව කුලී ගෙවන්න විදිහක් නැහැ. එහෙම නම් ඉස්සෙල්ලා අපි අපේ යුතුකම ඉටුකරන්න ඕන. අපේ වගකීම ඉටුකරන්න ඕන. ඊට පස්සේ අපි කියන්න ඕන. අපේ වගකීම ඉටු කරල ඉවරයි. අපේ බදු මුදල් දෙන්න. ඊට පස්සේ එන්තරවාසි යවන්න. බදු මුදල් නොගෙව්වොත් අපිත් එදාට කතා කරනවා. කඩෙන් ඉවත් වෙන්න කියලා අන්න ඒකයි සිදුවිය යුතු දේ. මෙන්න මේ පිළිබඳව තමයි තමුන්නාන්සේට විශේෂයෙන්ම මට මතක් කරන්න තියෙන්නේ

ඒ වගේම මම කලින් ගෙනාවහම පස්සෙ මට වෙනත් කරුණු යටතේ කතා කරන්න කව්ව RD 1637, RV 5013 ටැක්ටරේ තමුන්නාන්සෙලට පැමිණිලි කරල තියෙනවද ? මේකෙ පිටිපස්සෙ දොර තියෙනවද කියල. මේ මොහොත වෙනකොට පිටිපස්සෙ දොර නැහැ. දොර තිබිල තියෙනව.කොහේ හරි තැනක දොරත් ඇති. මෙන්න මෙතන පරිපාලනය. තමුන්නාන්සෙ දැනුවත් වෙන්න.අපිට මේව කියන්නෙ මිනිස්සු නොම්මරෙත් එක්ක. RD 1637 මම හිතන්නෙ ඇන්ජිමේ නොම්මරේ වෙන්න ඇති. RV 5013 ටේලරේ පිටිපස්සෙ දොර නැහැ.දැන් සති තුනකට වැඩියි. ඒකයි මම ඇහුවෙ දොරක් ගානෙ කතා කරන කොට මේකට මොකද වුනේ කියල. මේකදෝ කියල එහෙම නම් ඒ රථයේ රියදුරා කවුද? මෙතනට පැමිණිලි කරලත් නැහැ. දොර නැත්නම්,මේව රජයේ දේපොල ඔහු ගැන පරීක්ෂණයක් කරල දොරට මොකද වුනේ කියල සොයා බලන්න ඔබතුමාට අයිතියක් තියෙනව.දොර යකඩවලට විකුනුවද කියල පරීක්ෂණයක් කරන්න.

ඒ වගේම තමුන්නාන්සේට විශේෂ සමස්ත යෝජනාවක් මම ගේනවා. මේක නාගොඩ ප්‍රාදේශීය සභාවට නෙමෙයි. මුළු රටටම සමස්ත යෝජනාවක්. අද පුවත්පතක් අරන් බැලුවොත් අවුරුදු 7ක 8ක දරුවන් දූෂණය කිරීම, ඒ වගේම මිනීමැරුම් මේ සියල්ලම සිද්ධ වෙනවා. ඒක අපි නොපැකිලව කියනවා. දැන් බලන්න අවුරුදු 06 ක දරුවෙක් අද පාරේ යනකොට දූෂණය

කරනවා, මරලා දානවා, ලිදට දානවා. මේ අම්මා වරු ඉන්නෙ මේ අම්මාවරුන්ට ඒ වේදනාව දැනෙනවා. එහෙමනම් ඒ මේ පුංචි සභාවෙන් හරි මහා සභාවට යෝජනාවක් කරමු. අද එල්ලුම්ගහ ක්‍රියාත්මක වෙන්නේ නැති නිසා තමයි මේක වෙන්නේ. මම හිතනවා නාගොඩ සභාවෙන් මේක සිය වාරයක් මේ යෝජනාව එන්න ඇති. ඉතිහාසය ගත්තට පස්සේ නමුත් අද නැවත වරක් අලුත් කරමු. පුවත්පත් බලලා මාධ්‍ය බලලා අර ඊයෙ පෙරේදා අනුරාධපුර සිද්ධියක් දැක්කම පුදුම වේදනාවක් ඇත්තටම ඇති උනා. ඒක නිසා මේ සියල්ලම බලනකොට අපි යෝජනාවක් හැටියට, මම ගේනවා මොකද අපට අයිතියක් තියෙනවා නාගොඩ විතරක් නෙමෙයි සමස්ත පුරවැසියන් හැටියට අපි යෝජනාවක් ගේමු. අපි හෙට දවසේ නෙවෙයි, මෙම වතර්මාන යුගයේ ම, මෙම ආණ්ඩු කාලෙම එක්කෙනෙක් එල්ලලා මරනකොට ආයෙ සිද්ධ වෙන්නෙ නැහැ. ඒ වරද තව අවුරුදු ගාණකට. කිසිම කතාවක් නැතුව එහෙ ගිහිල්ලා සැපට සැප පහසුකම් ලැබෙනකොට මේ රටේ මේ අපරාධ අඩු කරන්න බැහැ. එහෙම නම් මම යෝජනාවක් හැටියට ගේනවා වහාම එල්ලුම්ගස ක්‍රියාත්මක කරන්න කියලා. මේක තමයි සමස්ත සියලු හෙට උපදින්න ඉන්න දරුවා වෙනුවෙන් මේ යෝජනාව ගේන්නේ නැත්නම් අහිංසක දරුවෙකුට, අහිංසක අම්මා කෙනෙකුට, අපට නිදහස තියෙන්න ඕන. ඒ වෙනුවෙන් මේ යෝජනාව මේ සභාවේ ඉදිරිපත් කරනවා.

මීට වැඩිය මම කාලය ගන්නේ නැහැ. තමුන්නාන්සේ මේ කියපු කාරණා සියල්ලම කැටි කරලා බලන්න. එහෙම නම් හෙට දවසේ මම මුලින්ම කරපු යෝජනාවට පිළිතුරක්, ඒ වගේම අර අහිංසක අම්මා සහ දරුවා ජීවිතක්ෂයට පත්වුණා නම් අර නාකියදෙණියෙ වගේ තමුන්නාන්සේලා අද පරීක්ෂණ කරනවා. තමුන්නාන්සේ අද උසාවි ගානේ කට උත්තර දෙන්න ඕන. ඒක නිසා වහාම, ඒක නීත්‍යානුකූල තත්ත්වයක් තියෙන නිසා වහාම ඒ අහිංසකයින්ට ගෙවිය යුතු, ලොකු ගානක් නෙවෙයි ගොඩනැගිල්ලම කැඩිලා නැහැ ෂීට් දෙකක් නැත්නම් තුනයි පොඩි වෙලා තියෙන්නෙ. ඒ අහිංසක අම්මාවරුන්ට මගේ කිසිම සම්බන්ධයක් නැහැ. වැඩේ වැරදුනායින් පස්සේ මම එතනට ගියාම මහත්තයා කවුද කියලා ඇහුවා. මම එතනට ගිහිල්ලා, අද තව වෙනකම් මම කවුද කියල කියල නැහැ. අපරාදෙ, වෙච්ච දේ, හානිය බැලුවා. මෙතැනට ඇවිල්ලා මම කරා අද තව වෙනකම් මගේ නම වත් මම වත් කවුද කියලා දන්නේ නැහැ. ඒක නිසා සද්භාවයෙන් මේ කතා කරන්නේ. එහෙම නම් තමුන්නාන්සේට මම හිතනවා, ඔබතුමාටත් ඒ සද්භාවයෙන් ම කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිමින් එන සභාවේ දී මගේ ප්‍රශ්න වලට අඩුම ගානේ, අහපු ප්‍රශ්න දෙකකටවත් පිළිතුරු ලැබේය කියලා ප්‍රාථර්නය කරමින් තමුන්නාන්සේලා සියලු දෙනාටම ජය වේවා යි කියමින් මම නිහඬ වෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රිනී අරුණ ශාන්ති මහත්මිය කතා කරමින්:-**

ගරු සභාපතිතුමා ගෙන් ද මන්ත්‍රී මණ්ඩලයෙන්ද අවසරයි. මම නැගී සිටියේ කවුරුත් කතාකරත් මාත් පොඩ්ඩක් කතා කිරීම සඳහා. මම මේ පළමුවෙන්ම ගනේවත්ත මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ සංවධර්න ගම්මානයෙ යන්න බැරි පාරක්. ඇත්තටම ඒක අවශ්‍ය අවස්ථාවක එතුමා කළ ශ්‍රමදානය ගොඩක්ම වටිනවා. අපේ ජනතාවට විතරක් නෙවෙයි අපි සියලු දෙනාටම බොහොම අමාරු වෙන්ම තිබුන පාරක්, එතුමාට මගේ හදපිරි ස්තුතිය පුද කරනවා. මම දැනගෙන හිටියත් නෑ එදා ඒ ශ්‍රමදානය කරන බව ඒත් දවල් වෙන මොහොතක ආරංචිය ලැබුනා. ඒත් අසනීප තත්ත්වයෙන් සිටි නිසා සහභාගි වෙන්න නොහැකි වුනා. ඒ වගේම මම කියන්න කැමතියි අපි නායකත්ව පුහුණුවකට සභාපතිතුමා යොමු කළා. ඒක

ඇත්තටම කාන්තාවන් වශයෙන් අපට ඉතාම වැදගත් අපේ කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් කතා කිරීම සඳහා සහ අපට සභාවක තිබිය යුතු අවශ්‍ය දේවල්, සියලුම දේවල් එහිදී අපට අදහස් කියලා දුන්නා. ගොඩක් ස්තුතිවන්ත වෙන්න ඕන. ඒ වගේම සහබන්දූ මහත්මය යෝජනා කළ එල්ලුම් ගස ගැන ඇත්තටම මම අම්මා කෙනෙක් වශයෙන් මම ඒ යෝජනාව ස්ථිර කරනවා. අපට නායකත්ව පුහුණුවෙදි පථමයෙන්ම කියලා දුන්නේ එයයි. අපේ දරුවන් වෙනුවෙන් අපි වෙනුවෙන් අපි ඉදිරියට ආ යුතු බව කවුරුත් පාරක් හදන්න කවුරුත් බෝක්කුවක් හදන්න නොව විය යුත්තේ කාන්තාව වශයෙන් අපි ඉදිරිපත් විය යුත්තේ අපේ කාන්තා අයිතීන් සහ ළමයින්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් කියන එකයි. ඉතින් එයත් මතක් කරන ගමන් සභාපතිතුමාට හද පිරි ස්තුතිය පුදකරනවා. අපි යැවීම ගැන අපට වියදම් කරා අපි සතුටින් ගිහිල්ලා ආවා. සියලුදෙනාටම ඒකට ස්තුතියි. ඒ වගේම අපට නිල මුද්‍රාවක් ලබාදීලා තියනවා. ඒ සාම විනිසුරු නිල මුද්‍රාව වලංගු වෙන්න මහේස්ත්‍රාත් උසාවියක අපි දිවුරුම් දිය යුතුයි. ඒ ගැන තොරතුරක් ලබාගන්න මම කැමතියි. මම නවක මන්ත්‍රීවරියක් හැටියට දැනගන්න කැමති. මම අහන්නේ මහේස්ත්‍රාත් උසාවියක දිවුරුම් දිය යුතුද?මම නොදැනුවත් නිසා විමසුවෙ. කවුරුත් විදුලි පහන් ගැන කතා කළා මමත් ඉතින් එතුමාට කියන්නේ මේක හැමෝම කතා කළත් ගෝණදෙනිය ප්‍රදේශයේ වීදි පහන් ලබාදෙන්න ගිහින් තිබුණත් අප ප්‍රදේශයට වීදි පහන් සවි කරන්න ගියේ නැහැ. අපෙත් තියෙනවා කවි කලයුතු වීථි පහන් මම අද උදේ එනකොටත් කිව්වා ඔයා ගිහිල්ලා කියන්න සභාපතිතුමාට මම කිව්වයි කියලා මම හිතන්නේ සභාපතිතුමාගේ නියෝජිතයෝ වෙන්න පුළුවන් පක්ෂෙ පාක්ෂිකයෝ ඉතිං කිව්වා අපටත් බල්බ් එකක් වත් දාල දෙන්න කියලා කියන්න කිව්වා. මම හිතන්නේ ඔබතුමා පෞද්ගලිකවත් දන්නවා ඇති. මේවා කවුද කියන්නෙ කියලා ඔබතුමාගෙන් ඉල්ලලත් තියෙනවා. ඉතින් අපටත් අඩුපාඩු බල්බ් ටික දෙන්න කියලා ඉල්ලා සිටිනවා. මගේ කතාව අවසානයි.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා කතාකරමින් :-**

ගරු සභාපතිතුමා ප්‍රධාන සියලු දෙනාගෙන් අවසරයි. මං හිතන්නේ මේ වෙලාවෙදි පසුගිය සභා වාර පිළිබඳව සෑම මන්ත්‍රීවරයෙක් ම කතා කළා. එනිසා මමත් මේ වෙලාවෙදි සිහිපත් කරනවා. ගරු සභාපති තුමාටත් ගරු ලේකම් තුමියටත් පසුවිපරමක්, මේ සභාවෙන් පස්සේ අදාළ විෂය සම්බන්ධයෙන් ඒ ඒ විෂය භාර නිලධාරී මේ සභාව තුළ සිටිනවා. ඔවුන්ට මේ කටයුතු ඒ ආකාරයෙන් පැවරුවොත් මේ අපට තියෙන අවලාදවලින් හා අපවාද වලින් ගැලවෙන්න පුළුවන් වේවි. ඊළඟ සභාව වෙනකොට මං හිතන්නේ විශේෂයෙන් මතක් කරනවා. අද සභාවේ වුනු සිදුවීම් ගැන පසු විපරමක් කරලා ඒ අදාල කටයුතු කොහොම හරි කරන්න. පුළුවන් හෝ බැරි හෝ කරන්න පුළුවන් එකක් හරි යෝජනාවක් සඳහා අවශ්‍ය ය කටයුතු කරන්න කියන ඉල්ලීම පළමුවෙන් කරනවා. මොකද විශේෂයෙන් මම ගිය සභාවාරය ඉල්ලීමක් කරා උඩවැලිවිටිය මෝදර කඩේ අසල සිට උඩවැලිවිටි තලාව දක්වා එන මාගර්ය ඉතාම ලඳු කැලෑවකින් වැහිල දැන් වාහන ගමන් කිරීමට අපහසු තත්වයට පත්වෙලා තියෙනවා. ඒ සඳහා අවශ්‍ය කටයුත්ත සිදු කරල දෙන්න කියලා. නමුත් ඒ කටයුත්ත අපට සිදු කරගන්න බැරිවුණා.

නිසා මේ වෙලාවෙ මම ඉල්ලීමක් කරනවා මේ 13 වන සිකුරාදා ප්‍රදේශයේ සිටින සියලුම ස්වේච්ඡා සංවිධාන එකතු කරගෙන අපේ ප්‍රදේශයේ තියෙන තණකොළ කපන මැෂින් ඒවත් සියලුම දේවල් මේ වන විට එකතු කරගෙන මේ 13 වන දින විශේෂයෙන් සෙනසුරාදා දිනක ඉරිදා දිනක දාගත්තේ නැත්තෙ සභාවෙන් අපට ලබාදෙන සහයෝගය අපට ලබා ගැනීමට අපහසු වෙනවා ඉරිදා සෙනසුරාදා යොදාගත්තම. ඒ අපහසුව මීට පෙර සඳහන් කරා. ඒ නිසා ඒ දහතුන් වන දින අදාළ ශ්‍රමදාන කටයුත්ත සිදු කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා සභාවෙන් දෙන්න පුළුවන් කම්කරුවන් සහ තණකොළ කපන මැෂින් ටික අපට ලබාදෙන්න කියන ඉල්ලීම කරනවා. එදාම අපි බලාපොරොත්තු වෙනවා තණකොළ කපලා ඒ මුල කුණු වෙන්න මොකක් හරි ක්‍රමයක් හදන්න බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා ගරු සභාපති තුමාගේ සහයෝගය සහ අධීක්ෂණය මේ සඳහා ලබා දෙන්න කියලා ගෞරවනීය ඉල්ලීම මේ අවස්ථාවේ කරනවා. ඒ වගේම මම බලාපොරොත්තු වුණා. මේ සභාව තුළදී කිසියම් හෝ මන්ත්‍රීවරයෙක් හෝ කතාබහට ලක් විය යුතු කරුණක් තිබුණා. පසුගිය දින අපි සතුටු වෙනවා ගංවතුර ව්‍යසනය වෙලාවේ ගංවතුර සඳහා විශාල ආධාර මුදලක් නාගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හරහා ප්‍රාදේශීය ලේකම් කායර්ාලයෙන් ලබා දුන්නා. නමුත් මේකේ පිටිපස්සේ කඳුළු කතාවක් තියෙනවා. ඊට පස්සේ දකින්න ඇති ප්‍රාදේශීය ලේකම් කායර්ාලය ළඟ මොන තරම් පිරිසක් ඒ සඳහා ඔවුන් ඇවිල්ලා ඇත්තටම කනගාටුදායක තත්ත්වයක් එදා උදාවෙලා තිබුණා. මමත් එදා ඒ ස්ථානයට ගියා ප්‍රාදේශීය ලේකම් කායර්ාලය අවට හිටපු සියලු දෙනා උද්ඝෝෂණයක් ආකාරයෙන් හැසිරුණා. ගංවතුර දැකපු නැති අයට ලොකු ආධාර මුදලක් ලැබුණා. වගකීමෙන් කියන්නෙ. ඒ වගේම තමයි සමහර ව්‍යාපාර උඩවැලිවිටි තලාවෙ තියෙන බේකරියක් තියෙනවා. ඒ බේකරිය නාගොඩ කොට්ඨාශය තුල හොඳම බේකරිය හැටියට තේරුණු බේකරිය. නමුත් ඒ බේකරියත් සම්පූණර්යෙන්ම හානියට පත්වෙලා. පෝරණුව පවා පුපුරලා විශාල හානියක් සිදුවෙලා තිබුණා. නමුත් ඒ ව්‍යාපාරික ස්ථානය වෙනුවෙන් කිසිදු ගණනය කිරීමක් කරලා නැහැ. ගණනය කරන්න ගිය නිලධාරීන් කියලා තිබුනේ බේකරි පිළිබඳ ගණනය කරන්න දන්නෙ නැහැ කියලා. ඒ එකක් තවත් විශාල ප්‍රමාණයක් ගංවතුරෙන් යටවුනු වැලිවිටියේ විතරක් නෙවෙයි ගම්මැද්දේගොඩ උනන්විටිය ඒ වගේ හැම ප්‍රදේශයකම මේ අසාධාරණය විශාල ලෙස සිදු වෙලා තියෙනවා. ඒ නිසා මේකේ නිලධාරීන්ද නැත්නම් එදා ගංවතුර ආධාර බෙදන වෙලාවෙනම් දේශපාලන අධිකාරියෙ මහත්වරුන්ගේ අතින් තමයි ඒව ලබා දුන්නේ. ඒ වුණත් ඔබතුමාලට යම් වගකීමක් තියෙනවා. මේ පිළිබඳ සොයා බලන්න යම් අසාධාරණයක් සිදුවෙලා තියෙනවාද කියලා. ඇත්තටම මම හිතන්නේ නැවත වතාවක් ඒ දේශපාලන අධිකාරිය දැනුවත් කරලා අසාධාරණය වුන අයට සාධාරණය ඉටුකරන්න කියන ගෞරවනීය ඉල්ලීම මේ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රී වරුන්ගෙන් මම ඉල්ලීමක් කරනවා. ඇතැම් නිලධාරීන් මේ සඳහා වංචනික ලෙස කටයුතු කරපු බවත් සඳහන් වෙනවා. ඒ නිසා මේවා පිළිබඳව මේ ගරු සභාවේ අවධානය යොමු කරවනව. මොකද ගංවතුර ව්‍යසනය පක්ෂ පාට භේදයක් නැතුව හැම කෙනාටම ආපු දෙයක්. නමුත් එකෙදි නිලධාරීන් කැමති කැමති අයට ආධාර මුදල් බෙදල දුන්න. මම කතා කරපු හැම කරුණක්ම මම වගකීමෙන් කියන්නේ. ඒ නිසා මේ වෙලාවේ ප්‍රාදේශීය ලේකම් කායර්ාලයේ කටයුතු සම්බන්ධව සෑහීමකට පත්වෙන්න බැහැ. මොකද තවත් දිනක මම ප්‍රාදේශීය ලේකම් කායර්ාලයට ගියා. නිවාස සංවධර්න නිලධාරි හමුවෙන්න. මට ඒ මොහොතේ මුණගැසුණු කොට්ඨාසෙවත් දන්නේ නැහැ. මගේ කොට්ඨාසෙ කෙනෙකුත් හිටියා. මම නිවාස නිලධාරීතුමා ළඟට එක්කගෙන ගියා

ලක්ෂ දෙකේ නිවාස ණය මුදල ලබා ගැනීම සඳහා අදාළ කටයුතු සිදුකරන්න. නමුත් ඒ අවස්ථාවේ නිවාස සංවධර්න නිලධාරි වරයා දැනුම් දුන්නේ කිසිම අයදුම්පත්‍රයක් එම කායර්ාලයේ නැහැ තියෙන්නේ දේශපාලන අධිකාරියේ ගරු බන්දුලලාල් බණ්ඩාරිගොඩ මැතිතුමා හා සුනිල් සේනානායක මැතිතුමා ලඟ තමයි ඒ අයදුම්පත්‍ර තියෙන්නේ. එහෙම අවශ්‍යතාවයක් තියෙනවනම් ඒ දෙපළ මුණගැහිලා ලබාගන්න ලෙස තමයි මට සඳහන් කළේ. ඒ නිසා මෙවන් කායර්යන් කිසිදා සිදු වුණේ නැහැ. ඊට පසුව මම ගාල්ලේ නිවාස සංවධර්න නිලධාරි තුමාටත් කතා කරලා ඇහුවා මේකේ සත්‍යතාවය. අතීතයේ උන සිදුවීම් නැතිකරන්නනෙ ඔබතුමාලා බලයට එව්වේ. මතක තියාගන්න බැංකු වලින් දෙන ණය වෙන එකක්. නිවාස සංවධර්න අධිකාරිය මගින් දෙන එක වෙන එකක්. මම මේ සම්බන්ධයෙන් වගකීමෙන් කතා කරන්නේ. මම සියලු නිලධාරීන්ට කතා කළා. මතක තියාගන්න ඔයගොල්ලො හෙට අනිද්දා වෙනකොට පොලිය නැතුව ණය දෙනවා. ඔයගොල්ලො සමෘද්ධි බැංකුවල තියෙන සල්ලි ටික දෙනවා. ඉස්සරහට මොනව කරත් මට කමක් නෑ දිනන්න හරි පරදින්න හරි නමුත් ප්‍රාදේශීය ලේකම් කායර්ාලය ලබාදෙන නිවාස ණය ක්‍රමය මේ දේශපාලන අධිකාරිය ඇත්තවශයෙන් මෙහෙමයි ප්‍රශ්නයක් නෑ දේශපාලන අධිකාරිය මඟින් නාමලේඛනයක් ඇවිල්ල දුන්නම. අර එන අහිංසක මිනිස්සුන්ට ගිහින් බලලා වැඩක් නැත්නම් විසිකරන එක වෙන කතාවක්. නමුත් ගිහිල්ලා කිව්වාම ප්‍රවධර්නය වෙන්නේ දේශපාලනයක්. ඒ නිසා මම දේශපාලන අධිකාරියට ඇඟිල්ල දික් කරනවා නෙවෙයි. ඔබතුමාලා කියන්නේ අතනින් ගන්න මෙතනින් ගන්න කියලනෙ. මම කියන්නේ මේ අතන මෙතන ගිහිල්ලා නෙවෙයි. අර බැංකුවේ මේ බැංකුවේ ගිහිල්ලා නෙවෙයි. මම පෞද්ගලිකව ගිහිල්ලා මට අත් විඳින්න වුණ සිදුවීම. මම ප්‍රාදේශීය ලේකම් කායර්ාලයට ගිහිල්ලා කතා කලහම මට එහෙම කතාවක් කිව්වා. ඊට පස්සේ මම කිව්වා මේ නිලධාරි, මම ගාල්ලෙනුත් ඇහුවා කතාකරල කරන්න දෙයක් නෑ ඔබතුමාට පෞද්ගලිකව කවුරුහරි ඉන්නවනම් ගාල්ලට කවුරු හරි එවන්න කිව්වා. කරන්න පුළුවන් දෙයක් තියෙනවනම් කරන්නම් කියලා. ඒක නිසා අන්න ඒ වගේ තත්ත්වයක් ඇතිකර ගන්න එපාය කියන එක තමයි විශේෂයෙන්ම ප්‍රාදේශීය ලේකම් කායර්ාලය කිව්වහම දේශපාලන වශයෙන් කරන වැඩ තියනවා ඒ කරන ක්‍රමයක් තියෙනවා ඒ කරන ක්‍රමවේදයට කරන්න ඕන. මේක ඇත්තවශයෙන්ම අසාධාරණයක් ඒක මම දකිනවා. එක පැත්තක් ප්‍රවධර්නය කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කායර්ාලය දරන උත්සාහයක්ද කියලා.

ඒ වගේම ඊළඟ එක තමයි තමුන්නාන්සේලාට මම පැහැදිලිව සඳහන් කරනවා. මේ වෙලාවෙදි රජයේ ඉඩම් ප්‍රාදේශීය ලේකම් තුමිය, අපි මහජන නියෝජිතයෝ හැටියට විශාල පිරිසක් ඡන්දෙ දීලා පත්කරලා තියෙනවා. ඒක නිසා මහජනයාගේ අදහස් තමයි අපි ප්‍රකාශ කරන්නේ. ඒ නිසා මම සඳහන් කර හිටියා අර උඩ වැලිවිටිය විද්‍යාලයට වෙන්වුන ඉඩම අද නිවාස ව්‍යාපෘතියක් හෝ වෙනයම් දෙකකට බෙදලා දෙන්න සූදානම් වෙලා තියෙනවා. ඒකට කමක් නෑ මිනිස්සුන්ට ඒ දේවල් වෙන්න ඕන. නමුත් මතක තියාගන්න මේ හැම ඉඩමක් ම ගත්තහම පෞද්ගලිකව අද බලන්න කිසිම ඉඩමක් අපට පොදු කටයුත්තකට ගන්න බැහැ. විශේෂයෙන්ම මම සභාපති තුමාගේ ලිපි ශීෂර්යේ අතින් ලියල සම්බන්ධීකරණ කමිටුවට ඉදිරිපත් කළා. අපට ඒ සැලකියයුතු ඩම් ප්‍රමාණයක් ලබාදෙන්න කියලා පොදු කටයුතු සඳහා. ඒ සඳහා මේකේ ඉඩම් කැල්ලක් වෙන්කරලා තියෙනවා. මොකක්ද පියසක් හදන්න රජයේ නිලධාරීන්ට නිල පියස හදන්න. ඒ නිලට විතරයි එතකොට එහේ සංවධර්න කටයුතුවලට කරන්න වෙන්නේ. මම කියන්නේ ගෙවල් හදන කතා නෙවෙයි. මට ගෙනියන්න නෙවෙයි. ඕක විතරයි ඒ ප්‍රදේශයට

රජයේ ඉඩමක් තියෙන්නේ. රැස්වීමක් තියන්න තැනක් නෑ ඉස්කෝලේන් එපයි කිව්වොත් රැස්වීමක් තියන්න තැනක් නෑ. හරි මට කියන්නකො දැන් ගෙවල් නැතුව ඉන්නේ කවුද කියලා. ගෙවල් නැත්තෙ කාටද කියලා. ඒක නිසා අවශ්‍යතාවයට ඉඩම් ඕන ප්‍රමාණයට මේ හැමතැනම තියනවා. නමුත් මම කියන්න ගෙවල් හදන්න එපා කියලා. නමුත් මේක ජාතික අපරාධයක්. හදිසියේ අපට පොදු ස්ථානයක මොකක් හරි දෙයක් කරන්න ඒකට අපට පොඩි ඉඩ ප්‍රමාණයක් වෙන්කරලා දෙන්න කියල කියන ඉල්ලීම මේ සඳහා මම සියලු දෙනාට ලිඛිතව ඉල්ලීම් කළා. ගරු ඉඩම් ඇමති තුමාට, ජනාධිපතිතුමාට දැන් දැන් ඉන්න සියලු දෙනාට මම මේකෙ වගකීම බරපතලකම සඳහන් කළා. ඊට එහා අපට යන්න තැනක් නැහැ. ඒ නිසා ඒවා පිළිබඳව මම මේ වෙලාවේ සභාවේ අපේ කණගාටුව ප්‍රකාශ කරනවා.

ඊළඟට අපේ ගමක් ගත්තම අද ඉන්න තරුණ පරපුරට මත්ද්‍රව්‍ය නිසා ගමේ එක තැනකවත් ඇවිදින්න බැරි තත්වයක් උදාවෙලා තියෙනවා. ඊයේ රෑ මම මළගෙදරකට යනවිට වැස්ස වසින නිසා දළු එකතු කරන මඩුවකට ගියා. එකේ හැම කායර්යක්ම ඒ විනාඩි ගාන ඇතුළත සිදුවෙනවා. අපි හිටියයි කියලා ඒ ගැන සැලකුවේ නැහැ. මම ඒ වෙලාවේ තෙමිලා හිටියෙ නැත්නම් ෆෝන් එකෙන් වීඩියෝ කරගන්නවා අන්න ඒ වගේ තත්ත්වයක් උදාවෙලා තියෙනවා. පොලිසිය මේ සඳහා මැදිහත් වීම ඉතාමත් මදි. මේ නාගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කසිප්පු අල්ලන්න බැරිය කියල නීතියක් ගෙනාවා කියලා නෙවෙයි අනිත් ඒව හරි විසඳන්න කටයුතු කරන්න ඕන කියන එක නිසා.

තමුන්නාන්සේලා කතා කරා අයාලේ යන හරක් ගැන, මට ඒකෙ අනිත් පැත්ත කියන්න තියෙන්නේ. අද වෙනකොට දහ පාරකට වැඩිය හරක් පටවගෙන ගිහිල්ලා ලොරිවල. ගෙවල්වල බැඳපු හරක් පවා අරගෙන ගිහිල්ලා. දැන් හැමදාම රාත්‍රී කාලයට සිද්ධ වෙනවා. එක නිසා ඒකට මොකද කරන්නේ. මේ හතට විතර පාරට ගිහිල්ලා යන බයිසිකල් ටික, අහිංසක අම්මා කෙනෙක් දරුවෙක් පන්තියට ගෙන ගියෝතින් හදිසියට කඩේට ගියොත් අල්ල ගෙන ඇවිල්ලා නඩු දානවා. මොකද කියල ඇහුවහම හරක් නැතිවෙනවා රෑට අපි මේ ඒකට වැඩපිළිවෙළක් කියලා. ඒ නිසා මම පැහැදිලිව සඳහන් කරනවා අපි මේ විදියට ගියොතින් අපේ මේ සමාජය දරුවන් තරුණ පිරිස කරන වැරදි අඩු කරන්නම් රාත්‍රී මුර සංචාර වැඩි කරල තැන්තැන්වල ගැවසිලා ඉන්න පිරිස්, ඒ වගේම කුඩු දැන් හැමතැනම තියෙනවා ඊයේ පෙරේදා පිටිගල දී ගංජා කිලෝග්‍රෑම් එකක් අත්අඩංගුවට ගත්තා. ඒ වගේ තත්ත්වයක් තියෙන්නේ ඒවා එන්නේ මේ ප්‍රදේශවලට. ඒ සඳහා මීට වැඩිය වගකීමකින් කටයුතු කළ යුතුයි කියන එක මේ වෙලාවෙදි මම සඳහන් කරනවා. ඒ වගේම මම අර උඩවැලිවිටිය මිල්ලගහ උඩුමුල්ල මාගර්ය ගරු සභාපතිතුමා, ලේකම් තුමියත් දැනුවත් කරල ශ්‍රමදාන මට්ටමෙන් අපි ප්‍රදේශයේ ජනතාවගෙන් මුදල් එකතු කරලා මමත් මුදල් දීලා කොරිපස් ගෙනැල්ලා අද යන්න පුළුවන් තත්වෙට පත් කරලා තියෙනවා. මම ගරු සභාපතිතුමා ගෙන් ඉල්ලීමක් කරනවා. මම ඒ ඇස්තමේන්තුවක් සකස් කරලා තියෙනවා. ඉතිරි ඒ මාගර්ය කොරිපස් ටික දාල තලලා සකස් කරන්න. ඒ සඳහා අවස්ථාවක් සලසා දෙන්න. කියන ගෞරවනීය සිහිපත් කිරීමත් කරනවා.

ඒවගේම මේ වෙලාවෙදි මම සඳහන් කරන්න ඕන රාහුල පෙරපාසලෙන් ඉල්ලීමක් කළා ගරු සභාවෙන් ඒ සඳහා මාදුගොඩ මන්ත්‍රීතුමා දැල් සම්පූණර්යෙන්ම ලබාදීලා තියෙනවා. නමුත් දැල් ලබාදුන්නට ඒ ශාලාවේ සවිකිරීම සඳහා මේ සභාවේ පොදු අරමුදලින් මුදලක් වෙන්කරලා දැල් ටික සකස් කරන්න කියලා ගෞරවයෙන් සිහිපත් කරනවා.

මම ඉතාමත් සතුටු වෙනවා. නාගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සංවිධානය කිරීමට නියමිත ව තිබෙන දහම් පාසල් ගුරුවරුන් සඳහා පවත්වන වැඩමුළුව අපේ ප්‍රාදේශීය සභාවෙන් අපේ ගරු උප සභාපති තුමා සඳහන් කලා වගේ අපේ ප්‍රාදේශීය සභා මට්ටමෙන් අපේ ප්‍රාදේශීය සභාව ඒ සඳහා සම්පූර්ණ දායකත්වය දීලා ඒ කාර්ය දහම් පාසල් අධ්‍යාපනය ගැන, අද කාගෙත් අවධානය ගිලිහෙමින් පවතින අවධියක මෙවන් සත්කාරයක් කිරීමට මෙම ප්‍රාදේශීය සභාවේ අවධානය යොමු කිරීමත් ඉතාම සතුටක්. ඒ සඳහා ඔබ සියලු දෙනාගේ සහයෝගය ලබාදෙනු ඇතැයි විශ්වාස කරමි.

ඒ වගේම අපේ ගරු මන්ත්‍රිතුමිය සඳහන් කලා වගේ අර මුහුණු පොතේ කතන්දරේ, මම අවසන් වශයෙන් හරි සඳහන් කරන්න ඕන ධර්මසිරි ගනේවත්ත ගරු මන්ත්‍රිතුමා හොඳ ශ්‍රමදානයක් කරයි කිව්වා ඔබතුමියට ඒ කටයුත්ත මුහුණුපොතට යොමු කරා නම් කොපමණ වටිනවාද? මා ඒ කරපු දේ හදපිරි සතුටින් කතා කරා වගේම තව එකක් කියන්න ඕන. ඔබතුමිය අර මාගර්ස්ථ ප්‍රවාහන අධිකාරිය දැනුවත් කරලා තිබුන මාගර්ස්ථ ප්‍රවාහන අධිකාරියෙන් ඒක හදලා දුන්නට, අපේ සභාවේ ඉදිරි කටයුතු කරගත යුත්තේ නඩත්තුව වගකීම අපේ. ඒ සඳහා අපේ කායර්යන් පිළිබඳ හැම මන්ත්‍රීවරයෙක්ම සහ මන්ත්‍රිතුමන්ලා නොදන්නවා නම් ඒ සම්බන්ධයෙන් දැනුවත් වෙන්න කියන සිහිපත් කිරීම කරනවා.

මේ වෙලාවේ ගරු සභාපතිතුමනි, එන්න එන්න විවේචන වැඩිවෙනවා. බලය තියෙන්නේ අපට. එනිසා නැවත වතාවක් . ඔබතුමාට කියන්නේ ආපස්සට හැරිලා බලලා වෙච්ච මොනවහරි අඩුලුහුඩුකම් තියෙනවද කියලා, ඔබ තුමා ඉතාම දක්ෂයි යම් කායර්යක් කිරීමේ හැකියාව තියෙනවා. ඒ නිසා ඔබතුමාට ගෞරවයෙන් සිහිපත් කරනවා. අපේ මේ කායර් මණ්ඩලයත් නිවැරදි ගමන් මගට යොමු කර ගනිමින්, දැන් මේ කට්ටිය බලන් ඉන්නේ මුට්ටිය දාලා මොකද වෙන්නේ කියලා. ඒ නිසා අපි මේ වෙලාවේ සියලු දෙනාට ආරාධනා කරනවා. අපේ මේ කටයුතු සාර්ථකව කරගෙන යෑම සඳහා ගරු සභාපතිතුමාට සහය ශක්තිය දීලා ඉදිරියට කටයුතු කරන්න කියමින්, විශේෂයෙන් මම නැවතත් සිහිපත් කරනවා. අපේ ආණ්ඩු පක්ෂ ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලීමක් කරනවා. මේ ගංවතුර ආධාර දීමේ දී සිදුවූ අසාධාරණය පිළිබඳව ඔබගේ අවධානයට ලක්කර සාධාරණය ඉටු කරන්න කියන ගෞරවනීය ඉල්ලීම සිහිපත් කිරීමත් කරමින් අපේ ඉනෝකා මන්ත්‍රීතුමිය ටත් මම ආරාධනා කරනවා දහතුන් වැනිදා අපේ ශ්‍රමදානයට සහභාගි වන ලෙස. සැම දෙනාට සුභ අනාගතයක් පතමින් මම නිහඬ වෙනවා බොහොමත්ම ස්තුතියි.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා කතා කරමින් :-**

ගරු සභාපතිතුමනි, යෝජ්‍ය සභාපති තුමනි, මන්ත්‍රීවරුනි, ලේකම්තුමිය, නිලධාරි මහත්වරු හා ජන මාධ්‍යවේදී තුමා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. අපේ ලක්රුවන් මන්ත්‍රීතුමා කතා කළ නිසා තමයි, නැත්නම් කතා නොකරන්න හිටියෙ. පහුගිය දවස්වල ඇතිවුණු ගංවතුර නිසා ගෙවපු දීමනා, ගෙවපු විදි ඒ ගැන කතා කළා. ගරුමන්ත්‍රීතුමා ඔබට වැඩිය අපට ගැටලු තියෙනවා. ඒ දීපු ක්‍රමවේද ගැන, ප්‍රාදේශීය ලේකම් කායර්ාලයේ නිලධාරීන්ගේ ඇස්තමේන්තු ගැන අපට ලොකු චෝදනා සහ අපේ දැඩි විවේචනයන් තියෙනවා. මොකද වැඩ කරානම් කවුරුහරි, මේ වගකීමෙන් කියන්නේ. ඒකේ වැඩ කරපු හැම කෙනෙක්ම, ඒ කියන්නේ ග්‍රාම

නිලධාරි කෙනෙක්ද, එහෙම නැත්නම් වෙන කෙනෙක්ද, ඒගොල්ලන්ගෙ ඇස්තමේන්තු සම්පූණර්යෙන්ම ගෙවල. නමුත් සාමාන්‍ය මිනිස්සුන්ගේ, හිතවත්කම් නැති අයගේ සිදුවුන පාඩුව හානිය පිළිබඳ තක්සේරුවේ කිසිම ගුණාත්මකභාවයක් නැහැ. ඒ නිසා ඔබට වැඩිය අපට මේක මිනිස්සු කියනවා. ඒ නිසා අපට ඒක ගැටළුවක්. මේ ගැන අපි අපේ නායකයන්ට කිව්වා. ඒ අය පරීක්ෂණ කරන්න දෙන්නෙත් මේ රාජ්‍ය නිලධාරීන්ට. ඇපිල් දෙන්නෙත් මේ නිලධාරීන්ට නම් මොනවද කරන්නේ. ඇතැම් නිලධාරි ඒ අයට දීපු ඇස්තමේන්තු නැති කරලා. ඒ අයට සතපහක් නැහැ. ඉතින් මේවයි වගකීම ගන්න කෙනෙක් නැහැ. පරීක්ෂණ කරන්න කෙනෙක් නැහැ. අපි අපේ රජය ගැන කණගාටු වෙනවා. ගංවතුර ආධාර ලබාදීලා ඒක නිසියාකාරව ක්‍රමවේදයක් හදන්නැතුව රාජ්‍ය නිලධාරි යාන්ත්‍රණය කරපු මේ තනි අපරාදේ පිළිබඳව අපේ කණගාටුව අපිත් ප්‍රකාශ කරනවා. නමුත් අපි සතුටු වෙනවා. ගංවතුර වෙලාවේ මේ ප්‍රදේශයට ගෙනාපු අතිවිශාල මුදල. රජයක් හැටියට, ඔබේ ආණ්ඩුව කාලෙත් ගංවතුර ආවා, යම් යම් දේවල් ආවා. මේ තරම් මුදලක් කෙනෙකුට දෙන්න පුලුවන් උනේ නැහැ කියලා අපි කියනවා.

පාරවල් ගැන, බද්දෙගම පාර ගැන අපේ එම්.එම්. දිසානායක මන්ත්‍රී තුමා ගෙන් ලියුමක් ඉදිරිපත් වෙලා තිබුණ. අපි දන්න ඉතිහාසේ විතරක් නෙවෙයි අවුරුදු 60 කින් විතර හදපු පාරක් නෙවෙයි, මේ ගංවතුර නිසා හදන්න පුළුවන් වුණේ. නමුත් ඒ ගැන අගය කරන්නෙ නැතුව. සිද්ද වෙච්ච පාඩුව ගැන විතරයි එතුමන්ගේ ලියුම්වල තියෙන්නෙ. අපි කණගාටු වෙනවා. එතුමන්ලට මේක අගය කරන්න කියලා, අඩුපාඩු ඇති මොකද දින 45 කින් 50කින් කරපු වැඩ හින්ද. නමුත් අද ගඟට යන පාරවල්, බැම් ඔබතුමාගේ ඇස් දෙකෙන් දකින කොට ඔබට හිතෙනවා ඇති යමක් කරලා තියෙනවා කියලා. ඒ සංවධර්නය කරා නම් ඒ ගැන අගය කරන්නත් ඕන. ඒ නිසා ලක්රුවන් මන්ත්‍රීතුමනි අපි ඔබට වැඩිය දුක් වෙනවා. ඔබට වැඩිය කණගාටු වෙනවා. මේ නාගොඩ ප්‍රාදේශීය ලේකම් කායර්ාලයෙන් වෙච්ච ගංවතුර පිළිබඳ අඩුපාඩු සම්බන්ධව, මොකද අපි අපේ නායකයන්ට කිව්වා. මේ ගැන පරීක්ෂණ කරන්න කියලා. අපි නායකයො ගැන කනගාටුවෙනවා. නිසියාකාර පරීක්ෂණයක් නොතිබ්බ එක ගැන. මොකද ඒකෙ නැකමක්, හිතවත්කමක් තිබ්බ නම්, වෙන සම්බන්ධකමක් තිබුණා නම් ඒ අයට ලක්ෂ ගණන් වලින් චෙක්පත් ලැබුණා. ඇත්තටම යටවෙලා ඒ විදිහටම වෙච්ච අනිත් ගෙදරට එහෙම නෑ. අපි අපේ දැඩි කනගාටුව විරෝධය ප්‍රකාශ කරලා තියෙනවා. අපි තව තැන්වල, නමුත් මේක වුණාම හෙට ඒ.ජී. ඔෆිස් එකට යන්න බැරි වේවි. ගැටලුවක් නැහැ. ඕකෙන් කරගන්න කියලා අපිට වැඩකුත් නැහැ. මොකද නිලධාරි අපට කරන විදිහ, අපි කොන්ත්‍රාත් කරන්නේ නැහැ. නමුත් ඒකෙ ගිහිල්ලා හැසිරෙන විදිහ, දේශපාලන පක්ෂ හිතවත්කම්, නැකම් මේ සියල්ල එක්ක තමයි එතන සිදුවීම් වෙන්නේ. නැතුව මනුස්සයෙක් එක්ක ගිහිල්ලා කතා කරනකොට, මනුස්සයෙක් වෙනුවෙන් කතාකරන හදවතක් තියෙන කෙනෙක් නැහැයි කියලා සමහර වෙලාවට හිතෙනවා. එතන ඒ අය කතා කරන හැසිරෙන විදිහ බැලුවම. ලක්රුවන් මන්ත්‍රීතුමා ඔබ කියපු නිවාස ප්‍රශ්නෙදි එහෙම කවුරු හරි කිව්ව නම් මං පුදුම වෙනවා. මොකද මෙච්චර දෙයක් ඔය ප්‍රාදේශීය ලේකම් කායර්ාලයෙන්, දේශපාලනය කරන කෙනෙක් හම්බවෙන්න කියල කියන්නෙ නැහැ. ඕක එයාලට කරන්න බැහැ කියලා කියන්නේ. නෑ එහෙම කිව්වා නම් මම සතුටු වෙනවා. එහෙම කියන්නෙ නැහැ. ලක්රුවන් මන්ත්‍රීතුමා නෑ එහෙම කියන්නෙ නැහැ. කිව්වා නම් හොඳයි. එහෙම කියන්නෙ නැති එකයි අපිට තියන ප්‍රශ්නේ. අපි ගරු කරනවා එහෙම කිව්වනම් හොඳයි. එහෙම කිව්වා නම්, මෙච්චර කාලෙකට

කිව්වේ නැහැ. ඕක එයාලට කරන්න බැහැ. මේක බොරුවක් කියලා කියන්නේ. එහෙම හරි කිව්වා නම් අපි ගරු කරනවා එයාට. හරි හෝ වැරදි, තනිකරම ආණ්ඩුව අපහසුතාවයට පත්කරන විදියට නිලධාරීන් හැසිරෙන්නෙ. ඒ වගේම ලක්රුවන් මන්ත්‍රීතුමා ඔබතුමා ඒ ගැන කතාකරනකොට මම මන්ත්‍රීවරයෙක් නොවෙයිද, එහෙම නැත්නම් දේශපාලනය නොකරපු විදියට තමයි ඔබතුමා කතා කලේ. ඔබතුමාගේ ආණ්ඩුවේ මොනවද මන්ත්‍රීතුමා යූ.එන්.පී. අයට කරන්න දුන්නේ. මොනවත් කරන්න දුන්නේ නැහැ. මේ සභාවේ හිටපු සභාපතිල එක බල්බ් එකක් දුන්නේ නැහැ අපට. අපි ඒවා කතා කරලා ඉල්ලන්නෙත් නැහැ. අපේ එහාපැත්තේ වාඩිවෙලා ඉන්න විජිත් සහබන්දු මන්ත්‍රීතුමා, එතුමාට දෙන්න මගේ ඒවත් එක්ක. පුද්ගලික ප්‍රශ්නයක් නෙවෙයි දේශපාලනයේදී යම් යම් කාරණා තියෙනවා. හැබැයි සමෘද්ධි කාඩ් එකක්, වැඩිහිටි දීමනාවක් කිසිදෙයක් යූ.ඇන්.පී. මිනිහෙකුට දුන්නේ නැහැ. මන්ත්‍රීතුමා ඔබතුමන් කතා කරාට ඔබතුමා මොනතරම් අසාධාරණකම් කරාද? යූ.ඇන්.පී. අයට ඔබ තුමා අතින් මොනතරම්, ඔබතුමා දන්නවා ඔබතුමා අද උසාවි යන්නේ ඒකයි. ඒ නිසා බොරුවට මේ දේශපාලන, පක්ෂ දේශපාලන අපි බබාලද? පෞද්ගලික පාර කැපූහැටි අපි දන්නවනේ. අපි ඔබට ගරු කරනවා යම් තැන්වලදී. ඔබතුමා දේශපාලනයේ හැසිරුණු හැටිත් අපි දන්නවා. පසුගිය කාලේ දේශපාලනය, මේක පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි. මං මේ කතා කරන්නේ පක්ෂ දේශපාලනයේදී, තමුන්නාන්සේ දැඩි විවේචනයන් කරනවා. හැබැයි සමෘද්ධි කාඩ් එකක් වැඩිහිටි දීමනාවක් යූඇන්පී පාක්ෂිකයෙක් හැටියට කවුරුවත් මේකෙ දෙන්න කටයුතු කළේ නැහැ. පසුගිය කාලේ නිලධාරීන් අදටත් එහෙමයි. අදටත් ඔය පංගුවක් ගංවතුර ආධාර දෙපැත්තෙ තියෙන ගෙවල් දෙකටම තියෙනවා. මැද ගෙදරට නැහැ. අර ඌරල පහල නිවාස දෙන්න ඕන මිනිහට නිවාසයක් නැහැ. ඒක දියයුතු නිවාසයක්. පදිංචි නැති එහෙකට නිවාසයක් පාස් වෙලා තියෙනවා. මේවා මෙතන කියන්න ඕන විවේචනයන් නොවෙයි. මීට වැඩිය දරුණු තැන්වල අපේ නායකයන්ට අපි මේව කියන්න ඕන. එයාල පාලනය කරන නිසා. අපි කණගාටු වෙනවා ඔබතුමාලට මේවා කියන එක ගැන. නමුත් මේ දේශපාලනයේ ක්‍රමවේදෙ, මේකේ හැටි. මම ගරු කරන මන්ත්‍රීවරයෙක් තමයි එම්.එම්.දිසානායක මන්ත්‍රීතුමා. එතුමගේ, දැන්මේ ඔබතුමා කියපු එකට මේ උත්තර දෙන්නෙ. එතුමා පහුගිය දවස්වල වීදි ලාම්පු හදන්න යවපු, පස්සෙන් ගිය මෝඩ මනුස්සයා වීථි ලාම්පු හයි කරපු විදිහ මෙතුමට කිව්වා. සභාපතිතුමාට, ඒ ගේ අත්හැරලා, ලැජ්ජවෙනවා අපි. මෙච්චර කාලෙකට අපි එහෙම කරල නැහැ. වීථි ලාම්පු හයි කරන්න බලයක් තිබුන නැහැ අපට. නමුත් හදපු හේමචන්ද්‍ර විලේගේ, අජිත් එඩේර ආරච්චි හිටිය, සහබන්දු මහත්තයා, නිශාන්ත මහත්තයා, ආරියතිලක මහත්තයා, හැබැයි ලයිට් පත්තු වෙන්නේ හැමෝටම එක විදියකට.ගෙයක් අතැරලා යූ.ඇන්.පී. කාරයෙක් ගෙයක්ද? ජේ.වී.පී. කරන මනුස්සයෙක් ගෙ ගෙයක්ද කියලා? ලයිට් පත්තු කරන්න, ඒ මිනිස්සු කැමැති නැද්ද. ලැජ්ජ වෙන්න ඕන මන්ත්‍රීතුමා. ඔය කියන ඒවගේ ඒව තමයි අදටත් කරන්නේ. ගරු එම්.එම්. දිසානායක මන්ත්‍රීතුමා අපි කියනවා ඔය වගේ මීහරක් යවන්න එපා වාහනේ පස්සෙන්. සභාපතිතුමා ඔබතුමා ඉස්සරහ එයා කියපු කතාව ඔබතුමා දන්නවා. ඔබතුමා පිළිගන්නවා ඒ කතාව. ඔබතුමාට පෞද්ගලිකව කිව්වා. හයිකෙරුවෙ නැත්තේ මෙන්න මේ හේතුව නිසා කියල. මම ඒක කියන්නෙ නැහැ හරි නැති හින්දා. අපට කමක් නෑ ඔබතුමාලා ලයිට් හයි කරගන්න. අපි කියන්නේ නෑ ඔබතුමාට අදටත්, අදටත් මෙතනට බල්බ් එකක් දාන්න කියල. කිව්වෙ නෑ, එහෙම නෙවෙයි නමුත් පාරේ යනකොට කාගේ හරි ලයිට් එකක් තියෙනවා නම් ඒක හයි කරල යන්න. මේක පාදඩ වැඩක්, කැත වැඩක්, නොකළ යුතු වැඩක්, මෙච්චර

කාලෙකට සභාපතිතුමා උනේ නැහැ. ඔබතුමා කොච්චර විරුද්ධ වුණාද මෙතැන කතා කරලා. ඔබතුමා සද්දෙට කතා කරා මෙතන ඉන්නකොට. අද ඒව නෑ මොකුත්,වැරදි ඒවා. ඒ නිසා අපි කියන්නේ, අපි ඉල්ලන්නෙ නැහැ ඔබෙන් පාරවල්, අපි ඉල්ලන්නේ නෑ ගයිට්, හැබැයි හදන එක සාධාරණව, මිනිහෙකුට වෙන දෙයක් කරන්න. අදටත් අපි යෝජනා දෙන්නෙ නැත්තෙ ඔබ අපහසුතාවයට පත්වෙන හින්දා. දීලා වැඩකුත් නෑ, කරන්නෙත් නෑ, කරන්න දෙන්නෙත් නෑ, අපි ඒක දන්නවා. ඕනේ නෑ, නමුත් මෙන්න මේ පෞද්ගලිකව මළගෙයක් උනාම, මිනිහෙක්ගේ හදිසි අවශ්‍යතාවයක් උනාම, මෙන්න මේ වගේ දෙයක් පෞද්ගලිකව කතා කරාම හරි උදව්වක් කරන්න. මේ තත්ත්වෙ තුළ මෙහෙමනම් මන්ත්‍රීවරු හැසිරෙන්නේ අපට ගුටි ගහගන්න වෙයි. මගේ ගමේ ලයිම් යනකොට එක කනුවක් හදන්නැතුව ඊළඟ කනුව හදන්න යනකොට ගහන්න සිද්ධ වෙනවා මන්ත්‍රීතුමා. එතකොට පොලිසි යන්න වෙයි අපිට. ඒක නිසා අපි කියන්නේ මන්ත්‍රීවරු ගියාට කමක් නැහැ. ගමේ ඉන්න ඡන්දෙ කරපු හෙන්චයියෝ යවන්න එපා කියල. එක වැරදි වැඩක්. මේකෙ හිටපු සභාපතිවරයෙක් ප්‍රාදේශීය සභා මන්ත්‍රිවරයෙක් වසන්ත මහත්තයා. ඒ මනුස්සයගෙ ගේ ළඟ ලයිට් එක හදන්නැහැ කියන්නේ මොන තරම් කැත වැඩක්ද. තමුන්නාන්සේලාත් මේකෙ ඉඳල, අපි හෙට අනිද්දා අයින් වෙයි. නමුත් ඔබට ඒක කරනකොට ඔබට මොන තරම් වේදනාවක් එනවද. මේවා මන්ත්‍රීවරු හැටියට අපි කරන නරක වැඩ. අපි චන්දෙ ඉල්ලන කොට ප්‍රශ්න තියාගමු. හෙට ඔබට මොනව හරි උනොත් ඉස්සරහින් ඉන්නෙ අපි. ඒ නිසා අපි කතා කරන්න නොවෙයි, අපි එන්නේ මෙතන. අපි යෝජනා දෙන්නෙ නැත්තේ තවත් කොළ පිරෙනවා. කතා කරහම මේව මුද්‍රණය කරල දෙන්න ඕන. අපරාදෙ මන්ත්‍රීවරුන්ට දෙන සභා වාතර්ාවට කොළ 1500ක් විතර යනවා. අපි මේවා අඩු කරල කතා කරන්න ඕන. නමුත් කරන දේවල් දැක්කම කිසිම සංවධර්නයක් වෙන්නෙ නැහැ කියලා, ඔබේ මන්ත්‍රීවරු කියනවා ඒකයි.

අපිට සතුටක් කියලා නෑ අපි කණගාටු වෙනවා. ඔබතුමා දැඩි අපහසුතාවයට පත් වෙච්ච බව අපි දන්නවා. මුදල් ප්‍රශ්න තියෙනවා අපි දන්නවා. නමුත් කරන චූටි දෙය, පොඩි දෙය හරි පිළිවෙලකට කරන්න. අපි ලයිට් ඉල්ලන්නෙ නැහැ. මම පෞද්ගලිකව ඉල්ලන්නෙ නැහැ. නමුත් මේවා මිනිස්සු කියන කොට අපට හරි වේදනාවයි. සභාපතිතුමා ඔබතුමාලගෙ මන්ත්‍රීවරු කියනවනම් අපිට දෙන්න එපා තියලා ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා පාලනය කරන මොනවා හරි ක්‍රමවේදයක් ඇති ගැටලුවක් නැහැ. නමුත් ඒ යන පාරේ මොනව හරි කරන්න. ලයිට් කතාව එතනින් ඉවරයි.

ඒ වගේම ගරු සභාපතිතුමා නාගොඩ වැල් පාලම තමුන්නාන්සේ දන්න දේ. තමුන්නාන්සේගේ ගමේ. මේ පළාතේම ඉතුරු වෙලා තියෙන්නෙ ඔච්චරයි. ඒ හින්දා හදිස්සියේ කපල් එකකට පින්තූරයක් හරි ගන්න, මේක සංරක්ෂණය කරන්න පුළුවන් විදිහේ වැඩපිළිවෙළක් කරන්න. මොකද ඒක අත්‍යවශ්‍යයි. පොඩි ළමයෙකුට සංගිලි පාලමක් කියලා බලාගන්න හරි තියෙන්නේ මෙච්චරයි. මහා වියදමක් දරන්නේ නැතිව යන්තම් හරි, මිනිසුන්ගේ පාවිච්චියට සහ යන්න අලුත්වැඩියා කරලා සලකුණක් හැටියට තියාගන්න පුළුවන් නම් මම විශ්වාස කරනවා නාගොඩට, වෙනදා අපි දකිනවා විදේශිකයෝ පවා ඇවිල්ලා එගොඩ මෙගොඩ යනවා. බලනවා. එයාල ඒකෙන් වින්දනයක් ලබනවා. ඒ නිසා මේ පිළිබඳ අවධානය යොමු කරලා තමුන්නාන්සෙගෙ ගමේ තියෙන හින්දා, මේක හදන්න පුළුවන් අඩුම වියදමින් නැවත සංරක්ෂණය කරන්න කියලා මම ඉල්ලනවා.

ඒ වගේම ගරු සභාපතිතුමනි, අපේ ප්‍රාදේශීය සභාවේ තියෙන තත්වය එන්න එන්නම දුවර්ල වෙනවා. අපේ ශක්තිය නැතිවෙනවා. පහුගිය දවස් වෙනකොට අපේ බන්ධුල මන්ත්‍රීතුමා ලාගේ ගේ ගාව තිබුණු බැංකුව, අපේ වෙනත් සභාවකට ගියා. ඒ හේතුව තමයි මේකේ තියන ගංවතුර සහ අපේ නගරවල නොදියුණු කම. ඒ නිසා දිගින් දිගට අපේ ආයතන, අපේ ප්‍රාදේශීය සභාව සතු ප්‍රදේශයේ තියෙන රාජ්‍ය ආයතන, එහෙම නැත්නම් දියුණුවක් කියලා ලබන්න තියෙන ආයතන අපෙන් බැහැර වුනොත් ලොකු ගැටලුවක් වෙනවා. අපි නිකම්ම නිකං මැරිච්ච ප්‍රාදේශීය සභාවක් බවට පත්වෙනවා. ඒ නිසා මොනවහරි වැඩපිළිවෙළක් යොදලා, පොලත් එක්ක එහෙම නැත්නම් එතන තියෙන ඉඩම් ටික පවර ගන්න ක්‍රමයක්, එහෙම නැත්නම් එතන අපේ ඉඩම දැනුත් කැඩී කැඩී යනවා. ඒවායි මොනව හරි හදලා තල්ගස්වල තියෙන එක මීට වැඩිය දියුණු කරලා, මාපලගම මීට වැඩිය දියුණු කරලා, අපිත් එක්ක පෞද්ගලිකව තරහ වෙයි. දැන් අර එක කඩේක වහලක් ගහලා තියෙනවා තනිකර පාරෙ තියෙන්නෙ. පෞද්ගලිකව මාත් එක්ක තරහා වෙයි මේක කිව්වම. ඒවා නොකල යුතු දේවල්. මාපලගම ගෙවල් ඔක්කොම අපේ සභාවෙ ඉන්න කට්ටිය හැදුවේ පාරේ. මේක අඩි තුනක් හතරක් පස්සට දාලා හැදුවනම් ඇත්තටම වටිනවා. අද දයානි එක ඉස්සරහ කානුව ගොඩවෙලා වතුර බහින්නේ නැහැ. වීදි ලාම්පුව ගැන අපේ මන්ත්‍රීවරු කතා කරනවා, ඒ ගැන කතා කරාම පෞද්ගලිකව තරහ වෙනවා. ඒක නිසා අපිත් එක්ක කට්ටිය පෞද්ගලිකව තරහා වෙයි. නමුත් නගරයක් සංවධර්නය කරන කරනකොට මේවා කළ යුතුයි. ගරු සභාපතිතුමා, ඒ නිසා මේවා අදාල ආයතන වලට යොමු කරලා හරි මේවා පිළිබඳව යම් කිසි දෙයක් නොකළොත්, අපේ ප්‍රාදේශීය සභාව සතු නගර ඔක්කොම මැරිලා යාවි. පාරවල් පළල් කරන්න දුන්නේ නෑ පහුගිය කාලේ හිටපු ඇමතිවරු. පාරවල් වල බැමි බැන්දලු අද ඒ බැමි බැදගත්ත උදවිය ඒ ඇමතිවරුන්ට බනිනවා. ඒ හින්ද, ඒ පාරවල් පළල් කරන්න බැරි හින්දා, අද යටලමත්ත හන්දියේ ගත්තත් ඒ වගේ. බස් දෙකක් එතන එන්න බෑ ඒ නිසා තව දුරටත් මේ වගේ තැන්වල පාරවල් වල ඉඩකඩ ,යම් ආයතන වලට හදන්න ඉඩකඩ දුන්නොත් තවත් අපේ නගර ඇකිලිලා ප්‍රාදේශීය සභාවේ දියුණුව මැරිලා යන තත්වෙට පත්වේවි. ඒ නිසා මේ ගැන තමුන්නාන්සෙගෙ අවධානය යොමු කරන්න කියලා ඉල්ලනවා.

ඒ වගේම කටුපොල් ගැන කතා කළා අපේ ජයවීර මන්ත්‍රීතුමා, විලේගේ මන්ත්‍රිතුමා, තරංග මන්ත්‍රිතුමා කතා කළා ඒකෙ යම්කිසි වැඩපිළිවෙළක් සකස් කරල සභාවක් හැටියට මීට වැඩිය, මේක බරපතළ කාරණයක් මීට වැඩිය ශක්තිමත්ව අපි ඒකට ප්‍රතිඋත්තර දිය යුතුයි කියලා මගේ විශ්වාසය. මොකද නැත්නම් අත ළඟ ලොකු විනාශයක් තියෙනවා. මින්ස්සුන්ට, අපට තේරෙන එකක් නැහැ. වත්තෙ ඉන්න අයට ඒක තේරෙන්න නැහැ. හැම කෙනෙක්ම ඒකෙන් ප්‍රතිලාභ ලබන හින්දා. නමුත් එයාලගේ දරුවන්ට ප්‍රතිවිපාක හම්බ වෙන්නේ. ඒක තේරුම් කරලා දෙන්න යනවට වඩා හොඳයි. අපි මේක තේරුම් අරගෙන ඒකට උත්තර හොයල, මේකට වැවිලි කමර්ාන්ත අමාත්‍යාංශයෙන් අවසර දෙනවා. මම හිතන්නේ වැවිලි කමර්ාන්ත අමාත්‍යාංශයෙන් උදව් කරනවා. ප්‍රශ්න ඇති ඒත් මේකට මීට වැඩිය හොඳ උත්තරයක් සභාවේ මන්ත්‍රීවරු හැටියට සහයෝගය දීලා, එකතු කරලා හදලා ඒකත් එක්ක කතාබහ කරලා මීට වැඩිය තැනකට ගෙනියන්න පුළුවන්නම් හොඳයි කියන විශ්වාසය මගේ තියෙන්නේ.

ඒ වගේම ගරු සභාපතිතුමා ධමර්සිරි ගනේවත්ත මන්ත්‍රීතුමා ගිහිල්ලා ඒකට උත්තර දෙන්න බැරි වුනා. එතුමා අර එක පුද්ගලයෙක්ගේ අන්වතර් නාමයෙන්, වීරසිංහ මහත්තයට අන්වතර්

නාමයෙන් කතා කළා. ඒක ගැලපෙන්නෙ නැහැ, මෙතන ඇත්තෙත් නැහැ, උත්තර දෙන්න විදිහක් නැහැ, එක වැරදි වැඩක්. ඒක වැරදියි උත්තර දෙන්න විදිහක් නැහැ. මේක මළ ගෙදරක දානෙ ගෙදරක කතාවක් වගේ නෙවෙයි. සභාවෙ එහෙම ලියන්නත් එපා. ඒ ගැනත් සිහිපත් කරමින් අද දවසේ සියලු දෙනාට සුභ දවසක් කියල ප්‍රාර්ථනා කරනවා.

**ගරු උප සභාපති තුමා කතා කරමින් :-**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රීවරුනි, ජනමාධ්‍යවේදී මහත්මයාගෙන් අවසරයි වැඩි වෙලාවක් ගන්නේ නැහැ. එක දිගට පැය කිහිපයක් ඉඳගෙන ඉඳල අවම පහසුකම් යටතේ මේ සභාව පවත්වාගෙන යද්දී ගරු මන්ත්‍රීතුමන්ලා දැඩි අපහසුතාවයෙන් පසුවෙනවා. අද සභාව හමුවේ ඉදිරිපත්වුන කරුණු කාරණා පිළිබඳව යමක් හෝ කතාකරල අද මෙතනින් නික්ම යාම තමයි මගේ බලාපොරොත්තුව. අපේ සභාවේ යම් යම් පොදු කරුණු කීපයක් පිළිබඳව මන්ත්‍රීවරු දිගින් දිගටම චෝදනා කරනවා. විශේෂයෙන්ම පසුගිය සභා කාලයේ යම් යම් වැරදීම් සහ යම් යම් දූෂණ ක්‍රියාවන් සිදුවුනා කියලා, ඒවට පිලිතුරු දෙන්න බැරුව ඒ පිළිබඳ ඇත්ත තත්වය මේ සභාව හමුවේ පැහැදිලි කරන්න බැරුව දෝ මේ කරුණු කාරණා සභාවෙන් සභාව හමුවට යනවා. ගරු සභාපතිතුමනි, ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වශයෙන් සභාව කරන මන්ත්‍රීවරයෙක් වශයෙන් ඔබතුමාට දිගින් දිගටම කිව්වා. මමත් කිව්වා. මේ කරුණ පිළිබඳව, සහබන්දු මන්ත්‍රීතුමා ගරු මන්ත්‍රීතුමන්ලා ඉදිරිපත්කරන චෝදනා පිළිබඳව විශේෂයෙන් ඔබ තුමා මේ කරුණු සභාව හමුවේ තබන්න කියලා. මේ සභාව හමුවේ ඔබතුමා ගේ මූලාසන කතාවෙන් හෝ යමක් කියන්න. ඔබතුමාට ඒ සඳහා ශක්තිය ධෛර්ය ලැබේවා කියල මම ප්‍රාර්ථනා කරනවා. ඉතින් අපටත් ලොකු කනගාටුවක් ඇතිවෙනවා. මේ ජේෂ්ඨ මන්ත්‍රීවරු ප්‍රාදේශීය සභාව නියෝජනය කරමින් මෙවැනි ප්‍රශ්න හමුවේ මේ සභාව කරගෙන ගියේ කොහොමද? යන්න පිළිබඳව. අද මේ සභාවේ ඉන්න ජන මාධ්‍යවේදී මහත්තයා ඇතුළු බලාගෙන ඉන්න අපේ ප්‍රදේශයේ ජනතාව සිතාවි, මේ සභාවේ තියෙන්නේ අමුතු ස්වරූපයක් කියලා. දැන් අද මේ අවස්ථාවට සම්බන්ධ වුණු මේ සභාව නරඹන පිරිස එතුමන්ලා මෙතනින් පිට වෙලා යන්නෙ, මේකද මේ සභාව කියන්නේ. මෙතන මොකද වෙන්නේ කියලා හිතා බලන්න. මම කියන්නේ වීථි පහන් පිළිබඳ, ඒ පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවනම් අපහසුතාවයට පත් වුණු ඌරල යටලමත්ත ගරු මන්ත්‍රීතුමන්ලාගේ ගැටළුව විසඳන්න ඔබතුමා මැදිහත් වෙන්න. විශේෂයෙන්ම මන්ත්‍රීවරුන්ගේ ආත්ම ගරුත්වය රැක ගන්න කටයුතු කරන්න. ආණ්ඩු පක්ෂයේ සෑම කොට්ඨාසයකින් ම පත්වෙච්ච සියලු මන්ත්‍රීවරුන් ඔබතුමාට දිගින් දිගටම කිව්වා ඒවට එතරම් මැදිහත් වෙන්න එපා. ඒවා කරන්න එපා. කවුරුවත් මෙතනදී හෝ පිටදී හෝ කණ්ඩායම් රැස්වීමකදී යෝජනා කරලා නැහැ. ඒ නිසා අපේ ගරු මන්ත්‍රීවරයෙක් යම් බලපෑමක් කරලා යම් අපහසුතාවයකට පත් කරනවා නම් ගමේ ඉන්න තව මන්ත්‍රීවරයෙක් ඒක ඒ මන්ත්‍රීවරයාට කියන්න. ඔබතුමා එහෙම කරන්න එපා. මෙහෙම කරලා මේ අවුරුදු හතරක කාලය තුළ මේ සභාවේ කටයුතු කරන්නේ කොහොමද? එතුමාත් ජනතා නියෝජිතයෙක්. එතුමාටත් නියෝජනය කරන යම්කිසි ජනතාවක් ඉන්නවා. වීථි පහනක් දාන්නෙ ගෙදරකට නෙවෙයි පාරකට. හිටපු සභාපති වරු මන්ත්‍රීවරු නිලධාරි වීථි පහන් දාලා තියෙන්නේ දාලා තියෙන්නෙ ලස්සන කරන්න නෙවෙයි. යම්කිසි වංගුවකට නැත්නම් ගෙවල් නැති තැනකට හරියට මිනිස්සුන්ට යන්න අපහසු තැනකට ආලෝකයක් ඇති කරන්න තමයි වීථි පහනක්

සවිකරන්නෙ. ඒ වගේ දෙයක් නඩත්තු කර ගන්නේ නැතුව එතනින් නතර වෙනවනම් යම් කෙනෙක් මේක දාන්න එපා කියලා එහෙම බලපෑමක් කරනවා නම් හරිම වැරදියි. ඒනිසා අතීතයේදි යම් යම් සිදුවීම් වුණා. අපේ සහබන්දු මහත්තයා ගරු සභාපති වරයා හැටියට මේ සභාව කරගෙන යද්දි අපි වීථි පහන් අඩුපාඩු කිව්වාම, නමුත් ඒ ප්‍රශ්න දිගට ගියෙ නැහැ. ඒ වෙලාවෙ ජයලත් සුමනසේකර මැතිතුමා අපේ ගමෙන් ඉදිරිපත්වෙලා සභාවට ආවා. ගමේ මන්ත්‍රීවරු දෙන්නෙක් හිටියා. ජයලත් සුමනසේකර මැතිතුමා වීථි පහන් කරුත් එක්ක වීථි පහන් සවි කරන්න යනවා. ඉතිං අපිත් ඒ පාරේ යනවා. අපි කිව්වම අපේ ගේ ළඟ ලයිට් එක සවි කරනවා. ඔබතුමාලා මෙතන එක පැත්තක් මවා පෙන්නනවා. පක්‍ෂෙ අයට දෙන්නෙ නැහැ කියලා. නමුත් ඒ සිදුවීම් අපටත් සිදු වුණා. මේ සභා කාලය 1991 පටන් ගත්තට පස්සේ විවිධ සභාපතිවරුන්ගෙන් විවිධ අතපසුවීම් වුනා. නමුත් ඒවා ඒ තරම් දුර දිග ගියේ නැහැ. නමුත් දැන් ගරු මන්ත්‍රීතුමන්ලා 27 දෙනෙක් ඉන්න නිසා තමයි මේක වෙලා තියෙන්නේ. එදා 9 යි 5 යි 8 යි 5 යි 9 යි 4 යි වගේ මන්ත්‍රීවරු පත් වුණේ. ඉතිං ඕක අපට විසඳ ගන්න හැකියාවක් තිබුණ දැඩි අවශ්‍යතාවයක්. ගරු සභාපතිතුමනි, අසාධාරණයක් නොවන විදිහට අපේ වීථි පහන් සම්බන්ධව කටයුතු කරන්න. අපේ කොට්ඨාස නියෝජනය කරන්න එක දවසක් ඇවිල්ල වීථි පහන් හතරක්ද පහක්ද හදල ගියා. මම ඊට පස්සෙ ඉල්ලීමක් කළේ නැහැ. සභාපතිතුමාට කිව්වෙත් නැහැ. ඒ නිළධාරීන්ට කිව්වෙත් නැහැ. ස්වාභාවික විදියට එන්න ඇරල නිකන් හිටියා. යම් කිසි අඩුපාඩුවක් තියෙනවා නම් සපයන්න. ඒ සඳහා අවශ්‍ය බඩු නැත්නම්, අපේ දේවල් අරගෙන හරි ගරු මන්ත්‍රීතුමන්ලා ගෙන් මේ සභාව හමුවේ යෝජනාවට ලක්වෙන ලක්වෙන හැටියට කරුණු කාරණා කරන්න එපා කියලා ගරු සභාව හමුවේ ගරු සභාපතිතුමා ගෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමා ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ එහෙම භේදයක් නැහැ. මෙතන වාඩිවෙලා ඉන්නෙත් එහෙම භේදයක් නැතුව. ඒක නිසා සද්භාවයෙන් කටයුතු කරන්න ශක්තිය ධෛයර් ලැබේවායි කියලා ප්‍රාථර්නා කරනවා. මේ අවස්ථාවේ විශේෂයෙන්ම කටු පොල් වගාව පිළිබඳ තරංග මන්ත්‍රීතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා කතා කළා. දැන් අපි දැක්කා ලියුම තියෙනවා. හත් වෙනිදා තමයි මේ මධ්‍යම පරිසර අධිකාරියේ ලිපිය, ඒ වගේම 6/7 ලියුමක් නිකුත් කරලා තියනවා. මධ්‍යම පරිසර අධිකාරිය ඒ ලියුම හත් වෙනිදා නිකුත් කරන කොටම වටවල වැව්ලි සමාගමේ කටුපොල් අංශයේ ප්‍රධාන නිලධාරියා ඇතුළු ඒ සියලු නිලධාරීන් දන්නවා. මම දැක්කා මම මෙහා කන්දේ ඉන්න විට එහා කන්දේ උඩලමත්ත කොටසේ තියෙන්නේ ටැක්ටරේකින් ඇවිල්ලා කටු පොල් ගස් වීසිකරනවා. ප්ලැට් ෆෝම් කපලා තිබුනෙ. වලවල් හාරලා තිබුනෙ. තාමත් ඉන්දුවේ නැතුව ඇති විසි කරගෙන විසි කරගෙන යනවා. අර ස්ථාන වල භූගත කරන්න. ඒ තරමට මේ දේවල් අපට වඩා ප්‍රවෘත්ති ඒ අයට යනවා. ඒ පැත්තට අපට වඩා සම්බන්ධකම් වැඩියි ඒ අයට. අපට වැඩිය ඒ පැත්තට තමයි ප්‍රවෘත්ති යන්නේ . අපට මේ ලියුම ආවට පස්සෙ අපි දැනුවත් වුනා. පෝස්ටරයක් ගහලා තිබුනා පෝස්ටරේ මේ ලිපිය නිකුත් කරපු බවක් තිබුනේ නැහැ. එරෙහි වෙන්න කියලා තිබුණා. නමුත් අපට වඩා අපේ විරුද්ධවාදීන්ට දූෂණ කරන අයට ප්‍රවෘත්ති යනවා වැඩියි. නැත්නම් ට්‍රැක්ටරයකින් කටු පොල් ගස් ගෙනල්ලා විසි කරගෙන යන්න තරම් මේ වැවිලි සමාගමේ ක්‍රියාදාමය වෙලා තියෙනවා. කටු පොල් ප්‍රවාහනය කරලා, කම්කරුවන් ගෙනැල්ලා නියමිත විදිහට භූගත කරන්න. එහෙම කරෙත් නැහැ. ටක් ටක් ගාලා කටු පොල් ටික දා ගත්තා හතට කලින් එහෙම තත්වයක් ඇතිවුණේ. මේ පරිසර දූෂණය පිළිබඳ දිගින් දිගටම මේ සභාවේ තවදුරටත් කථා කරයි. ගරු සභාව හමුවේ ඔබතුමාට මම යෝජනා කරනවා. මේ වැව්ලි

සමාගම්වල වගකිවයුතු නිලධාරීන් ගෙන්වන්න. මේක හැම සැරේම කළා. නමුත් ප්‍රතිඵලයක් වුණේ නැහැ. කටුපොල් විතරක් නෙමෙයි. අද බලන්න වතු ආශ්‍රිතව තියෙන අතුරු මාගර් වල සියලු ජල පාරවල් එන්නේ ප්‍රධාන මාගර්යට. දැන් යටලමත්තේන් බරවා මුල්ල පාරට ගියාම මාමනදොළට යනකොට ඒ පාරේ තියෙන සියලු අතුරු පාරවල් වල තියෙන වතුර කාණු ඔක්කොම ප්‍රධාන පාරට ගිහිල්ලා බරව මුල්ල පාර සවුත්තු වෙලා තියෙන්නෙ. එහෙමයි ඒ වගේ දේවල් තියෙනවා. වටවල වැව්ලි සමාගම විසින් පරිසරය සුරකින්න බෝඩ් ගහලා තියෙනවා. දැන් මාමනදොල එහෙම ඇළ දිගේ හගරංවල පැත්තට යනකොට සතුන් හුවමාරුව වන පෙදෙස ආරක්‍ෂත කලාපය, ආරක්ෂිත ඉවුර, පරිසර පද්ධති ජල උල්පත් සුරකිමු, ලස්සන සුන්දර වාක්‍ය ටිකක් බලන්න. වැලි කුකුළන් ගැවසෙන ස්ථාන, මොනරුන් ගැවසෙන ස්ථානය මේ බෝඩ් කාට පේන්නද? මේ බෝඩ් හගලා තියෙනවා. අපටත් හිනා. දැන් කාබිල් පැත්තේ යනකොට තියෙනවා. ඔබතුමා දකිනවා ඇති. ජල සම්පත සුරකිමු, වනය සුරකිමු, ඇළවේලි සුරකිමු, තහනම් කලාප ලස්සන සුන්දර වචන ටිකක් විතරයි. දඩයම් කිරීම තහනම් ,අනාචාරයේ හැසිරීම තහනම් එක එක මාතෘකා දාල ඒව බෝඩ් වලට විතරයි. කවුද රවටන්නෙ, කාටද මේවා කරන්නේ. ඉස්සර අපි දන්නවා. ගරු මන්ත්‍රීතුමන්ලා සභාපති වෙලා හිටපු කාලේ සහබන්දු මහත්තයාටත් මතක ඇති, සමහර ඇළ මාගර් වල ගඟ ආශ්‍රිතව වන වගාවන් කළා. උණවගාවන් ආදිය තාමත් තියෙනවා. ඒ වගාවන් කරපුවා දැන් ඒවා කරන්නේ නැහැ. අර බෝඩ් වලින් තමයි සුන්දරත්වය මවා පාන්නෙ. දීඝර් වශයෙන් කටුපොල් වගාව පමණක් නෙවෙයි. වතු සමාගම් වල සිදුවන අපහරණ කටයුතු සම්බන්ධව අපි විධිමත් වැඩ පිළිවෙලකට යා යුතුයි කියලා මං මේ අවස්ථාවේ මතක් කරනවා. විශේෂයෙන්ම මේ සභාවෙ යෝජනාවක් කළා. මම න්‍යාය පත්‍රයට ඇතුළත් කරපු රංගන ශාලාව නම් කිරීම ඒ පිළිබඳව ඒ යෝජනාව ස්ථිර වෙලා තිබෙනවා. එතනදී යම් යම් ප්‍රශ්න ගැටලු වෙනත් යෝජනා ඉදිරිපත් වුණා. ඒවා සාකච්ඡා කරන්න අපිත් කැමතියි. ගැටලුවක් නැහැ. වඩාත් සුදුසු ම නම් කිරීමක් තමයි මම ඒ අවස්ථාවේ කළේ. ගරු සභාපතිතුමා මේ ගැන කටයුතු කරලා අවශ්‍ය ස්ථානගතකිරීම් කරලා ඒ පුවරුව සවි කරන්න කටයුතු කරයි කියලා හිතනවා. ඊළඟට නගර ශාලාවට අපි ගියා බලන්න නගර ශාලාව ඊට දවස් කිහිපයකට කලින් රුපියල් 15,000 ක ට අරගෙන කොට්ඨාස අධ්‍යාපන කායර්ාලයට බදු දීලා තිබුණා. නගර ශාලාව බලන්න ගිය වෙලාවෙ අපි නගර ශාලාවට ගියෙ ඒක බලන්න නෙවෙයි. අපි ගියේ අර ගොඩනැගිල්ල බදු දීම පිළිබඳව බලන්න. ඒක සම්පූණර් අපවිත්‍ර වෙලා, සිවිලින් ෂීට් කඩාවැටිලා, ඒ වගේම ඒකෙ කිසිදු පිරිසිදු කිරීමේ වැඩපිළිවෙළක් නැහැ. කිසිම කෙනෙක් යොදවලා නැහැ. අපේ කම්කරුවෙක් වත් යොදවල නැහැ. අර ගලිවලට හයි කරපු, දෙපලක් කඩා වැටිලා ඒවයි කිසිදු නඩත්තුවක් නැහැ. දැන් වැසිකිලියට ජලය දෙන්නේ උත්සවයක් තියෙන අවස්ථාවට විතරයි. ඒ වගේම අපද්‍රව්‍ය දාන්න කුණු බක්කියක් වත් අපි දැක්කේ නැහැ. ඒ වගේම අනාරක්ෂිත විදියට වැටක් තියෙනවා. ඒ වැටේ වැඩ නිම කරලා නැහැ. මේවට සුළු ප්‍රමාන යයි යන්නේ. දැල් ගහන්න. නිවසත් එක්ක මෙන්න මේ බිල්ඩින් එක වගේ ප්‍රමාණයක් තියෙනවා. හැමතැනම වට කරලා අර ටික විතරක් නතර කරලා තියෙනවා. ඇහුවම කියෙනවා මේක ගෙනාවේ උඩුගම හෝමදොල ක්‍රීඩාංගණයේ දැල් වගයක් මේකෙ වැඩ පටන් ගත්ත කියල. ගොඩනැගිල්ල ආරක්ෂා කරගැනීමට අවශ්‍ය සියලු ස්ථානවල අඩුපාඩු තියෙන තැන් වල මේ සභාවේ අරමුදලින් දැල් ආවරණ යොදන්න කියලා ඔබතුමාට ගෞරවයෙන් මතක් කර සිටිනවා.

ඊළඟට විශේෂයෙන්ම උපකායර්ාලය බදු දීම පිළිබඳව අලුත් මාතෘකාවක් මේ සභාව හමුවේ ගොඩනැගිලා තියෙනවා. මේක අපට අයිති නැති භූමියක් නිසා හැකියාව නැහැ කියලා මතයක් ගොඩනැගිලා තියෙනවා. කවුද මන්දා මේ මත ගේන්නේ. මේවට උල්පන්දම් දෙන්නේ කවුද? විශේෂයෙන්ම ඔබතුමා මේ ගැන උපදෙස් අරගෙන ගොඩනැගිල්ලට දැන් මේ සභාව හමුවේ විරෝධතාවක් ගොඩනැගිලා නැහැ. ගොඩනැගිල්ලට යම් ආදායමක් ලබාගන්න පුළුවන් නම් ඒ ආදායම අපි කවුරුවත් බෙදාගන්නෙ නැහැ. පොදු අරමුදලට ඒ ආදායම යොමුවෙන්නේ ඔබතුමා ඒ මුදල අරගෙන වෙනම ගිණුමක තැන්පත් කරල තියන්න. පොදු අරමුදලට දාන්නෙ නැතුව. එතකොට මේකෙ යම් කිසි ප්‍රශ්නයක් ගැටලුවක් තියෙනවනම් වගකීමක් ඇතුව කටයුතු කරන්න පුළුවන්. එතකොට ඔබතුමාට ඒ ගොඩනැගිල්ල බදු දීමේ දී පැන නගින ගැටළු වලට නිහඬීතව මුහුණ දෙන්න පුලුවන්. විශේෂයෙන් ම ගරු සභාවේ සභාපතිවරයා වශයෙන් ඔබට තියෙන බලතල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවක් වශයෙන් මෙය ක්‍රියාත්මක කිරීමේ දී ඔබතුමාගේ බලතල අනුව කටයුතු කරන්න කියලා මතක් කර සිටිනවා. ඒ වගේම විශේෂයෙන්ම මන්ත්‍රීවරුන්ගේ හැඳුනුම්පත් පිළිබඳව ඉල්ලීමක් තියෙනවා. හැකි ඉක්මනින් පින්තූර ලබාගෙන හැඳුනුම්පත් ලබා දෙන්න. විශේෂයෙන්ම වෙනත් කායර්ාලයකට යාමේදී අනන්‍යතාවය පිළිබඳ ගැටලුවක් තියෙනවා. මන්ත්‍රීවරුන් හඳුනාගැනීම සඳහා ඒ සඳහා කටයුතු කරන්න කියලා ඔබතුමාට මතක් කර සිටිනවා.

ඒ වගේම දැන් තවත් අඩුපාඩුවක් කතා කරා. අපේ මාපලගම වෙළඳ සංකීණර්යේ අඩුපාඩුවක් පිළිබඳව. ඒ කියන චෝදනා පිළිබඳව සොයා බලා වහල අලුත්වැඩියා කරන්න තියෙනවා නම් හොයල බලල, හිග මුදලක් තියෙනවනම් අයකරගෙන, ඒ කටයුත්තට මැදිහත් වෙන්න කියලා ඉල්ලීමක් කරනවා. ඒ වගේම තල්ගස්වල පොළෙත් යම් යම් අඩුපාඩු රාශියක් තියෙනවා. උඩුගම පොලේ බදුකරු ගෙන්නගෙන එයාට උපදෙස් දීලා ගොඩනැගිල්ලට ප්‍රවේශ කරන්න. ඒ වගේම උපක්‍රමශීලීව පරන ගොඩනැගිල්ල අලුත් වැඩියා කරනවා කියලා කටයුතු කරලා, නව ගොඩනැගිල්ලට ව්‍යාපාරිකයින් ගිහිල්ලා ඒ කටයුත්තට ඒ පරිසරය විශේෂයෙන්ම අපද්‍රව්‍ය පැතිරීම සම්බන්ධව උඩුගම ජනතාවගේ චෝදනා තියෙන හින්දා මේ ගරු මන්ත්‍රීවරු කතා කරන්නේ. ඒ සඳහා කටයුතු කරනු ඇතැයි බලාපොරොත්තු වෙමින් මේ සභාවේ විශේෂ කරුණු යටතේ කතා කරන්න අවස්ථාව ලබාදීම ගැන ගරු සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරුන්ට ස්තුති වන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී විජිත් වීරගුණරත්න සහබන්දු මහතා :-**

ගරු සභාපතිතුමනි, ගරු මන්ත්‍රී තුමනි කතා කරන්න ඕන නිසා කතා කරනවා. මොකද මගේ ප්‍රශ්න ටික අපේ මන්ත්‍රීතුමන්ලා කතා කරා. කටුපොල් වගාව ගැන කතා කරා. ඉතින් ඒ වගේම ගංවතුර ප්‍රශ්නෙ ගැන කතා කළා. අපේ ලක්වරුවන් මන්ත්‍රීතුමා කතා කළා. අවශ්‍ය පිළිතුරු නන්දන මන්ත්‍රීතුමා දුන්නා. හැබැයි මට ප්‍රශ්නයක් තියෙනවා. ඌරල මන්ත්‍රීතුමාට පස් සැරයක් ලයිට් වාහනය ගිහිල්ල තියෙනවා. ඉතිං මම කියන්නේ අපේ ගරු සභාපතිතුමා ට අපේ නන්දන මන්ත්‍රීතුමාට විපක්ෂ නායක තුමාට පස්සැරයක් යැව්ව නම් නන්දන මන්ත්‍රීතුමාට විපක්ෂයේ සංවිධායකතුමාට හතර සැරයක් වත් යවන්න. එතකොට මගේ ප්‍රශ්නෙත් විසඳෙනවා. ඒ යෝජනාව තමයි මට කරන්න තියෙන්නෙ. අපේ එහෙම ප්‍රශ්නයක් නැහැ. ලයිට් වල අපි

කණගාටු වෙනවා. අර පොඩි ප්‍රශ්නයක් අතන වෙලා තියෙන්නෙ නොතේරුම්කමට වෙච්ච දෙයක්. ඒ ගැන අපි එච්චර සද්ද කරන්න අවශ්‍ය නැහැ. ඒ පිළිබඳව මතක් කරනවා. ඒ වගේම ගංවතුර ප්‍රශ්නෙට අවශ්‍ය දේවල් කතා කළා. කතා කළ දේවල් ආපහු කතා කරලා වැඩක් නැහැ. ගංවතුර ආධාර මමත් ගත්තා. ඒත් මටත් අසාධාරණයක් වුනා.
ඒ වගේම මම හිතන්නේ විශේෂයෙන් කතා කළ යුතු දෙයක් නැහැ. ඒ වගේම මම කියනවා. පහුගිය දවසෙ ආණ්ඩුවේ රාජ්‍ය ඇමතිනි විජයකලා මහේෂ්වරන් මන්ත්‍රීතුමිය කළ ප්‍රකාශය පිළිබඳ අපේ විරෝධය ප්‍රකාශ කරමින් අපේ සභාවේ මන්ත්‍රීවරුන් 15 දෙනාගෙම විරෝධය ප්‍රකාශ කරමින් ඔබ සියලුදෙනාටම සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින් මගේ කතාව අවසන් කරනවා.

## ගරු සභාපති තුමාගේ මූලාසන කතාව:-

ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රීතුමන්ලා ,ලේකම්තුමිය, මාධ්‍යවේදී මහතා ඇතුළු සියලු දෙනාගෙන්ම අවසරයි. දරුවො කරන වැරදි වලට කවදත් බැණුම් අහන්න වෙන්නේ දෙමාපියන්ට. මම ඒ වගේ බැනුම් අහගෙන හිටියා. විශේෂයෙන්ම විදුලිය පිළිබඳ තමයි එදා ඉදලම කතාකරන්නෙ. විදුලිය තමයි හැම ප්‍රාදේශීය සභාවකම ප්‍රශ්නෙ. මම මේ පිළිබඳව තවලම ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා ගෙන් ඇහුවා. එතුමා කිව්වා මන්ත්‍රී කෙනෙකුට පූර්ණකාලීනව බල්බ් දහයක් දෙනවයි කියලා. තමන්ට නිව්ච්ච බල්බ් එකක් තියනවා නම් දාගන්න ඊට වඩා දෙයක් එහෙ වෙන්නේ නැතෙයි කිව්වා. මං කීප දෙනෙක්ගෙන් ඇහුවම සමහර අය ගණන් ගත්තෙත් නැහැ. අපේ තමයි මේ හුඟක් ප්‍රශ්න තියෙන්නේ. හැමදාම බල්බ් 10 ක් හදන්න යනවා. අපේ ප්‍රදේශීය සභාවෙ කාමරීක නිලධාරි, ක්‍රමවේදයක් හදලා තිබුනා. ඒ ක්‍රමවේදෙ වරදක් කියලා ඒ ක්‍රමවේදෙ වෙනස් කරලා කොට්ඨාශ 15 ටම යන ක්‍රමවේදයක් හැදුවා. ඒ හදලා යන අතරේ තමයි මේ සියලූ සිදුවීම් වෙන්නේ. කිසි කෙනෙක් හිතන්න එපා. මම පෞද්ගලිකව කිසි කෙනෙක්ගේ බල්බ් එක දාන්න එපා, අරක දාන්න, මේක දාන්න කියලා අද වෙනකන් කෙල බිදක් එලියට දාලා නැහැ. මම ඒවට විරුද්ධයි. මම ඒවට සමහර අවස්ථාවලදී විරුද්ධව කතා කරලා තියෙනවා. අපේ සහබන්දු මන්ත්‍රීතුමා කිව්වා වගේ පස් වතාවක් මම බැලුවා. ඒ පස් වතාවක් නෙමෙයි ඒ අවස්ථානුකූලව ගිහින් තියෙන්නේ මම එතන වරදක් දකින්නේ නැහැ. ඔබතුමාලා දන්නවා දවස් තුනක්ම මොකද්ද කතන්දරේ එක සැරයක් හදද්දී මෙතන සේවක රැස්වීමට එන්න කියලා, ඊට පස්සේ පොලේ ප්‍රශ්නයක් වෙලා බල්බ් දෙකක් දානකොට එව්වා. එහෙම කතන්දර තමයි වුනේ. ඉතිං මැතකත් ගියා. සමහරවිට මම හොද වැඩ හින්දා වෙන්න ඇති මේ හැම දේම වෙන්නේ. එහෙම මම සිතනවා. මට ඕන නම් පුළුවන් ප්‍රධාන මාගර් වල විතරක් වීථි පහන් සවි කරන්න. නමුත් ඒ විදිහට කරන්න යද්දී අපේ මන්ත්‍රීවරුම අපට දෝෂාරෝපණය කරනවා. විදුලිය පිළිබඳ කතා කරන මන්ත්‍රීවරයාම ඒ ගැන දෝෂාරෝපනය කරනවා. ඒ නිසා මීට පසුව මම හරි විදියට කරන්නම්. ඒ විදියට ඉල්ලීම් කරන්න මොකද මට දැන් බැනුම් අහල ඇති වෙලා. දැන් හැම එක්කෙනාගෙම දෝස්මුරේ හම්බ වෙන්නෙ මට. නමුත් දැන් බලන්න මම තවම අපේ නාගොඩ ප්‍රදේශයේ වත් එක බල්බ්

එකක් වත් හැදුවෙ නැහැ. මොකද සියලු දෙනාගේ ඒවා හදලා මම හදන්නම් කියලා ඉන්නවා. අපේ මිනිස්සු බණිනවා මට. මමත් මන්ත්‍රීවරයෙක් මටත් එහෙනම් මගේ බලතල වලින් මගේ ඒව සේරම හදන්න පුළුවන්. මේ උප සභාපති තුමාගේ පැත්තේ ගියේවත් නැහැ. පෙරේද පළමුද දැන් දවස් පහක් තිස්සෙ බල්බ් හදන්න විදිහක් නැහැ. මොකද ඒ හාඩ්මෙක්යන්ත්‍රෙ කැඩිලා. ඒක නැතුව යන්න බැහැ. ඊළඟට තව එක්කෙනෙක් වීථිපහන් දාන්න ගත්තොත් එයාට අවශ්‍ය ද්‍රව්‍ය දෙන්න විදිහක් නැහැ. හාඩ්මෙක් තව එකක් ගන්න ඕන. ඉනිමග ගෙනියන්න තව වාහනයක් ගන්න ඕන. ප්‍රායෝගිකව අපි කල්පනා කළොත්, අපේ ක්ෂණික අවශ්‍යතා වුනත්, අරක ගමු ,මේක ගමු කිව්වත් ප්‍රායෝගිකව කර ගන්න අපහසුයි. සියලුදෙනාගේම විදුලිය පිළිබඳ ව කටයුතු කරන්න මම බොහෝම උත්සාහ ගන්නවා. මොකද දැන් විදුලියට අපේ මන්ත්‍රිවරුන් කිහිපදෙනෙක් ප්‍රතිපාදන එවලා තියෙනවා. අපේ සුමනසිරි ලියනගේ මැතිතුමා ඒ වගේම පද්මසිරි සිල්වා මැතිතුමා ඉසුරු දොඩංගොඩ මැතිතුමා එවැනි අය මන්ත්‍රී ප්‍රතිපාදන එවල තියෙනවා. ඉතින් අපට ඒ අනුව කටයුතු කරන්න පුළුවන්. ඔය ඕනෑම මන්ත්‍රීවරයෙක් ඉල්ලන්න අලුතෙන් වීථි පහන් දැමීම  පිළිබඳ පොඩි ප්‍රශ්නයක් තියෙනවා. ඒවා තවම අපි ගෙනාවෙ නැහැ. ඒව ගේන්නත්  මට අවසර දෙන්න. ඒවට මිල ගනන් අරගෙන තමයි තියෙන්නෙ. මේවා කරන්න මෙච්චර කල් මම බොහොම ඉවසලා හිටියේ. ඊලගට අර සෝඩියම් ලයිට් හදන්න අපි අවශ්‍ය මිල ගණන් අරන් තියෙනවා. සභාවට ඉදිරිපත් කරලා තියෙන්නේ. ඉදිරියේදී ඒ කටයුතු සියලු දේම සිදුවේවි. ඉවසන්න. මොකද මන්ත්‍රීවරු තුන්දෙනෙක් එක දවසෙ ඉල්ලුවොත් මට දී ගන්න බැහැ. හැකියාවක් නැහැ. ඉතින් මම හරි අසරණ භාවයට පත් වෙනවා. ඒක නිසා ඇත්ත කතන්දරේ මම දන්නවා. මම මන්ත්‍රීවරයෙක්ව සිටිද්දී සභාපතිතුමාත් එක්ක හුගක් රණ්ඩු උනා. මට බල්බ් එකක් දාගන්න බැරුව, ඒ ගැනත් හිතලා, අනිත් මන්ත්‍රීවරු ගැනත් හිතල තමයි ඇත්ත ඔබතුමන්ලා ඒ අසරණ භාවයට පත් වෙනවා. මොකද බල්බ් එකක්වත් දාගන්න බැරිද කියලා. නමුත් ප්‍රායෝගිකව අපිට හරි අමාරුයි. මේක ඉතින් හැම කෙනාටම කිය කිය යන්නත් බැහැ. අපට ඒ නිසා විදුලිය පිළිබඳ හුගක් ප්‍රශ්න තියෙන්නේ. මොකද ඇත්ත කතන්දරේ ප්‍රශ්නයක් වෙලා තියෙන්නේ විදුලියයි, කුණුයි තමයි. ඒ නිසා මම ඉදිරියේදී ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මම මේ වැඩ කටයුතු කරන්නම්. මට කාලයක් ඉඩ දෙන්න. ඒ පිළිබඳව කටයුතු කරන්න.

තව එකක් මම අපේ මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. අපේ කොට්ඨාස පහලොවේ මන්ත්‍රීවරු ඇත්තටම කොට්ඨාස මට්ටම තිබුන නිසා හොඳයි. මොකද මේ මන්ත්‍රීතුමන්ලා දන්නවා. තම තමන්ගේ බල ප්‍රදේශයේ, කොට්ඨාසෙ ඉන්න සියලුම මන්ත්‍රීවරුන් එකතුවෙලා දැනුවත් වෙලා කටයුතු කරන්න. මං අර ඕන වෙලාවක කියනවා. මට විශේෂයක් කරන්න වෙනවා. අපේ පහළොස් දෙනා වෙනුවෙන්. නමුත් අනිත් අයටත් මම උදවු කරනවා කියන එක කියනවා. ඒක හැබැයි වරදවා ගන්න එපා. මගේ යුතුකමක් වගකීමක් තියෙනවා. හැබැයි මම එතුමන්ට කියලා නැහැ. අනිත් ප්‍රතිපක්ෂ මන්ත්‍රීවරුන්ට කරන්න දෙන්න එපා ඒ තැන්වලට කරන්න යන්න එපා කියලා. මොකද එතුමන්ල එක්ක සහයෝගයෙන් කටයුතු කරන්න ඕන. මේ සියලු දෙනාම අපි එක සහෝදරයෝ මතිමතාන්තර වලින් වෙනස් වුණාට. ඒ නිසා ඔබතුමන්ලගේ ගරුත්වය ආරක්ෂා කරන්න මම බැදී ඉන්නවා. ඒක නිසා කවදාවත් බල්බ් එකකට අපේ මන්ත්‍රී කෙනෙක් හැල්ලුවට පත් කරන්න මම කටයුතු කරනවා කියලා. ඒ වගේම තමයි අපේ වසන්ත මන්ත්‍රීතුමා පාරක් පිළිබඳව කතා කළා. ඔබතුමාවත් දන්නැතුව ඇති ඔය පන්සල හැදුවෙ මගේ තාත්තා ආනන්දාරාමය, ආනන්ද පාසල වැසී ගිය මගේ තාත්තා හැදුවේ. අපේ ගෙදර ආනන්ද ගිරි ඔය

පන්සල හදන්න මූලික වෙන්න හේතුව නාගොඩ ශ්‍රී පඤ්ඤානන්ද කියන හාමුදුරුවෝ අපේ ලොකු තාත්ත කෙනෙක් කිතුලම්පිටිය ආනන්ද පිරිවෙනේ නායක හාමුදුරුවෝ. ලංකාවේ චිර ප්‍රසිද්ධ ගෞරවණීය නායක හාමුදුරු කෙනෙක් උන්වහන්සේගේ තමයි ඔය පන්සල. උන්වහන්සේගේ නම සඳහන් කරලා දැම්මේ. ඔය ගමේ මුලනෙ ඉන්න සියලු දෙනාම අපට ණයගැතියි. ඔය ඉඩම් බෙදා දුන්නේ මගේ තාත්තා ඉස්කෝලේ සේරම කරලා තියෙන්නේ මගේ තාත්තා මූලික වෙලා. නමුත් මම කියන්න කැමතියි. 2002 දි මම ප්‍රාදේශීය සභාවට ආවට පස්සේ අපේ මලාමුරේ පඤ්ඤාලෝක හාමුදුරුවෝ මන්ත්‍රී හාමුදුරුවෝ ඔයපාර හංදියේ ඉඳලා මගේ තාත්තාගේ නමින් නම් කරලා යෝජනා ස්ථිර වුණා. මේ ඔබතුමන්ලාට මතක ඇති සහබන්දු මන්ත්‍රීතුමා ඔබතුමත් හිටියා. නමුත් මම ඒක කරන්න අනුමත කරන්න ගියේ නැහැ. මගේ තාත්තගේ නම ගහන්න මම ගියේ නැහැ. මම යුතුකමක් කරේ පඤ්ඤානන්ද නායක හාමුදුරුවන්ගේ නමයි නියාගම චන්දවිමල නායක හාමුදුරුවන් ගේ නමයි පාරවල් දෙකේ ගැස්සෙව්වෙ. ඒක ඔය මුලනේ අයට මම ප්‍රසිද්ධියේම කියනවා. නොදන්න අය අලුත් අය වෙන්න ඇති ඔය පරණ අය ඕවා කියන්නේ නැහැ. මොකද මගේ තාත්තා තමයි ඔය ඉස්කෝලේ හදලා තාත්තගේ සල්ලිවලින් ගෙවලා, ගුරුවරු ඇති කරලා ඒ වැඩ කටයුතු කළේ. අපේ තාත්තලා කරපු දූවිල්ලක් තරම්වත් අපට කරන්න බැහැ. නමුත් ඒක ගරුත්වයක් තියෙන්න ඕන ඒකයි මම ඒ නම දැම්මේ. මම මේ කරපුවා කියනවා නෙවෙයිනමුත් කියන්න සිද්ධ වුණේ මේ නමක් නිසා.

ඒ වගේම විශේෂයෙන්ම අපේ සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ඉල්ලුම් කළේ විදුලිය පිළිබද තමයි. අපේ පියල් මන්ත්‍රීතුමා කතා කලා. ඒක යථාකාලෙ සපයනවා. මම පෞද්ගලික ආයතනයක් සම්බන්ධ කරගෙන කතා කලා. ඒක යථා කාලයේදී ලැබේවි. නිල ඇඳුම් පිළිබඳව අපි යථා කාලයේදී කටයුතු කරමු. මොකද රුපියලෙන් දෙකෙන් කරන්න බැරි දේවල් ඕව යෝජනා ස්ථිර වුනා ඔබතුමන්ලා කිව්වා වගේ සේරම බාර අරගෙන මට ඕවා කරන්න බැහැ. විශේෂයෙන්ම මම ගරු මන්ත්‍රීතුමන්ලා ගෙන් ඉල්ලාසිටිනවා. අර හැම ප්‍රාදේශීය සභාවකම මං හිතන්නේ ශ්‍රමදාන මට්ටමින් තමන්ගෙ පාරවල් සුද්ද කරනවා. ඒ තුළ සභාවෙන් දෙන්න පුළුවන් උපරිම දායකත්වය දීලා වැඩ කටයුතු කරමු. ඒක යූ.එන්.පී. ශ්‍රී ලංකා ජේ.වී.පී. කියල නැහැ. අපේ මේ මන්ත්‍රීතුමා ශ්‍රමදානයක් කළා ඒ තුන්දෙනාම එකතු වෙලා කටයුතු කළා. ඒ වගේම තමන්ගේ බල ප්‍රදේශයේ ශ්‍රමදාන කටයුත්තක් කරනකොට සෙනසුරාදා ඉරිදා හැර දිනයක් ගන්න. මොකද සේවකයන් ලබාගැනීමේ අපහසුතාවය තියෙනවා. එතුමන්ලාගේ නිවාඩු දින හින්දා. ඊළඟට ඉදිරියේදී අපි තණකොළ කපන මැෂින් ගත්තහම හුගක් පහසු වේවි. . විශේෂයෙන්ම සේවකයෝ හත් දෙනයි. ඉන්නේ හත් දෙනාගෙන් දෙන්නෙක් විතර නැති වුනාම පස්දෙනයි. ඔය පස්දෙනා තමයි හැමදේම කරන්නේ. අර පොළ පිළිබඳ අපේ මන්ත්‍රීතුමන්ලා කතා කළා. එදා අපි පොරොන්දු වුණා. කාලගුණයත් එක්ක අවහිරයි. ඊළඟට එතුමන්ලා නිකන් හිටියේ නැහැ. එක එක වැඩ නිසා ක්ෂණිකව කරගන්න බැහැ. ඒ නිසා පොල පිළිබඳව අපිට කටයුතු කරන්න බැරි වුනේ. මොකද පොලට වඩා දේවල් කරන්න සිද්ද වෙනවා. ඇත්තටම සමන් මන්ත්‍රීතුමා අපි එදා පොරොන්දු වුනා මේක කරනවා කියලා. නමුත් අපි ඒක බලාපොරොත්තු වුණේ, එතනට ගියේ අර අලුත් හදපු හෝල් එකට එයාලව දාන්න. නමුත් එතුමන්ලා කැමති නැහැ. එතුමන්ලා අර කැලෑ රොදේ ම ඉන්නවා. ඒක සුද්ද කරලා දෙන්න පුළුවන් නමුත් අපට ඕන අතනට යවා ගැනීම ඉදිරි කාලෙදි ඒ කටයුත්තට මූලිකත්වය

දීලා ඒ ස්ථානය අපි පිළිසකර කරලා දෙන්න බලාපොරොත්තු වෙනවා. මොකද සේවකයන්ගේ අඩුපාඩුව තමයි අපිට තියෙන එකම ප්‍රශ්නෙ.
ඒ වගේම ගරු මන්ත්‍රී සහබන්දු මැතිතුමා ප්‍රශ්න කළ ආකාරයට අපි කොස් ගහේ ප්‍රශ්නයට කටයුතු කළා. ඇස්තමේන්තුවක් හැදුවා. හාර දහස් ගණනක ඇස්තමේන්තුවක් හදලා තියෙන්නේ. ඒ කොස්ගහ අයිති එක්කෙනා මෙතනට ආවා. ඔහු හමුදාවේ සේවය කරන කෙනෙක්. ඇයි අපට මෙහෙම කරන්නේ කියලා ඇහුවා. මම කිවුවා මගේ පෞද්ගලික මතය නෙවෙයි. මේක අපේ යුතුකම. අර ගහේ අත්තක් පමණක් කඩා වැටුන නිසා ඔයාලා බේරුණා. ඊට වැඩිය ලොකු අනතුරක් උනානම් අපිත් වගකියන්න ඕන. ඔයාලට තමයි ගෙවන්න වෙන්නේ කියලා. එයාලට කපන්න කිව්වම කම්බියක් දාල ගැටගහලා අතු කපන බව කිව්වා. මට තව මාස දෙකක් ද කොහෙද ඉල්ලුවා. මොකක්ද නිවාඩු ගැනීමේ අපහසුතාවයක් තියෙනවා කියලා. ඒ අතර තුර දෙයක් වුනොත්, ඒ නිසා  හැකි ඉක්මනට කරන්න කියලා මේ ඇස්තමේන්තු හදලා තියෙනවා. ඒ ලියුමෙන් ඉල්ලලා තියෙන්නෙ අපෙන් නෙවෙයි. ආපදාවට පත් වෙච්ච අය ඉල්ලලා තියෙන්නේ එයාලගෙන් අරන් දෙන්න කියලා. නමුත් අපට පුළුවන් ඒ කටයුත්ත කරන්න. මෙන්න ඇස්තමේන්තුව මෙන්න ඔයාල වෙනුවෙන් කළ දේ කරුණාකරලා ගෙවන්න කියලා කටයුතු කරන්න පුළුවන්. සහබන්දු මහත්තයා ඔබතුමාම ඇහුවා ආයතනය පවතින ඉන්වෙන්ට්‍රි ලේඛන වල කොඩි කණු සහ සංගීත භාණ්ඩ පිළිබඳ කිසියම් හෝ සඳහන් වීමත් නැතිද කියලා. ඉන්වෙන්ට්‍රි ලේඛන වල නොමැති බව තමයි මට දැනගන්න ලැබුණේ. අපි කොමසාරිස් තුමාටත් ලිඛිතව යවලා තියෙන්නෙ. දොර පිළිබඳ සොයා බලන්නම්. ඒ වගේම ලක්රුවන් මන්ත්‍රීතුමා කිව්වා වගේ ගංවතුර පිළිබඳ කතන්දර ඇත්ත අසාධාරණයක් වුණා. අසාධාරණයක් වුනා කියන්නෙ ඒකත් වෙලාවට 2003 හා 2017 ගංවතුර එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලේ අපේ ආණ්ඩුවක් තිබුණා නම් අපි මැදිහත් වෙලා බොහෝම සාධාරණවයි වැඩේ කරනවා. අසාධාරණයක් කරන්න ඉඩ තියන්නෙ නැහැ. ගංවතුරට වැඩියෙන්ම ආපදාවට ලක් වෙච්ච මනුස්සයෙක් මම සත පහක් නැහැ. පිළිගන්න. ඊළඟට එකම ගෙයි කාමර දෙකට දෙකක්, එකකට තියෙනවා. අසූ හත් දාස්ගානක් අනිකට තියෙන්නේ දෙදහස් ගානයි. එකගෙයි කාමර 2ක්. ඉතින් එවැනි කටයුතු තියෙනවා. හේතුව ඇත්තටම තරංග මන්ත්‍රීතුමා එකෙන් ඒකෙ නිධාරීන්ට දොස් කියලත් බැහැ. දේශපාලනයට දොස් කියලත් බැහැ. ඕකෙ කවුද දොස් අහන්න ඕන කියල දන්නෙ නැහැ. මොකද හේතුව පිටින් ඇවිල්ලා ඇස්තමේන්තු කරලා තියෙනවා. ඉතින් අපට ඒක හිතාගන්න බැහැ. ගරු මන්ත්‍රීතුමා, සේරම ලිඛිතව පොලීසියට දුන්නා. 2003දී 2017ත් එහෙමයි. 2017 දි පොලිසියෙන් ඉල්ලුවෙ නැහැ. කොහොම නමුත් අපේ ගෙදරට වත් මට වත් මොකුත් නැහැ. මාත් අභියාචනයක් දුන්නා. මේ සැරේ ලැබෙයිද දන්නෙ නැහැ. අපේ රජයක් කාලෙ වුනා නම් මම කොහොම හරි මැදිහත්වෙලා කරනවා. සාධාරනව අරන් දෙනවා.

ඊළඟට අපේ තරංග මන්ත්‍රීතුමා සුමනසිරි ලියනගේ මැතිතුමා ලක්ෂ දහයක් දීපු එක ගැන කතා කළා. ඇත්තටම හොඳයි. ඒ වගේම පත්මසිරි සිල්වා මැතිතුමා පාසල් දෙකට ලක්ෂ 10 ගානේ දුන්නා. මලාමුර කනිෂ්ඨ විද්‍යාලයට, උනන්විටිය විද්‍යාලයටයි ලක්ෂ 10 ඒවා දෙකක් දීලා තිබුණා. සිසිර කුමාර මැතිතුමා උඩලමත්තට ලක්ෂ දහයක් දීලා තිබුනා. ඒත් අපේ බල ප්‍රදේශයේ අපි ඇත්තටම ගරුත්වයක් දෙන්න ඕන. එතකොට අපේ නලින් හේවගේ මැතිතුමා උඩවැලිවිටියට ලක්ෂ දහයක් දීලා තියෙනවා. ඒ පිළිබඳව අපි ඇත්තටම ගෞරවය පුද කරන්න ඕන. ඒ මන්ත්‍රීතුමන්ලාට. ඒ වගේම ඒ මන්ත්‍රීතුමන්ලා  අපට සහාය දක්වන මන්ත්‍රීතුමන්ලා. අපට ලොකු ගරුත්වයක් එතුමන්ල අපේ සභාවල් වලට වෙනත් ප්‍රතිපාදන පවා එවනවා. විදුලියට, යම් පාරවල් වලට ඇත්තටම අපට සතුටුයි. අපේ මන්ත්‍රීතුමන්ල කොහොම හරි අනිත්

මන්ත්‍රීතුමන්ලා සම්බන්ධ කරගෙන කොහොමහරි ප්‍රතිපාදන අරගෙන එන්න. අපට එතකොට කිසි කතන්දරයක් නැතිව ඒ කටයුත්ත කරන්න පුළුවන්. ඒ අනුව අර ලයිට් කණුව ඉවත් කිරීම පිළිබඳව අපි ඉදිරි කාලෙදි විදුලි අධිකාරී දැනුවත් කරනවා. ඒවගේම කුඹුරු ගොඩකිරීම පිළිබඳව, අවංකව අද ඉදල නෙවෙයි. මන්ත්‍රීතුමා උඩුගම ප්‍රදේශයේ ගොඩ කරපු හැටි පේනවා. ඌරල ප්‍රදේශයේත්, අර හැම ප්‍රදේශයේම ගියොත් ඔය පිළිබඳ නිලධාරී අසරණ වෙනවා. දේශපාලන අධිකාරියත් ඇඟිලි ගහනවා. මේවට ඉතින් ඔය ගොඩ කිරීම් පිළිබඳව මටත් දුරකථනයෙන් දැනුම් දුන්නා. මාත් දේශපාලන වශයෙන් නොවෙයි. පචර්ස් 10 ක් නැති අයට ගොඩ කරන්න දෙනවා. මොකද ඒ අයට නැතෙයි කියන කතන්දරය අපිත් එක්ක කතා කළා. නමුත් ඊට වඩා දෙයක් දන්නෙ නැහැ. ගොඩකිරීම් වලදි නිලධාරි අසරණයි. මාපලගම කඩකාමරය ගැන එතුමල කතා කරන්නේ ඇත්තටම මොනවත් නොදැන නොවෙයි. එතුමලට අපි කිව්වා. දැනුම් දුන්නා. හිග බදු ගෙවන්න කියලා. එතකොට අපි යටත් හිග බදු තියාගෙන මේ කරන්නේ. නමුත් ඒ කටයුත්තේ දී මැදිහත්වෙලා සභාවක් හැටියට ඒ කටයුතු කරනවා. ඊළගට මෙහා පැත්තේ කඩයක් ලක්ෂ තුන හමාරකට ද, තුනකට ද කොහේද දුන්නේ. දොර කැඩිල ඒ දොර හදන්න මං හිතන්නේ ලක්ෂයක් එකහමාරක් විතර යාවි. ඉතින් අපට ඒ කඩේ අපි තියාගත්ත නම් හොඳයි කියලා හිතනවා.

ඒ වගේ තමයි. මේ පොල් ඉඩම බදු ගත්තා. අවංකවම මම පොල් ගෙඩියක් වත් කුරුම්බයක් වත් කන්න නෙවෙයි. ඕන්නම් එතැනට ගියොත් තැඹිලි කඩාගෙන බොයි. මේ සියලු දෙනාම පොල්වල කතන්දරේ අපි දැනුවත් උනා ඔය කොටස වෙන්දේසි කරන බව ඒ පාර මම ලිඛිතව දැනුම් දුන්නා. දිසාපතිතුමියට අපට ලබාදෙන මුදලට නොවෙයි. නොමිලේ අපට ලබාදෙන්න. අපට අයිතිය ලබා දෙන්න කියලා. නමුත් එතුමිය කිව්වෙ මට ඒකට නීති ප්‍රතිපාදන නැහැ. සාමාන්‍යයෙන් ආයතනයක වෙන්දේසියේ තමයි වෙන්දේසි කරලා. ඒකේ ආදායම ගන්නේ. ඔබතුමා කොමසාරිස්තුමාට කතා කරන්න කියලා. මම කොමසාරිස්තුමා වෙනුවට කතා කරා. අපේ හිටපු දිසාපතිතුමා චන්ද්‍රලාල් මහත්තයට වතර්මාන ඉඩම් අධ්‍යක්ෂ ජනරාල් එතුමා කිව්වා. අපට අයිතිය තහවුරු කරගැනීම සඳහා වෙන්දේසිය අරගන්න කියලා. එහෙම ඒ ක්‍රමයට යන්න කියලා. එහෙම තමයි අපි මන්ත්‍රීවරු දැනුවත් කරලා, එතුමන්ලගෙත් විරෝධතා තිබුණේ නැහැ. එහෙම තමයි ගත්තේ. ඒ අනුව හැටදහස් හයසීයකට අපට පුළුවන්කම ලැබුනා. මේක ගන්න සමිතියේ සභාපති කිවුවා. හොරු නො කැඩුවොත් එක් ලක්ෂ පනස් දාහක හැටදාහක ආදායමක් ගන්න පුලුවන්. හොරු කැඩුවොත් නම් ලක්ෂයක විතර ආදායමක් තමයි ගන්නේ කියලා. ඒ ආදායමත් අරන් තරංග මන්ත්‍රීතුමා කිව්වා වගේ දැන් අපේ සේවකයෝ හා ටැක්ටර් යොදලා තමයි ඒවා කරන්නේ. ඒ වියදම් හැර තමයි ලාභාංශ පෙන්නන්න වෙන්නේ. ඒ විදිහට තමයි අපි කටයුතු කරන්නේ. බලමු ඒ නිසා විශේෂයෙන්ම ඕන ලාභ පාඩුවට වඩා අපට අපේ අයිතිය රැක ගැනීමේ කතර්ව්‍යය. අපි ඉල්ලුව අක්කර 35 ම අපි ඉදිරි අනාගතයේදී බලපාන ලොකු ප්‍රශ්නයක් තමයි, කුණු ප්‍රශ්නය. ඊලගට අනිත් සභාවල ඒවත් අපිට සමහර විට ගන්න සිදුවේවි. අක්කර 35 ක භූමි ප්‍රමාණය තිබ්බොත් ලොකුවට පිළිසරු ව්‍යාපෘතිය කරන්න පුළුවන් කියන අදහස අපේ තියෙනවා. ඒ වගේම තමයි ඔබතුමාලට වටිනාම දෙය දැන් මම කියන්න යන්නෙ, පසුගියදා මම අපේ දිස්ත්‍රික් නායක රමේෂ් පතිරණ මැතිතුමා හමුවෙලා ගරු ඉඩම් අමාත්‍ය ගයන්ත කරුණාතිලක මැතිතුමා හමුවීමට අවස්ථාව සලසා ගත්තා. අපේ සම්බන්ධතාත් උඩ. දේශපාලනයෙන් තොරව එතුමා අපට බොහොම ආධාර උපකාර කරන මැතිතුමෙක්. මම ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට පාලර්මේන්තුවට ගිහිල්ලා ගයන්ත කරුණාතිලක මැතිතුමා හමුවෙලා අපි අපේ අවශ්‍යතාවයන් ලිඛිතව ප්‍රකාශ කළා. ඒ අනුව එතුමා තල්ගස්වල

අපට අයත් අපි දැනට අපේය කියන අපේ හැටියට පාවිච්චි කරන ඉඩම තල්ගස්වල හැරෙන තැන එල්.ආර්.සී. ඒක එතන ඉස්සරහා සහ අපට ලබාදී පර්චස් 80 අපට නීත්‍යානුකූල තත්ත්වයෙන් ලබා දීමට ඉදිරියේදී කටයුතු කරන බවට පොරොන්දු වෙලා ඊට පසුවදාම නිලධාරි එව්වා එතන ඉඩම් බලන්න යන්න. ඒ නිසා අපි ගරු අමාත්‍ය ගයන්ත කරුණාතිලක මැතිතුමාට අපේ ප්‍රාදේශීය සභාවේ සියලු මන්ත්‍රීතුමන්ලාගේ ස්තුතිය ගරුත්වය පුද කරනවා. අපේ ගරු රමේෂ් මැතිතුමාටත් අපි ස්තුතිය ප්‍රකාශ කරන්න ඕන. අපේ ආදායම රැකගන්න. ඉදිරියේදී අපි අපේ ආදායමක් හැටියට යම් ඉදි කිරීම් කටයුතු කරලා අපේ සභාවට ආදායමක් එන ලෙස කටයුතු කිරීමට බලාපොරොත්තු වෙනවා. ඒවගේම මාපලගම ආදශර් ගම්මානෙ අක්කර තුන හමාර ඉඩම අපට නීත්‍යානුකූල පවරා ගැනීමට කටයුතු කරනවා. ඒක විශේෂයෙන්ම කිව්වා. අපට අක්කර තුනහමාරක් වෙන් කරලා දෙනවා. ආදාහනාගාරයට තමයි. අපි විශේෂයෙන්ම ගියේ. ආදාහනාගාරයට ලක්ෂ දෙසීයක් හෝ තුන් සියයක් අපට දෙන්න පොරොන්දු වෙලා ඉන්නේ. වලකුඹුර ප්‍රදේශයේ තමයි. අපි බැලුවේ පීල්ල ළඟ, නමුත් එතන ගලක් තියෙන කතන්දරේ නිසා මේ අවස්ථාව වෙනකොට කීප තැනක අදහස් තියෙනවා. නමුත් මට මේ අද සභාවේ කියන්න හිටියේ ඔබතුමන්ලාගෙත් අපේ මැද ස්ථානයක් හැටියට අපේ සභාවෙ මේ ප්‍රදේශයේ තමයි ආදාහනාගාරයට සුදුසු වෙන්නේ. මොකද තල්ගස්වලින් එහා වැයිහේන එක තියනවා. ඊළඟට යක්කලමුල්ලෙ එක නාකියාදෙණිය තියෙනවා. බද්දෙගමත් තියෙනවා. මෙතන තමයි මැද ස්ථානය වෙන්නේ. මේ හරියේ තමයි සුදුසු ඉඩමක් තෝරා ගන්න වෙන්නෙ. සුදුසු ඉඩම තෝරගෙන වතු සමාගමත් එක්ක කතා කරලා අරන් දෙනවා කිව්වා. ඒකට ආධාර උපකාර කරනවා කිව්වා. ඉදිරියේදී ඉතින් ඒ ගැන විශේෂයෙන් ම අවධානය යොමු කරන්න. අපේ සභාවේ මන්ත්‍රීවරු ඒ කටයුත්ත කරන්න මොකද මේ අවස්ථාවේ ඉන්නේ ඉඩම් පවරා දීමට සම්පත් සුබසිංහ ආරච්චි කියන සභාපතිතුමා එතුමා දුරකථනයෙන් ඇමතිතුමාට දැනුම් දීලා අපි එතනට යැව්වා. ගිහිල්ලා පූණර් දායකත්වය දීලා පස්සෙන්ද නිලධාරියෙකුත් එව්වා. ඇමතිතුමා, එතුමා කිව්වා හැබැයි මම දෙන්නෙ කියල නමත් සඳහන් කරන්න කියලා. මම කිව්වා දහ සැරයක් හරි සඳහන් කරන්නම් කියලා. අපි දේශපාලනයෙන් තොරව, අපට දේශපාලනේක අවශ්‍යතාවයක් නැහැ. අපට මේ සභාවට යම් ප්‍රතිලාභයක් ලැබෙනවා නම් ඒ ප්‍රතිලාභ ලබා ගැනීමට කටයුතු කරනවා. ඒ නිසා නැවත වරක් එතුමාට ගරුත්වය ස්තුතිය පුද කරනවා. මම මීට වඩා යමක් කියන්න යන්නේ නැහැ. අදත් ඇත්තටම වෙන සභාවල් දිහා දැක්කම අපේ සභාව රත්තරං. අවංකවම ගරු මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ල වෙන සභාවල් දිහා බැලුවම ජේනව ඇති රූපවාහිනිය පත්තර බලන කොට මන්ත්‍රීවරුන්ට නුසුදුසු ආකාරයට හැසිරෙනවා. අපි එවැනි තත්වයක් බලාපොරොත්තු වෙන්නෙ නැහැ. අපේ නාගොඩ බල ප්‍රදේශයේ ඉන්නෙ ගරුත්වයක් ඇති මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා. එවැනි කටයුතු වලදි මධ්‍යස්ථ සිතා බලා සාධාරණ තීරණ ගන්නේ. අද දිනත් නියෝජ්‍ය සභාපතිතුමා ඇතුලු මන්ත්‍රිතුමන්ලා, මන්ත්‍රීතුමන්ලා සභාව සඳහා ලබාදුන් සහයෝගය පිළිබඳ ගරුත්වය ප්‍රකාශ කර සිටිනවා. විශේෂයෙන්ම මට ලේකම්තුමිය ගැන කතා කරන්න බැරිවුනා. ගිය සභා වාරවල් දෙකේදිම ලේකම්තුමිය ඇල් වතුර එකක්වත් නොබී තමයි මේ පැය ගණන අප අතර රැඳිලා කටයුතු කෙරේ. තමන්ගේ ආගම ඇදහීම වෙනුවෙන් ඇල් වතුර එකක් වත් නොබී පැය තුනක් හතරක් අපි වෙනුවෙන් කැප කළා. එදා මට ස්තුති කරන්න බැරි වුනා. මේ අවස්ථාවේ ඒකත් සිහිපත් කරමින්, අද දින සියලුදෙනාට ස්තූතිවන්ත වෙමින් අද සභාව මෙතනින් හමාර කරනවා. ඉදිරියෙදි ඔබතුමන්ල කියපු යම් යම් කාරනා මේ මාසය

තුළදී ඉටු වේවි. ඒ වගේම අර කියපු යෝජනාවන් වලින් යම් කිසි ප්‍රමාණයක් ඉටු කිරීමට අපට හැකියාව ලැබේවි කියල බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම මේ කාලගුණ තත්ත්වය නිසා තමයි අපට කටයුතු කිරීමට අපහසු වෙන්නේ. අද දින සභාව මෙතනින් අවසන් කරනවා. සියලු දෙනාටම සුබ අනාගතයක් ප්‍රාර්ථනා කරනවා ! ස්තූතියි.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී          දිනය :- ..............................